

දිවයින
ඉරිද සංග්‍රහය

ලිපි මාලාවක් ඇසුරින්

අතහැරීම 6

මහ රහතුන් වැඩි මඟ ඔස්සේ

ඉදිරිපත් කිරීම

ඉන්ද්‍රජිත් සුබසිංහ

මහ රහතුන් වැඩි මඟ ඔස්සේ

අතහැරීම 6

(සතර අපායෙන් මිදෙමු)

ඉදිරිපත් කිරීම
ඉන්ද්‍රජිත් සුබසිංහ

දිවයින ඉරිදා සංග්‍රහයේ
ලිපි මාලාවක් ඇසුරිනි

© ඉන්ද්‍රජිත් සුබසිංහ

පළමුවන මුද්‍රණය - 2014 මාර්තු
දෙවන මුද්‍රණය - 2014 අප්‍රේල්
තෙවන මුද්‍රණය - 2014 මැයි
සිව්වන මුද්‍රණය - 2014 ජුනි
පස්වන මුද්‍රණය - 2014 ජූලි
හයවන මුද්‍රණය - 2014 අගෝස්තු
හත්වන මුද්‍රණය - 2014 සැප්තැම්බර්
අටවන මුද්‍රණය - 2014 ඔක්තෝබර්
නවවන මුද්‍රණය - 2014 නොවැම්බර්
දහවන පළමු මුද්‍රණය - 2014 දෙසැම්බර්

ISBN 978-955-1118-11-2

පොත ලබාගත හැකි ස්ථාන

දිවයින පුරා ප්‍රධාන පොත් අලෙවි සැල්

විමසීම් - 071 2 199 900
(කාර්යාල වේලාවන් හීදී පමණක් ඇමතීමට කාරුණිකවන්න)

ඡායරූප
වාසල සේනාරත්න

මුද්‍රණය සහ බෙදාහැරීම
චැනල් ලින්ක් පුද්ගලික සමාගම
473/1, සමූපකාර මාවත, පැලන්වත්ත, පන්නිපිටිය
දු. ක. 0777 551 911 (කාර්යාල වේලාවන් හීදී පමණක් ඇමතීමට කාරුණිකවන්න)

මේ ලිපි මාලාව ලියූ ස්වාමීන් වහන්සේ මේ වන විට කොහි වැඩ සිටිනවාදැයි මම නොදනිමි. එහෙත් උන්වහන්සේ මේ පින් බිමේ කුමන හෝ ගැඹුරු වනගැබක අලි, කොටි, වලසුන් මැද ඒක විහාරීව දහම් සුව විඳිමින් සිටිතැයි මම විශ්වාස කරමි. මේ ඝෝර කටුක සංසාරයේ භිය දැක මේ ආත්මයේදීම සසර දුකින් එතෙරවීම අදිටන් කරගනිමින් ඍජුව නිවන් මගේ ගමන් කළ උන්වහන්සේ ලබා ඇති මග ඵල ගැන කියන්නට තරම් මම සමතෙක් නොවෙමි. එහෙත් උන්වහන්සේ වැඩිය යුතු බවුන් වඩන උතුමකු බව කියන්නට මම නොපැකිලෙමි. තම අවබෝධය මෙන්ම අත්දැකීම්ද උන්වහන්සේ සතුවූ සටහන් පොත් කිහිපයක සංස්කරණය නොකළ සටහන් ලෙසින් මා අතට පත්කළ උන්වහන්සේ නොපෙනී ගියහ. එහෙත් ඒ සටහන් කෙතරම් දාර්ශනිකද. ගැඹුරුද. ආශ්චර්යමත්ද. නිවන් මඟට පිළිපන් ගිහි පැවිදි උභය පාර්ශ්වයටම මෙය අගනා පූජාවක් වනු ඇතැයි මගේ පුහුදුන් සිත කියයි. මේ සියල්ල ඔබ වෙත ඉදිරිපත් වුවද ඒවා ලියූ උන්වහන්සේගේ නාමය හෙළි නොකරන සේ කරන ලද ඇයැදුමක්ද විය. කර්තෘ අඥාත වුවද මේ සියල්ල ඔබ හැමගේ යහපතට හේතුවනු නිසැකය. ඒ නිසාම මා ලද ඒ අතිශයින් අගනා දහම් පඬුර පොතක් ලෙසින් ඔබ අතට පත්කිරීමට මට ඉඩ දුන මැනවි!

(2012 වෙසක් පුන් පොහෝ දින)

මේ ඝෝර භූමික භයානක සංසාරයේ
තියද්දී, මේ අන්ධකාරයේදීම
සසර දුකින් එතෙර වීමට
අධිෂ්ඨානය කරමින් වීර්ය වඩමින්
ජීවත්වන ඔබ වැනි "දක්ෂ"
නිසි කල්හි දැනුමක් වචනක්
සෝ අනිත්‍ය නියාමය
උපකාරයක් වේවා, පෙන්වීමක් වේවා
ආරාධනයක් වේවා
තම තමාට එළඹෙන ව්‍යායාමය
තම තමන්ගේ ජීවිත වලට ගලපා ගනිත්වා.
අර්ථ හෝ ව්‍යාඤ්ජන වැරදී ඇතොත්
ඔබ නොකළ වරදකට
ඔබ නොගැටේවා.
සුහදව අනුකම්පා කෙරේවා
වරදක් ඇතොත් නිවැරදි වෙස
නිවැරදි ලෙස දක්වා.
මෙහි සටහන් කළ අර්ථයෙන් ලොවා
ඔබ සැමට සහායක් වේවා.
තව තවත් විශිෂ්ට කොට ගනිත්වා.

(පින්වත් ඔබ වෙනුවෙන් මෙම සටහන් තැබූ භික්ෂුන් වහන්සේ විසින් ලියූවකි.)

පිදුම

මේ අනන්ත වූ සංසාරයේ අප කරක් නොගැසූ තැනක් වේද? අත් නොවිඳි අත්දැකීමක් වේද්ද? ඒ සා තැන්හී කරක් ගසා, ඒ සා අත්දැකීම් විඳ මෙලෙසින් තවත් උපතක් ලැබූ අපි මේ භව චක්‍රයේ තවත් කැරකෙමුද? අප හැමදාම කැරකුනේ එකම තැනක් වටාය. විඳගත්තේ ජාති, ජරා, ව්‍යාධි, මරණ.... වැනි එකම අත්දැකීම් පෙළකි.

හිත හැරුණු අතේ, හිස හැරුණු අතේ....යන්නන් වාලේ ගිය මේ ගමනේ වෙහෙස යනු 'දුක' යැයි කියාදුන්, ඒ දුකට සමුදීමේ ක්‍රමවේදය 'දුක අවබෝධ කිරීම' යැයි කියාදුන්, දුක අවබෝධ කිරීමේ උත්සාහයට වචනයකින් හෝ ආදර්ශයෙන් හෝ සවිය දෙන කල්‍යාණ මිත්‍රයෙක් යැයි කියන්නා වූ යමෙක් වෙත්ද, ඒ කල්‍යාණ මිත්‍රයා වෙනුවෙන් මෙය පුදමි.

ඉන්ද්‍රජිත්

පටුන

මේ දුකම කියන දහමක්ද ? දුකෙන් මිදෙන දහමක්ද?	1
දුකසැප පෙරලෙන සංස්කාර	7
මට අවශ්‍යවූයේ බුදුරජාණන්වහන්සේව තෘප්තිමත් කිරීම පමණි	12
පිංවත් ඔබත් මෙතැනට එන්න	19
මේ මුළු ලෝකයම කමටහනක් වූ මෙවලමක් කරගන්න	25
ඔබ ඔය සුරතල් කරන්නේ සතර අපායයි	32
මේ දුකම දැයි සිහියෙන් බලන්න	35
ආදීනව නොපෙනෙන ආශ්වාදයද ආදරය?	41
මරණ භියෙන් තොර මරණයක් උදෙසා	45
ගුරුකමේ රඟ....	52
ප්‍රේතානුස්සතියද? දේවතානුස්සතියද?	61
තවත් පුතුන් කුමට පතන්.....	71
පොඩි කමට කළත් පව පොඩි නැත පුතුනේ	75
ප්‍රඥාවේ පහන් සිළෙන් රැයෙහි අඳුර දුරුකරන්න	80

ශීලය සැබවින්ම කුමක් උදෙසාද? 86

වන්දනාවක සැඟවුන රහස 90

මේ අකුසලය පොළී වෙන ලෝකයයි 94

පොඩි දෙයක් ආහාරයට ගන්න - ලොකු දෙයක් දන්දෙන්න 101

පව පහුරුගාමින් නොසිට කුසල නිධිය මතුකරගන්න 107

ඔබ ඔය ඊර්ෂ්‍යා කරන්නේ සංස්කාරවලට බව දැනගන්න 112

ඔබ විනෝදය ලෙස දකින්නේ තෘෂ්ණාවේ ගින්දරයි 117

ඔබේ භෂ්මාවශේෂ පූජනීයත්වයට පත්කරන්න 121

අහසට පොළොවට දෙස්දී කුමකට? 126

ඔබේ ඔය මහන්සිය හිස් අතින් මැරෙන්නද? 132

ස්ථාවර සාමයක් උදෙසා... 141

ඇයි! ඔබ පිංවන්ත නැතිද? 146

මේ දුකම කියන දහමක්ද ?
දුකෙන් මිදෙන දහමක්ද ?

ධර්මයට අනුව පිංවත් ඔබ නිවැරදි වෙන්න. ධර්මය පිංවත් ඔබට නිරතුරුවම කථාකරන්නේ වඩාත් සැපයකට ඔබව ඔසවා තබන්න. ඒ ශීලය, දානය, ශ්‍රද්ධාව නමැති සැපයේ උපාදානය ඔස්සේ ක්‍රමානුකූලව ඔබව 'පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දැකීම' කියන අවබෝධයට යොමු කිරීම පිණිසයි. සද්ධර්මය කොතැනින් ගත්තත් හේතුඵල ධර්මයන්මයි සකස්කර දෙන්නේ. ඔබ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව, ශීලය, දානය නමැති ධර්මතාවයන් ඔබේ ජීවිතය තුළින් අවංකවම ක්‍රියාත්මක කරනකොට එම හේතුන්ගේ ශක්තිමත්භාවය විසින්ම පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවය ඔබ තුළින් වැඩෙනවා. පිංවත් ඔබ සියල්ලටම පෙර පංචඋපාදනස්කන්ධයේ අනිත්‍යභාවය වැඩීමට යන්න එපා. මෙය මාර්ගයක්. එහි මුල මැද අග වශයෙන් ක්‍රමානුකූලව පෙරට යා යුතුයි. ඔබ ඉක්මන් වුණොත් ධර්මය කෙරෙහි කලකිරේවි. එසේ නැතහොත් නොයෙක් දෘෂ්ටි මතවාදවල සිරකරුවෙක් වේවි. ඔබ සැප ලබන්නට කැමතිනම් මුලින්ම 'සැපය' කියන කාරණය හොඳින් සිහිනුවණින් හඳුනාගන්න. විශේෂයෙන් තරුණ පිංවතුන් පිංවතියන් මොකක්ද 'සැපය' කියලා උපාදානය කරගෙන සිටින්නේ. ඔබ ඔය 'සැපය' යැයි අල්ලාගෙන සිටින්නේ ලෝකයේ සැබෑම සැපය සමග සසඳා බලනවිට ඉතාමත් ප්‍රාථමික සැපයක්. ලෝකයේ සත්ත්වයා අත්විඳින සැබෑම සැපය යම් දවසක ඔය ඇස්වලින් දැක්කොත් ඔබ සිතාවි සැබැවින්ම ඔබ ඇස් ඇති අන්ධයෙක් කියලා. පිංවත් ඔබ උදාහරණයකට මේ මනුෂ්‍ය ලෝකයේ ජීවත්වෙන හොඳම රූප සුන්දරිය ගන්නකෝ. රූපවාහිනී කැමරා සිය ගණනකින් ලෝකයාට

පෙන්වන ඇයගේ සුරූපී රූපය ගන්නකෝ. පිංවතුනි! දිව්‍ය ලෝකවල ඉන්නේ දෙවියන් දිව්‍යාංගනාවන් විතරක් නෙමෙයි. දිව්‍ය තිරිසන් සතුනුත් ඉන්නවා. දිව්‍යලෝකයේ උපත ලද දිව්‍ය අජානීය අශ්වයන් සිටිනවා. භික්ෂුවක් සමාධියෙන් පසුවන විට දිව්‍ය තලයක දිව්‍ය අජානීය අශ්ව විමානයක් දර්ශනය වෙනවා. දිව්‍ය අජානීය අශ්වයන් හතරදෙනෙක් එහි සිටියා. එම දිව්‍ය අශ්වයකුගේ උස අඩි 7ක් පමණ ඇති. දිව්‍ය අශ්වයාගේ වර්ණය තනිකරම මනුෂ්‍ය ලෝකයේ සිටින මොනරකුගේ වෛවර්ණ පැහැයට සමානයි. කොළ, නිල් පැහැයන්ගෙන් අලංකෘතයි. ඔබ සිතන්න, මොනර පිල් කළඹ විසිපහක් පමණ එකතු කරලා මිටියක් බැන්දා කියලා. අන්න ඒ ප්‍රමාණයේ, හැඩයේ වල්ගයක් දිව්‍ය අශ්වයාට තිබෙනවා. එම වලිගය මුලින් පිට උඩ අතට නෙරලා තමයි පහළට වැටෙන ස්වභාවයෙන් තිබෙන්නේ. එය බොහොම ගාම්භීර පෞරුෂයක් තිබෙන වල්ග පිහිටීමක්. එම දිව්‍ය අශ්වයාගේ පිට උඩ කොඳු නාරටිය දිගටම අඩියක් පමණ දිග රෝම මොනර පිල් පැහැයට පහතට වැටී තිබෙනවා. මෙම අශ්වයින් ආයුෂ, වර්ණ, සැප බලයෙන් අනූන දිව්‍ය අශ්වයන්. පිංවතුනේ භික්ෂුව සමග විරසක වෙන්න එපා! පිංවත් ඔබට ධර්ම මාර්ගයේ සැබෑ සැපය ගැන කියන්නයි මෙය සටහන් කරන්නේ. පිංවත් ඔබ සැපයි කියා අල්ලාගන්නා රූප සුන්දරියගේ රූපශ්‍රීයට වඩා අසිරිමත් සුන්දරත්වයක් ඒ දිව්‍ය අජානීය අශ්වයා තුළත් තිබේනම්...

මේ දිව්‍යලෝකයේ තිරිසන් සතෙක් ගැනයි කථාකළේ. දිව්‍ය ලෝකයේ තිරිසන් දිව්‍ය සත්ත්වයාත් මනුෂ්‍ය ලෝකයේ අපට වඩා රූපශ්‍රීයෙන් ඉහළින් සිටිනවා. ඒත් පිංවත් ඔබ ලැජ්ජාවෙන්න එපා. ඔබත් සැබැවින්ම පිංවත්. ඔබට ඔය රූපය ලැබුණේ පෙර පින නිසාමයි. නමුත් ඔබ ඔය රූපයෙන් මත් නොවී ධර්මය සිතන්න දක්ෂ වෙන්න. 'අර දිව්‍ය අශ්වයා මට වඩා ලස්සනයි' කියලා. එතකොට ඔබට පුළුවන්, නිතරම කිළුටු වෙන, නිතරම සෝදන, මේ රූපය ගැන කලකිරිලා, සැබැවින්ම කාලයකට කිළුටු නොවෙන, වඩාත් ලස්සන දිව්‍ය රූපයක් කෙරෙහි උපාදානය සකස්කරගන්න. අවංකවම ඔබට එහෙම අවශ්‍ය නම් ඔබේ රූපයේ ජරා, ව්‍යාධි, මරණ වසා දමන රූපලාවන්‍යාගාරයෙන්, බාබර් සාප්පුවෙන් මිදිලා ශ්‍රද්ධා, ශීල, දානය නැමැති සැබැවින්ම ඔබව

වර්ණවත් කරන මාර්ගයේ මුල් අදියරට එන්න. එතැනදී තරුණ ගිහි පිංවතුන්ලාට බුදුරජාණන් වහන්සේ දේශනා කරන සැබෑ සැපය කෙරෙහි විශ්වාසයක්, දැකීමක් ඇතිවෙනවා. තමා සිටින්නේ මුලාවක බව දැනෙනවා. ඒ කියන්නේ ශ්‍රද්ධාවේ බීජය ඔබ තුළ සකස්වෙනවා. මුලින්ම හිමින්සීරුවේ ඔතනට එන්න. ශ්‍රද්ධාව තමයි මෙලොව ශ්‍රේෂ්ඨතම ධනය. ඒ ශ්‍රේෂ්ඨ ධනයේ හිමිකාරිත්වය ලබාගන්න.

එවිට නිතැනින්ම හේතුඵල ධර්මයන්ට අනුව සැප ලැබීමේ සැබෑම මාර්ගය ඔබ සොයාගෙන යාවි.

පිංවත් ඔබට සැබෑ සැපය ගැන අවබෝධයක් ලැබීම පිණිස, එය ධර්ම මාර්ගය පටන්ගැනීමේ ගමනට අයෝමය ශක්තියක්වීම පිණිස, මේ ලෝක ධාතුව තුළ වෙසෙන වර්ණයෙන්, සැපයෙන්, බලයෙන්, රූපයෙන් ආඪ්‍ය කාන්තාව ගැන සඳහනක් තබනවා. මේ රූපශ්‍රීයෙන් බබලන නන් විසිතුරු මුතු, මැණික්, රන් ආභරණවල වටිනාකම දකින විට පිංවත් ඔබට සිතේවි ඔබේ ඔය ඩෙනිම් කලිසම, කොණ්ඩා මෝස්තරය, ඉමිටේෂන් කරාබු, මාල, වළලු, රනින් සැදූ ආභරණ මොනතරම් අඩු ලංසුවේ නොවටිනා දේවල්ද කියලා. ඔබ සැපයි කියලා විශ්වාස කරන සැපයත්, ලස්සනත්, ලොව්තුරා ධර්මය තුළින් ගිහි පිංවතුන්ලා ඔසවා තබන සැබෑ සැපයත් අතර පරතරය ඔබ හොඳින් අත්දකින්න. ඔබ ඉහත ඇඳුම් ආභරණ අයිති කරගන්න මොනතරම් රැකීරක්ෂා ව්‍යාපාර කරලා මුදල් හම්බ කරන්න දුක් විඳින්න ඕනද? පවුමක රන්මාලයක් ගන්න වර්තමානයේ තරුණයෙකුට, තරුණියෙකුට මොනතරම් ශ්‍රමය වගුරවන්න ඕනෙද? ඊට අවශ්‍ය මුදල් හම්බකරගන්න, වර්තමාන සමාජයේ ඒවා අරාක්ෂාකරගන්න මොනතරම් වෙහෙසක් ගන්න ඕනෙද? රන් මාලයක් දමාගෙන අද බියකින් තොරව මහපාරක යන්න පුළුවන්ද? ඔබ සැපය කියලා කියන්නේ ඔය කරදර පීඩා රැසක් රැඳුණු දුකට නේද?

නමුත් ධර්මයේ ගිහිපිංවතුන්ලාට දේශනාකරන සැපය තුළ ඇති ශ්‍රේෂ්ඨම ලෞකික සැපය ලබන කාන්තාව මනුෂ්‍ය කාන්තාවක් නොව දිව්‍ය කාන්තාවකි. ඇය අන් කවුරුත් නොව මුළු දිව්‍යතලයන්ටම අධිපති ශක්‍ර දෙවියන්ගේ අගබිසව සුජම්පතී දිව්‍යාංගනාවයි. ඇය

වැනි අසිරිමත් සැපයෙන් ආඪ්‍ය දිව්‍යාංගනාවක් දිව්‍යතලයක තවත් සිටිය නොහැකිය. මේ සුජම්පතී දිව්‍යාංගනාව සමාධියේ ඇසින් දුටු භික්ෂුවක් ඇයගේ රූපශ්‍රීය පහත ආකාරයට දක්වන ලදී.

භික්ෂුවට සමාධියෙන් ඇය දර්ශනය වෙද්දී ඇය අඩි 6ක් පමණ උස දිව්‍යාංගනාවකි. ඉන්දියානු නාට්‍යාංගනාවක් සාරිය අඳින ආකාරයේ මෝස්තරයට සාරියක් ඇය පැළඳගෙන සිටියාය. එම සාරිය නිල්, කොළ, දම්, අළු පැහැයෙන් යුත් වර්ණවලින් මිශ්‍රව දිලිසෙන ස්වභාවයේ සාරියකි. වැලමිට අසලට අත දිග ඉහත වර්ණවලින් සමන්විත හැට්ටයක් ඇය ඇඳ සිටියාය. මෙම සාරියේ සහ හැට්ටයේ එකම තැන ඉහත වර්ණ මිශ්‍රවීමකින් දැකිය හැකිය. සාරියත් හැට්ටයත් අතරින් ශරීරය බාහිරට කොතැනකවත් නිරාවරණය වී නොමැත. ඇය සාරියට උඩින් අඟල් හතරක් පමණ පළල බඳපටියක් පැළඳගෙන ඇත. බඳපටියේ ඉදිරිපස දිදුලන මැණිකකින් සාදන ලද රවුම් හැඩයේ ආභරණයකි. බඳ පටිය වටේටද මුතුමැණික් ඔබ්බවා ඇත. ඇයගේ හිසකෙස් වැටිය දණහිස දක්වා දිගය. එය හොඳින් ගොතා පහළට දමා තිබිණ. හිසේ, උසින් අඩු ඔටුන්නකි. එය අතේ පළඳින පේරස් මුද්දේ හැඩයට තැනූ සුදු මැණික් ඔබ්බවූ ඔටුන්නකි. ඇගේ ගෙල මාල හතක්, දහයක් අතර ගණනක් ඇත. මේ සෑම මාලයක්ම ඇයගේ කලවා ප්‍රදේශයට දිගය. මේ සෑම මාලයක්ම ඉහත සියුම් මුතුමැණික් සහ රනින් ගෙත්තම් කර ඇත. මේ මාල සියල්ල අතර එක සුවිශේෂ වූ මාලයක් ඇත. එය එතුමියගේ නාභිය ප්‍රදේශයට දිගැති මාලයකි. එහි අග සුදු පැහැති දොඩම් ගෙඩියක ප්‍රමාණයේ මැණිකකි. එම මැණිකෙන් වොට් 100 ක ප්‍රමාණයේ බල්බයකින් නිකුත්වන ආලෝක ධාරාවක් නිකුත්වේ. කොටින්ම ඇය දීප්තිමත් දැල්වෙන බල්බයක් ගෙල එල්ලාගත් දිව්‍යාංගනාවක් සේය. නමුත් එම ආලෝකය විහිදෙන්නේ ඇගේ ගෙල බැඳි මාලයක ඇති සුදු පැහැති මැණිකකිනි. ඇය මේසා ආභරණින් රූපශ්‍රීයෙන් අග රැජිනක් වුවද ඇය නිරහංකාර තැන්පත් ගති ඇති පෞරුෂයෙන් පිරිගිය දිව්‍යාංගනාවකි. සමහර දිව්‍යාංගනාවන්ගේ ඇති කෙලිලොල් බව, රූපශ්‍රීයේ ඇති රිද්මය, ලාලිත්‍යය වැනි දඟකාර චරිත ලක්ෂණ ඇයට නැත. ඇය තැන්පත් මහේශාක්‍ය දෙව් දුවකි.

පිංවත් ඔබ ඉහත සටහන පිළිගත්තද නොපිළිගත්තද එය මේ ලෝකයේ ධර්මය තුළින් ගිහිපිංවතුන්ලාට ලැබිය හැකි සැබෑම සැපය පිළිබඳව මනස අවදිකරවන අත්දැකීමකි. භික්ෂුව පිංවත් ඔබට එසේ සඳහන්කළද මේ නිමේෂයේත් ඒ සුන්දර සුජම්පති දෙව් දුවගේ රූපය භික්ෂුව දකින්නේ ඇට සැකිල්ලක් කොටය. ධර්මයේ සැබෑඅර්ථය එතැනය. එහෙත් පිංවත් ඔබ කලබල විය යුතු නැත. මේ අතිසුන්දර දිව්‍යාංගනාවට ඉහත සශ්‍රිකභාවය ලැබුණේ මහන්සිවෙලා රැකීරක්ෂා, ව්‍යාපාර කරලා නොවේ. අම්මා, තාත්තා, ස්වාමිපුරුෂයාගේ දැවැද්දට නොවේ. මේ සියළු සම්පත් ඇයට ලැබුණේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ගිහිපිංවතුන්ලාට ඇඟිල්ල දිගුකර පෙන්වන ධර්ම මාර්ගයේ ගමන්කිරීම තුළින්ය. ශ්‍රද්ධාව, ශීලය, දානය, දේවතානුස්සතිය ඉහත සැපය ඔබට පෙන්වන මාර්ගයයි. පිංවත් ඔබ ඉන් බැහැරව බොරුවට මොනතරම් දඟලනවාද තුට්ටුදෙකේ සැපයක් සොයන්න.

බලන්නකෝ මොනතරම් අසිරිමත් සැපයකටද බුදුරජාණන් වහන්සේ ඔබලාට පාර පෙන්වන්නේ. ඇයි අපි 'ධර්මය දුක ගැන, මරණය ගැන, අනිත්‍ය ගැන පමණක්මයි කියන්නේ' කියලා ධර්මයෙන් ඈතට යන්නේ. ධර්මය කෙරෙහි කලකිරෙන්නේ. පිංවත් ඔබ සැපය හැටියට දකින අවුරුදු 10ක පමණ නවයොවුන් තරුණ කාලයක් තිබී ජරා, ව්‍යාධි, මරණයන්ට පත්වන ඔය ''දුක'' ලස්සන රූපය කෙරෙහි ඇති කැමැත්තෙන් මිදී ''සැප'' ලස්සන රූපයක හිමිකාරිත්වය ලබාගැනීමට ඔබත් කැමතිවෙන්න මුලින්ම.

එක පිංවත් පවුලක මහත්මයෙක් භික්ෂුවගෙන් ඇසුවා 'හාමුදුරුවනේ අපි ශීලය ගැනම සිතමින්, අනිත්‍ය සංඥාව දකිමින්ම ජීවත්වුණොත් අපේ දරුපවුලට යන කලදසාව, ඒ ගොල්ලන්ගේ අනාගතය අඳුරු වෙනවා නේද කියලා. බලන්න ඒ මහත්මයා ධර්මය මොනතරම් වැරදි අන්තයකින්ද අල්ලාගෙන ඉන්නෙ කියලා. තමන් ජීවත්වීමට නොදන්නාකමින් ඇතිවන ආදීනව ධර්මයේ ගිණුමට බැරකරනවා. සද්ධාව අඩුකම, විචිකිච්ඡාවෙන් සිතුවිලි පිරිලා, පංචනීවරණයන්ගෙන් සිත වැඩිලා. ඒ මහත්මයා ශීලය ගැන අනිත්‍යය ගැන කතාකළත්, අවම වශයෙන් ශීලය තුළවත් ඔහු නැතිය කියන එක ඉහත කාරණයන්ගෙන්

පැහැදිලිවෙනවා. සෑම පවුලකටම ආදායමක් වියදමක් කියන කාරණයක් තිබෙනවා. කොතෙක් ආදායම් ලැබුවත් වියදම ඊට වැඩිනම් ජීවන ප්‍රශ්න ඇතිවීම අනිවාර්යයි. මෙය ධර්මයේ වරදක්, ශීලයේ, අනිත්‍ය සංඥාවේ වරදක් නොවේ. එම මහත්මයා ලැබීමේ තරමට වියදම් කිරීමට නොදන්නාකමේ වරදයි. නමුත් අශ්‍රද්ධාව නිසා එම වරද පටවන්නේත් ධර්මයට. මුලින්ම පිංවත් ඔබ අවංකවෙන්න, ධර්මයෙන් තොරව ජීවත්වෙමින් ඔබ විඳින දුක නුවණින් දකින්න. දුක දකින කෙනායි සැප ඇති මාර්ගයට අවතීර්ණ වෙන්නේ. දුකය කියමින් ධර්මයට ඔබ ද්වේශ කළහොත්, සැක කළහොත් ඔබට අහිමිවන්නේ සැබෑම සැපයයි.

අවංකව ධර්ම මාර්ගයේ ගමන් කරන කිසිම කෙනෙකුට ‘මට වැරදුණාය’ කියල කියන්න තැනක් නැහැ. අතීත අකුසල් සංස්කාර හේතුවෙන් යම් තැනකදී වැරදුණොත් එය හේතුඵල ධර්මයන්ට අනුව ජයග්‍රාහීව ජීවිතයට ගලපාගන්නවා. මෙය තමයි ශ්‍රද්ධාව නැමති පරම ධනයේ ලක්ෂණය. මෙන්න මේ ධනයේ හිමිකාරීත්වය මුලින්ම ඔබට ලබාගැනීම සඳහාමයි මේ සටහන තැබුවේ. මේ ධනයේ හිමිකාරීත්වය මුලින්ම ඔබ අයිතිකරගන්න. එවිට රුපියල්, ශත ඔබේ ජීවිතයේ දෙවැනි තැනට වැටේවි. ශ්‍රද්ධාව ඇති පුද්ගලයාට ජීවිතය කියන කාරණයේදීත් මරණය කියන කාරණයේදීත් ජයග්‍රාහී අවසානයක්මයි ලැබෙන්නේ. එම නිසා බුදුරජාණන් වහන්සේගේ ධර්මය දුක ගැන කථාකරන දහමක් නොව දුක අභිබවා සැප අයිතිකරගන්නා දහමක්. අවශ්‍යනම් දුකත් සැපත් දෙකින්ම මිදීයන දහමක්.

දුක සැප පෙරළෙන සංස්කාර

වැස්ස බොහෝම හයියෙන් වහිනවා. තුන් බිත්ති කුටියේ ඉදිරිපස එල්ලා ඇති පැරණි සිවුර අතරින් මීදුමත්, වහලයේ කුමේරය අතරින් වැහි බිඳුත් කුටියට වැටෙනවා. පරිසරය මීදුමින් වැසිලා. හැබැයි සුළඟ තවම නැහැ. වෙලාව පස්වරු 5.30 යි. දියසීරාව නිසා කුටියේ බිම සිමෙන්තිය තෙත්වෙලා. පාවහන් වලින් තොර නිර්වස්ත්‍ර දෙපා, තෙතබරිත සිමෙන්ති පොළොවේ ගැටෙන විට සීතලක් දැනෙනවා. මේ වැස්ස, සීතල, දියසීරාව, මීදුම හරිම අසරණයි. සරණක් ඇති ජීවිතයක් ඉදිරියේ මේවා කුමක් නම් පීඩාවක් කරන්නද...

ලන්තෑරුම් එළියෙන් ලෑලි ඇඳ මත වාඩිවී මේ සටහන තබනකොට භික්ෂුවගේ සිත පුදුමාකාර සැනසීමකින් පිරිලා. මේ ටික සටහන් වුණේ වැස්ස නිසා. ඒ නිසාම භික්ෂුව වැස්සට ආශිර්වාද කරනවා. භික්ෂුවට මතකය ථේර ථේරී ගාථාවල එක් රහතන්වහන්සේ නමක් උදාන වාක්‍යයක් ප්‍රකාශ කරනවා 'වැස්ස! ඔබ ඇතිතරම් වහින්න. ගොරව ගොරවා වහින්න. වැස්සට බැහැ මාව අපහසුවට පත්කරන්න. මම කුටිය හොඳින් සෙවිලි කරලයි තිබෙන්නේ' කියලා. වැස්සට ගුලිවෙලා, වකුටුවෙලා වැස්සට බැන බැන ඉන්නවා වෙනුවට උන්වහන්සේ වැස්සට ආශිර්වාද කළා. අපි වැස්සට කොච්චර කිව්වත් වහින්න එපා කියලා වැස්ස එය අහන්නේ නැහැ. වැස්සට ඇතිවෙන තුරාවට එය වහිනවා. වැස්ස වහිනතාක් පරිසරය, කුටිය හිරිකිඩෙන්, මීදුමෙන්, දියසීරාවෙන් ආක්‍රමණය කරනවා.

මේ වැස්සට තෙමුණොත් වැඩිම වුණොත් උණක්, සෙම්ප්‍රතිශ්‍යාවක් හැදෙයි. ඊට වඩා හැදෙන ලෙඩක් නැහැ. කොත්තමල්ලි ටිකක් තම්බලා වළඳලා, බටහිර බෙහෙත් පෙත්තක්, කරලක් වළඳලා එය

සනීප වෙලා යාවි. නමුත් ඇස නිසා ඇතිවන කෙලෙස් වැස්සට, කන නිසා ඇතිවෙන කෙලෙස් වැස්සට නාසය, දිව, මනස, කය නිසා ඇතිවන කෙලෙස් වැස්සට පිංවත් ඔබ තෙමුණොත් මෙලොව, පරලොව දෙකේදීම අපි දුකට වැටෙනවා. අර අතීත රහතන් වහන්සේ සිංහනාද කරන්නේ 'මගේ කුටිය හොඳින් සෙවිලි කරලයි තිබෙන්නේ. වැස්ස ඇති තරම් වහින්න' කියලා.

අධ්‍යාත්මික රූපයත්, බාහිර රූපයත්, විඥානයත් මේ කාරණා තුන එකතුවන ඵස්සය ළඟදීම උන්වහන්සේ අනිත්‍යය දකිනවා. ඵස්සය අනිත්‍යයයි කියලා අවබෝධයෙන් දකින තැනදී විඳීමක් සකස්වෙන්නේ නැහැ. ඉන් මෙහා අපි සැවොම ඵස්සය නිත්‍ය වශයෙන් ගෙන පංචඋපාදානස්කන්ධය සකස්කරගන්නවා. ඒ කෙලෙස් වැස්සට තෙමෙනවා. විඳීම කියන සෙවිලි නොකළ වහලය අපිව බරපතල ආකාරයට කෙළෙස්වලින් තෙමෙනවා. මෙහි ඵලය තමයි සංස්කාරයන්ගේ බලවත් රෝගාතුරභාවය. සංස්කාර හේතුවෙන් හටගන්නා රෝගාබාධ බෙහෙත්පෙති, කරල්, සිරප් වළඳලා නම් සනීපකරගන්න බැහැ. කල්ප ගණන් මිථ්‍යාදෘශ්ඨිකභාවය, දුප්පත්බව, කුසගින්න, විරූපිබව, ගින්දර, ගිනිඅඟුරු, ලෝදිය මත මදි නැතිව දුක් අනුභව කරලයි අවසන් වෙන්නේ. දුකත් සැපත් දෙකම සංස්කාරයන්ගේ ඵලයක් මයි. එම නිසා දුක, සැප දෙකම අපි සම සිතින් පිළිගත යුතුයි. අපි සූදානම් සැප සතුටින් පිළිගෙන, දුක අසතුටින් ප්‍රතික්ෂේප කිරීමට නම් අපට කවදාකවත් ධර්මය කෙරෙහි ශ්‍රද්ධාවට පැමිණෙන්නට බැහැ. අනිත්‍ය සංඥාවන්ගෙන් සෙවිලි නොකරන ලද ඇස නිසාමයි, කන නිසාමයි, නාසය නිසාමයි, දිව නිසාමයි, කය නිසාමයි, මනස නිසාමයි දුකත් සැපත් දෙකම අපට උරුමකර දෙන්නේ. අතීතයේ වැඩසිටිය රහතන්වහන්සේ 'වැස්ස ඇතිතාක් වහින්න. මාගේ කුටිය හොඳින් සෙවිලි කරලයි තිබෙන්නේ' කියලා සිංහනාද කරන්නේ, උන්වහන්සේගේ කුටියට වැසිදිය නොවැටෙන නිසා නොව මීදුම, සීතල නොඑන නිසාම නොව උන්වහන්සේ 'දැක්කාය' කියන තැනදීම, 'ඇසුණාය' කියන තැනදීම 'දැනුණාය' කියන තැනදීම ඵස්සය අනිත්‍ය වශයෙන් දැකීම පිණිස අවබෝධයෙන් සම්පූර්ණ උත්තමයකු නිසාය. 'මම' කියන පුද්ගලයා හේතුඵල ධර්මයන්ගෙන් සකස් වූ ඵලයක් ලෙස

අවබෝධකරගනිද්දී, හේතූන් නිසා සකස්වූ ඵලයක් තුළ සත්ත්වයෙක්, පුද්ගලයෙක් වශයෙන් අර්ථයක් නොපෙනෙද්දී කුමක් නිසා, කව්රුන් උදෙසා තෘෂ්ණාවක් සකස්වෙන්නද?

පිංවත් ඔබ දෑස් හොඳින් විවර කර බලන්න. ඇස, කන, නාසය, දිව, කය, මනස යන ආයතන නිසා සකස් වූ කෙලෙස් වැස්සට තෙමුණු සත්ත්වයින්ගේ ලෝකයයි ඔබ ඉදිරියේ දර්ශනය වන්නේ. ධාරානිපාත වර්ෂාවක් ගහකොළ පෙරළා, ඇළ දොළ ගංගා දෙගොඩතලා, පස්කඳු නායගොස් මහා විනාශයක් කරන්නා සේ ඇස නිසා සකස්වූ කෙළෙස් වල බරපතලභාවය නිසාම මොනතරම් දුක් ගොඩක් සත්ත්වයා විඳිනවාද? අපි එක මොහොතක්වත් ඇස, කන, නාසය, දිව, කය, මනස නිසා වන දුක් ගැන මෙනෙහි කරනවාද? කථාකරනවාද? ඇස, කන, නාසය, දිව, කය, මනස නිසා කෙලෙස් වැස්සට හසුවුණ අයමයි ඔය සිරගෙවල්වල, රෝහල්වල, යුධ භූමිවල, ගිහිගෙවල්වල, මගතොටේ අපට මුණගැසෙන්නේ. ස්වභාව ධර්මයේ වැස්සෙන් නොතෙමෙන්න අපි උපක්‍රම යෙදුවාට, තෘෂ්ණාවේ කෙලෙස් වැස්සෙන් අප නිරතුරුවම තෙමෙනවා. අපි ලෙඩවෙනවා. නොදැනුවත්කම නිසාම අසාධ්‍ය රෝගීන් බවට පත්වෙනවා. එහෙම රෝගීන්ට බෙහෙත් කියන්නෙත් තවත් අසාධ්‍ය රෝගියෙක්මයි. ඒ නිසා රෝගියා සහ වෛද්‍යවරයා දෙදෙනාම හුඟක් වෙලාවට විනාශය කරාම පියවර තබනවා.

එක තාත්තා කෙනෙක් සිටියා, ඒ තාත්තා දරුවන්ට බොහොම ආදරෙයි. ඔහු රජයේ සේවකයෙක්. මොහු ශීලය ගැන එතරම් තැකුව කෙනෙක් නෙවෙයි. මාරයා විසින් සමාජය තුළ එලා ඇති තරඟකාරීත්වය නමැති දැලට හසුවෙලා සිටි අයෙක් මොහු. යමක් අයිතිකරගැනීමට යන ගමනේදී මොහු බොහෝම වේගවත්. කොටින්ම මොහුට දවසේ පැය 24 ම වුණත් කටයුතු සඳහා ප්‍රමාණවත් මදි. මොහු තමන්ගේ දරුවෙක් වෙනුවෙන් බොහොම මහන්සියෙන් නිවසක් හැදුවා. නිවසේ වැඩකටයුතු අඩක් නිමාකර තිබියදී මොහු මියයනවා. අපි දන්න ස්වාමීන් වහන්සේ නමක් සමාධිය තුළින් අරමුණු කර බලනවා මොහු මරණින් මතු කොතැනක ඉපදිලා සිටිනවාද කියලා. එවිට එම ස්වාමීන් වහන්සේට අරමුණු වෙනවා මුල් ගලක් දැතින් අල්ලාගෙන

සිටි බහිරව ස්වභාවයේ ප්‍රේතයෙක්. ඔහු එරමිනියා ගොතාගෙන, මුල්ගල බදාගෙන ඉන්නවා වගෙයි දර්ශනය වෙලා තිබෙන්නේ. අපි බහිරවයා යනුවෙන් හඳුන්වන සත්ත්වයෙක්.

මේ කාරණයේදී භික්ෂුව හඳුනාගෙන ඇත්තේ, වැඩ අවසන් නොවූ නිවසේ උපාදානය නිසා ඉහත උපත සකස් කරගත් බවයි. දැන් ඉතින් මුල්ගල මගේ කොටගෙන බහිරව ලෝකයේ ජීවත්වෙනවා. මේ මුල්ගල නිශ්චිත වශයෙන් එම නිවසේම මුල්ගලද කියන්න භික්ෂුව දන්නේ නැහැ. බලන්න, නිවස නමැති රූපය නිසා සකස්වූ තෘෂ්ණාව හේතුවෙන් ඇතිවූ කෙලෙස් වැස්සට හසුව ඔහුව ගසාගෙන ගොස් ඊළඟ භවයේ ප්‍රතිසන්ධිය සකස්කර දුන් තැන. 'උපාදාන පච්ජයා-භවෝ'..... ඔබ ඉදිරියේ ඇති භයානකම අනතුරු නුවණින් හඳුනානොගත්තොත් ඔබට දුකම උරුමකර දෙන ධර්මතාවය. මේ මහත්මයා මනසේ සකස් වූ කෙලෙස් වැස්සට හසුවීම නිසා සකස් කරගත් දුක කල්ප ගණනාවක් විය හැකියි නේද?

වර්තමාන සමාජයේ ජීවත්වෙන හුග දෙනෙකුට තමන්ගේ කටයුතු වලට දවසේ පැය 24 ත් මදි. ඒ මදි බව නිසාම සමහරු රාත්‍රියේ නින්දෙන් ගණන් හදනවා. දරුවන්ට, බිරිඳට ආදරය කරනවා. මාරයා විසින් එලන ලද තරගකාරීත්වයේ දැලට හසු වී දුවන්නන් වාලේ දුවන චර්යාවෙන් මිදෙන්න. විවේකීව කෙලෙස් වැස්ස ගැන සිතන්න. සමාජය වේගයෙන් ලෞකික වශයෙන් සංවර්ධනය වෙනවා. විසිතුරුභාවයෙන්, ගෘහ නිර්මාණ ශිල්පයෙන් එකිනෙක අභිබවා දැකුම්කළු නිවාස ඉදිවෙනවා. ඔබගේ සුන්දර නිවස යම් සේ දැකුම්කළුද, විසිතුරුද බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා ඔබගේ සිත ඊටත් වඩා විසිතුරුයි කියලා. මොකද ඔබ තුළ ඇති තෘෂ්ණාවේ දිග පළල නිසාමයි ඔයවැනි විසිතුරු නිවසක් නිර්මාණය වුනේ කියලා. ඉහත වැකිය සටහන් කරනවිටම භික්ෂුවට හිනාවක් ඇති වුණා. භික්ෂුව මේ වෙලාවේ වැඩ සිටින කුටිය කැලයේ ඇති මැටි ගැසූ කුඩා පැළක්. රජගෙදර ඉන්න රජතුමාට වඩා නික්ලේශී සැනසිල්ලක් භික්ෂුව මේ මොහොතේ අත්විඳිනවා. තෘෂ්ණාව ක්ෂයවුණ තැන නිස්සරණය, සැහැල්ලුව මිස දුක සැප එහි කොයින්ද?

වැස්ස, සුළඟ, සීතල, මීදුම එනවා. යනවා. ඒත් ඒ කිසිවකින් පීඩා විඳින්න පුද්ගලයෙක් මෙතැන නැහැ. 'ඵස්ස පච්චයා-වේදනා...' ඵස්සය නිසා සකස් වූ විඳීමත්, ඵස්සයත්, විඳීමත් අනිත්‍ය ධර්මයන්මයි. මොන තරම් සරල සමීකරණයක්ද. විසිතුරුභාවය වැඩිවන්න වැඩිවන්න, තෘශ්ණාව වැඩිවන බව ඔබ තේරුම්ගන්න ඕනා. තෘෂ්ණාව වැඩිවන්න වැඩිවන්න දුකයි වැඩිවන්නේ. දුක කියන්නේ අවිද්‍යාව නිසා අපිට රැස්වෙන්නා වූ සංස්කාරයි. සංස්කාරයන් නිදහසේ භුක්තිවිඳීමට අභය භූමියක් වෙමිනුයි ලෝකය පවතින්නේ. කුසල් සහ අකුසල් සංස්කාරයන්ට බාධාකරන්න කෙනෙක් ලෝකයේ නැහැ.

මට අවශ්‍ය වූයේ බුදුරජාණන් වහන්සේව තෘප්තිමත් කිරීම පමණි

සම්මා සම්බුද්ධ ශාසනයක 'ශුෂ්ක විදර්ශක' කියලා රහතන් වහන්සේලා වැඩසිටිනවා. අතීතයේ වැඩසිටියා වූ චක්කුපාල මහරහතන් වහන්සේ එවැනි ශුෂ්ක විදර්ශක රහතන් වහන්සේ නමක්. සම්මා සම්බුද්ධ ශාසනයක අවසාන කාලවකවානුවලදී චතුරාර්ය සත්‍යය අවබෝධය කරන රහතන් වහන්සේලා මෙවැනි ශුෂ්ක විදර්ශක ගණයට වැටීම ස්වභාවයක්. මෙවැනි අයට බුදුරජාණන් වහන්සේගේ, මහ රහතන් වහන්සේලාගේ ඇසුර, දර්ශනය ලැබීමක් නැහැ. ශුෂ්ක විදර්ශක රහතන් වහන්සේ යනු මුලින්ම තෙරුවන් කෙරෙහි අචල සද්ධාවට පැමිණ, ආර්ය අෂ්ඨාංගික මාර්ගය, සිය මාර්ගය කරගනිමින්, ලෝකය කෙරෙහි, නාමරූප ධර්මයන් කෙරෙහි දැඩි කලකිරීම් සකස්කරගෙන තම ජීවිත අත්දැකීම් තුළින්ම, ස්වෝත්සාහයෙන්ම ජීවිත පරිත්‍යාගයෙන් නිවීමේ මාර්ගයේ සිටින කෙනෙක්. ලෝකය කෙරෙහි ඔහුගේ කලකිරීම කොතරම්ද කියනවා නම් මොහු ජීවිතය අතහරිනවා චතුරාර්ය සත්‍යය අවබෝධය උදෙසා. මොහුගේ අරමුණ ඉලක්කය නිවීම, අවබෝධය පමණක්මයි. ජීවිතය කෙරෙහි ඇල්මක් නැහැ. ධර්මය කෙරෙහි විශ්වාසය තියුණුයි. මොහු අවංකවම සුදානම් ජීවිතය මරණයට දමා, මැරෙන මොහොතේ හෝ ලබන අවබෝධය තුළ ලෝකයෙන් නිවී යන්න. තෙරුවන් කෙරෙහි අචල සද්ධාව නිසාම මොහු තුළ මේ විශ්වාසය සකස්වෙලයි තියෙන්නේ. එයත් ධර්මතාවයක්. ජීවිතයට ආශාවකුත් නැහැ. මරණයට කැමත්තකුත් නැහැ. ජීවිතයත් මරණයත් දෙකම අතහැරුණු තැන නිවීම කියන අවබෝධය සකස්වෙනවාය කියන දැඩි විශ්වාසය තිබෙනවා. ජීවිතය අතහැරල තිබෙන්නේ මරණයට. ජීවිතය

බැසගෙන තිබෙන්නේ මරණයට. නිවීමේ අරමුණ එතරම් ප්‍රබලයි. ශුෂ්ක විදර්ශකට අවසාන මොහොතේදී මරණය පෙනෙනවා. නමුත් අඹ මල් රේණුවක තරම්වත් මරණයට බියක් නැහැ. මෙතැනදි ද්වන්ධ සටනක් පවතින්නේ ලෝකය සහ අවබෝධය අතර. ඒ කියන්නේ මාරයා සහ නිවීම අතර. මාරයා ලෝකය දෙසට අදිනවා. ශුෂ්ක විදර්ශක, නිවීම දෙසට හඹාගෙන යනවා. මේ නිහඬ ද්වන්ධ සටනින් මරණය අතහැරී ඔහු අවබෝධය සාක්ෂාත් කරගන්නවා. චක්කුපාල මහ රහතන් වහන්සේ තමාගේ දෑස් අන්ධවෙන බව හොඳටම දූන දූන නිවීම උදෙසා දෑස් අතහරිනවා. වීර්ය සකස්වෙනවා. අධිෂ්ඨානය තීව්‍ර කරමින් නාමරූපධර්ම විනිවිද දකිමිනුයි මෙහෙයුම ක්‍රියාත්මක වෙන්නේ. ශුෂ්ක විදර්ශක රහතන් වහන්සේ නිවන් අවබෝධය උදෙසා ජීවිතය අතහැරියත්, මරණය පෙනි පෙනී නිවීම දෙසටම යනවා. අවසන් මොහොතේ උන්වහන්සේ තුළ පුද්ගල සංඥාව හීනම වෙලා සියුම් නූල්පටක් වන් දෙයකිනුයි ලෝකයට බැඳිලා තිබෙන්නේ. ඒ මෝහය නැමති නූල්පටින්.... උන්වහන්සේ තුළ මෝදු වූ ඡන්දය, වීර්යය, චිත්තය විනිවිද දැකීම නිසාම චතුරාර්ය සත්‍ය අවබෝධය සාක්ෂාත් කරගන්නවා. ඒ අවබෝධය ලබන මොහොතේම ශුෂ්ක විදර්ශක රහතන් වහන්සේ බලාපොරොත්තු රහිතවම නැවත ජීවිතයට ගොඩවෙනවා. අවබෝධයයි ජීවිතයයි දෙකම ලැබිලා.

මරණයට අතහැරපු ජීවිතය ශුෂ්ක විදර්ශක රහතන් වහන්සේට නැවත ලැබෙන්නේ සංස්කාරයන්ගේ බලවත්භාවය නිසා. මාරයා මෙතැනදි දැඩි වෙහෙසක් ගන්නවා 'ශුෂ්ක විදර්ශක' ධර්මාවබෝධය ලබනවාත් සමගම මරණයට තල්ලුකර දමන්න. මොකද මාරයා දන්නවා මොහු ජීවත් වුණොත් තමන් අවබෝධ කරගත් ධර්මය ලෝකයාට දේශනා කරයි කියලා. එය මාරයාට දැඩි තර්ජනයක්. නමුත් මාරයාගේ අභියෝගය එතනදිත් පරාජය වෙන්නේ ශුෂ්ක විදර්ශක රහතන් වහන්සේගේ අතීත සංස්කාරයන්ගේ බලවත් භාවය නිසා. කුසල් සහ අකුසල් සංස්කාරයන්ගේ බලවත්භාවයට මාරයා එතැනදි නැවත පරාජය වෙනවා. කොණ්ඩඤ්ඤ මහ රහතන් වහන්සේ අතීත සම්මා සම්බුද්ධ ශාසනයකදී ඇතිකරගත් උපාදානයක් තිබුණා. 'ගෞතම සම්මා සම්බුද්ධ ශාසනයේ මුල්ම මහ රහතන් වහන්සේ මම

වෙනවා'ය කියලා. අනෙකුත් සෑම භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා සිව්වනක් පිරිසම එවැනි අතීත උපාදානයන් සකස්කරගෙන ඊට අදාළ කුසල් ධර්මයන් වඩවාගෙන තමයි ගෞතම සම්මා සම්බුද්ධ ශාසනයට බැසගත්තේ. ඒ වගේම ශුෂ්ක විදර්ශක රහතන් වහන්සේ කියන්නෙත් අතීත ශාසනයක ඉපදිලා, එම ශාසනය අතුරුදහන්වීමට ආසන්න කාලයක දැඩිලෙස වීර්ය වඩා ශුෂ්ක විදර්ශක රහතන් වහන්සේ නමක් බවට පත්වූ රහතන් වහන්සේ නමක් එහිදී දැක 'මමත් අනාගත සම්මා සම්බුද්ධ ශාසනයකදී ශුෂ්ක විදර්ශක රහතන් වහන්සේ නමක් වෙනවා'ය කියන උපාදානය ඇතිකරගෙන ඊට අදාළ කුසල් පරිපූර්ණ කරගෙන පැමිණි අයෙක්. එම නිසා තමාගේම දැඩි වීර්යයෙන් ශුෂ්ක විදර්ශක රහතන් වහන්සේ නමක් බවට පත්වුවද, උන්වහන්සේලා තුළ අතීත ශක්තිමත් කුසල් සහ අකුසල් සංස්කාර සැඟවී තිබෙනවා. චක්ඛුපාල මහ රහතන් වහන්සේ විසින් මරණයට දමූ එතුමන්ගේ ජීවිතය, අවබෝධයට පත්වීමත් සමගින්ම මරණයට යා නොදී නැවත ලබාදෙන්නේ කුසල් සංස්කාර විසිනුයි. නමුත් උන්වහන්සේගේ දෑස් අන්ධභාවයට පත්කරගන්නේ අකුසල් සංස්කාර විසින්. දෙයාකාරයක් වන සංස්කාර උන්වහන්සේට විපාකයන් සලස්වා දුන්නේ එහෙමයි.

සංස්කාරයන්ගේ විපාකයන්ට එරෙහිව යන්න මාරයාටත් නොහැකිබව ඉහත කාරණයෙන් පැහැදිලි වෙනවා. නමුත් සංස්කාර රැස්කර ගැනීමට ඔබට උපකාරී වෙන්නේත් මාරයාම බව ඔබ සිහි තබාගත යුතුයි. මාරයා අකැමැත්තෙන් හෝ කුසල් සංස්කාර රැස්කර ගැනීමට ඔබට උපකාර කරන්නේ ඔබව ලෝකය තුළ සිරකර තබාගැනීමට මිස, භවයෙන් එතෙරවීමට අවස්ථාව ලබාදීමට නොවේ. රහතන් වහන්සේ යනු මාරයාට අභියෝග කළ උත්තමයෙක් වන්නේ මාර ධර්මය, මාර සැඩපහර විනාශකර දමා, මුලාකර දමා සම්මා සම්බුද්ධ විෂයට අවතීර්ණ වන හෙයිනි. මාරයාගේ සැපය නැමති මුලාව උපයෝගී කරගෙන පෙරලා මාරයාවම පරාජය කිරීමයි. දුකත්, සැපත් නැමති මාරයා විසින්ම පෝෂණය කළ ධර්මතාවයන් දෙක, මුලාවෙන් තොරව නිවරැදිව හඳුනාගෙන දුකත්, සැපත් උපයෝගී කරගෙන දුකෙන්, සැපෙන්, උපේක්ෂාවෙන් මිදී නිවීම සාක්ෂාත් කරගැනීම දක්ෂයාගේ දක්ෂභාවයමයි.

මහත්මයෙක් ධර්ම සාකච්ඡාවක් කරන අතරතුර ප්‍රශ්නයක් යොමුකළා. 'ස්වාමීන් වහන්ස රෝහලේ වාට්ටුවල සමහර රෝගීන් සිටිනවා දින ගණනාවක් වේදනාවෙන් පණ අදින. ආහාරයක් නැහැ. නාසයට, මුඛයට, මුත්‍රාමාර්ගයට බටදමලා. සමහරු මහා හයියෙන් කෙඳිරිගානවා. හිතාගන්න බැරි දුකක් මේ රෝගීන් විඳින්නේ. මෙවැනි රෝගීන් නිසා තම ඥාතීනුත් මහා දුකක් විඳිනවා. මෙවැනි රෝගීයෙක් දක්කහම වෛද්‍යවරයෙක් වශයෙන් මට හිතෙනවා අනේ මේ රෝගියා මැරුණොත් හොඳයි කියලා. ස්වාමීන් වහන්ස, මෙහෙම සිතෙන එක මට පවක්ද? කියලා. දින ගණනාවක් රෝහල් ඇඳක දුක්විඳින රෝගියෙක් දකලා අපි සිතනවා නම් මේ මනුෂ්‍යයා මැරෙන එක හොඳයි කියලා, එහෙම සිතන්නෙත් එම රෝගියා කෙරෙහි ඇති අනුකම්පාව කරුණාව නිසා. ඒ අනුකම්පාව කියන්නේ දැඩිලෙස මෝහය මුසුවූ අනුකම්පාවක්. පිංවත් ඔබ ධර්මානුකූලව ඒ ජීවිතය දෙස බලන්නේ නැහැ. මේ රෝගියා දින ගණනාවක් පණ අදිමින් මේ ගෙවන්නේ තමා විසින් අතීතයේ කළ අකුසල් සංස්කාරයන්ගේ ඵලයයි. ද්වේශය සකස් කරගනිමින්, අනුනගේ සැපයට ඊර්ෂ්‍යාකරමින්, සත්ත්වහිංසාවන් කරමින්, දෙමාපියන්ට ඇප උපස්ථාන නොකරමින්, රෝගීන්ට පීඩාකරමින් අතීත ජීවිතයේ තමා විසින්ම සතුටෙන් සිනාසෙමින් කළ අකුසල් විපාකයන් තමයි ඔය රෝගී පුද්ගලයා ඇඳ මත වේදනාවෙන් අත්විඳින්නේ. ඔහු විසින්ම කරගත් දෙයයි ඔහු අත්විඳින්නේ. ඔතැන කිසිම අසාධාරණයක් නැහැ. 'අනේ පව්' කියන්න දෙයක් නැහැ. ධර්මානුකූලව බලනවිට ලෝකයේ සර්ව සාධාරණ වූ විපාකයක් ඔහු විඳින්නේ. පිංවත් ඔබ සිතනවානම් එය අසාධාරණයක් කියලා, ධර්මයෙන් බාහිරවයි ඔබ සිතන්නේ. අකුසල් සංස්කාරයන්ගේ බියකරුබව, විෂමබව, අපුලබව, දුක්ඛිතබව මෙවැනි රෝගීන් තුළින් දකින්නට ඔබ දක්ෂවෙන්න. හැකිතාක් එවැනි රෝගීන්ට උපස්ථාන, උපකාර කරන ගමන් ඔබට එවැනි උපතක් එපා යැයි කලකිරීම සකස්කරගන්න. එම රෝගියාට ගෙවීමට අකුසලයක් ඇත්නම් එය සති ගණනාවක් හෝ විවේකීව ඔහුට ගෙවා දමා මියයන්න ඉඩපහසුකම් සලසන්න. සෑම තත්පරයකදීම පිංවත් ඔබ මේ දුක්ඛිත සංස්කාර කෙරෙහි කලකිරීම සකස්කර ගන්න.

වර්තමාන ලෝකයේ සාකච්ඡාවට බඳුන්වෙනවා, දැඩි දුක් විඳින රෝගීන්ට මාරාන්තික ඖෂධ එන්නත්කර ඉක්මනින් මරණයට පත්කිරීම සම්බන්ධව. මෛත්‍රිය වේවා, ද්වේශය වේවා, කුමන හේතුවක් මුල්කරගෙන හෝ මරණාසන්නව දුක් විඳින රෝගියෙකුට බලෙන් මාරාන්තික ඖෂධ එන්නත් කර අස්වාභාවික ලෙස මරණයට පත්කිරීම මනුෂ්‍ය ඝාතනයක්මයි. රෝගියා දුක් විඳින්නේ ඔහු විසින් කරගත් අතීත අකුසලයක් නිසාමයි. ඔබ ඔය උත්සහ ගන්නේ 'අකුසලයට' මාරාන්තික බෙහෙතක් එන්නත් කර මරාදැමීමටය. අකුසල් සංස්කාරයෝ මරාදැමීමට ඔබට නොහැකිය. ඔබ එය සිදුකළහොත් මනුෂ්‍ය ඝාතන අකුසලය විසින් ඔබට විපාකය සලස්වනු ඇත.

ලොව්තුරා ධර්මයට අනුව රූපය යනු මාරයාය. ඒ කියන්නේ රෝගියා ලෙස ඇඳේ සිටින්නේ මාරයා යැයි දකින්න. අනුකම්පාව මෛත්‍රිය නැමති මාර ධර්ම උපයෝගීකරගෙන මාරයා ඔය උත්සාහ කරන්නේ ඔබගේ දුක්ගොඩ වැඩි කිරීමටයි. කෙනෙක් අකුසලයේ යොදවා එහි විපාක ලෙස ඔහු දුක්විඳිනවිට, ඔහු ඒ අකුසල් සංස්කාර ගෙවීමේ විපාකය තුළින් තවත් පිරිසක් අකුසලයේ යෙදවීම මාරයාගේ සිරිතයි. මාරයාගේ මේ දෙපිටකාට්ටු ක්‍රියාවලිය නුවණින් හඳුනාගන්න. මේ විෂම සංස්කාර කෙරෙහි කලකිරීම ඇතිකරගන්න. ඔබේ ඇසට හමුවන සෑම සත්ත්ව රූපයක්ම සංස්කාරයන්ගේ ඵලයක් බව දකින්න. සංස්කාරයන්ගෙන් තොර ලෝකයක්, ලෝකයෙන් තොර සංස්කාරයක් නැති බව දකින්න. එවිට ඔබට පෙනේවි මාරයාත් සංස්කාරත් එකම කාසියේ දෙපැත්ත බව.

මේ සංස්කාර අප තුළින් සකස්වෙන්නේ අවිද්‍යාව නිසාමයි. චතුරාර්ය සත්‍යය නොදැනීම... ලෝකය සැපයක් හැටියට ගැනීම... මෙහි ඵලය තමයි සක්කාය දිට්ඨිය, මමත්වයේ දැඩිභාවය.

පිංවත් ඔබට වසන් වෙමින් ඔබ තුළම සැඟවී සිටින භයානක සතුරෙක් සිටිනවා. ඔබ කොහොම බැලුවත් ඔබ තුළ මේ සතුරා සිටිනවාය කියලා හඳුනාගන්න බැහැ. මේ සතුරා තුළිනුයි ඔබ ලෝකය දකින්නේ. එම නිසා ඔබෙන් සතුරා වසන් වෙලයි සිටින්නේ. මේ වසන්වීම මොනතරම් සියුම්ද කියනවානම් ඔබත් සතුරාත් දෙදෙනෙකු

නම් ඔබම වශයෙන්මයි ඔබට පෙනෙන්නේ. පිංවත් ඔබ දක්‍ෂනම් මේ සතුරා ඔබෙන් වෙන්කර හඳුනාගන්න පුළුවන්. හඳුනාගන්න පුළුවන් විතරක් නොවෙයි, මොහුව ජීවිතයෙන් නෙරපාදමන්නත් ඔබට පුළුවන්. ඒ සඳහා ඔබ කල්‍යාණ මිත්‍ර ආශ්‍රය, සද්ධර්ම ශ්‍රවණය කියන කාරණා ජීවිතයට එකතුකරගත යුතුයි. මෙතනදි තමයි තමා තුළ මෙවැනි සතුරෙක් සිටින බව ඔබ දකින්නේ. පිංවත් ඔබ ඔබත් සතුරාවත් වෙන්කර හඳුනාගන්න. මේ සතුරා තමයි සක්කාය දිට්ඨිය. සක්කාය දිට්ඨිය නැමති සතුරා පිංවත් ඔබට අත දිගහැර සංස්කාර රැස්කරගැනීමට උපකාරීවෙනවා.

දැන් විශ්ව විද්‍යාලවල, පාසල්වල ළමයි අපට මුණගැහුණම අහන්නේ 'ස්වාමීන් වහන්ස, පංතියෙ අනෙක් ළමයින් හොඳින් පාඩම් කරනවිට වැඩියෙන් ලකුණු ගන්නවිට මට හරි ඊර්ෂ්‍යාවක් ඇතිවෙනවා. මේක මගේ අධ්‍යාපන කටයුතුවලටත් බාධාවක් වෙනවා. මේකට මොකද කරන්නේ' කියලා. පාසල් වියේදීම තරඟකාරීත්වය නිසා දරුවන්ගේ ජීවිත සක්කාය දිට්ඨියෙන් පිරෙනවා. මේ මමත්වයේ දැඩිභාවය සකස් වෙන්නේ රැකියාව, විවාහය, අවසන් ඉලක්කය කරගෙනයි. අම්මා තාත්තාත් දරුවන්ගේ සක්කාය දිට්ඨියට පොහොර දමනවා. දරුවන්ට පොහොර දමන්නේ තමන් තුළත් අස්වැන්නට කැමත්ත තිබෙන නිසා. මොකක්ද මේ සමාජය බලාපොරොත්තුවන අස්වැන්න? ලෝභ, ද්වේෂ, මෝහ අකුසල මූලයන්.

මේ සටහන ලියන භික්‍ෂුවටත් ගිහිජීවිතයක් තිබුණා. මගේ ළමා, තරුණ කාලයේ මගේ අම්මා තාත්තා බලාපොරොත්තු වුණෙත් ඉහත අස්වැන්නමයි. ඒත් අම්මා තාත්තා කියපුදෙය මමනම් කළේ නැහැ. දෙමාපියන් මෙහෙම කීවේ අවංකවම අපිට ඇති ආදරය නිසා. දෙමාපියන් සැප හැටියට දකින්නේ ඔතැනයි. ඒ පිංවතුන්ට ඉන් එහාට ධර්මානුකූල දැක්මක් තිබුණේ නැහැ. නමුත් මොකක්දෝ සංස්කාර කුසල් ශක්තියක් නිසා දෙමාපියන්ට නැති ඉවක් ජීවිතය ගැන මට තිබුණා. දෙමාපියන් ඒ ගැන අතෘප්තියෙන් හිටියේ. ඒත් මට අවශ්‍ය වුණේ දෙමාපියන්ගේ මෝහය තෘප්තිමත් කිරීම නෙමෙයි. බුදුරජාණන් වහන්සේ තෘප්තිමත් කිරීම පමණයි මට අවශ්‍යවූයේ.

බුදුරජාණන් වහන්සේ උදෙසා යමක් අතහරින්න පිංවත් ඔබ බියවෙන්න එපා. මොකද අතහරින්න යමක් ඔබට තිබෙනවා නම් ඒ දෙය ඔබට ලැබුණේ සද්ධර්මය නිසාමයි. ඒ නිසා පිංවත් ඔබට ලැබුණුදෙය සද්ධර්මය උදෙසාම අතහැර, භවයේ මෙතෙක් නොලද එකම දෙය අයිති කරගන්න. ජීවිතයේ ඉතිරිව ඇති කෙටි කාලය, සතර අපායෙන් එතෙර වීම සඳහා කැපකර, අකුසල් සංස්කාර හේතුවෙන් සකස්වන කල්ප ගණනාවක අතිශය දුක්, විනාශකාරී ස්වභාවයන් නුවණින් මෙනෙහිකර, වළක්වා ගැනීමට දක්ෂවන්න. ජීවිතයේ හිස්බව දකිමින්ම ජීවත්වන්න. සිහිනුවන තිබෙන අම්මා තාත්තා දෙපලක් තම දරුවාගේ අධ්‍යාපනය උදෙසා වැයකරන වසර 15 ක පමණ කාලය එම දරුවාට සතර අපායෙන් මිදීමේ ධර්මතාවයන් ප්‍රගුණ කිරීම උදෙසා කැපකළහොත් ඔබේ දරුවාට ඔබ සැබෑම කල්‍යාණ මිත්‍රයෙක් වනවා. එම දරුවා ලෝකයාගෙන්, ප්‍රශ්න, දුක්, කම්කටොළුවලින් පීඩාවන් ලබන දරුවෙක් නොව, දෙවිබඹුන්ගෙන් වැඳුම් පිදුම් ලබන දරුවෙක් වෙනවා. මව් කිරෙහි වන්දිය ගෙවූ දරුවෙක් වෙනවා. එපමණක් නොව උපරිම භව හතකට ජාතිය සීමාකරගත් මාර්ගඵලලාභී දෙවියෙක්, දිව්‍යාංගනාවක් වෙනවා. මාර්ගඵලලාභී දෙවියන් දිව්‍යාංගනාවන්ගේ ඇසුර ලබන පිංවතෙක් වෙනවා. පිංවත් දෙමාපියන් දරුවන් යොමුකිරීමට බලාපොරොත්තුවන දුක දෙසත්, ධර්මයේ පෙන්වාදෙන සැබෑම සැපය දෙසත් නුවණින් බලන්න. දරුවන් මේ විෂම, දුශ්ශීල, අන්තරාකාරී සමාජයේ අතරමං කරන්න එපා. පිංවත් ඔබේ දරුවා සැබෑම පිංවත් දරුවෙක් නිසයි මේ මොහොතේ ඔබේ කුසෙන් ධර්මය සන්දිට්ඨිකව තිබෙන මේ බිමට බැසගත්තේ. දරුවා ලැබූ ඒ උතුම් අවස්ථාවේදී දරුවාට නොමග නොව, ධර්මයේ සැබෑම මග කියාදී, බුදු සමිඳුන් තම රාහුල පුතණුවන්ට මග පෙන්වූයේ යම් දිශාවකටද, පිංවත් ඔබත් ඔබේ දරුවාට දුකෙන් තොර සැපයෙන්ම සපිරුණු දිශාව පෙන්වා දෙන්න. එතනදී ඔබ සැබෑ බෞද්ධ අම්මා කෙනෙක්, තාත්තා කෙනෙක් වෙන්නේ.

පිංවත් ඔබත් මෙතැනට එන්න

'පිංවත් ඔබත් මෙතනට එන්න' කියලා කියපුවාහම ඔබට හිතෙන්න පුළුවන් කොතැනටද මේ එන්න කියන්නෙ කියලා. භික්ෂුව ඔබට මේ එන්න කියන්නේ ලෝකයේ සුන්දරම තැනට. මෙතන ඔබේ තැනකුත් නොවේ. ඔබේ නොවන තැනකුත් නොවේ. මේ මොහොතේ විවේකය ලබන තැනයි. හෙට මෙතනින් නික්ම යායුතුයි. ආපසු හැරී බැලීමක් නැත. හෙට තැන නැවුම් වුවත් විවේකයේ වෙනසක් නම් නැත. තැනත් නොතැනත් දෙතැනම ධර්මයේ ස්වභාවයෙන්මයි තිබෙන්නේ. ඔබට එන්න කියලා ආරාධනා කරන්නේ මෙතැනට.

මෙතැන පුද්ගලයෙක් සිටිනවා. ඔහු ලෝකය සමඟ තැවරිලා නැහැ. ලෝකයට මුහුවෙලා නැහැ. ලෝකයේ නොතැවරුණු මේ සුන්දර මිනිස්සු ජීවත්වන්නේ සම්මා සම්බුද්ධ ශාසනයක, මේ සුන්දර ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ අර්ථය තුළ පමණක්මය. වචනයේ පරිසමාප්ත අර්ථයෙන්ම නිදහස තිබෙන තැනක් මෙතැන. 'නිදහස' කියලා කීවේ සීමා, මායිම්, වැටකඩුලු, පිඹුරුපත් වලින් කොටුකරගත් නිදහසක් නොවේ. ගොඩගසාගත් වස්තුව, දේපල, ඥාතීන් 'මගේ' කරගත් තෘෂ්ණාවෙන් බැඳුණු නිදහසද නොවේ. මේ සියල්ල කෙරෙහි ඇලීම්, ගැටීම්, උපේක්ෂාවන් අවබෝධයෙන් අතහැරි නිදහසයි.

මෙහෙම සටහන් තබපුවහම ඔබට බිය සිතෙන්න පුළුවන්, භික්ෂුව මේ ඔබට එන්න කියන්නේ මොකුත්ම නැති මුඩු තැනකටද කියලා. එහෙම හිතන්න එපා. මෙතැන ඉරත් තිබෙනවා. හඳත් තිබෙනවා. ආලෝකයත් අඳුරත් තිබෙනවා. අම්මා, තාත්තා ඉන්නවා. කැපකරු, දායක පිරිස් ඉන්නවා. නැත්තේ මේවා කෙරෙහි ඇති තෘෂ්ණාව පමණක්මය. එනිසා සියල්ල අභිමිවනවාය කියලා, පිංවත් ඔබ

බියවෙන්න එපා. අභිමිවෙන්නේ දුකට හේතුවන තෘෂ්ණාව පමණයි. බලන්නකෝ, ලෝකය තිබියදී තෘෂ්ණාව ක්ෂයවෙලා. තෘෂ්ණාව කියන එකම කරුණෙනුයි ලෝකයට බැඳුණේ. 'නිදහස' කියලා කීවේ මෙතැනයි. ලෝකය තිබෙනවා. බැඳීම් නැහැ. ඇස තිබෙනවා. ඇස නිසා බැඳීම් නැහැ. ඔබම සිතන්නකෝ ඒ සිත මොන තරම් විවේකී, නිස්කලංක සිතක්ද? ඒකයි පිංවත් ඔබටත් අරාධනා කළේ 'මෙතැනට එන්න' කියලා.

ලස්සන මාර්ගයක් තිබෙනවා. මෙතැනට එන එක තමයි මේ ලෝකේ සුන්දරම මාර්ගය. සැපයටම හේතුවන මාර්ගය. විවේකය දිසාවට, සරල භාවයේ දිශාවට, නිවීමේ දිශාවට ඔබව රැගෙන යන මාර්ගය. ඒ උතුම් මාර්ගය ආර්ය අෂ්ඨාංගික මාර්ගයමයි. වැලි,කළුගල්, සිමෙන්ති, කොන්ක්‍රීට් වලින් මිදුණු, ලෙයින්- මසින් සැදුණු ජීවිතයට අර්ථය ගෙනෙන මාර්ගයයි. මේ මාර්ගය දිගේ ඔබත් පෙරට එන්න. එතැනදී ඔබ මුලින්ම දකින්නේ 'දුක' කියන කාරණයයි. 'දුක' කියන කාරණය මතින් ඔබ ගමන්කරන විට, ඔබ දකිනවා දුකට හේතුව තෘෂ්ණාව කියන කාරණයයි කියලා. තෘෂ්ණාව නැතිකළොත් දුක නැතිවෙනවාය කියන කාරණය තමයි ඔබේ ගමනේ ආරම්භය. පිංවත් ඔබ මෙතැනට එනකොට දාන, ශීල, භාවනා මාර්ගය ජීවිතයේ කොටසක් කරගත්ත අයෙක්. මේ ආරම්භයත් සමඟ ඔබ දුකෙන් මිදෙන දිශාවටමයි ගමන් කරන්නේ. තමා කව්රුන් උදෙසාවත් ව්‍යාපාදය, කේන්තිය, ද්වේශය සකස්කරගන්නේ නැහැ. එයා දකිනවා ව්‍යාපාදය තමාටත්, අනුන්ටත් දුක පිණිසයි පවතින්නේ කියලා. තමාගේ කේන්තියවත් තමාට අයිති නැතිකොට එයා කවදාකවත් අනුන්ගේ කේන්තියක් තමාගේ කරගන්න යන්නේ නැහැ. ඒ නිසා ඔහු නිරතුරුවම මනසින් සිදුවන මනෝකර්ම ගැන අවදියෙනුයි සිටින්නේ. අනුනට ව්‍යාපාදය කිරීම තමා, තමාට කරගන්නා දරුණු පලිගැනීමක් බව ඔහු දකිනවා. ව්‍යාපාදයට ඔහු බියවෙනවා. සතර අපාය ව්‍යාපාදයේ ප්‍රතිඵලයක් බව ඔහු දකිනවා. ව්‍යාපාදය, ද්වේශය කියන අකුසල මූලයන් නිසාම මෙතෙක් නිවන් මාර්ගය දුරස් වූ බව ඔහු දකිනවා. තමා තුළින් ඇතිකරගන්නා වූ ව්‍යාපාදය තමාවම ප්‍රමාද භාවයට පත්කරනවා.

ඒ නිසාම තමා කාටවත් හිංසාවක් කරන්න යන්නේ නැහැ. තමන් දකිනවා හිංසාවක් කළොත් තමාත් අනුනුත් දුකට වැටෙනවා කියලා. හිංසාවට තමන් අකමැති සේම සියළු සත්ත්වයෝත් හිංසාවට ප්‍රිය නොවන බව ඔහු දකිනවා. තෙරුවන් ගුණයන් ගැනමයි ඔහු මෙනෙහි කරන්නේ. අසද්ධාව කියන්නේ තමා තමාට කරගන්නා ලොකුම හිංසාවයි කියලා ඔහු දකිනවා. එම නිසාම තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව තව තවත් අර්ථවත් කරගෙන එය අචල ශ්‍රද්ධාවක් බවට බලගන්වාගෙන මුලින්ම තමා තමාට මෛත්‍රී කරගන්නවා.

නෙක්ඛම්මයටමයි සිත යොමුවන්නේ. ලෝභ සිතක් පැමිණියොත්, ද්වේශ සිතක්, මෝහ සිතක් පැමිණියොත් එහි ආදීනව දැකලා ඒවා අතහැර දමනවා. ලෝභය, අලෝභය බවට පරිවර්තනය කරගන්න ඔහු දැන් දක්ෂයි. ද්වේශය මෛත්‍රියක් බවටත්, මෝහය අමෝහය බවටත් පරිවර්තනය කරගන්න ඔහු තුළ දක්ෂතාවය තිබෙනවා. එයා දකිනවා මේ ජීවිතය තමාට අයිති නැතිනම්, එය උදෙසා කුමකට අකුසල් රැස්කරගන්නවාද කියලා. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව නිසාම, මොහු සැබෑම සැපය නෙක්ඛම්මය බව දකිනවා. සැබෑම සැපයට ඇති කැමැත්ත නිසාම, සැපයට බාධා කරන සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස කියන බැඳීම් සිඳෙන දිශාවටමයි ජීවිතය අර්ථවත් කරගන්නේ. මෙතැනයි නෙක්ඛම්මයේ සැබෑම ආරම්භය. ඔහු දක්ෂයි ''මම''කියන දුක් ගොඩ බිම තබා පටිච්ඡසමුප්පන්නව ජීවිතය දෙස බලන්න. තව ඉදිරියට එනවිට කාම, රාග, පටිඝ, මෝහ කියන කාරණාත් ඔහුට බිම තබන්න සිද්ධවෙනවා. නෙක්ඛම්මයේ සැබෑම අර්ථය ශක්තිමත් වන්නේ පංචඋපාදනස්කන්ධයේ අනිත්‍ය දැකීම අවබෝධය තුළින්ම බව ඔහු දැන් දන්නවා.

මේ වන විට වචනය බොහොම සංවරයි එයාගේ. එයා දන්නවා වගකීමකින් තොර එක වචනයක් භව ගමනේ මහා විනාශයක් කරනවා කියලා. දුකක් අත්කර දෙනවා කියලා. සෑම වචනයක්ම මුවින් පිටකරන්නේ දැඩි විනයකින්. බොරුව ඔහුගේ තහනම් වචනයක්. එයා අනුනට ප්‍රිය වචනයෙන්මයි කථාකරන්නේ. ඒවායේ විෂ නැහැ, මංමුලා කිරීම් නැහැ. වචනය ඔහු උපයෝගීකර ගන්නේ ශීලයේ,

දානයේ, භාවනාවේ ආනිසංස ගැන කථාකිරීමටයි. යහපතක්මයි ඔහු මුවින් ප්‍රකාශ කරන්නේ. නිවන් මාර්ගයට අදාළ ධර්මයක්මයි ඔහු සිතන්නේ. එයා කවදාකවත් ලෝකය, පංචඋපාදානස්කන්ධය සැපය කියන බොරුව කියන්නෙ නැහැ. එයා බාහිර, අධ්‍යාත්මික රූපය තුළ සැප තිබෙනවාය කියන බොරුව කියන්නෙ නැහැ. අපි මේ ජීවිතයේදී කියන ලොකුම බොරුව තමයි 'ලෝකය සැපය' කියන බොරුව. ඔහු එය කවදාකවත් කියන්නේ නැහැ. තෙරුවන්ගේ අගුණයක් ඔහු කියන්නේ නැහැ. කර්මය කර්ම ඵලයන්ගේ විශ්වාසය ගැනමයි ඔහු කථාකරන්නේ. මව් පිය ගුණයන් ඔහු නිරතුරුවම සිතනවා. අනුනට කියනවා.

කයෙන් සිදුවන වැරදි එයා කරන්නේ නැහැ. ප්‍රාණඝාතය, සොරකම, වැරදි කාමසේවනය, සුරාපානය ජීවිතයට අපුල දේවල්. ජීවිතයට දුගඳ දේවල් හැටියටයි දකින්නේ. එයා මේ විෂමාචාර වලින් මිදෙනවා පමණක් නොවේ අනුනටත් ඒවායේ ආදීනව කියනවා වගේම ඒවායේ යෙදෙන මනුෂ්‍යයින්ගෙන් දුරස් වෙනවා. පවට ඔහු බයයි. එයා කයෙන් යහපත් ක්‍රියාවක්මයි සිදුකරන්නේ. මේ වයසට යන ලෙඩවෙන, මැරෙන කය නිසා අකුසල් සිදුකරගන්නේ නැහැ. සද්ධර්ම ශ්‍රවණය, දානය, ශීලය, භාවනාව උදෙසාමයි කය ප්‍රයෝජනයට ගන්නේ. එයා අනුනගේ ජීවිතවලට හානි නොකරනවා වගේම තමාගේ ජීවිතයටත් හානි කරගන්නෙ නැහැ. එයා දන්නවා සංස්කාර නිසාමයි සත්ත්වයා මැරෙමින් උපදිමින් ගමන් කරන්නේ කියලා. එයා මුලින්ම සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බත පරාමාස සංයෝජන ධර්මයන් දුරුකරලා ජීවිත හතකට උපත සීමාකරගන්නවා.

එයා අන්සතු දෙයක් මගේ කරගන්නේ නැහැ. මේ ඇස මගේ නොවේ. ඒ නිසා එයා ඇස මගේ කරගන්නේ නැහැ. මේ රූපය මගේ නොවේ. ඒ නිසා රූපය මගේ කරගන්නේ නැහැ. මේ මනස මගේ නොවේ ඒ නිසා මනසේ ඇතිවෙන සිතුවිලි මගේ කරගන්නෙ නැහැ. ඇස නිසා සකස්වෙන ඵස්ස, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ තමාට අයත් නොවන දේවල් බවයි දකින්නෙ. අන්සතු දෙය තමාගේ කරගෙන දුක්විඳින්නෙ නැහැ. ඒවාට බැඳී යන්නෙ නැහැ. ඒවායෙන් මත්භාවයට

පත්වෙන්නෙ නැහැ. එයා හොඳින් දන්නවා ජීවිතය මත්කරන දේවල් මොනවද කියලා. සත්ත්වයා නිරතුරුවම රාග, ද්වේෂ, මෝහ ධර්මයන්ගෙන් මත්වෙනවා. මේ මත්වීම නිසා සත්ත්වයා කල්ප ගණන් දුකට පත්වෙනවා. එක සිතුවිල්ලක් නිසා දුකෙන්මයි මත්වෙන්නේ. ඒ නිසා එයා නිහතමානී වෙනවා. මාන්නයට පත්වෙන්නෙ නැහැ. එයා මිදුල අතුගෑවත් එය අතුගාන්නේ තමාගේ සිතේ ඇති කුණු අතුගානවා කියන අදහසින්. එයා වැසිකිළිය සේදුවත් එය සෝදන්නේ තමාගේ සිතේ රාග, ද්වේෂ, මෝහ සිතුවිලි සෝදාහරිනවා කියන අදහසින්. පිරිසිදුභාවයට එයා හරි ප්‍රියයි. යමෙක් ජීවත්වෙන පරිසරය අපිරිසිදු නම් එයින් පෙනෙන්නේ ඔහුගේ සිතේ ඇති අපිරිසිදු භාවයයි. බාහිර පරිසරය පිරිසිදු වෙන්න, පිරිසිදු වෙන්න තමාගේ සිතත් පිරිසිදු වෙනවා, තැන්පත් වෙනවා. මේ හේතුව නිසාම නිහතමානීභාවය ඇතිවෙනවා. නිහතමානී කෙනා රාග, ද්වේෂ, මෝහ ධර්මයන්ගෙන් මත්වෙන්නෙ නැහැ. ඔහු තාවකාලික සැපයක් උදෙසා දීර්ඝකාලීන දුකකට පාර පෙන්වන මෝහය දුරුකරමින් යන කෙනෙක්. කයෙන් සිදුවන ප්‍රාණඝාත, අදත්තාදාන, කාමය වරදවා හැසිරීම, සුරාපානය තුළින් දිවිහිමියෙන් වෙන්වන ඔහු දන්නවා ලෝභ, ද්වේෂ, මෝහ නිසාමයි අකුසලයෙන් සත්ත්වයා මත්වෙන්නෙ කියලා. ඒ නිසාමයි පරපණත්, තම පණත් නසන්නේ දුක්දෙන්නේ කියලා. දුක පිණිස හේතුවෙන අන්සතු වස්තුව වගේම දුකදෙන සක්කාය දිට්ඨිය, විචිකිච්චාව, සීලබ්බත පරාමාස සංයෝජන ධර්මයන් මගේ කරගෙන ජීවත්වෙන්නෙ කියලා. ඒ නිසා මොහු යහපත් සිහිය මත්කරන්නා වූ කයෙන් සිදුවන සියළු වැරදිවලින් මිදෙනවා.

පිංවත් ඔබ මීළඟට සම්මා ආජීවයෙහි යෙදෙනවා. වැරදි වෙළඳාම් වලින් යැපෙන්නෙ නැහැ. මස්, මාංශ, සුරාව, වස-විස, වෙඩිබෙහෙත්, මනුෂ්‍යයින් ඇතුළු සතුන් වෙළඳාම මිච්ඡා වෙළඳාම හැටියට ගැනෙනවා. ඔබ ශක්තිමත්ව මේ මාර්ගයේ ගමන්කරනවිට ඔබ කවදාකවත් තමා විකුණන්නෙත් නැති තමා විකිණෙන්නේත් නැති තත්ත්වයට පත්වෙන්න ඕනේ. වෙළඳ භාණ්ඩයක ස්වභාවයෙන් ඔබ මිදෙන්න ඕනේ. සෑම විටම තමාගේ ජීවිතය ගලපාගන්නේ ධර්ම විනයත් සමගයි. මේ සඳහා ඔබට උපකාරී වෙන්නේ ශීලයයි.

ගිහිපිංවතුන්ලාට නම් පංචශීලය ශක්තිමත් භාවයට පත්වෙන්න ඕනේ. සාමණේර ස්වාමීන් වහන්සේ නමකට දස ශීලයත් සේඛියා 75 ත් තම උතුම් ශීලය වශයෙන් ආරක්ෂා කර ගන්න ඕනේ. උපසම්පදා ස්වාමීන් වහන්සේ නමකට ප්‍රාතිමෝක්ෂ ශීලය තම ශීලය වෙනවා. විනය කාරණා අප නිවැරදිව දැනගෙන සිටිය යුතුයි. එසේ නොවුණහොත් අපිත් විකුණන විකිණෙන කෙනෙක් බවටයි පත්වෙන්නේ. ප්‍රාතිමෝක්ෂ ශීලය තුළින්මයි අපිව මේ අවදානමෙන් මුදවා දෙන්නේ. ශීලය ගිලිහී ගිය තැනදි අපි වැරදි ආජීවයන්ට යොමුවෙනවා. සෑම විටම අපේ ඉලක්කය ගැන අවධානය යොමුවිය යුතුයි. එසේ නොවුණ තැන කාම, භව, දිට්ඨි, ශීල, උපාදානවල සිරකරුවන් වෙන්න පුළුවන්. මේවා නිවන් මග සොයා යන පිංවතුන්ට මිච්ඡා ආජීවයක්මයි. ශීලය ඔබට පහසු බවක්මයි, සරල බවක්මයි ඇතිකරන්නේ.

මේ මුළු ලෝකයම කමටහනක් වූ මෙවලමක් කරගන්න

භික්ෂුවට මතකයි, භික්ෂුව උපසම්පදා විනය කර්මයට සහභාගී වී පැමිණි පසු ආරණ්‍යයේ වැඩ සිටි සාමණේර හිමිනමක් විමසුවා 'ඔබ වහන්සේ ඊයේ උපසම්පදා වුණානේ. දැන් ඔබ වහන්සේ ලොක්කෙක් නේද?' කියලා. ඒ දරුවා උපසම්පදාව කියන අර්ථය දුටු චිත්‍රයයි ඒ ප්‍රකාශ කළේ. ඒ මොහොතේ භික්ෂුව කිව්වේ 'දරුවෝ, උපසම්පදා පිංකමෙන් පස්සේ මම තව කුඩා වුණා' ය කියලයි. සරල වුණාය කියලයි. නිහතමානී වුණාය කියලයි. උපසම්පදා විනය කර්මයෙන් පස්සේ මට වෙච්චි දෙයයි මම ප්‍රකාශ කළේ. ඒත්, ඒ දරුවා ඒක තේරුම් ගත්තේ නැහැ. ශීලය තුළට යන්න යන්න ඔහු නිවෙනවා. එය ශීලයේ ආශ්චර්යයක්. ශිල්පද රකිනවාය කියන්නේ ජීවිතයට පහසුවක්මයි. භික්ෂුව මේ මොහොතේ ඉන්න සරලභාවය ශීලයේ ඵලයක්. මෙතනට එන කෙනා අවබෝධයෙන් දන්නවා තමා තුළ විකුණන්නවත්, විකිණෙන්නවත් දෙයක් නොමැති බව. අපි විකුණන්නේ ලෝභ, ද්වේෂ, මෝහ අකුසල් මූලයන් තුළින් ගොඩගසාගත් 'මගේ කුණුගොඩමයි. එහෙම කුණුගොඩක් නැති තැන ඔහු නිදහස් පිංවතෙක්.

පිංවත් ඔබ සම්මා වායාම කියන යහපත් ව්‍යායාමයක යෙදෙන කෙනෙක් වෙනවා. යහපත් ව්‍යායාමය කියන්නේ කුසල් ධර්මයන් දියුණුකරගැනීමත්, අකුසල් දුරුකරගැනීමත් කියන කාරණයයි. අකුසල් ප්‍රහානය කරන පිංවතා කුසලය තුළටමයි ජීවිතය රැගෙන යන්නේ. එයා කුසල් අකුසල් හොඳින් හඳුනනවා. ඒ දෙකේ ඵල විපාකයන් හොඳින් හඳුනනවා. දැන් මොහු දිට්ඨධම්මවේදනීයව කුසලයේ ඵලයන් භුක්ති විඳින කෙනෙක්. ජීවිතයට සැනසිල්ල ලැබෙන්න ලැබෙන්න

තව තවත් කුසලය දිශාවටමයි ඔහු ඇදීයන්නේ. මොහු ලෝකය තකන්නේ නැහැ. සන්දිට්ඨිකව ධර්මයේ ගුණයන් අත්විඳිනවා. මොහු ආපසු හැරීබලන්නේ යමක් ඉගෙනගැනීමට පමණක්මයි. පසුතැවීමට නොවේ. මොහු බොහෝම ක්‍රියාශීලියි. හැබැයි අධිවේගී නැහැ. ශීලය විසින් මොහුව තැන්පත්කොට තිබෙන්නේ. ඔබ දැන් දන්නවා කුසල් අකුසල් දෙකම සංස්කාරයන් බව. සංස්කාරයන්ගේ ස්වභාවය අනිත්‍යබව. මේ දැක්ම නිසාම ඔබ උත්සහගන්නවා කුසල් අකුසල් දෙකෙන්ම මිදෙන්නට. ඔබ කල්පනා කරනවා කුමක් නිසාද කුසල් අකුසල් සිද්ධවෙන්නේ කියලා. රූපය කෙරෙහි ඇති ඡන්ද රාගය නිසාමයි අපි කුසල් අකුසල් සිදුකරන්නේ. එයා නුවණින් මෙනෙහි කරනවා රූපයේ අනිත්‍යබව. දැන් එයා ව්‍යායාමයක යෙදෙන්නේ දුක පිණිස හේතුවන දේවල් අයිතිකරගන්න නොවේ. දුකෙන් මිදෙන දිශාවටයි ඔහු යොමු වී සිටින්නේ. ඔහු තෘෂ්ණාව ඉලක්ක කරගෙන, පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දකින්නයි උත්සාහ ගන්නේ. එතනමයි එයාගේ සම්මා වායාමය. කුසල්, අකුසල්වල ඵලය භවයමයි කියලා ඔහුට දැන් පෙනෙනවා. ඔහු සිත, කය, වචනය මෙහෙයවන්නේ ධර්මය තුළින් යමක් ඉගෙනගැනීමේ දිශාවටමයි. රූපය කාමය සඳහා නොව, ක්‍රීඩාව සඳහා නොව අවබෝධය සඳහාය කියන කාරණය ඔහු දකිනවා.

ඔහු තුළ සම්මා සතිය යහපත් සිහිය ඇතිවෙනවා. මොහු හොඳ නරක තෝරාබේරා ගන්නවා. ධර්මය අධර්මය හඳුනාගන්නවා. විනයට අනුව ඇවත දැක ඒවා පිරිසිදු කරගන්නවා. මග නොමග තේරුම් ගන්නවා. නවාතැන් පොළවල් නැති නිවන් මාර්ගය දැන් ඔහු හොඳින් හඳුනනවා. එයා දන්නවා 'බුද්ධං සරණං ගච්ඡාමි' කියන සරණාගමනයේ ඇති අර්ථය. එයා බුදුරජාණන් වහන්සේ තුළින් බුදුරජාණන් වහන්සේගේ රූපය නෙමෙයි දකින්නේ, උතුම් සම්මා සම්බුද්ධ ඥානයයි. එයා දන්නවා ධර්මයේ අර්ථය අනිත්‍යයි කියලා. සංසරත්නය කියන්නේ විමුක්ති ඥානදර්ශනවල ඵලයයි කියලා. එයා කවදාකවත් පොත්ත සොයාගෙන යන්නේ නැහැ. එයා සොයාගෙන යන්නේ අරටුවයි. එයා දැන් අරටුව හඳුනනවා. කාම රූපී, අරූපී භවාත්‍රයන් පිළිබඳ මුලාවන් දැන් ඔහුගෙන් ඉවත්වෙලා. ඔහු ඒ සඳහා සක්කාය දිට්ඨිය, විචිකිච්ඡාව,

සීලබ්බත පරාමාස ධර්මයන් ජීවිතයෙන් සියුම්කර දමනවා, නුවණින් මෙනෙහි කරමින්. ඔහු නිවැරදිව දන්නවා ඔහු ඉදිරියේ කාම, රාග, පටිඝ පලිබෝධයනුත් තිබෙනවා කියලා. කල්‍යාණ මිත්‍ර ඇසුර ලබමින් මොහු ස්වයංක්‍රීයව ධර්මයේ ශක්තියෙන්ම ඉදිරියට යන්නේ. මොහුට හදිසියක් නැහැ, මොහු දන්නවා ඉක්මන්කාර බවත් සිතිවිල්ලක්ය කියලා. ඒ සිතුවිල්ලත් අනිත්‍ය වශයෙන් දකිද්දී ඔහු දකින්නේ ධර්මයේ අර්ථයයි කියලා. වාද විවාද සිත ඇතුළේ තිබෙනවා. ඒවා විසඳෙන්නේ ධර්මානුකූලව, නිවැරදි දිසාවටමයි. මොහු ආපසු හැරෙන්නේ නැහැ. සම්මා සතියේ සැබෑම ආශ්චර්ය ඒකයි. ඔබ මේ මොහොතේ මොන දේවල් අයිතිකරගෙන සිටියත් අවසානයේ ඒවා මතක සටහන් පමණක්මයි. ඒ මතක සටහන් හේතුවෙන් තවත් උපතකටයි ඔබ බැසගන්නේ කියලා ඔහු දන්නවා. මොහු කය දකින්නේ සතර මහා ධාතුන් වශයෙන්, දෙතිස් කුණුපයන් වශයෙන්, ආයතන වශයෙන්, පංචඋපාදානස්කන්ධය වශයෙන්. මොහු වේදනාව දකින්නේ ඇලීම්, ගැටීම්, උපේක්ෂාවන් හැටියට. විඳීම නැති තැන මනස විසිතුරුයි. එහි ඝන රූප සටහන් නැහැ. රූප සටහන් ඇඳුණද ඒවා ඉතා ඉක්මනින් මැකීයන සටහන්. එහෙයින් එතැන ගැටළු නැහැ. ගැටළු ඇත්තේ තෘෂ්ණාවේ තීන්ත විසින් රූප ඝන කර අඳින තැනදීය. තෘෂ්ණාවේ තීන්ත ක්ෂයවුන තැනදී ඝන චිත්‍රයක් නැත. එහෙයින් සිත නිරතුරුවම ප්‍රභාෂ්වරයි. ඒ ප්‍රභාෂ්වර සිතිනුයි ඔහු දැන් ලෝකය බලන්නේ. මේ මුළු ලෝකයම ඔහුට කමටහනක් වූ මෙවලමකි. එම සිත ඔබ මඩේ ඔබාගත්තද එහි මඩ තැවරී නැත. තැවරෙන ස්වභාවයෙන් යුත් තෘෂ්ණාවේ ලාටු එහි නැත. දායක මහත්මයෙක් මහත්මියක් මොනතරම් ලෙන්ගතුකම් පෑවද, පිංවත් ඔවුන් සමග බැඳීමක් නැත. මන්ද බැඳීම ඇතිකරන්නාවූ තෘෂ්ණාවේ මැවුම්කාරියව මරාදමා ඇති හෙයිනි. දැන් ඔබ ලෝකයට ණයකාරයෙකු නොවේ.

මුල් අදියරේදී ඔහු දුකට හේතුවන සක්කාය දිට්ඨිය, විචිකිච්ඡාව, සීලබ්බත පරාමාස යන සංයෝජන ධර්මයනුත්, දෙවැනුව කාම රාග පටිඝ මෝහ ධර්මයනුත් හොඳින් හඳුනන අයෙකි. මොහු දැන් එක දෙයක් කරමින් තව දෙයක් හිතන අයෙක් නොවේ. එක දෙයක් කරමින් තව දෙයක් කථා කරන අයෙක් නොවේ. කළ යුත්ත නොකළ

යුත්ත වටහාගෙන කරන අයෙකි. තමාගේ අරමුණු මොහු තමා විසින්ම පාවා නොගනී. මොහුගේ ගමන ප්‍රසන්නය. ධර්මයේ හැඩතල පෙන්වන්නෙකි. සිතුවිලි විවේකීභාවයට පත්වූවෙකි. මොහු ඇවතක් වුවහොත් වහ වහා නිවැරදි වනවා, දුසිල්වතුන් මග හැර යනවා, නපුරු අවදානම් තැන් මග හැර යනවා, ශීලයට ඇති කැමැත්ත නිසාම.. ලෝකයෙන් තනිවුනාය කියල මොහු තකන්නෙ නැහැ. මොකද තනිවෙන්න කෙනෙක් මෙතන නැහැ. ස්ථිරව රැඳෙන්න පුළුවන් කෙනෙකුත් ලෝකයේ නැහැ. සිව්පසය පරිහරණයේදී මොහු මන්දගාමීයි. ඔහු දන්නවා වේගය තමාව ගොදුරක් කරගනීවි කියලා. ලාභ සත්කාර සර්පයෙක් වශයෙන් දකින්නේ. උවමනා එපාකම් ගොඩාක් ගොඩගසා ගන්නේ නැහැ. ලද දෙයින් සතුටුවෙනවා. ඉන්ද්‍රිය සංවරය ඉතා දියුණුයි. උදේ, දවල්, රාත්‍රී වශයෙන් මොහු කාලය දකින්නෙ නැහැ. මොහු දන්නවා මේ මොහොත උතුම්ම මොහොතයි කියලා. එය ගෙවී යනවා ලැබුවා වූ මොහොත ප්‍රයෝජනයට ගන්නවාය කියලා. මොහු ලෝකයාගෙන් සම්මාන ගෞරව බලාපොරොත්තු වෙන්නෙ නැහැ. ඔහු දන්නවා නිකෙලෙස් ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ සම්මාන ගෞරවයට තමන් පාත්‍රවී ඇති බව. ඔහු සංකීර්ණව ජාති, ජරා, ව්‍යාධි, මරණ අභිබවාගිය අයෙක්. නිරතුරුවම ලෝකය වසඟ කරන දුක කියන කාරණයේ අර්ථය හෙළිකරගත් කෙනෙක් වෙනවා.

සමාධිමත් භාවයේ ආරම්භය ආශ්වාස ප්‍රශ්වාසයේ දිග භාවය, කෙටි භාවය, විචාර විතක්ක, ප්‍රීතිය සැපය පසුකරමින් සිත උපේක්ෂාව කියන ඇලීම් ගැටීම්වලින් තොර ස්වභාවයට පත්වෙනවා. උපේක්ෂාව කියන තැන බොහෝම සුන්දර පැහැදිලි නම්‍යශීලී තැනක්. විදර්ශනාව දෙසට හිත මෙහෙයවීමට අවශ්‍යනම් දැන් සිත සුදානම්. ඔහු මුලින්ම තමා උපේක්ෂාව දක්වා පැමිණි ආශ්වාස ප්‍රශ්වාසයේ දිග, කෙටි භාවය, විචාර විතක්ක, ප්‍රීතිය සැපය අනිත්‍යවූ හැටි විදර්ශනාවෙන් දකිනවා. ඔහු ඒවාට ඇති ඇලීමෙන් මිදෙනවා. සෑම රූපයක්ම අභියස අනිත්‍ය සංඥාව ඉස්මතුවෙනවා සිත තුළින්ම. කැමැත්තයි අතහැරෙන්නේ අවබෝධයයි ලබන්නේ. සතර මහා ධාතුවේ සැබෑම වේගය, විඤ්ඤාණ ධාතුවේ සැබෑම වේගය ඔහු තම අවබෝධ පථයට

හසුකර ගන්නවා. සිත උපේක්ෂාව කියන නම්‍යශීලී තැනදි අවශ්‍යනම් මොහු චුතුපපාතඥානය, පූර්වේනිවාසානුස්සති ඥානය, දිබ්බචක්ඛු ඥානය, දිබ්බසොත ඥානය ඔස්සේ සිත රැගෙන යනවා. මස් ඇසෙන් නොදුටු ලෝකය සමාධියේ ඇසෙන් දකිනවා. සිත රළු බවට පත්කරන පංචනීවරණයන්ගේ ග්‍රහණයෙන් මිදුණු සිත ප්‍රභාෂ්වරයි. ආලෝකය තුළිනුයි මොහු ලෝකය දකින්නේ. සම්මා සමාධිය ලෝකයේ බොරුව නිශේධ කර සත්‍යාවබෝධය අත්දැකීම් තුළින්ම ඔබට පසක්කර දෙනවා. එවිට ඔබ තුළ පැටලිලි ස්වභාවයන් නැත. ඔබ ඇත්ත ඇතිහැටියෙන් දකී. සම්මා සමාධියේ අසිරිමත් ස්වභාවයක් මෙහි සටහන් තබමි.

එක්තරා භික්ෂුවක් සමාධියෙන් පසුවෙන විට මීට වසර දෙදහස් පන්සියයකට පෙරාතුව ජීවමාන වැඩසිටි ලොව්තුරා බුදුරජාණන් වහන්සේ මේ මොහොතේ සමාධියෙන් දර්ශනය කර ගෙන ඇත. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ පිරිනිවන්පා අවසානය. නමුත් මේ භික්ෂුව ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දකින්නේ පූර්වේනිවාසානුස්සති ඥානය තුළින්ය. එම භික්ෂුව මීට වසර දෙදහස් පන්සියයකට පෙර කාලයේ දඹදිව දී බුදුරජාණන් වහන්සේ ජීවමානව දැක තිබෙන්න පුළුවන්. එසේත් නැතිනම් ශ්‍රී ලංකාවට වැඩමකළ අවස්ථාවක බුදුරජාණන් වහන්සේ ජීවමානව දැක තිබෙන්න පුළුවන්. එසේත් නැතිනම් දිව්‍ය තලයක දෙවියෙක් ලෙස ඉපිද සිට බුදුරජාණන් වහන්සේව ජීවමානව දැක තිබෙන්නට ඇත. ඒ අතීත දර්ශනය පූර්වේනිවාසානුස්සති ඥානය ඔස්සේ අරමුණු නොකරම ලොව්තුරා බුදුරජාණන් වහන්සේ එම භික්ෂුවට දර්ශනය වී ඇත.

ලෝකයේ ඇත්ත ඇතිසැටියෙන් පෙන්වීම සම්මා සමාධියේ ස්වභාවයයි. ඒ ඇත්ත ඉදිරියේ කුමන රූපයක් දුටුවද එම රූපය ක්ෂණයෙන් මනසින් මැකීයන්නේ අනිත්‍ය සංඥාව ඉස්මතුවීමත් සමඟින්මය. ශාස්තෘන් වහන්සේගේ රූපය ඉදිරියේ වුවද විඳීම නිරුද්ධ වී ගොස්ය. සම්මා සමාධිය ඔබව ලෝකයෙන් එතෙර කරන දැක්මයි. අනිත්‍යයේ සියුම් වේගය ප්‍රඥාවේ දැලට හසුකරගන්නා දැක්මයි.

භික්ෂුව පිංවත් ඔබටත් එන්න කියලා ආරාධනා කරන්නේ මෙතැනට. අතුරු නවාතැන්පලවල්වල නැවතී සිටිනවාට වඩා මොන තරම් ආරක්ෂාකාරී තැනක්ද?

පුද්ගලයෙක් සිටිනවා ඔහු ලෝකය සමග තැවරී නැහැ. ලෝකය සමග මුහුවෙලා නැහැ. ලෝකය කියලා කීවේ නාමරූප ධර්මයන්ට. ලෝකයට නොතැවරුණ, ඔබටත් මටත් පාර කියන මේ සුන්දර මිනිසා ජීවත්වන්නේ සම්මා සම්බුද්ධ ශාසනයක. මේ සුන්දර ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ඵලය තුළ පමණක්මයි.

දැන් වේලාව සවස 5.00 පමණ ඇති. කුරුල්ලන්ගේ හඬ බොහෝම වේගවත්. මේ කුටිය අවට කැලෑරොදේ කුරුල්ලන් සිය ගණනක් සිටිනවා. විවිධ වර්ගවල, හැඩවල, වර්ණවලට අයිති. මේ කුරුල්ලන් නගන විවිධ ශබ්ද කිචිබිචිය හරිම මිහිරියි. ඒ මිහිරි පක්ෂි චර්යාවන් නරඹන්න ඔබ හරිම කැමතියි. සමහරවිට එය ඔබේ විනෝදාංශයක්. නමුත් මේ කුරුල්ලන්ගේ මිහිරි නාදය භික්ෂුවට ඇසෙන්නේ අඳෝනාවක් වගේ. නිකං අඳෝනාවක් නොවේ. තිරිසන් අපා දුකේ අඳෝනාවක් වගෙයි. ඔය කුරුල්ලෝ අතුපතර රිංග රිංගා සොයන්නේ ගස්වල සිටින පණුවන්, දලඹුවන්, කෘමීන්. ඒවා ඔවුනගේ රසවත්ම ආහාරයයි. ඔය ලස්සන පාට පාට සුන්දර එක කුරුල්ලෙක් දිනකට අවම වශයෙන් පණුවන් පනස් දෙනෙක් පමණ ගිලදමනවා. ප්‍රාණඝාත අකුසලයේ තෝතැන්නක් පක්ෂි ජීවිතය. පණුවන් හොටෙන් අල්ලාගෙන එම හොටෙන් දෙතුන් වරක් අතුවලට තට්ටු කරනවා පණුවා මැරෙන්න. පණුවා මැරුණ පසුයි එය ගිලදමන්නේ. එම පක්ෂියා තුළ සත්ත්ව ඝාතන, සත්ත්ව හිංසා කියන චේතනා සියල්ල සකස් වෙලා තිබෙන්නේ. කර්මය කර්මඵල විශ්වාසය තමයි නැත්තේ පක්ෂියා තුළ. මේ පක්ෂීන් කියන්නේ අකුසල් නිධි. එම පක්ෂීන් මිය යන වෙලාවේ එම පක්ෂීන්ට මතක් වෙන්නේ පණුවන්ගේ රසය. ඒ උපාදානයට අනුව එම පක්ෂියා මරණින් මතු පණු කුලයක, දලඹු, කෘමි කුලයකයි උපත ලබන්නේ බොහෝවිට. එසේ වුණහොත් එම කර්ම ඵලය කුරුල්ලකුටම ගොදුරු වෙන්න පුළුවන්. බලන්න සුන්දර කුරුළු ජීවිතයක් තුළ මොනතරම් අසුන්දර කථාවක් සැඟවිලා

තිබෙනවාද කියල. මෙවන් සුන්දර කුරුළු ගීතයක් තුළ මොනතරම් අම්හිරි අඳෝනාවක් සැඟවී තිබෙනවාද කියල. මෙවැනි අසුන්දර, අම්හිරි කුරුළු ලෝකය විනෝදාංශයක් කරගත්ත අපි විනෝදාංශයක් කරගන්නේ මෝහයයි. කමටහනක් කරගත යුතුදෙය විනෝදාංශයක් කරගන්නවා. මෝහය විනෝදාංශයක් කරගත්තාවූ ලෝකයාට අමෝහයේ සැබෑම මග විවර කරදෙන්නේද උතුම් ආර්ය අෂ්ටාංගික මාර්ගයමය. සත්තු මරන මිනිස්සුන්ව පිළිකුල් කරන අපි සත්තු මරන කුරුල්ලන්ව විනෝදාංශයක් කරගන්නවා. පක්ෂීන් යනු අපායේ යන කුරුල්ලන්ය. මන්ද ඒ සතුන් ඒ තරමටම ආහාරය සඳහා ප්‍රාණඝාතය සිද්ධකරගන්නවා. ඇසට පෙනෙන දෙයින් එහාට දකින්න. ඒ දැක්ම ප්‍රඥාවයි.

ඔබ ඔය සුරතල් කරන්නේ සතර අපායයි

ඉතාම ලෙන්ගතුභාවයෙන් සතුන් ඇතිකිරීමෙන් සිදුවන භයානක අනතුර නම් ජලභීතිකාවවත්, මැලේරියා, බරවා, වැනි රෝගවත් නොවේ. ඒවා වෛද්‍ය ප්‍රතිකාර ගැනීමෙන් සුවපත් විය හැකිය. සතුන් ඇතිකිරීමෙන් සිදුවන්නා වූ භයානකම අනතුර ගැන ඔබ අවධානයෙන් සිටිය යුතුය.

ඔබ සිතන්න ඔබ ඉතා ආදරයෙන් ඇති දැඩි කරපු සතෙක් මිය යනවා. මියගිහින් ඔබ ඇසුරේම ප්‍රේත සතෙක් ලෙස උපදිනවා ඔබ නොදන්නවාට මේ මේ ප්‍රේත සතා ඔබ ඇසුරේම ඔබේ නිවසේම ඉඩමේම ජීවත්වෙනවා. මෙවැනි අවස්ථාවකදී ඔබද වයසට යාම නිසා වෙනත් රෝගී තත්ත්වයක් නිසා හදිසි අනතුරක් නිසා මරණීය තත්ත්වයට පත්වෙනවා. අපිට කියන්න බැහැ අපි කොහොම කොයි මොහොතේ මැරෙයිද කියලා. සමහරු ඉන්නවා හොඳින් ජීවත්වෙලා මැරෙන මොහොතේ අසිහියෙන්, වේදනාවෙන් මිය යනවා. මෙවැනි අවස්ථාවක තමාගේ මානසික තත්ත්වය බිඳ වැටිලයි තිබෙන්නේ. එවැනි විටක තමා අභිබවා ඔය අමනුෂ්‍ය බලවේග ඉස්මතු වෙනවා. ඒ අය මනුෂ්‍යයාගේ දුර්වල මනෝභාවයට පෙනී සිටිනවා. මෙවැනි අවස්ථාවක ඔබට ඔය ප්‍රේත සුරතල් සතාව දර්ශනය වුවහොත් ඔබ සුරතල් කළ, ආදරය කළ එම සතා කෙරෙහි ඡන්ද රාගය ඇති වී තමාත් එම ප්‍රේත සතාගේ ලෝකයේ ඉපදීම සිදුවිය හැකියි. ජීවිතයේදී කාය, වචී, මනෝ කුසල කර්මයන් පුරුදු පුහුණුකර නොතිබුණහොත් අපි මැරෙන මොහොතේ අධ්‍යාත්මිකව වැටිල අසරණවෙන විට අපි ඉදිරියට එන ඕනෑම ප්‍රිය රූපයක් අල්ලා ගන්නවා, උපාදානය

කර ගන්නවා. අපිද එහිම බැසගන්නවා. තෙරුවන් කෙරෙහි සද්ධාව නොමැති නිසා, සද්ධර්මය ශ්‍රවණය නොකිරීම නිසා කල්‍යාණමිත්‍ර සේවනය නොකළ නිසා සතර අපාය මොකක්ද කියලාවත් මේ අය දන්නෙ නැහැ. තමා ඉදිරියේ පෙනීසිටින ප්‍රේත සුරතලා, ජීවමානව සිටි සුරතලා වශයෙනුයි මේ අය හඳුනාගන්නේ. අවසානයේ ස්වාමියා ප්‍රේතයෙක් ලෙසත් ඔහුගේ ප්‍රේතලෝකයේ සුරතලා ප්‍රේත සතාත් බොහෝම සමීපව ප්‍රේත ලෝකයේ ජීවත්වෙනවා.

සතුන් කෙරෙහි තෘෂ්ණාව ඇතිකරගත් පිංවතුන් තමාත්, එම අසරණ සතුන්වත් දුකෙන් දුකට පත්කරනවා. ඉහත ස්වභාවයන් අවබෝධකරගෙන සතුන් ඇතිකිරීම දෙපාර්ශවයටම යහපත් වෙනවා. එසේ නොවුණ හොත් සතර අපාය තව තව පිරීම හැර වෙනත් විකල්පයක් නැහැ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේද භික්ෂූන් වහන්සේලාට තම පාත්‍රය සෝදා ඉතිරිවන ඉඳුල් වතුරටික පවා සතුන් නොමැති ජලයේ පා කර හරින්න යැයි අනුදැන වදාළේ, සතුන් ඇතිදැඩි කිරීමට නොහැකි ආකාරයට විනය නීති පැනවූවේ ගිහි පැවිදි සැමටම ඉහත සතුන් පලිබෝධයක් වන නිසාමය. අද සතෙකුට කෑමට යමක් දැම්මොත් එම සතා නැවත ඔබ සොයා එනු ඇත. මෙය නැවත නැවත සිදුවීමේදී සතා ඔබේ හිතවතා, සුරතලා වීම අනිවාර්යය. සතාගේ හිතවත් භාවය නිසා, අසරණ භාවය නිසා ඔබ එම සතාට ආහාර ලබාදෙයි. මෙහිදී සිදුවන්නේ තෘෂ්ණාව මත ඇතිවන ගනුදෙනුවකි. එම ගනුදෙනු ඔබව මුලා කරුනු විනා සත්‍යවබෝධය සඳහා නම් උපකාර නොකරයි. ප්‍රේත අලියාගේ ඉරණම සම්බන්ධයෙන් ඉහත සටහන තැබුවේ භික්ෂුව එය ගලපාගත් ආකාරයටය. ඔබට එය වැරදියයි හැඟේනම් පිංවත් ඔබට කැමති ආකාරයට එය ගලපාගත හැකිය. පිංවත් ඔබ කෙසේ ගලපාගත්තද සීමාව ඉක්මවා ගිය සතුන් කෙරෙහි බැඳීම ඔබේත් සුරතලාගේත් දුක පිණිසම හේතුවේ. සුරතලා කොහොමත් සිටින්නේ සතර අපායේය. එහෙත් ඔබ උතුම් මනුෂ්‍ය ජීවිතයකය. මේ දෙක ඔබ පටලවා නොගතයුතුය. තමාවත් තමාට අයිති නැතිකොට සතර අපායේ සතෙකු තමාගේ කරගැනීමට යාම අනතුරුදායක බව මෙනෙහි කරන්න. ඔබේ සෙවනේ වැඩෙන සුරතලා කුමන සතෙකු වුවද එම සතා පෙර ජාතියක මනුෂ්‍යයෙක්

බව හොඳින් සිහිකරන්න. එම මනුෂ්‍යයා තිරිසන් සත්ත්වයෙක් ලෙස සතර අපායට වැටුණේ පෙර මනුෂ්‍ය ජීවිතයේදී තිරිසන් සත්ත්ව සංඥා වැඩූ නිසා වීම එක හේතුවක් විය හැකිය. මනුෂ්‍ය ජීවිතය ප්‍රපාතයට හෙලන මෙවැනි හේතූන්ගෙන් ඔබ අත්මිදෙන්න. තිරිසන් සත්ත්ව ලෝකය විවිධත්වයෙන් පිරී ඇත. මේ විවිධත්වය යනු එම සතුන් ගෙවන කර්ම සහ කර්ම විපාකයන්ගේ ස්වභාවයයි. මෙහි පර්යේෂණ කිරීමට, ඇතිදැඩි කිරීමට, සුරතල් කිරීමට දෙයක් නොමැත. ඔබ සුරතල් කරන්නේ නම් ඒ ඔබ සුරතල් කරන්නේ සතර අපායේ කර්ම විපාකයකි. ඔබ දක්ෂයෙක් වන්නේ සතර අපායේ දුක තිරිසන් සත්ත්ව ලෝකයේ දුක දැක එය කමටහනක් කර ගෙන සතර අපායෙන් එතෙරවීමෙන්ය. එසේ නොකොට සතර අපාය සුරතල් කිරීමෙන් නොවේ.

මේ දුකම දැයි සිහියෙන් බලන්න

වනගත ආරණ්‍යවල හුදකලා වනවාසී කුටිවල වැඩසිටින ස්වාමීන් වහන්සේලා ගත කරන්නේ සමහරවිට දුෂ්කර ජීවිතයකි. මෙය සටහන් තබන වේලාවේ භික්ෂුව වැඩසිටින්නේ රුහුණු ප්‍රදේශයේ වනගත ආරණ්‍යයකය. මේ වන විට මාස කිහිපයකින් මෙහෙට වැසි නැහැ. පරිභෝජනයට ගන්න තිබෙන වැව් දෙකම හිඳිලා. ඒ හිඳීගිය වැවේ ඇති සුළු වතුර ප්‍රමාණයේ අලින් නානවා, සත්තු වතුර බොනවා, කිඹුල්ලුත් බැසගෙන ඉන්නවා. ලුණු ගතිය වැඩි නිසා මාළුත් මැරිල උඩ පාවෙනවා. ඒ කියන්නේ දිනෙන් දින හිඳෙන සීමිත ජල ප්‍රමාණයට අපවිත්‍ර දෑ මිශ්‍රවෙනව වැඩියි. මෙම ජලය තමයි 'පිල්ටර්' කරල සැවොම වළඳන්නේ. ඒ උනත් මේ ජලය පිරිසිදුයි. අපුලක් දැනෙන්නේ නැහැ. සමහර වියළි කලාපයේ ආරණ්‍යවල ජලය හිග නිසා ශාරීරික අවශ්‍යතා සඳහාද ජලය සොයා ගන්නේ ගල් වලකින්, පොකුණකින්. බොහෝම තෘප්තියකින් තමයි පිංවත් ස්වාමීන් වහන්සේලා මෙහෙම, අවම පහසුකම් වලිනුත් තොරව තම නිවීමේ ප්‍රතිපදාවේ යෙදෙන්නේ. අපේ පිංවත් දායක මහත්වරුන් මෙවැනි භික්ෂූන්ගෙන් අසන ප්‍රශ්නයක් තමයි 'ඔබ වහන්සේලා කැලයට වෙලා දුක් විඳින්නේ ඇයි' කියලා. භික්ෂුවට තේරෙන්නෙ නැහැ ඇයි ඒ පිංවතුන් මෙහෙම අහන්නේ කියලා. කැලේ ජීවත්වෙන විට සතියකට වරක් තමයි හිස රැවුල බාන්නේ. භික්ෂුව දරා සිටින්නේ දුඹුරු පාට චීවරය. වියළි පරිසරය නිසා ශරීරය වියළි ස්වභාවයක් තමයි දරන්නේ. මේ ස්වභාවයන් දක්කම ගිහි පිංවතුන් සිතනවා භික්ෂූන්වහන්සේලා දුක්විඳිනවා කියල.

එක් අවස්ථාවක භික්ෂුවට මතකයි මිනිස් වාසයෙන් හුගාක් ඈත ආරණ්‍යයක වැඩසිටියදී කුටියේ සිට දානයට පිණ්ඩපාත ශාලාවට

කැලය මැදින් වඩින විට චන්දනාවේ පැමිණි නඩයක පිංවත් වයස අවුරුදු දොළහක් පමණ දූරියක් පාත්‍රය එල්ලාගෙන පැමිණෙන භික්ෂුව දැකලා තමන්ගේ මවගෙන් අහනවා 'මොකෙක්ද අම්මේ ඒ කියලා' ඒ කියන්නේ 'අමුතු සතෙක්' හැටියට තමයි ඒ පිංවත් දූරිය භික්ෂුවව දැක්කේ. ඒ කථාව ඇසෙද්දී මට හරි නිරාමිස සතුටක් දැනුණා. මට හිතුණා භික්ෂුව මේ ලෝකයට අයිති නැති කෙනෙක්ය කියලා. භික්ෂුව මේ ලෝකයේ හැමෝටම වඩා වෙනස් කෙනෙක්ය කියලා. කොයිහැටි වෙතත් ඔබ කවදාකවත් භික්ෂූන්වහන්සේ නමකගෙන් එහෙම අසන්න එපා. එහෙම සිතන්න එපා. මොකද එය මේ ලෝකයේ තිබෙන ලොකුම මුසාවාදය වෙනවා. මෙය සටහන් තබන භික්ෂුව මොනම කටුක පරිසරයකදීවත් කවදාකවත් කැලයේ අසතුටින් හිඳ නැහැ. පිංවත් වනවාසී ස්වාමීන් වහන්සේලා බොහෝම තෘප්තියකින්, නිදහසකින්, හුදකලාවකින් තමයි කැලයේ නිවන් මග වඩන්නේ. දුකක් කොතැනද මේ හුදකලාව තුළ. මෙතනදි පිංවත් ගිහිපිංවතුන් පටලවාගෙන තිබෙන්නේ දුක සහ සැපයේ ස්වභාවය. තමන් ගෙවල් දොරවල්, ඉඩකඩම්, දරුමල්ලන්, ඥාතීන්, නිලතල, තනතුරු වැනි මහා දුක් ගොඩකට මැදිවෙලා. මේ සියල්ලෙන්ම මිදී නිදහස්ව නිස්සරණ ජීවිත ගත කරන භික්ෂූන් වහන්සේලාගෙන් පිංවතුන් අසනවා 'ඇයි දුක් විඳින්නේ?' කියලා. අපි කිසිම දුකක් විඳින්නේ නැහැ. බොහෝම සැනසිල්ලේ තමයි මෙහි ජීවත් වෙන්නේ. අතහැරීම තුළ භික්ෂූන් වහන්සේලා ලබන සැපය, සංහිඳීම පිංවත් ඔබලාට සිතාගන්නවත් සමහරවිට බැරිවෙයි. ඔබත් ජීවිතයේ බැඳීම් අඩු අයෙක්නම් ඔබට මේ සැපය දැනී ඇත. එසේ නොවුණ අය භික්ෂූන් වහන්සේලා කෙරෙහි ආදරයෙන් ඉහත ප්‍රශ්නය අහන්නේ.

හැබැයි මෙයත් සටහන් කරන්න ඕනේ. වනවාසීව ආරණ්‍යගතව වැඩසිටියත් යමක් කෙරෙහි තෘෂ්ණාවක් ඇතිකරගෙන නම් ජීවත්වෙන්නේ ඒ ජීවිතවලටද සැපයක් නැහැ. දුක තමයි තිබෙන්නේ. මොකද කැලයේ පරිසරයට, වනසතුනට, ඇළදොළට, පුරාවස්තුවලට තණ්හාවෙන් මේවාට ඇලිල මේවා සොයන්න, ගවේෂණය කරන්න, ආරක්ෂාකරන්න වෙහෙසෙන ස්වාමීන් වහන්සේලාත් වැඩ සිටින්න පුළුවන්. හැබයි සැබෑ ආර්ය අෂ්ටාංගික මාර්ගය තුළ ගමන් කරන ස්වාමීන් වහන්සේලාට කිසිම දුකක් වනවාසී ජීවිතය තුළ නැහැ.

ගිහි පිංවතුන් නිතරම තම වසඟයේ තබාගත නොහැකි ඇසත්, කනත්, නාසයත්, දිවත්, මනසත්, කයත් මගේ කරගෙන ඒවාට ආහාර සොයන්න වෙහෙසෙනවා. ඔබට දැනෙන්නේ නැහැ ඇසත් ඇසට දෙන ආහාරත් අනිත්‍යබව. අනෙක් ආයතන පහත් එසේමයි. ඒවාට ලබාදෙන ආහාරත් අනිත්‍ය වන දේවල්මයි. මේ නිසාම ඔබ නැවත නැවතත් වෙහෙසෙනවා මේවායේ කුසගින්න නිවන්න. මේ ගින්දර අවුළුවන්නේ අධ්‍යාත්මික බාහිර රූප දෙකත් විඤ්ඤාණයත් හේතුවෙන් සකස්වෙන ඵස්සය නිසාමයි. මේ ඵස්සය වුණේ ගින්දරත් පිදුරුත් බව නොදන ඔබ ඵස්සය හේතුවෙන් සකස්වුණ වේදනාව මගේ කරගන්නවා. නමුත් ඔබ මගේ කරගෙන තිබෙන්නේ ගිනි ගොඩක්. ඔබ ඒ ගිනි ගොඩවල් නිසාම වර්තමානයේ තැවෙනවා, දුම්දමනවා, රත්වෙනවා, ගිනිගන්නවා. වර්තමානය කියලා සටහන් කරනවිටම ඒ සඳහන් කළ වර්තමානය අතීතයට ගොස් ඉවරයි. මේ අත්දකින්නේ රූපය අනිත්‍යභාවයට පත්වෙන වේගයයි. මේ වේගය පංචඋපාදාන ස්කන්ධයටම පොදුයි.මේ අනිත්‍ය ස්වභාවයේ යථාර්ථය තමයි වනවාසී භික්ෂූන් අත්දකින්නේ. මෙයින් අදහස් වෙන්නෙ නැහැ වනවාසී භික්ෂූන්වහන්සේලා අන්ධ, ගොළු, බිහිරියි කියලා. උන්වහන්සේලා ආශ්වාදයේ කෙටි බව දැකලා, ආදීනවයේ දිගුබව වියරුබව දැකලා කාමයේ නිස්සරණයමයි සොයන්නේ. රූපයේ නිස්සරණයමයි සොයන්නේ. මෙතන තියෙන්නේ පලායාම නොවේ. මගහැරීම නොවේ. අවබෝධයෙන් අතහැරීමයි. අතහැරීමෙන් නිදහස්වීමයි.

මේ මොහොතේ භික්ෂුව අත්දැකීමට ලැබුණු සිද්ධියක් මතක්වුණා. දිනක් භික්ෂුව කැලයේ කුටියක සිට පිණ්ඩපාතය සොයා ගමට වඩින්නට පිටත්වුණා. හිමිදිරියේ කුටියෙන් එළියට බහිනවිට වැසිවසින ලකුණක් පෙනෙන්ට තිබුණෙ නැහැ. දැන් භික්ෂුව කුටියෙන් එළියට බැහැල කිලෝමීටර් දෙකක් පමණ ඇවිදින් තිබෙනවා පිණ්ඩපාතය සොයන්න. කිලෝමීටර් කාලක් යන්න හම්බවුණේ නැහැ. කැලය මැදදීම මහා වැස්සක් වසින්න පටන් ගත්තා. ලැබුණු අභියෝගයේදී භික්ෂුව අධිෂ්ඨානයක් ඇති කරගත්තා අනෝරා වැස්සක් වැස්සද වැස්සෙන් මිදීමට සෙවනකට නොයනවා කියලා. දැන් වැස්සෙන් සිවුර, ශරීරය, පාත්‍රතවිකය හොඳටම තෙමිලා. ගෙවල්

කිහිපයකට වැඩමකරලා අවශ්‍ය ආහාර සොයාගත්තා. සමහර දායක පිංවතුන් ඇසුවා හාමුදුරුවනේ කුඩයක් දෙන්නද කියලා. සමහරු කුඩයක් ඉහලලම දෙන්න උත්සහ කළා. භික්ෂුව ප්‍රකාශකළා මහත්මයෝ එළියට බසිනවිට වැසි වසියි කියලා සිතුවේ නැති නිසා කුඩය ගෙනාවේ නැහැ දැන් ඉතින් හොඳටම තෙමිල නිසා කුඩයක් අවශ්‍ය නැහැ. මෙහෙමම කුටියට වඩිනවාය කියල. ඒත් ඒ සද්ධාවන්ත පිංවතුන්ට එය ලොකු දුකක් වුණා. ඒ මොහොතේ වැස්සට තෙමී සිටි භික්ෂුව දුටුවා නම් ඔබ සිතන්නේ අනේ මේ හාමුදුරුවෝ වුවමනාවෙන් දුක්විඳිනව කියල. ගෞරවනීය, වන්දනීය නායක ස්වාමීන් වහන්සේලා පවා සමහර විට ප්‍රකාශ කරනවා කැලේට යන්නේ දුක් විඳින්නද කියලා. කැලේ වනවාසී ජීවිත දුකක් නොවන්නේ කොහොමද කියල භික්ෂුව ඔබට පහදා දෙන්නම්. ඔබ දන්නවද බලාපොරොත්තු නොවූ ආකාරයට කඩාවැටුණු මහ වැස්සෙ තෙමි තෙමි තෙත බරිත වෙලා වඩින භික්ෂුව මොනතරම් සංහිඳීමකින්ද වඩින්නෙ කියලා. ඔබට දැන් ප්‍රශ්නයක් මතුවෙන්න පුළුවන් භික්ෂුවට මොළේ අමාරුවක්ද කියලා. ඇයි හාමුදුරුවො කියනවා වැස්සෙ හොඳටම තෙමිල වඩින්නේ සංහිඳීමකින් සැපයකින් කියලා. සත්‍යකින්ම එය ලෝකයේ ශ්‍රේෂ්ඨම සැපයක් ආර්යයන් වහන්සේලා පමණක් අත්විඳින සංහිඳීමක්. ලෝකයට හොරා ලබන සංහිඳීමක් සැපයක්. නමුත් දෙවියන්, බ්‍රහ්මයන් පමණක් දකිනා සැපයක්. ඔබ දන්නවාද භික්ෂුව එම සංහිඳීම සැපය ලබන්නේ කොහොමද කියලා. මහ වැස්සේ තෙතබරිත වෙච්ච ශරීරය සිවුර බාහිරින් පෙනුණද භික්ෂුවට ශරීරයේ එක රෝම කූපයකටවත් ශීතලක් දැනුණෙ නැහැ. දැනෙන්නේ නැහැ. භික්ෂුවට වහිනවද තෙමිලද කියල තේරුමක් නැහැ. ඇයි දන්නවද? ලොව්තුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ දේශනා කර වදාළ ප්‍රතිදාවේ ආශ්චර්ය ප්‍රාතිහාර්යන් නිසා. භික්ෂුව කුටියෙන් පිටවෙලා වැස්ස පටන්ගත් මොහොතේම තේජෝ මනසිකාරයට සම වැදිලයි වැඩියේ. භික්ෂුව මුළු ශරීරයේම තේජෝ ධාතුවේ ක්‍රියාකාරීත්වය සිතෙන් වැඩි කරගන්නවා. හරියට දැඩි ලෙස උණෙන් පෙළෙන අයෙක් වගේ ශරීරය එවිට උණුසුම් වෙනවා. මේ උණුසුමට වැස්ස කෙසේනම් දුකක් දෙන්නද? මෙවැනි විටක වැස්ස නවත්වන්න කාටවත් බැහැ. එය ලෝක ස්වභාවයක්.

ලෝක ස්වභාවයන් වළක්වන්න නිවන්මග වඩන්නන්ට බැහැ. නමුත් එම ස්වභාවයන් අවබෝධයෙන් හඳුනාගෙන ඒවායේ නොඇලී නොගැටී ඉන්න භික්ෂුවට පුළුවන් වෙන්න ඕනේ. ආර්යයන් වහන්සේ කියන්නේ වැස්සත් උෂ්ණත්වයත් ජයගත්ත කෙනෙක්. ලොව බලසම්පන්න පඨවි, ආපෝ, තේජෝ, වායෝ ධාතුන් විනිවිද දුටු කෙනෙක්. උන්වහන්සේලා දන්නවා සතර මහා ධාතුව තමන්ට අවශ්‍ය ආකාරයට ගලපාගන්න, පෙරලාගන්න. ඇයි සතර මහා ධාතුවේ ස්වභාවය අවබෝධකර අවසන් නිසා. නිරතුරුවම වෙනස් භාවයට පත්වෙන සතර මහා ධාතුන් ප්‍රඥාව අවබෝධය හමුවේ අසරණයෙක්මය.

දැන් ඔබ මෙය ඔබේ ජීවිතයට ගලපාගන්න. වනවාසී භික්ෂූන් දුක්විඳින පිරිසක් නොවේය කියල දැනගන්න. සැබෑ බුදුපුතුනට පුළුවන් අවශ්‍ය අවස්ථාවක තේජෝ ධාතුවේ ක්‍රියාකාරීත්වය සිතින් වැඩිකර ශරීරය උණුසුම් කරන්න, ශරීරය ගිනි තබාගන්න, ශරීරය අළු දුවිලි හැටියට දකින්න. මුළු ලෝකයම තේජෝ ධාතුවෙන් ගිනිඅවුළුවා මුළු විශ්වයම, දස දිශාවටම ගිනිගොඩක්, අළු ගොඩක් ලෙස දකින්න. අනෙක් ධාතුන්ද ඉහත ආකාරයට අවශ්‍ය අවස්ථාවේදී ක්‍රියාකාරීත්වය අඩු වැඩි කිරීමේ ශක්තිය ආර්යයන් වහන්සේට තිබෙනවා. එම නිසා පිංවත් ඔබ නොදැනුවත්භාවය නිසා වනවාසී, ආරණ්‍යවාසී භික්ෂූන් දුක්විඳිනවාය කියනවානම් එය ලෝකයේ තිබෙන ලොකුම මුසාවාදය වනු ඇත. එම නිසා ඔබට වඩා දශමයකින් හරි ශීල, සමාධි, ප්‍රඥා මාර්ගයේ ඉදිරියෙන් සිටින පන්සල් වේවා ආරණ්‍ය වේවා පැවිදි උතුමෙකුට සහතික දීමට ඔබ ඉක්මන් නොවන්න. එය ඔබලාගේ සැපය පිණිසම හේතුවෙනවා ඇත. පිංවත් ඔබලාද කළයුත්තේ සතර මහා ධාතුවේ ස්වභාවය අවබෝධයෙන් හඳුනාගෙන අධික ශීතලද දැඩි රස්නයක් බවට පත්කළ හැකි, ඝන දැඩි ස්වභාවය දියරයක් බවට පත්කළ හැකි, ඇතිවෙමින් නැතිවෙන සිතේ හැකියාවන් දියුණුකළ ප්‍රඥාවෙන් හඳුනා ගැනීමය.

මාර්ගය ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනාකර ඇත. එම ධර්මය අත්දැකීමට අපි සැවොම පිංකර ඇත්තෙමු. මඟ වැඩූ ගුරුවරයෙකුගේ, කල්‍යාණ මිත්‍රයෙකුගේ ඇසුරකින් තොරව ඉහත ස්වභාවයන් ඔබ

අත්දැකීමට ගියොත් කායික මානසික රෝගියෙක් වීමේ ඉඩකඩ වර්තමාන සමාජයේ ඉතා වැඩි බව සිහිතබාගන්න. ඉහත සටහන තබන භික්ෂුවද කුඩයක් පාවිච්චි නොකර වැස්සේ වැඩිය මුල්ම අවස්ථාව මෙන්ම අවසාන අවස්ථාවද එයම බව හොඳින් මතක තබාගන්න. ඊට හේතුව වුයේද කුටියෙන් පිටවන මොහොතේ වැසි ලකුණු නොතිබුණු නිසාය. යම් හෙයකින් වැසි ලකුණු තිබුණානම් භික්ෂුව අනිවාර්යයෙන්ම කුඩය සමගයි වඩින්නේ. මොකද මේ ආශ්චර්යමත් ප්‍රතිපදාවන් අවබෝධය ලබා අතහැරදැමීම සඳහා මිස ලෝකයාගෙන් ලකුණු ලබාගැනීමට නොවන නිසාය. තමා කවුද යනු අවබෝධයෙන් හඳුනාගත් පසු තමා තමාටද අතහැරෙනු ඇත. මන්ද තමා තුළද ඇත්තේ හේතුඵල ධර්මයන්ගෙන් සකස්වූවක් මිස සත්ත්වයෙක් ඔහු නොදකින නිසාය. සෑම බුදු පුතෙකුම පන්සලක වැඩසිටියද, ආරණ්‍යවාසීව වැඩසිටියද තෘෂ්ණාවෙන්, ඡන්දරාගයෙන් යමක් අල්ලා නොගෙන ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන් කරන්නේ නම් උන්වහන්සේ ලබන්නේ සංහිඳීමක්මය, සැපයක්මය.

ආදීනව නොපෙනෙන ආශ්වාදයද ආදරය?

තාරුණ්‍යය කියන්නේ බොහෝම සුන්දර තැනක්. ලස්සන, කඩවසම්, ලාලිත්‍යය, රිද්මය, ප්‍රභාෂ්වරබව තාරුණ්‍යයත් එක්ක ජීවිතයට එකතුවෙන ධර්මතාවයන්. ශරීරය තුළ කුළුදුලේ නිපදවන හෝමෝන ක්‍රියාකාරීත්වය නිසා සතර මහා ධාතුව හොඳින් දීප්තිමත්ව හැඩවැඩ වෙන කාලයක් මේ තාරුණ්‍යය. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා 'මහණෙනි, රූපයේ ආශ්වාදයක් තිබෙනවා. මම රූපයේ ආශ්වාදයක් නැහැ කියන්නේ නැහැ' කියලා.

රූපයේ ආශ්වාදය තමයි නව යොවුන් දරුවෙකුගේ, දූරිවියකගේ රූපයේ ලාලිත්‍යය, හැඩය, ප්‍රභාෂ්වරබව. මෙතන ආශ්වාදයක් තිබෙනවා. ඒ නිසාමයි සත්ත්වයා මේ තාරුණ්‍යයෙන් යුත් රූපයට බැඳී යන්නේ. ඒ රූපය තුළ බැසගන්නේ. මෙන්න මේ රූපයේ ආශ්වාදයට මත්වෙන අපි රූපයේ ආශ්වාදය වගේම රූපයේ ආදීනවයකුත් තිබෙනබව අමතක කරනවා. බුදුරජාණන් වහන්සේ දේශනාකරනවා රූපයේ ආදීනවය තමයි ඔය ප්‍රභාෂ්වර කාන්තිමත් රූපය ක්‍රමාණුකූලව වයෝවෘද්ධභාවයට පත්වීම කියලා.

වයස හැට පිරුණු විට රූපය වැහැරී මහල්ලෙක්, මැහැල්ලක් බවට පත්වෙනවා. රූපයේ ආශ්වාදය කියන්නේ බොහොම කෙටිකාලයක් පවතින දෙයක්. නමුත් එහි ආදීනව බොහෝම දිගයි. තාරුණ්‍යය නිසා අපි ඇතිකරගන්නා රාග, ද්වේෂ, මෝහ සිතුවිලි නිසා ආදීනවය කියන කාරණය කල්ප ගණනාවක් දිග වෙන්න පුළුවන්. තාරුණ්‍යය සමඟ අත්වැල්බැඳගන්න ධර්මතාවයක් තමයි ආදරය. තාරුණ්‍යයත් ආදරයත්

එකතුවෙච්ච තැනදි ආශ්වාදයෙන් මත්වීම නිසාම ආදීනවය දකීමේ හැකියාව අන්ධ වෙනවා. මේ අන්ධභාවය නිසා ඇතිකර ගන්නා අනතුරු හේතුවෙන් අහිමිකරගත් ජීවිත, විනාශකරගත් ජීවිත සහ තම ජීවිත තුලින් රාග, ද්වේශ, මෝහ අකුසල මූලයන් ශක්තිමත් කරගන්න සමාජයක් අපි ඉදිරියේ තිබෙනවා. මෙය ධර්මයේ කැඩපතක්. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ක්‍රමානුකූලව මනුෂ්‍යයාගේ ආයුෂ පිරිහීමට පත්වෙනවා කියලා. ඒ කියන්නේ අනාගතයේදී මනුෂ්‍යයාගේ පරමායුෂ අවුරුදු 10ක් බවට පත්වෙනවාය කියල. එම කාලයේදී වයස අවුරුදු 05 වන විට මනුෂ්‍යයෙක් විවාහ වෙනවා. වයස අවුරුදු 07 වන විට දරුමුණුබුරන් ලබල මැරිල යනවා. මොකද පරමායුෂ වසර 10යි. මෙන්න මේ තැනට ලෝකය දුන් යමින් පවතිනවා. අපි මේ රටේ ලෝකෙ සිද්ධවෙන සිදුවීම් දෙස කම්මුලට අත තබාගෙන බලා සිටින්නේ අදහාගන්න බැරුව වගේ. ඒත් මේ අරුමයක් නෙවෙයි. සම්මා සම්බුද්ධ මුවින් දේශනා කළ ලෝකයේ ගමන් මාර්ගයම තමයි. මනුෂ්‍යයාගේ ආයුෂ කෙටි වෙන්න, කෙටි වෙන්න වර්තමානයේ මනුෂ්‍ය චර්යාවන්ද කෙටි වෙනවා. අද කාලයේ දරුවෙක් වයස අවුරුදු 7, 8 වන විට වැඩිවියට පත්වෙනවා. ඒ කියන්නේ ලාබාල වයසේදීම දරුවන් වැඩිහිටියන් බවට පත්වෙනවා. ලාබාල වයසේදීම වැඩිහිටිභාවයට අදාළ මානුෂික අවශ්‍යතාවයන්ට ඒ අය බැඳී යනවා. ළමා වයසේදීම විරුද්ධ ලිංගිකයන් සමග ආදරයට හා ඒ හා සමාන බැඳීම්වලට බැඳීයනවා. දරුවෙක් තුළින් වැඩිහිටියෙක් මෙන්ම එහි අනෙක් පැත්ත හැටියට වැඩිහිටියෙක් තුළින් තරුණයෙක් දැකීමට ඔබට සිද්ධවෙයි. මේවා ආයුෂ පිරිහීමත් සමග ඇතිවෙන හේතුඵල ධර්මයන්ය. මෙය වැඩිහිටි පරපුරට එක්තරා අභියෝගයක් වෙන්න පුළුවන්. නමුත් සම්බුදු ධර්මයට අනුව ගලපා බලනවිට මෙතන කිසිම අභියෝගයක් නැහැ. ලෝකය යායුතු ගමන හැඩවැඩ වෙමින් යනවා. නමුත් මේ ගමන දැකලා සතුටුවෙන්ට ඔබට බැහැ. ඔබ කුමන වෙහෙසක් ගත්තද මේ ගමන නවත්වන්නත් ඔබට බැහැ. මේවා හේතුඵල ධර්මයන්ය. මීට වසර දෙදහස් පන්සියයකට පෙර අවුරුදු 160 ක් ආයු වැළඳූ බක්කුල මහරහතන් වහන්සේ වැඩසිටියා. ඒත් ඒවා දුර්ලභ පාරමී ශක්තීන් නිසා සකස් වූ සිද්ධීන්.

එදා මනුෂ්‍යයාගේ පරමායුෂ පැවතියේ අවුරුදු 120 යි. නමුත් මේ මොහොතේ වසර දෙදහස් පන්සියයක් ගෙවුණ තැනදි මනුෂ්‍යයාගේ පරමායුෂ අවුරුදු 65 ක් දක්වා පමණ අඩුවෙලා. ඒ කියන්නේ මනුෂ්‍යයෙකුගේ ආයුෂ අඩකට සමාන ප්‍රමාණයකින් අඩුවෙලා. මේ ගෙවුණා වූ කාලය ලෝකය අස්වාභාවිකත්වයෙන් කාර්මීකරණයෙන් දෝරගලා ගිය යුගයක් නොවෙයි. ස්වාභාවිකත්වය තුළ ලෝකය පැවති කාලයක්. නමුත් ඔබ වර්තමානය අනාගතය තුළ දකින්නේ අතිශය අස්වාභාවික කාර්මීකරණය දෝරගලා ගිය ලෝකයක්. රසකාරක, කෘමිනාශක, වල්නාශක.... මත රැඳුණු ලෝකයක්. ඒ හේතුව නිසාම මනුෂ්‍යයාගේ ආයුෂ අතීතයට වඩා මහා වේගයකින් හීන වෙනවා. වර්තමාන ලෝකය ගමන් කරන දැඩි කාර්මීකරණය, කෘතිම ආහාරකරණය දෙස බලනවිට තව වසර එක්දාහස් පන්සියයක් ගිය තැනදි මනුෂ්‍යයාගේ පරමායුෂ අවුරුදු 10 කියන තැනටවත් වීමේ හැකියාව කාටවත්ම බැහැර කරන්න බැහැ. මොකද ගෙවීගිය වසර දෙදහස් පන්සියයට වඩා අතිශය ව්‍යාකූල එක්දාහස් පන්සියයක් ඉදිරියේ එළඹෙන්නේ.

අපි තරුණ කාලයේදී ආදරය කියන හැඟීමක් අප තුළ සකස්වුණේ අවුරුදු 20 පසු වුණාට පසුව. ඒත් අපි ආදරය ගැන කතාකරන්න බය වුණා ලැජ්ජාවුණා. නමුත් වර්තමානයේ අවුරුදු 15 වෙනවිට ආදරය කරල ආදරයෙන් පරාජයවෙලා මුහුදට, ගඟට පැනල, වස බීලා ජීවිත නැතිකරගන්න කොතෙක් තරුණ ජීවිත මේ සමාජයේ ඇතිද? තමාට වූ ආසාධාරණය වසාගෙන ජීවත්වන චරිත සමාජයේ කොතෙක් ඇතිද? මේවායේ ගණන් හිලව් වැඩිවීමක් මිස අඩුවීමක් සිතීම විහිළුවකි.

ලෝකය යමක් සුන්දරයි කියල දැක්කහම අපි ඒ සුන්දරත්වයට රැවටෙනවා. ඔබ සිතන්නේ ඒ සුන්දරත්වය ලෝකයට අයිති දෙයක් කියලා. ඒ සුන්දරත්වය ලෝකයට අයිති දෙයක් නොව ඔබ තුළින්ම එම රූපය කෙරෙහි ඔබ සකස් කරගන්නා වූ ඡන්ද රාගය නිසාම ඔබ තුළ සකස් කරගත් සිතුවිලි සමුදායකි. මෙන්න මෙතනදී ඔබ රැවටීමට ලක්වෙනවා. මොකද අනුන් නිසා ඔබ තුළින්ම සකස් කරගත්

හොඳයි කියන මිම්මක්, සීමාවක් තුළ සිට ලෝකයාට පුද්ගලයාට බැඳී යනවා. රූපය නිසා තෘෂ්ණාවෙන් බැඳුණ සිතට පුදුමාකාර හැකියාවක් තිබෙනවා ඇඳුමකින් වසා තිබෙන කසල ගොඩක් රත්‍රං ගොඩක් කරලා දකින්න. මනුෂ්‍යයාගේ ආයුෂ පිරිහෙන්න පිරිහෙන්න මනුෂ්‍යයා සූදානම් නැහැ තමාගේ ආයුෂ අඩුවෙනවාය යන්න පිළිග න්න. එය සද්ධර්මය කෙරෙහි ඇති දුරස්ථභාවය නිසාම සිදුවන්නක්. එවැනි අය යමෙක් අවුරුදු 50 - 60 ක් ජීවත්වෙලා මැරුණොත් එම මරණයට කියන්නේ අකල් මරණයක්, හදිසි මරණයක් කියලා. ධර්මයේ යථාර්ථය සංස්කාර ධර්මයන්ගේ ක්‍රියාකාරීත්වය පිළිගන්න සූදානම් නැහැ. තවත් පැත්තකින් මනුෂ්‍යයාගේ ආයුෂ පිරිහෙනවාය කියන කාරණය පිළිගන්න සූදානම් නැති නිසා සමහරු අවුරුදු 50-60 දී ආදරය සොයන කාමය සොයන වැඩිහිටියන්ගේ සමාජයකුත් තිබෙනවා. මොකද මේ අය දකින්නේ තවම පරමායුෂ අවුරුදු 120 ක් පමණය කියලා. මේ අය අවුරුදු 65 න් මියයාමේ බලාපොරොත්තුවෙන් නොවේ සැලසුම් සකස් කරන්නේ. මරණය ජීවිතයෙන් ගොඩාක් ඈතට දුවනවා. ඒ කියන්නේ ධර්මයෙන් ඈතට යනවා. පුළුවන් තරම් මරණය ජීවිතය කිට්ටුවට ගන්න. එවිට ඔබ ධර්මයට සමීප වෙනවා. කෙනෙක් ධර්මයෙන් හොඳටම දුරස්වුණොත් ඔහු හිතන්නේ නැහැ තමන් මැරෙනවාය කියල. මරණය ගැන හිතන්න බය කෙනා ඉබේම ධර්මයෙන් ඈතට යනවා. බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මය තුළ සිට ලෝකය දකින්න.

මරණ භියෙන් තොර මරණයක් උදෙසා

වර්තමානයේ කුමක්ද ලෝකය තුළ සිද්ධ වෙන්නේ? සිදුවෙමින් පවතින අපි අකැමති දේවල් නැවත්විය නොහැකිද? එසේත් නොමැතිනම් මේ ලෝක ධර්මතාවයන්ද?

තෙරුවන් කෙරෙහි සද්ධාව සකස්කර ගන්න. එතකොට ඔබ බුදුරජාණන් වහන්සේගේ ධර්මයෙන් බැහැරවෙන්නෙ නැහැ. ඔබ ලෝකය දැකල කම්පාවෙන්නෙ නැහැ. ඉපදීම තිබුණ නම් දුක තිබෙනවා. ඒ දුක නේද අපි අත්විඳින්නේ. මනුෂ්‍යයා තෙරුවන් කෙරෙහි සද්ධාවෙන් ශීලයෙන් ඒවායේ අර්ථයෙන් ඈත්වෙනවිට ඒ හේතුවෙනුයි ආයුෂය පිරිහීමට පත්වෙන්නේ. එහෙමනම් අපි පිළිගන්න ඕනේ අපි තුළින් ඉහත අර්ථයන් අර්ථවත්ව ක්‍රියාත්මක නොවන බව. සමාජය තුළින් ඇසෙන්නා වූ ආදරයේ විරහවේ හඬ, ළමා තරුණ පිරිස් සීමාවන් ඉක්මවා චර්යාවන්ට යොමුවීමේ හඬ, වැඩිහිටියන් මෝස්තරකරණයන්ට යොමුවීමේ ප්‍රවණතාවය යනු ආයුෂ පිරිහීමත් සමඟ ලෝකය තුළ ඇතිවන විකෘතීන්ය. මේවා හේතුඵල ධර්මයන්ය. හේතුව ලෝකයා ධර්මයෙන් ඈත්වීමයි. ශීලයට වටිනාකමක් නොදෙන ජනතාවක් බිහිවීමයි.

මෙය බෞද්ධ ජනතාවට පමණක් වන අනතුරක් නොවේ. දුශ්ශීලභාවය නිසා මුළු ලෝකයාම මුහුණ දෙන අනතුරකි. දැන් අපිට මේ ධර්මතාවයන් නිවැරදි කරගන්න බැහැ. මිනිසා විසින් සිදුකරන අකුසල් බහුල බැවින් ඒවා විපාක දීමට සුදුසු ලෝකයක් අපි ඉදිරිපිට ඇතිවෙන්නේ. කිරිසප්පයාගේ පටන් මනුෂ්‍යයා කයින්, වචනයෙන්, මනසින් සිදුකරගන්නා වූ අකුසල් කන්දරාව කොතෙක්ද? දරුවෙක්

දරුගැබේ සිටියදීත්, දරුවා ළදරු පාසලට, පාසලට යාමේදීත් දරුවා රැකියාවට, විවාහයට, විවාහයෙන් අනතුරුව දරුමුණුබුරන් බලාගැනීම දක්වා ලෝභ, ද්වේශ, මෝහ කියන අකුසලයන් කොතෙක් ඔබ අතින් සිද්ධවෙනවාද? සමාජය තුළ තිබෙන තරඟකාරීත්වය නිසාම දරුවෙක් නිසා දෙමාපියන්ට, දෙමාපියන් නිසා දරුවෙක්ට සැනසෙන්න පුළුවන් ලෝකයක් ඉදිරියේදී බිහිවෙයිද? මෙය අසුභවාදීව ඍණාත්මකව ලෝකය දකිනවා නොවේ. මෝහයෙන් තොරව සතියෙන් සිහියෙන් ලෝකය දැකීමේ ක්‍රමයයි මෙහි සටහන් කරන්නේ.

සමහර පිංවතුන්ලා දුක විඳිනවා. ඒත් දුක හෙළිකරගන්න, විවෘතකර දකින්න කැමති නැහැ. ඊට එකම හේතුව අකුසල් විපාකවල බලවත්භාවයයි. අනතුරෙන් මිදෙන දිශාවට යන්න ඉඩදෙන්නෙ නැහැ. අනතුරුවලට කැමත්තෙන් බැසගන්නවා. රටේ ලෝකයේ සිදුවෙන සිදුවීම් දැකලා බිය ඇතිකරගන්න. එතනදි තමයි ඔබ දුක දැක්කා, දුක හඳුනාගත්තා වෙන්නේ. දුක දුකක් බව හඳුනානොගෙන අපිට බැහැ දුකෙන් මිදෙන දිශාවට යන්න. එක තත්පරයක්වත් සතුටුවෙලා බලන්න පුළුවන් ලෝකයක් නොවේ අපි ඉදිරිපිට තිබෙන්නේ. කෙටි ආශ්වාද සතුටු සිතින් පිළිගත්තොත් දීර්ඝ වූ ආදීනවයන් පසුපසින් එන බව දකින්න. වර්තමානයට වඩා අනාගත ලෝකය විනාශකාරී ලෝකයක් වෙනවා. මිනිසා ශීලයෙන් පිරිහෙන්න පිරිහෙන්න විවේකීව යමක් සිතීමේ ශක්තිය මනුෂ්‍යයාට නැතිව යනවා. පිංවත් ඔබ කලබල නොවී විවේකයෙන් ලෝකය දකින්න. කලබලකාරීබව සහ ඉක්මන්කාරී බව ආශ්වාදයේම නිවුන් දරුවෝය. ඔවුන් හුරුබුහුටිය, දඟකාරය. එහෙත් ආදීනවය අපෙන් වසන්කර දුකෙන් අපිව මුලාවට පත්කරයි.

නිස්සරණය අතේ දුරින් තිබියදීම විවේකීව, සිහිබුද්ධියෙන්, ඉවසීමෙන් එම කෙටිදුර පියමං නොකොට කෙලෙස් පිරිණු ලෝකයාගෙන්, මාරයාගෙන් ලකුණු ප්‍රශංසා බලාපොරොත්තුවෙන් අපි ගිහි ජීවිතයේදීද, පැවිදි ජීවිතයේදීද, පැවිදි වෙද්දීද ඉක්මන්කාරී වුණොත් ධර්ම විනය ඉක්මවා කටයුතු කළොත් එය කාමයන් උදෙසා ආශ්වාදයක් වනවා විනා නිස්සරණය උදෙසා මාර්ගයක් නම් නොවන්නේය. අපි වීරවරයන් විය යුත්තේ තරඟය අවසානයේදීය. තරඟය ආරම්භයේදීම වීරයන් වීමට ගියහොත් ඒ 'අධි බලාපොරොත්තු'

සහ නොඉවසීම විසින්ම අපගේ ලැබිය හැකි ජයග්‍රහණයන් සහ දක්ෂතාවයන් මරා දමනු ඇත.

සැබවින්ම ඔබලා දක්ෂයන්ය. අදක්ෂයන්ට එම දක්ෂභාවය විනාශකර දැමීමට ඉඩ නොදීමට පිංවත් ඔබතුමන්ලා වගබලා ගත යුතුය. අදක්ෂයාද දක්ෂයෙක් බවට පත්කරගත හැක්කේ එවැනි ආදර්ශයන්ගෙන්ය. අප තුළ දක්ෂභාවය සැඟවී තිබුණද අප සියල්ලෝම මුලා වූ සතත්වයන්ය. අපි අතර ඇති එකම වෙනස මුලාවේ අඩු වැඩිභාවය පමණි. එහෙයින් කිසිවෙකුටවත් වරද පැටවීම නොකළ යුතුය. වැරදි කරන ලෝකය කැඩපතක් කරගෙන ඔබ ඔබේ වැරදි හඳුනාගෙන නිවැරදි විය යුතුය. ලෝකය විවේකීව නිවැරදිව හඳුනාගතහොත් ඔබ ලෝකයට රැවටෙන්නේ නැත. එතෙක් ඔබ ලෝකය රවට්ටන්නේය. අවසානයේ අප සියල්ලෝම රැවටී ඇත්තෙමු.

ඔබ නිරතුරුවම සිතත් එක්ක කථාකරන්න. සිතත් එක්ක තර්ක කරන්න. කුමක් ගැනද කථාකරන්නේ දුක ගැන, දුකෙන් මිදීම ගැන.

සැපය ඔබෙන් දුරස්කරන සැබෑම සතුරා තෘෂ්ණාව හඳුනාගන්න. කාමයන්ට කැමති සිත ආශ්වාදයම සොයන සිත සතුරෙක් ලෙස දකින්න. ඇසෙන් ලෝකය ඈත් කරන්න. කනෙන් ලෝකය ඈත් කරන්න. මනසින් සිතුවිලි ඈත් කරන්න. මේ ඔබෙන් ඈත්වූයේ තෘෂ්ණාවයි. ඔබව වීරයෙක් කරන තෘෂ්ණාව ඈත් කරන්න. එවිට ඔබට පුළුවන් නිහතමානීත්වයේ පිහිටෙන්, පීඩාවකින් තොරව ලෝකය ඉදිරියේ දෙවෙනි තැනට වැටෙන්න. දැන් තමයි මොනම තරඟයක් වුව ඇරඹීමට හොඳම වෙලාව. හැබැයි මෙතනදී කතාකරන්නේ භවයෙන් එතෙරවීමේ තරඟය ගැන. තෘෂ්ණාවෙන් බැඳී යන කල, ආශ්වාදය උදෙසාම ඇදීයන සිත හොඳින් හඳුනාගන්න. එවිට අපිට පුළුවන් වීරයෙක් නොවී ජයග්‍රාහකයෙක් වෙන්න. එතෙක් අපි ජයග්‍රහණයක් නොලැබූ වීරයන් වනු ඇත.

ඉක්මන් නොවී පිංවත් ඔබ ළඟ දකින්න. ඉක්මන් තීරණ දුකෙන් දුකටමයි අපිව පත්කරන්නේ. රූපයන් කෙරෙහි ඇතිකරගන්නා තෘෂ්ණාවේ තරමට අවිවේකය වැඩිවෙනවා. මොහොතක් විවේකීව සිතන්න ඔබ ඔබට අනුකම්පා කරගන්න. ඔබ මේ හම්බ කරන්නේ

කාටද? ඔබ මේ වෙහෙසෙන්නේ කවුරුන් උදෙසාද? හෙට උදේට ඔබට කුමක්වෙයිද කියන සහතිකය තිබෙනවාද? සංස්කාර හේතුවෙන් සකස්වුණා වූ විඤ්ඤාණය නැමති 'කොක්කේ' එල්ලා ඇති රූපයක් මේක. සංස්කාර හේතුවෙන්ම කොක්ක ප්‍රතික්‍රියා දක්වුව තැනදී රූපය වැටෙන්නේ මහ පොළවට. ඊට වඩා දෙයක් මෙතැන නැහැ. මෙහෙම සිතීම ජීවිතයෙන් පලායාමක් නොවේ. පලායන ජීවිතය සැබෑම අරමුණක් උදෙසා පෙලගැස්වීමකි. මේ ගැන සිතන්න විවේකී මනසක් තිබීම අවශ්‍යයි.

සිත විවේකයට කැමති නැහැ. අනිත්‍ය අරමුණක්, ධර්ම අරමුණක් මෙනෙහි කරන්න සිත මැලිකරනවා. ඒ නිසයි ගිහිපැවිදි අපි ගොඩාක් වගකීම් කරපින්නාගත්තේ. පන්සලකට ගියත් ආරණ්‍යයකට ගියත් සිල්සමාදන් වෙන්න ගියත් එතන යමක් හදන්න යමක් කරන්න තමයි වඩාත් කැමති. මේවා වැරදි කියලා කියනවා නොවේ. මීටත් වඩා නිවැරදි දෙයක් ධර්මය තුළ තිබෙනවාය කියන කාරණයයි මේ අවධාරණය කරන්නේ. සිත විවේකයට අකමැති වෙන්නේ පංචනීවරණයන්ට සිත කැමති නිසා. පංචනීවරණයන්මයි ලෝකයේ යථාර්ථය ඔබෙන් වසන්කර තබන්නේ. මේ සතුරාගේ ස්වභාවය ඔබව මුලාවට පත්කිරීමයි. පෞරුෂත්වය හේතුවෙන්, විශේෂ කුසලතා හේතුවෙන් සමහරවිට මේ මොකුත්ම නොමැතිව තමා තුළ අධිවිශ්වාසයක්, මාන්නයක් ගොඩනගා ගන්නවා. කාමච්ඡන්දයන් අපිට උපකාර -කරනවා අළුත් සැලසුම් ක්‍රමවේදයන් උපක්‍රම තුළින් ඔබව දැනුවත් කරන්න. මේවා ක්‍රියාත්මක භාවයට පත්කිරීමට යාමේදී ඇතිවන ජය පරාජයන්හිදී තමයි ඔබ පීඩාවට පත්වෙන්නේ. දැන් ඔබ අවිවේකී මනුෂ්‍යයෙක්. ඒ අවදානම තුළ සිටිමින්ම ධර්ම දේශනා අහනවා. පිංකම්කරනවා. භාවනාකරනවා. නමුත් ඒවායේ ප්‍රතිඵල ධනාත්මක නැහැ. නමුත් ඔබ කැමති නැහැ පිළිගන්න ඔබ දුර්වලයි කියලා. ඔබ කැමති කාමච්ඡන්දයන් තුළින්ම තෘප්තිමත්වන පරාසයක් තුළ ධර්මයන් ජීවිතයට එකතුකරගන්න. මෙතනදී අපි රැවටීමට ලක්වෙනවා. මොනදෙයක් ගැන අතීතයේ වර්තමානයේ සිතුවද ඒ හැම සිතුවිල්ලක්ම හිස්දෙයක් පමණක්මයි. සංස්කාර ගොඩක් තවත්

සංස්කාර ගොඩවල් නිසා තව තවත් සංස්කාර රැස්කරගන්නවා. සෑම විතර්කයක්ම භව ගමන දිග්කර ගන්නවා.

අවිද්‍යාව විසින් ගොඩනගා දුන් සම්මුති ලෝකය ඇස, කන, නාසය, දිව, මනස, කය සමඟයි බැඳී පවතින්නේ. ඇස, කන යනු හිස්දෙයක්ය යන්න අපි දකින්න දක්ෂවුවහොත් ඇසෙන් දකින සම්මුති ලෝකය හිස්දෙයක්ය යන්න ඔබ අවබෝධ කරගන්නවා. ඇසෙන් ලෝකය බැහැර කරමින් එතකොට ඇස ඇසේ ස්වභාවයෙන් පවතීවි. කනෙන් ලෝකය බැහැර කරන්න. එවිට කන කනේ ස්වභාවයෙන් පවතීවි. නාසය, දිව, මනස, කයෙන් ලෝකය බැහැර කරන්න. එවිට ඒවා ඒවායේ ස්වභාවයෙන් පවතීවි.දැන් ඔබ ලෝකයෙන් මිදුණ මනුෂ්‍යයෙක්. මෙතන තමයි නිදහස්ම තැන. ලෝකයාට බැඳී යන විටයි දුකට ඔබ බැඳී යන්නේ. මෙතැන අවබෝධයෙන් දකින්නයි ඔබ අප්‍රමාණව වෙහෙසෙන්නේ. නමුත් මේ පුංචි දෙය මහමෙරක් වගේ දැනෙන්නේ තෘෂ්ණාව කියන එකම කාරණය නිසාමයි. මෙන්න මේ තෘෂ්ණාව නිසාමයි දරුවන් සිතන්නේ තමන් වැඩිහිටියන්ය කියලා. වැඩිහිටියන් සිතන්නේ තවම තමන් තරුණයි කියලා. රූපය කෙරෙහි ඡන්ද රාගය නිසාම ජීවිතවලට වැඩි වටිනාකමක් අධි තක්සේරුවක් දෙනවා. මේ අධි වටිනාකම ජීවිතයට ලබාදෙන කිසිවෙකුටත් සුවපහසු මරණයකට නම් යන්න බැහැ. මොකද ඔහු මේ ජීවිතය මැරෙනවාය කියල දකින්න සිතන්න කැමති නැහැ. මරණය කියන්නේ අපි කතාකරනවා, සිනාවෙනවා වගේ ලෙහෙසි පහසු දෙයක්, විනෝදකාමී දෙයක් නොවෙයි. ශීලයෙන් අපි පරිපූර්ණ නැතිනම් මරණය කාටත් මරණ දණ්ඩණයක් බවට පත්වෙනවා. මරණය කියන්නේ තමන් මගේ කොට අල්ලාගත් සියල්ල අත්හැරදැමීමට සිදුවන අවස්ථාවක්. මාර සිත ඔබට භවයේ වැඩි දුකක් කරා ඇදදැමීමට අකුසල් සිත් මතුකර දක්වනවිට, ශීලයෙන් පරිපූර්ණ කෙනාමයි එම මාර අකුසල් සිත් යටපත්කර සුගතියට අවශ්‍ය කුසල් සිත් මතු කර ගැනීමට දක්ෂවෙන්නේ.

මනුෂ්‍යයෙකුගේ අවසාන මොහොත බොහෝම සංකීර්ණ අවස්ථාවක්. මරණයට ඔබ සූදානම් වී නොසිටියොත් ඔබ අසරණභාවයට පත්වෙනවා.

දායක මහත්මයෙක් සුනාමි අවස්ථාවේදී මුහුණදුන් සිද්ධියක් මෙහි සඳහන් වෙනවා. මෙම දායක මහත්මයා වෙද මහත්මයෙක්. මොහු පන්සල් යන, දානය පූජාකරන බෞද්ධ මහත්මයෙක්. වර්තමාන සමාජය 'බෞද්ධයා' කියල සඳහන් කරන තැන හිටපු මහත්මයෙක්. සුනාමි අවස්ථාවේදී සුනාමියට හසුවී විනාශ වූ දුම්රියේ සිටි මගියෙක්. දුම්රිය මුහුදු වතුරෙන් පිරිලා මොහු වතුරේ ගිලිණු වෙලාවේ මොහුට එකපාරටම සිතුවිලි සකස්වෙලා තිබෙන්නේ ධර්මය බොරුයි කියලා. බුදුරජාණන්වහන්සේගේ සරණක් නැහැයි කියලා. බලන්න මරණීය අභියෝගය ඉදිරියේදී ධර්මයත් ප්‍රතික්ෂේපකළා. මේකට තමයි අමූලිකා සද්ධාව කියන්නේ. ජීවිතය ඉදිරියේ අභියෝගයක සෙවනැල්ල, මරණයේ සෙවනැල්ල වැටෙනවිට ධර්මයත් බුදුරජාණන් වහන්සේවත් ප්‍රතික්ෂේප කරනවා. මෝහය මුසු සද්ධාව, මුල් ශක්තිමත් නොවූ සද්ධාව අභියෝග ඉදිරියේ වෙනස්වෙනවා. ඒකයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ සද්ධාව කියන කාරණය මේ ලෝකයේ ශ්‍රේෂ්ඨම ධනයයි කියලා. තෙරුවන් කෙරෙහි ගුණයන් දැන පැහැදෙන ආකාරවතී සද්ධාව කවදාකවත් ඔබව මුලාකරන්නේ නැහැ. ඔබ තුළින් වෙනස්වෙන්නෙ නැහැ. එම පිංවත් වෙද මහත්මයා කියනවා දෙවැනි රළ පහරට ඔහුව යටවුණ වෙලාවේ අතීතයේ සිදු වූ සිදුවීම් වේගයෙන් සිතට ගලාගෙන පැමිණියා කියලා. අතීතයේ තමා සමග රණ්ඩුවුණ මිනිස්සු තමා කරගත් ලෝභ, ද්වේශ, මෝහ අකුසල් මැවී පෙනෙන්නට පටන් අරගෙන. බලන්න පළමුව මුහුදු රළට යටවුණ වෙලාවේ එම අභියෝගය ඉදිරියේ සද්ධාව අහිමිකරගත්තා. දෙවැනි රළ පහරෙදි සද්ධාව අහිමිකරගැනීම නිසාම සකස් වූ මිථ්‍යාදෘෂ්ඨිකභාවය නිසාම අකුසල් සිත්, ලෝභ, ද්වේශ, මෝහ සිත් සකස්වෙන්න පටන් ගත්තා. නමුත් මොකක්දෝ වාසනාවකට එම වෙදමහත්මයා ජීවිතය බේරාගත්තා. ඔහුම කියනවා ඒ වෙලාවේ මගේ ජීවිතය නැතිවුණා නම් මහා දුකකටයි තමා ඇදවැටෙන්නෙ කියලා. වර්තමානයේ මේ වෙදමහත්මයා අමූලිකා සද්ධාවේත්, ආකාරවතී සද්ධාවේත් වෙනස හොඳින් හඳුනාගත් මහත්මයෙක්. නමුත් අතීතයේ ඔහුට තිබී තිබුණේ තෙරුවන්ගේ ගුණයන් හොඳින් දැන ඇතිකරගත් ආකාරවතී සද්ධාව නොව අමූලිකා සද්ධාවයි. මේ ගැන පිංවත් ඔබ හොඳින් අවධානය

යොමුකරන්න. තෙරුවන් කෙරෙහි සද්ධාව තුළ නොපිහිටියොත් මිථ්‍යාදෘෂ්ඨිකභාවයමයි උරුමවෙන්නේ.

එම නිසා තමා තමාවම රවටාගැනීමේ සංසාර බිය දැකලා, ලෝකය පත් වීගෙන එන විකෘතිභාවය දැකලා එම ව්‍යසනයෙන් මිදීම උදෙසාම තෙරුවන්ගේ ගුණයන් ඥානයන් හොඳින් දැන පැහැදීමෙන් ඇතිකරගන්නා සද්ධාවයි පිංවත් ඔබව සැපයට ඔසවා තබන්නේ. මහා වේගයකින් මනුෂ්‍ය ආයුෂ හීනභාවයට පත්වෙමින් විකෘතිභාවයෙන් යුත් පරිසරයක් ලෝකය තුළ ගොඩනැගෙන මෙවන් මොහොතක තරුණ වැඩිහිටි සැවොම සද්ධර්මය තුළින්ම ජීවිතයට සැනසීම සොයන්න උනන්දු වූවොත් කෙටි ආශ්වාදයක් උදෙසා අත්විඳින දීර්ඝ කාලීන ආදීනවයන් වෙනුවට කාමයන්ගේ නිස්සරණය දෙසටම පියවර තැබීමට ඔබට හැකිවනු ඇත. මරණ බියෙන් තොර මරණයක හිමිකරුවෙක් විය හැකිය. එසේ නොවුණහොත් ඔබේ මරණයද මරණ දඬුවමක්ම වනු ඇත. රජයන්හි අවිහිංසක ප්‍රතිපත්තීන් නිසා මරණීය දණ්ඩනය රටේ නීති පද්ධතියෙන් ඉවත් කළද ඔබ වැරදි කරනවා නම් ධර්මයේ නීතිය තුළින් මරණය දඬුවමක්ම වනු ඇත. මරණයට බිය ඇතිකරගන්න. බියෙන් තොර මරණයක් උදෙසා සද්ධර්මය ජීවිතයකර ගන්න. වර්තමාන සමාජයේ මිනිසුන් මැරෙන මොහොතේ සමහරු අසිහියෙන් මැරෙන්නේ. තවත් සමහරු අකාරුණිකව මැරෙන්නේ. තවත් සමහරු කායිකව, මානසිකව මහා පීඩාවන්ට පත්වෙමින් මැරෙන්නේ. පිංවත් ඔබ මේවා කමටහනක් කරගන්න. හඬමින් මෙලොවට බිහිවුණ ඔබට පුළුවන්නම් සිනාසෙමින් සාදුකාරදෙමින් මියයන්න. හේතුඵලධර්මයන් නිසා ඔබ ඊළඟට ලබන ජීවිතය සතුටෙන්, සිනාසෙමින්, සාදුකාරදෙමින්මයි උපත ලබන්නේ. මන්ද ඔබ මව් කුසකට බැසගැනීමෙන් තොරවම ඕපපාතිකව සශ්‍රීක දෙවියන් අතර මාර්ගඵලලාභී දෙවියන් අතරම උපත ලබන හෙයිනි. දණ්ඩනයෙන් තොර මරණයක් උදෙසාත්, හැඬීමෙන් තොර උපතක් උදෙසාත් පිංවත් ඔබ වහා වහා සද්ධර්මය තුළට පෙළගැසෙන්න.

ගුරුකමේ රඟ...

කලෙක භික්ෂුව මනුෂ්‍ය වාසයෙන් මඳක් ඈතින් වූ වැසි වනාන්තර ලක්ෂණ සහිත කුඩා ආරණ්‍යයක වැඩසිටිය. භික්ෂුව මෙම කුටියට වැඩම කරලා තවම සතියයි ගතවුණේ. මෙම කුඩා ආරණ්‍යයේ මාස 15 කින් කිසිවෙක් වැඩහිඳ නැහැ. පාළුවට ගිහින් තිබුණ ස්ථානයක්. ඉහත කාලය තුළ එක ස්වාමීන්වහන්සේ නමක් සති දෙකක් පමණ වැඩහිඳ ඉවත්ව ගිහින් තිබෙනවා. මීට මාස පහළවකට පෙරාතුව මෙහි තනිවම වැඩසිටි වයෝවෘද්ධ ස්වාමීන් වහන්සේ අපවත්වීම නිසයි මේ ආරණ්‍යය පාළුවට ගිහින් තිබෙන්නේ. අපවත්වීමට පෙර උන්වහන්සේ වසර දහනවයක් හුදකලාව මෙහි වැඩහිඳ තිබෙනවා. නේවාසික කැපකරුවෙක්වත් නොමැතිව, කැලයේ සැබෑම ආරණ්‍යය ලක්ෂණ සහිත හුදකලාව රජයන, කුඩැල්ලන් ගහණ පරිසරයක මෙම ආරණ්‍යය පිහිටියත් එහි දීර්ඝ කාලයක් වැඩසිටි ස්වාමීන් වහන්සේ ගුරුකම්, යන්ත්‍ර මන්ත්‍ර, තෙල් බෙහෙත් මේවා තමයි කරලා තිබෙන්නේ. භික්ෂුවකට අගෞරව කරනවා නොවේ. යම් පිංවතෙක් එහෙම හිතනවානම් මට සමාව අවසර ලැබෙන්න ඕනේ. මෙවැනි ඔබට පාඩමකට ගත හැකි සිද්ධියක් ඔබ හමුවේ තබන්නේ ඔබගේ යහපත පිණිසයි. ජීවතුන් අතර නොමැත. කිසිවෙකුට අගෞරව කිරීමට නොවේ. මෙවැනි සිදුවීම් වසන් කළහොත් එය ජීවත්ව සිටින අයට කරන අගෞරවයක් වනවා ඇත.

මෙම භික්ෂුවට මාසික සලාක දානය ගමේ දායක පවුල් උදේම ආරණ්‍යයට ගෙන ගිහින් පුජාකරලා තිබෙනවා. බොහෝම දුරබැහැරව සිට යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් සඳහා ජනතාව මෙහි පැමිණ තිබෙනවා. වසර දහනවයක් තුළ මේ භික්ෂුව මෙහි තනිවම වැඩහිඳලා

තිබෙන්නේ කිසිවෙකුට මෙම භික්ෂුව සමග දීර්ඝව කටයුතු කිරීමට නොහැකි කේන්ති යන ස්වභාවයක් තිබෙන නිසා. මේ හේතුවෙන් ශිෂ්‍යයෙක් කැපකරුවෙක් හිඳ නැහැ. මෙහෙම කටයුතු කරලා තමයි අපවත්වෙලා තිබෙන්නේ. අපවත් වුණාට පස්සේ දායක පිරිස කුඩා කුටියේ අල්මාරිය විවෘතකරලා තිබෙනවා. එහි පාවිච්චි නොකළ සිවුරු 46 ක් තිබිලා තිබෙනවා. කල් ඉකුත් වෙච්ච බිස්කට් පැකට්, තේ කොල පැකට් තිබිල තිබෙනවා. ඉහත සියල්ලෙන් කියවෙන්නේ ක්‍රෝධය, වෛරය සහිත ලෝභී චරිතයක ස්වභාවය තිබුණ බවයි. දැන් ඉතින් ඔය කථාව ඔතනින් ඉවරයි. මේ කථාවේ දෙවැනි කොටස පටන් ගන්නේ එම භික්ෂුව අපවත් වී අවුරුද්දයි මාස තුනකට පසුව පාළුවට ගිය ආරණ්‍යයට භික්ෂුව වැඩමකළාට පසුවයි. ඒ කථාව කීමට පෙරාතුව භික්ෂුව ලොව්තුරා බුදුරජාණන් වහන්සේ උදෙසා අද වෙසක් පුරපසළොස්වක පෝය දිනයේ කළ උතුම් පූජාවක් ගැන සටහන් කරනවා. මෙය අහම්බෙන් කළ පූජාවක්. ඔබ තුළද මේ දක්ෂභාවයන් තිබෙනවා. ඒ නිසයි එය මෙහි සටහන් කරන්නේ. අද වෙසක් පොහොය දවස. අද දවසේ ගෞරවනීය ස්වාමීන් වහන්සේලා මොනතරම් ගිහි ඔබගේ ධර්මාවබෝධය සැනසීම උදෙසා ධර්ම සාකච්ඡා, මල් පහන්, සම්බුද්ධ පුජා, ගිහි පිංවතුන් මොනතරම් වෙසක් සැරසිලි, තොරණ්, දන්සැල්, පහන්කූඩු, භක්තිගීත, මේවා කරලා බොහෝම ගෞරවයෙන් ශ්‍රද්ධාවෙන් බුදුරජාණන් වහන්සේව සිහිපත් කරනවාද?, වන්දනාකරනවාද? මේ සියල්ල පිංවත් ඔබ කළ යුතුමයි. මේවා තුළින් ඔබ සැමදෙනා තුළම ඇතිවෙන්නේ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවක්මයි. පුණ්‍ය සිතුවිලිමයි. එහෙත් මේ සටහන වෙසක් දිනයේ භික්ෂුව අහම්බෙන් ලොව්තුරා බුදුසමිඳුන්ට කළ පුජාවක්. වෙසක් දිනයේ ලැබූ අත්දැකීමක්. වෙසක් දිනයේ හිමිදිරියේ ගමට වැඩමකර පිණ්ඩපාතය කරගෙන නැවත ආරණ්‍යයට වඩිනවිට කැලය මැද කළු ගලක් මත නැවතී සිටින භික්ෂුවට මෙහෙම සිතුණා. අද වෙසක් පොහොය දවස භික්ෂුව ලබන සැනසිල්ල සංහිඳීම ලෝකයාට දායාද කළ සම්මා සම්බුදු රජාණන් වහන්සේගේ තෙමඟුල සිදුවූ උතුම් දිනය. මේ මොහොතේ ලොව්තුරා බුදුසමිඳුන්ට මේ ආකාරයේ පූජාවක් සිදුකළා. ඊයේ දහවල පටන් ආහාරයක් ගිලන්පසක් නොමැතිව හිමිදිරියේ පැන් වීදුරුවක්

වළඳා කිලෝ මීටර් තුනක් පමණ වඩිමින් පිණ්ඩපාතය සොයා ගොස් එන මේ ගමනේදී භික්ෂුව අත්දකින වෙහෙස, තෙහෙට්ටුව සහිත මේ ජීවිතය සම්මා සම්බුද්ධ ඥානය උදෙසා පූජාවේවා. මේ වෙහෙස තෙහෙට්ටුව තුළ තිබෙන්නේ තෘප්තියක් නොඇලීමක්. මේ පූජාව කරනකොටම භික්ෂුවට මහා ජවයක් ආවා. වෙහෙස තෙහෙට්ටුව සංසිඳුණා. දහදියෙන් තෙතබරිත සිවුර දරාගෙන ඉතිරි දුර ගෙවාගෙන ආරණ්‍යයට පැමිණියා. මේ පැමිණි ගමනේදී මේ දෙපට චීවරය තෙතබරිත වන්නට දාඩිය බිඳු කීදාහක් ශරීරයෙන් පිටවෙන්න ඇතිද? සැබෑ සම්බුදු ප්‍රතිපදාවේ යෙදීම උදෙසා ඉපදෙන මේ දහදිය බිඳු තරම් නෙළුම් මල්, සමන්පිච්ච මල්, රෝස මල් තව කොහින්ද? බුදු සමිඳුන්ට පුදන්නට. මේ ප්‍රතිපදාවේ යෙදීම උදෙසා ඉපදෙන සෑම දහදිය බිඳුවක්ම ලොව්තුරා බුද්ධගුණයට පූජාවේවා කියලා දෙවැනි පූජාව කළා.

වෙහෙස නිසා තෙහෙට්ටුව නිසා පිණ්ඩපාත ගමන නිසා හෘදවස්තුවෙන් නැගෙන ඩිග්, ඩිග් යන හෘද ස්පන්දනයේ හඬ මොනතරම් වේගවත්ද? මේ හදවතින් නැගෙන හඬට වඩා ''ශබ්ද පූජාවක්'' තවත් කොහින්ද? බුදුසමිඳුන් පුදන්නට. සණ්ටාර දසදහසක් නාදකළද, හේවිසි, මඟුල් බෙර දසදහසක් නාදකළද එම භික්ෂුවකගේ සැබෑම මධ්‍යම ප්‍රතිපදාවට කැපවීම උදෙසා හදවතින් නැඟෙන හඬ ඒ සියළු ශබ්ද පූජා ඉක්මවා යන්නකි. භික්ෂුවගේ හෘදස්පන්දනයෙන් නැඟෙන ඩිග් ඩිග් හඬ සම්මා සම්බුද්ධ ඥානයට උත්තම ''ශබ්ද පූජාවක්'' වේවා. තෙවැනි පූජාව කළා.

මෙවැනි පිණ්ඩපාත ගමනකදී ගෙන් ගෙට යමින් තේ දළු කඩන දුප්පත් මිනිසුන් පූජාකරන බත් ව්‍යංජන පිඬ පිඬ ලබමින් ඒ අයට පිං අනුමෝදන් කරනවිට ශරීරයේ රෝම කූපයක් රෝම කූපයක් පාසා කුල්මත් කරන මෛත්‍රිය තරම් තවත් ආලෝකයක් කොහින්ද සම්මා සම්බුදු ඥානයට පූජා කරන්න. මේ ''මෛත්‍රියේ ආලෝක පූජාව'' ලොව්තුරා සම්මා සම්බුද්ධ ඥානයට පූජා වේවා. අද වැනි වෙසක් දවසක අසූහාරදාහේ පහන් පූජාවකින් දෙවියන් මනුෂ්‍යයින් සතුටු කළ හැකිය. සසර සැප ලැබිය හැකිය. නමුත් එය බුදු සමිඳුන්ට කරනා සැබෑ

පූජාවක් විය නොහැක. අද මේ වෙසක් දිනයේ හිමිදිරියේ භික්ෂුවක් ලොව්තුරා බුදු සමිඳුන්ට කල පූජාව මේ ලෙසින් කරන්නට ඔබත් උත්සාහ ගන්න. සමහර විට ඔබද මෙසේ සැබෑලෙස ප්‍රතිපදාවේ යෙදී බුදු සමිඳුන් පුදන්නට ඇත. ඔබේ හෘදසාක්ෂියට තට්ටු කර බලන්න ඔබත් ඉන් එක් අයෙක්ද කියලා. එය එසේ නොවේ නම් එම පූජාව කරන්න ලබන වෙසක් පොහොය වෙනකම් ප්‍රමාදවෙන්න එපා. ඔබ එතෙක් ජීවත්වෙයිද මියයයිද කියන්න දන්නෙ නැති නිසා. ඉහත ප්‍රතිපදාවන්ගෙන් බුදු සමිඳුන් පිදුවොත් ඔබට දැනේවි ඔබ බුදු සමිඳුන් ගිය මග යන බුදුපුතෙක්ය කියලා. මේ තුන් ලෝකයේ තවත් කුමකින් නම් මෙවැනි ආත්ම තෘප්තියක් ලබන්නද? මේ බුද්ධෝත්පාද කාලයේ බෞද්ධයෙක් ලෙස උපත ලැබුවේ පෙර ජීවිතයේ තෙරුවන් සරණ ගිය නිසාමය. එසේ නොවුණානම් ඔබ මේ ජීවිතයේ උපත ලබන්නේ අන්‍ය ආගමික මවකගේ කුසක වීමට තිබිණ. ඒ තෙරුවන්ගේ ආශ්චර්ය නොදන්නාතාක් කල් අපි බුදු සමිඳුන්ට ණයකරුවන්මය.

ඉහත සටහන භික්ෂුව සැලසුම් කිරීමකින් තොරව පිණ්ඩපාත ගමනේදී කැලය මැද ගල් පඩියක් මත වෙහෙස නිවීමට නැවතී සිටියදී ඇති වූ අදහසකි. එම භික්ෂුව සිදුකල ලොව්තුරා පූජාව ඔබටත් දැන ගැනීමට සටහන් කළෙමි.

දැන් නැවතත් කථාවේ මුල් කොටසට යමු. භික්ෂුව මේ ආරණ්‍යයට පැමිණ තුන්වන දිනයේදී රාත්‍රී 10.00 ට පමණ සමාධියෙන් පසුවෙනවිට භික්ෂුව ඉදිරියේ බියකරු උල් නිකටක් සහිත විරූපී සිහින් දිග උල් දත් සහිත ප්‍රේතයෙක් දිස්විය. මේ ප්‍රේතයා වියරුවෙන් දැඩි වේගයෙන් දත්මිටි කමින් රෞද්‍ර ලෙස බලමින් භික්ෂුව ඉදිරියේ සිටියේය. දත් මිටි කන ප්‍රේතයා දුටුවිට දරුවෝ ඔබ කරලා තිබෙන පව මදිවටද තවත් පව් කරගහන්නේ. යන්න පුතේ යන්න කියලා භික්ෂුව ආමන්ත්‍රණය කළා. ප්‍රේතයා නොපෙනී ගියා. විනාඩි තුනක් පමණ ප්‍රේතයා දත්මිටි කමින් සිටියා. මෙතනින් මේ සිද්ධිය ඉවරයි. තවත් සතියකින් පමණ රාත්‍රියක මේ ප්‍රේතයා නැවත දර්ශනය වුණා. හැබැයි පෙර දැක්මේදී තිබූ රෞද්‍ර දත්මිටි කෑම, බියකරු පෙනුම නැතිව උල් දත් සහිත මුඛය අයාගෙන භික්ෂුව දෙස බලා සිට විනාඩි දෙකකින් පමණ නොපෙනී

ගියා. පෙර සතියේ දැක්කාට වඩා ප්‍රේතයා සන්සුන් වී ඇති ස්වභාවයක් දුටුවා. මේ සිද්ධියත් මෙතනින් ඉවරයි.

තවත් දින කිහිපයක් ගතවන විට රාත්‍රියේ භික්ෂුව සමාධියෙන් පසුවන විට භික්ෂුව ඉදිරියට අඩි හයක් පමණ උස හැඩි දැඩි කළුම කළු ප්‍රේතයෙක් පෙනී සිටියා. මේ ප්‍රේතයා කර රවුම් දණහිස දක්වා දිග පැරණි ඉස්කෝල මහත්වරු අඳින ආර්යසිංහල ඇඳුමක් සුදු සරමක් සමඟ පැළඳගෙන සිටියේ. මොහු ප්‍රතාපවත් ප්‍රේතයෙක්. ස්වරූපයෙන් හරියට උස, මහත, කළු පැරණි ගුරුමහත්මයෙක් වගේමයි. ඇස්දෙක හරි ලොකුයි. ඇසිපිය ගහන්නේ නැහැ. මොහු ඇස් ලොකුකරමින් උරහිස් දෙක මාරුවෙන් මාරුවට උස් පහත් කරමින් බෙල්ල දෙපැත්තට සොලවමින් නිතර ගැස්සෙන ස්වභාවයෙන් භික්ෂුව දෙස බලාසිටියා. මේ ප්‍රේතයාගේ ස්වභාවය අනුව මන්ද බුද්ධික ප්‍රේතයෙක්. ප්‍රේතයාගේ සෑම ඉරියව්වකම මන්ද බුද්ධික ස්වභාවයක් තිබුණා. අසරණ බැගෑපත් ස්වභාවයක් දැක්වූවා. භික්ෂුව මේ ප්‍රේතයාට පිංදුන්නා. විනාඩි තුනක් පමණ දර්ශනය වී ප්‍රේතයා නොපෙනී ගියා. මේ සිද්ධියත් මෙතනින් ඉවරවුණා.

දැන් භික්ෂුවට ප්‍රශ්නයක්, අවස්ථා තුනකදී දර්ශනය වූ මේ ප්‍රේතයන් දෙදෙනා කවුද කියන එක. මේ වනවිට භික්ෂුව දැන සිටියේ නැහැ, වසර 19 ක් මෙහි වැඩසිට අපවත් වූ භික්ෂුව පිළිබඳව. එම භික්ෂුව කොහොම කෙනෙක්ද? ඇවතුම් පැවතුම් කෙසේද? කියලා. මොකද මේ ගමේ අය මේ ආරණ්‍යයට පැමිණියේ නැහැ. මිනිසුන් තුළද අමනුෂ්‍ය බියක් තිබෙන බව භික්ෂුවට දැනුණා. මෙහෙම වැඩ සිටිනවිට දිනක් ගමේ තරුණයන් දෙදෙනෙක් භික්ෂුව ගමට පිණ්ඩපාතය වැඩීමට පෙර හිමිදිරියෙම දානය රැගෙන කුටියට පැමිණියා. එම තරුණයන් දෙදෙනා ප්‍රකාශ කළේ, මෙම ආරණ්‍යයේ වසර 19 ක් වැඩසිටි භික්ෂුවගේ තොරතුරු තමයි මේ කථාවේ මුලින්ම සටහන් කළේ. වසර 19 ක්, කේන්ති යන ස්වභාවයෙන් ගුරුකම්, වෙදකම් කළ, ලෝභී ස්වභාවයක් තිබූ, අපවත්වූ භික්ෂුවගේ තොරතුරු එම තරුණයන් දෙදෙනා සඳහන් කරනවිට, භික්ෂුව නිසැකයෙන්ම සිතුවා, ඉහත සටහන් කළ පරිදි දත්මිටි කමින්, රෞද්‍ර ලෙස දර්ශනය වූ ප්‍රේතයා

වෙන කව්රුවත් නොව, ක්‍රෝධය වැඩූ, මෙම ස්ථානය තණ්හාවෙන් උපාදානය කරගත් ඒ අපවත් වූ භික්ෂුවම බව.

ගිහි පිංවතුන්ගේ උපස්ථාන ලබමින්, සිව්පසය ලබමින්, ගුරුකම් - වෙදකම් කරමින්, නිරතුරුවම කේන්තියන ස්වභාවයේ අයෙක් වූ මේ භික්ෂුව මරණින් මතු, එහිම නැවත ප්‍රේතයෙක් ලෙස උපත ලබා ඇතැයි භික්ෂුව අනුමාන කළා. මොහු වැනි වියරු ස්වභාවයේ ප්‍රේතයෙක් මෙහි සිටින නිසාමයි, මේ ස්ථානය අවුරුද්දයි මාස 3 ක් පාළුවට ගොස් තිබුණේ. මෙය සටහන් තබන භික්ෂුව ඉදිරියටද, මේ ප්‍රේතයා රෞද්‍ර ස්වභාවයෙන් පැමිණියේ භික්ෂුව බියගැන්වීමට විය හැකිය. එය ප්‍රේතයාගේ උපාදානයේ බලවත් බවයි. අසරණකමයි.

තමා වසර 19 ක් 'මගේ' කොටගෙන, ගහකොළ වවාගෙන, ඖසු උයන් තනාගෙන, තණ්හාවෙන්ද ක්‍රෝධය සහිතවද ගතකළ ජීවිතය නිසා සහ ඒ සියල්ල කෙරෙහි පැවැති ඡන්දරාගය නිසා ඉහත වියරු ප්‍රේත උපත සිදුවූවා විය හැකිය.

දෙවැනිව භික්ෂුව ඉදිරියට පැමිණි රෞද්‍ර භාවය අඩු, දමනය වූ ප්‍රේතයා මේ වියරු ස්වභාවයෙන් මිදුණේ වියරු ස්වභාවයෙන් යුත් ප්‍රථම දර්ශනයේ දුටු ප්‍රේතයාට සහ අපවත් වූ භික්ෂුවට නිරතුරුවම පිං අනුමෝදන් කළ නිසා විය යුතුය. ඉහත වියරු ප්‍රේතයා දර්ශනය වූවාට පසුව භික්ෂුව එම ප්‍රේතයා කෙරෙහි අනුකම්පාවෙන් තම දුක්ඛිත ප්‍රේත ආත්මයෙන් යම් සහනයක් ලබාගැනීම සඳහා ප්‍රේත ජීවිතය දියුණුකර ගැනීම සඳහා නිරතුරුවම පිං අනුමෝදන් කළා. මෙම ආරණ්‍යය පිහිටි ගම්මානය තේ දළු නෙලන, වගාකරන ජනතාව බහුල ගමකි. කවදාකවත් දානයක් දීමට අපහසු පිරිස් ද මෙහි සිටියහ. මෙවැනි පිණ්ඩපාත ගමනකදී භික්ෂුව තුළ ඇතිවන මෛත්‍රීය ශක්තිය අති ප්‍රබලය. ගිහි පිංවතුන්ගේද ශ්‍රද්ධාව අධිකය. මේ දෙකම එකතුවීමෙන් රැස්වෙන පින කුටියට ගිය විගස අපවත් වූ භික්ෂුව සහ වියරු ප්‍රේතයා අරමුණුකරගෙන අනුමෝදන් කළා. අවුරුද්දයි මාස තුනක් පාළුවට ගිය මෙම ආරණ්‍යය අමනුෂ්‍ය පීඩාවක් ඇතොත් එම අමනුෂ්‍යයින් සතුටුකර සංඝයාගේ පරිහරණයට සුදුසු ස්ථානයක් බවට පත්වීමට

භික්ෂුව මෙසේ ක්‍රියා කළහ. භික්ෂුව වඩන සැබෑ මධ්‍යම ප්‍රතිපදාව දෙස බලන්න. භික්ෂුවගේ අතහැරීමේ ශක්තිය දෙස බලන්න. ඒවා දකිමින් ඔබද ඔය නපුරු රෞද්‍ර ගති අතහරින්න. මේ පිං දැක සතුටුවෙන්න. මේ ප්‍රේතයා මනුෂ්‍ය ජීවිතයේදී පිං ගැන කුසල් ගැන දන්න අයෙක්. නමුත් ඒවා යටපත් වෙලා ක්‍රෝධය, වෛරය වගේම ස්ථානය පිළිබඳ තණ්හාව නිසාම. ගුරුකම් කිරීම නිසා ඇතිවන පලිගැනීමේ ස්වභාවය නිසාම මේ දරුණු ප්‍රේත තත්ත්වයට වැටෙන්න ඇත්තේ. නමුත් දිගටම භික්ෂුව එහි නේවාසිකව වැඩසිටිමින් භික්ෂුවගේ සරල මෛත්‍රී සහගත ඇවතුම් පැවතුම් දකිනවිට, පිං දෙනවිට ප්‍රේතයාට තමා අතීතයේ වඩපු යහපත් දේවල් මතුවෙන්න ඇති.ඒ නිසාමයි ප්‍රේතයා අදියර දෙකකදී උසස් භාවයන් ලබාගත්තේ.

දැන් අපි බලමු තුන්වැනිව සුදු ආරිය සිංහල ඇඳුමක් ඇඳපු, කළු, උස, මහත ප්‍රේතයා කවුද කියලා අනුමාන වශයෙන්. මුලින්ම දර්ශනය වූ රෞද්‍ර ප්‍රේතයා දෙවන වර බොහෝම දමනය වූ ස්වභාවයෙන් දර්ශනය වුණා. භික්ෂුව නැවත නැවත පිං දීම නිසා ප්‍රේත ස්වභාවය අදියරෙන් අදියර උසස් වී පිනෙන් ඉහළ ප්‍රේතයෙක් ලෙස සශ්‍රීක භාවය ලැබුවා. මේ සශ්‍රීක බව ලැබුව ප්‍රේතයා තමයි තුන්වනවරට දර්ශනය වූ ආරිය සිංහල ඇඳුම දමාගත් මන්ද බුද්ධික ප්‍රේතයා. මේ තුන් ආකාරයෙන් වරින් වර දර්ශනය වූයේ අන් කවුරුත් නොව වසර දහනවයක් ආරණ්‍යයේ සිට අපවත් වූ භික්ෂුව බවට අනුමාන කරනවා.

ඉහත සිද්ධිය හරහා මතුවන මේ කථාව ඔබට ගොඩාක් වටිනවා. ඇයි මේ ප්‍රේතයා පිං ගැනීමෙන් පසුවත් මන්දබුද්ධික ප්‍රේතයෙක් වුණේ කියලා. ඇයි මේ ප්‍රේතයා තද කළු පැහැති ශරීරයක් ලැබුවේ කියලා. අපවත්වුණ භික්ෂුව නිතර ගුරුකම් කිරීම නිසාත් ස්වභාවයෙන් පිහිටි කේන්ති යන ස්වභාවය නිසාත් ඇතිවුණ වෛරීබව, ක්‍රෝධය නිසාමයි. එහි අකුසල් විපාක නිසා මේ කළු පැහැය ලැබෙන්නේ. මේ වඩපු ක්‍රෝධය නිසාමයි මුල් අවස්ථාවේදී කිසිදු බියකින්, චකිතයකින් තොරව භික්ෂුව ඉදිරියට දත්මිටිකමින් වියරුවෙන් පැමිණෙන්න ශක්තිය ලැබුණේ.

ප්‍රේතයා මන්දබුද්ධික ප්‍රේතයෙක් වුණේ ඇයි? මේ කථාවේ ඔබට වැදගත්ම පාඩම ඇත්තේ මෙතනය. මේ ටික කියන්නයි මේ සටහන ඔබට ලිව්වේ. මියගිය භික්ෂුව වසර දහනවයක් පුරාවට කළේ ගුරුකම්, යන්ත්‍ර මන්ත්‍ර, වෙදකම් වැනි ලොව්තුරා බුදුරජාණන් වහන්සේ තිරස්චීන ධර්මය ලෙස ප්‍රතික්ෂේප කළ දේවල්මයි. මොහු මේවා කළේ උපසම්පදා භික්ෂුවක් ලෙස දායකයින්ගේ සද්ධාවෙන් දෙන සිව්පසය ලබමින්. මෙම අකුසල් කර්මයේ විපාකය හැටියටයි මන්ද බුද්ධික ප්‍රේත ස්වභාවය ලබන්නේ.

සමාජය දෙස හොඳින් දෑස්හැර බලන්න. මොනතරම් යන්ත්‍ර මන්ත්‍ර, ගුරුකම් ගිහිපැවිදි දෙපාර්ශවයම කරනවද? මිනිසුන් අතරට මේ බුදුරජාණන් වහන්සේ විසින් එපා කියන ලද තිරස්චීන ධර්මයන් පතුරවා හරිනවාද? ලොව්තුරා බුදුරජාණන් වහන්සේ යමක් එපා යයි දේශනා කළා නම් ඒ දේශනා කළේ හේතුවක් ඇතිවය. එයින් ඇතිවන ඵලය ගැන අවබෝධයෙන්ම දත් හෙයිනි. ප්‍රඥාවේ ආලෝකය වසා අවිද්‍යාවේ අඳුරෙන් ජනතාව අන්ධකිරීම හේතුවෙන් මරණින් මතු ලැබෙන ඵලය නම් මනුෂ්‍ය, ප්‍රේත, තිරිසන් ජීවිතයක් ලැබුවත් මන්ද බුද්ධිකව ඉපදීමයි. ඉහත මන්ද බුද්ධික ප්‍රේතයාද තම ප්‍රේත ජීවිතය උසස් තත්ත්වයට පත්වුවද මන්ද බුද්ධික ස්වභාවයක් ලැබුවේ අතීතයේ කළ ගුරුකම්, යන්ත්‍ර මන්ත්‍ර වල කර්ම විපාකයක් නිසා වීමට හොඳටම ඉඩකඩ ඇත. ප්‍රශ්නය ඇත්තේ මෙතනය. මොහු තමා විසින් කළ අකුසල කර්මයන්ට දුක් විඳීම සාධාරණය. මොහු නිසා තව කීදාහක් මෙම තිරස්චීන ධර්මයන් විශ්වාස කර ඒවා සරණගොස් ඇතිද? තම මරණින් මතු මන්ද බුද්ධික ජීවිතයක් ලබනවා සේම අනුනටද එම ස්වභාවය හිමිකරදීම අවාසනාවකි. වර්තමාන සමාජයේ වෛද්‍ය විද්‍යාව කොතෙක් දියුණු වුවද මන්ද බුද්ධික දරු උපත් වැඩිය. මෙවැනි දරුවන් නිසා දෙමාපියන් විඳින වේදනාවන්, සමාජ අපකීර්තිය අති විශාලය.

ඉහත සටහන කියවන ඔබට එය විශ්වාස නම් ඔබ කෙරෙහි අනුන් කෙරෙහි අනුකම්පාවෙන් මෙම තිරස්චීන ධර්මයන්ගෙන් ඈත්වෙන්න. මේවා විශ්වාස නොකරන්න. එකම විශ්වාසය, සරණ තෙරුවන් කෙරෙහි ඇතිකරගන්න. ඉන් තොර විශ්වාසයක් ඇතැයි නොසිතන්න.

අඳුනකට, අංජනමකට, ගුරුකමකට, කොඩිවිනයකට, ජීවම්කළ තෙලකට සරණයෑම යනු මතුභවයක ඔබ කැමත්තෙන්ම මන්ද බුද්ධික ජීවිතයක් ලැබීම බව හොඳින් වටහාගන්න. ඔබේම කැමත්තෙන් ඔබ මන්ද බුද්ධිකයෙක් නොවීමට ඉහත තිරස්චීන ධර්මයන්ට ඔබම වැට බඳින්න. ඔබ ප්‍රශ්න පීඩා දුක් කම්කටොළු වලින් දැවේ නම් තෙරුවන් කෙරෙහි විශ්වාසය තබමින් නිරතුරුවම ශීලයක පිහිටා එය ආරක්‍ෂා කරමින් දන් දෙමින් ලෝකයට මෛත්‍රිය වඩන්න. ඔබේ ජීවිතයේ ප්‍රශ්න ගැටළු වැඩිවන්න වැඩිවන්න ඉහත ධර්ම ප්‍රතිපදාවේ වැඩි වැඩියෙන් යෙදෙන්න. අකුසලය පැරදවිය හැක්කේ කුසලයෙන්ම බව සිතන්න. කුසල් ගොඩ වැඩිකරගෙන අකුසල් බෙලහීන කරගන්න. තමා දුක්විඳින්නේ තමාම සංසාරයේ කරනලද හපන්කම් නිසා බව සිතන්න. ප්‍රතිඵලය දුක නම් දුකට අයිතිදෙය නොකරන්න.

සාස්තර කියනු ලැබේ, යන්ත්‍ර මන්ත්‍ර, ගුරුකම්, අංජනම්, කොඩිවින, වශී ගුරුකම් බෝඩ් ගසාගෙන ඔබ එනතුරු ආදායම සොයා ගැනීමට බලා සිටින ''මන්ද බුද්ධිකයන් නිපදවන්නනන්ට'' ඔබ නොරැවටෙන්න. යමෙක් මේ වනවිටත් තමාගේ පවුලේ අයෙක් මන්දබුද්ධික ස්වභාවයෙන් පෙළේ නම් ඒ අයගේ සුවය පතා මේ තිරස්චීන ධර්මයන් පසුපස නොයන්න. තමාට මෙවැනි මන්දබුද්ධික භාවයක් ලැබුණේ පෙර භව වල මෙවැනි තිරස්චීන ධර්මයන් පසුපස යෑම නිසා බව සිතන්න. සුදුසුකම් ලත් වෛද්‍ය ප්‍රතිකාර සහ පිං දහම් වලම යෙදෙන්න. මෙසේ යෙදෙමින් තමා අතින් අතීත භවයන්හිදී කෙරෙන ලද ඉහත වැරදි ක්‍රියාවන්ට තමාම තමාගෙන් සමාව ගන්න. ඒවා කෙරෙහි ඇලීමට ගැටීමට නොයන්න. ඒවායේ ස්වභාවයන් ඒවාට ලෝකයේ පැවතීමට ඉඩහරින්න. ඔබ ඔබේ ස්වභාවයෙන් ජීවත්වෙන්න. ප්‍රඥාවේ ආලෝකය වසා දමන අවිද්‍යාවේ සිතුවිලි වලින් මිදෙන්න. ප්‍රඥාවේ ආලෝකය ලැබෙන සම්බුදු වදන්ම ජීවිතයට ළංකරගන්න. ලෝකයාට නොඇලී නොගැටී ලෝකයෙන් එතෙරවන්න. තණ්හාව, වෛරය, ක්‍රෝධය, ඔබ තුළින් වැඩෙන්නේ නම් මීළගට ඔබ ලබන උපතද තණ්හාවට, ක්‍රෝධයට, වෛරයටම අයිති උපතක් බව හොඳින් මෙනෙහි කරන්න. ඉහත රෞද්‍ර ප්‍රේතයා ඔබ දේවදූතයෙක් කරගන්න දක්‍ෂවෙන්න.

ප්‍රේතානුස්සතියද? දේවතානුස්සතියද?

වර්තමානයේ මනුෂ්‍යයාගේ ආයුෂ ප්‍රමාණය අවුරුදු 75 ක් පමණ වෙනවා. මේ කෙටි ආයු කාලය මනුෂ්‍යයෙක් ගෙවන්නේ මුලින්ම තමන්ගේ දෙමාපියන්ගේ ගෙදර. ආවාහ විවාහ වුණාට පස්සේ තමන්ගේ ගෙදරක. වැඩිමහළු වියට පත්වුණාම තමන්ගේ දරුවන්ගේ ගෙදරක. සමහරු ජීවිතකාලයම අනුනට අයිති කුලී ගෙදරක ජීවත්වෙනවා. තවත් සමහරු මහළු නිවාසයක්, වැඩිහිටි නිවාසයක් තම අවසාන කාලයේදී නිවස කරගන්නවා. මේ කොතැනක ජීවත්වුවද පිංවතුනි ඔබ මනුෂ්‍ය ජීවිතය වසර 75 ක් වැනි කෙටිකාලයක් තමයි ගතකරන්නේ. මේ කාලය කෙටිය කිව්වේ දිව්‍ය, බ්‍රහ්ම සතර අපාය සමග සසඳලා. ඉහත ලෝකවල ආයුෂ බලන විට මනුෂ්‍යයාගේ ආයුෂ හරිම අල්පයි. මේ මොහොතේ ලෝකයේ දියුණු අති නවීන විද්‍යාගාරවල විද්‍යාඥයින් බොහොම වෙහෙසෙනවා මනුෂ්‍යයාගේ ආයු කාලය වැඩිකරගැනීමට ක්‍රමවේදයක් සොයාගැනීමට. වැඩිපුර වසර පහක් දහයක් මනුෂ්‍ය ආයුෂ වැඩිකරදෙන්න. එහෙත් අවාසනාව කියන්නේ මේ විද්‍යාඥයින්ට සිතාගන්නවත් බැරි විදිහට ළමා, තරුණ, වැඩිහිටි මනුෂ්‍යයන් සිය ගණනින්, දස දහස් ගණනින් මාරාන්තික රෝග, ස්වභාවික විපත් වරින් වර මතුවෙමින් අසරණ ලෙස මරා දමනවා.

මේ වරින් වර මතුවෙන ස්වභාවික විපත්, වසංගත රෝග හමුවේ ඉහත විද්‍යාඥයින් හරිම අසරණයි. මේ අසරණභාවයට ඔවුන් පත්වෙන්නේ පොතපතේ දැනුමෙන් සියල්ල දැනගත්තත් ධර්මය නොදකින නිසාමය. මේ අයගේ ඇති අවිද්‍යාවේ පුළුල් දැනීම් සම්භාරය නිසා හිතනවා මනුෂ්‍යයෙක් යනු ජීව විද්‍යාත්මකව ඇතිවුණ සත්ත්වයෙක් පමණක්ය

කියලා. ඉන් එහා කර්මයක්, කර්ම ඵලය ගැන, හේතුඵල ධර්මයක් ගැන ඒ අයට දැනුමක් නැහැ. ඒ නිසා මේ අය නිරතුරුවම උත්සාහ ගන්නවා තමා උපාදානය කරගත් තම දැනුම උපයෝගී කරගෙන ඇතිකරගත් මමත්වයේ දැඩිභාවය නිසාම මිනිසාගේ ජාති, ජරා, ව්‍යාධි, මරණ පාලනය කරන්න. මේ උත්සහය නිරර්ථක උත්සහයක්.

හැබැයි මනුෂ්‍යයින් හැටියට අපිට සතුටුවෙන්න පුළුවන්. මන්ද, සතර අපායේ සත්ත්වයා විඳින දුක, වේදනාව, කටුක බව සමඟ සසඳා බලනවිට මනුෂ්‍යයා යනු සැප විඳින පිරිසක්මය. අනාථ කඳවුරක කැඳ උගුරක් පමණක් ලැබී ජීවත්වන මනුෂ්‍යයාද විඳින්නේ සැපයක්මය. අවිද්‍යාවේ ක්‍රමවේදයන් විසින් පුහුණුකරන ලද ඉහත විද්‍යාඥයින් ආචාර්ය, මහාචාර්ය මහත්වරුන් සත්ත්වයා සතර අපායේ විඳින දුක් වේදනා දකින්නේ නම් අවිද්‍යාව නිසා සතර අපායේ තමා උපදිනබව දන්නේ නම් ඔය පර්යේෂණ සියල්ල නවතා දමා සතර අපායෙන් මිදීමේ ආර්ය පර්යේෂණයේ යෙදෙනවා නියතය.

භික්ෂුව ඉහත සටහන් කළේ පසුගිය වස් සමයේදී භික්ෂුව වැඩසිටිය රුහුණු ප්‍රදේශයේ කැලෑබද ආරණ්‍යය භූමියේදී භික්ෂුවට දර්ශනය වූ ප්‍රේත සන්නිපාතයක් ගැන ඔබව දැනුවත් කිරීමටය. භික්ෂුවගේ භික්ෂු ජීවිතයේදීම වැඩිම ප්‍රේතයින් ප්‍රමාණයක් දර්ශනය වුණ කාලය මෙයයි. මෙය කෙටි මනුෂ්‍ය ජීවිතය තුළින් ලබන ප්‍රේත ජීවිතයේ දීර්ඝබව කියන කථාවක්. භික්ෂුව සමාධියෙන් පසුවනවිට ප්‍රේතයින් සියය, දෙසියය දර්ශනය වුනා. මේ සෑම ප්‍රේතයෙක්ම ඉතාමත් විකෘති ප්‍රේතයින්. එක්කෙනෙකුට එක්කෙනෙක් විකෘතියි. විකෘති මුහුණු, විකෘති හිස්. ප්‍රේත ලෝකයේ අත්විඳින ආදීනවයන්ගේ විවිධත්වය හොඳින් දකින්න පුළුවන්. මේ හැම ප්‍රේතයෙක්ම උඩු කයට ඇඳුමක් නැතිවයි සිටියේ. යටි කය වසාගෙන සිටියෙත් කෙටි සරොම් කැබැල්ලකින්. පිනක් දහමක්, දැකල, ලැබිල, නැති එවැනි සංඥා නුහුරු ඒ නිසාම අනන්ත දුක්විඳින විකෘති, අවිචාරවත් ප්‍රේත සන්නිපාතයක්. මේ ප්‍රේතයන්ගේ පිං මඳ අසරණභාවය දැකලා මේ අය අරමුණු කරලා පිං අනුමෝදන් කළා.

භික්ෂුව සොයා බැලුවා මේ තරම් අසරණ ප්‍රේත සන්නිපාතයක් එම ප්‍රදේශයේ සිටින්නේ ඇයි කියලා. මේ අවස්ථාවේ කල්‍යාණ මිත්‍ර ස්වාමීන්වහන්සේ නමකගෙන් පහත තොරතුරු දැන ගන්නට ලැබුණා. මේ යාල වනෝද්‍යානය ආශ්‍රිත ප්‍රදේශ අතීතයේ සශ්‍රික ගොවිබිම් සහිත ජනාකීර්ණ ජනාවාස සහිත ප්‍රදේශයක්. බැමිනිතියාසාය පැමිණි වෙලාවේ මේවායේ ජීවත් වූ ජනතාව. ඒ දුෂ්ඨ බමුණා විසින් ඒ අයගේ ගොවිබිම් කුරිරු ලෙස විනාශකරලා ජනතාව අමුඅමුවේ ඝාතනය කර තිබෙනවා. ඉන්පසුව මෙම ප්‍රදේශ කැලයට ගිහිල්ලා. මේ අවාසනාවන්ත ලෙස මැරිච්ච මිනිස්සුන්ට පිනක් අනුමෝදන් කරන්න කෙනෙක් ඉතුරුවෙලා නැහැ. තමන්ගේ ගොවිබිම්, දූවා-දරුවන් කෙරෙහි ඇතිකරගත් ඡන්දරාගය, ආක්‍රමණිකයන් කෙරෙහි ඇති කරගත් වෛරය, ක්‍රෝධය සමඟ අවසන් හුස්ම හෙලා තිබෙනවා. ඔබම හිතන්නකෝ, තමන්ගේ නිජභූමියේ ගොවිතැන් කරගෙන ජීවත්වුණ ගම්වැසියන් ආක්‍රමණිකයන් සියල්ල විනාශකර දමා ගිනිබත් කරනවිට හදවතේ ඇතිවන වෛරය, ක්‍රෝධය, තෘෂ්ණාවේ ගිනිදළු ගෙවල් දොරවල් හව බෝග ගිනිගෙන නැගෙන ගිනිදළුවලට වඩා ප්‍රබලයි නේද? ගම්බිම් කෙත්වතු දවා අළු කළ ගින්න මොහොතකින් නිවී ගියද ඒ අය මැරෙන මොහොතේ හදවතේ අවුළුවාගත් වෛරයේ, ක්‍රෝධයේ ගින්න තවමත් නොකඩවාම ඒඅයව පීඩාවට පත්කරනවා. නිවීයන ගින්නක් උදෙසා බුර බුරා නැගෙන දුක් ගින්නක් 'මගේ' කරගන්නවා. ඉහත අවාසනාවන්ත ප්‍රේතයින් ලෙස උපත ලබා තිබෙන්නේ අතීතයේ මේ ගම්බිම්වල ජීවත්වුණ මිනිස්සු කියලා භික්ෂුව අනුමාන කරනවා. ආහාර, ඇඳුම් අහේනිය නිසා ඉන දවටාගත් සරම් කැබැල්ල පිටින්ම ප්‍රේත ලෝකයේ උපදින්න ඇත්තේ ඒ නිසා විය යුතුය. කැලයේ දඩයමේ යන, මී වද, ඖෂධ සොයන්න කැලේට වදින මිනිස්සු නොයෙක් හේතුන්ගෙන් මියයනවා. මෙවැනි මිනිස්සුද මැරෙන්නේ වෛරයෙන් බියෙන් නිසා විකෘති ස්වභාවයන් පිහිටන්න පුළුවන්. භික්ෂුවට දර්ශනය වූ ප්‍රේත ලෝකයේ ප්‍රේතයින්ගෙන් ඉතාමත් අපුලම ප්‍රේතයින් මේ ප්‍රේත සන්නිපාතය තුළ සිටියා. එය විකෘතියේ ලෝකයක්. එක ප්‍රේතයෙක් භික්ෂුව ඉදිරියේ වැඩි වේලාවක් දර්ශනය වුණා.

භික්ෂුව ඔහුගෙන් ඇසුවාම ඔබ කවුද කියලා මේ ප්‍රේතයා ගොතගසන ස්වභාවයෙන් වචන පිටකරන්න උත්සාහ කළා. භික්ෂුවට තේරුණේ 'කථාකරන්න බැහැ' කියනවා වගේ. එහෙම කියන විටම දැක්කේ එම ප්‍රේතයාගේ උඩුතොල සහ යටිතොල කට වටේම කුණුවෙලා හරියට හොරිදාල වගේ කට කුණුවෙච්ච ප්‍රේතයෙක්. මේ ප්‍රේතයාට කවුරුන් බෙහෙත් කරන්නද? කවුරුන් සුව දුක් විචාරන්නද? කට කුණු වෙච්ච වේදනාව විඳිමින් කර්ම විපාකය ගෙවනවා.

වචනය සංවරකර නොගත් නිසා මුසාවාද, පිසුනාවාච, පරුෂවචන, සම්පප්‍රලාප භාවිතා කළ නිසා අනුනට දුන් දුක තමන් ප්‍රේත ලෝකයේ විඳිනවා. මේ කථාව කියවලා ඔබ දැන් හිතන්න ඕනේ මේ ප්‍රේතයා විඳින දුක නොවේ. ඒ ගැන හිතලා වැඩක් නැහැ. ඔහුව ගොඩගන්න ඔබට බැහැ. තමා කැමත්තෙන්ම සකස්කරගත් හේතූන් නිසා ලැබුණු ඵලය තමා ප්‍රේතයා විඳින්නේ. මේ දුක අසල ඔබ කල්පනා කරන්න ඕනේ ඔබේ වචනයත් සංවරද කියලා. සමහර පිංවතුන්ගේ දිව හරියට දැලිපිහියක් වගේ. සමාජයේ සෑම ක්ෂේත්‍රයකම තමාගේ පැවතීම, බලය, ආත්ම ගරුත්වය උදෙසා මේ දැලිපිහියෙන් මොනතරම් අහිංසක ජීවිත රිදවනවද? රැවටීමට ලක්කරනවාද? විශේෂයෙන් දේශපාලනයේදී එහෙම.....

සමහර දිනවල භික්ෂුව උදේට පිණ්ඩපාතේ වඩිනවිට ගෙවල්වල ක්‍රියාත්මක කර ඇති රේඩියෝවේ බොහෝම වේගවත්ව අදහස් ප්‍රකාශ කරනවා ඇසෙනවා. ඒ හඬවල්වල ඇති තියුණු, වේගවත්, ප්‍රහාරාත්මක බව ඇසෙන විට එම හඬවල් අයිති අයිතිකරුවන් මොනතරම් දේවල් ඡන්දරාගයෙන් අයිතිකරගෙන තිබෙනවාද? තව අයිතිකර ගැනීමට බලාපොරොත්තු වෙනවාද? ඒවා රැකගැනීමට උත්සහ ගන්නවාද කියල පෙනෙනවා. ඔබ අනුන්ව හදන්න යන්න එපා. මේ අවිචාරවත් දුක් දෙන ප්‍රේතලෝකය ගැන සිතලා බිය ඇතිකරගන්න. ඔබ තනි තනිවම නිවැරදි වෙන්න. ඔබේ කටින් පිටවෙන වචනයකින් තව කෙනෙක්ව රිදවන්නේ, මුලාකරන්නේ නැහැය කියලා. එම විශ්වාසය තුළ ජීවත් වන්න. එවිට ඔබ ඔබටම ලියාගන්නා සහතිකයක් ඔබ ළඟ තිබෙනවා. කට කුණු වෙච්ච ප්‍රේත උපතක් ඔබ නොලබනවා

කියලා. මේ ආරණ්‍යයේදී දර්ශනය වූ ප්‍රේතයින් අතර තව විශේෂ ප්‍රේත පිරිසක් සිටියා. ඒ භික්ෂු සහ භික්ෂුණී ස්වරූපයේ ප්‍රේතයන්. මේ අය අතර විදේශීය ජාතික භික්ෂු භික්ෂුණී ප්‍රේතයන් සිටියා. දර්ශනය වුණ එක ප්‍රේත භික්ෂුණියක් හිස සම්පූර්ණයෙන්ම මුඩුකර සිටියේ. නමුත් හරියට හිස මැද හිසකෙස් රොදක් ඉතිරිකර තිබෙනවා. එක අතකට මිට මොලවා ගන්න පුළුවන් ප්‍රමාණයේ එම කෙස් රොද ගොතලා තිබෙන්නේ. සිවුරු කොටට පෙර වූ ප්‍රේත භික්ෂුණීන් විදේශීය අය බව හොඳින් හඳුනාගත්තා. මේ ප්‍රේත භික්ෂු භික්ෂුණීන් විකෘති දේහයන් සහිත අය නොවේ. මේ අයට විකෘති ශරීරික ලක්ෂණ නොලැබුණේ යමක් කෙරෙහි ඇතිකරගත් ඡන්ද රාගය නිසා ප්‍රේත ලෝකයට බැසගත්තත් තමන් විසින් කරන ලද පුද පූජාවල කුසල් විපාකයන් ක්‍රියාත්මක වීම නිසා විකෘති ස්වභාවයෙන් තොර ප්‍රේත ස්වභාවයන් ලැබෙන්න ඇතැයි භික්ෂුව අනුමාන කරනවා. මේ භික්ෂුණී ප්‍රේතයින් හරිම කඩිසරයි. ඒකෙන්ම පෙනෙනවා මොවුන් යමක් නිත්‍යභාවයෙන් ගෙන එය අයිති කර ගැනීමට අධි ක්‍රියාත්මක භාවයෙන් කටයුතු කර ඇති බව.

ඉහත ආරණ්‍යය පුරාවිද්‍යාත්මක සාධක අනුව ප්‍රකාශ වෙනවා අතීතයේ විදේශීය භික්ෂු භික්ෂුණීන්ගේ අධ්‍යාපනයට කැපවී තිබූ බව. ඔබට පේනවා නේද ගිහිපැවිදි භේදයකින් තොරව දේශීය විදේශීය භේදයකින් තොරව අපි ගිහින් පදිංචිවෙන ස්ථානයක් තමයි කියලා ප්‍රේත ලෝකය. විදේශීය රටවලින් ඇවිල්ලත් මහණකම නොවේ කරල තිබෙන්නේ. බුද්ධානුස්සතිය, ධම්මානුස්සතිය, සංඝානුස්සතිය, නොවේ වඩල තිබෙන්නේ 'ප්‍රේතානුස්සතිය' යි. මොවුන් අතහැරීම නොවේ කරල තිබෙන්නේ. මොවුන් මේ අල්ලාගෙන ඉන්නේ කුමක්ද? ආරණ්‍යයද, පන්සලද, ඉඩකඩම්ද, සිව්පසයද, පූජාවස්තූද මේවා නොවේ. මේවාට වර්තමානයේ අයිතිකරුවන් සිටිනවා, බලධාරීන් සිටිනවා. එසේ නම් මොවුන් මේ වසර එක්දාහස් තුන්සියයක් වැනි අතීතයක සිට මගේ කර අල්ලාගෙන බොහෝම කඩිසරකමින් ප්‍රේත ලෝකයේ ජීවත්වන්නේ රූපය කෙරෙහි තමා තුළ ඇතිවූ ඡන්දරාග නිසයි. රූපය කෙරෙහි ඇති ඇල්මයි. රූපයට ඇති විඳීම ආත්මයක් කරගෙන චීවරයක් දරාගෙන ප්‍රේත ලෝකයේ ජීවත්වෙනවා.

මේ අයට වෙහෙස බවක් පෙනෙන්නේ නැහැ. මෙතැනින් මිදෙන්න අවශ්‍ය බවක් පෙනෙන්නෙ නැහැ. ඒක හරියට මේ වගේ දෙයක්. පිටකොටුවේ යාචක අම්මා කෙනෙක් ඉන්නවා. තම කුඩා දරුවන් සමග ජීවත්වන්නේ සිඟාකාලා. නිදාගන්නේ කඩ පිලක. ධනය තිබෙන මහත්මයෙක් ඇවිල්ලා මේ යාචක අම්මාගෙන් දරුවා හදාගන්න ඉල්ලනවා. පාසල් යවල හොඳට උගන්වන්නම්, අනාගතය බාර ගන්නම් කියලා. ඒත් ඒ යාචක අම්මා දරුවා දෙන්නේ නැහැ. ඒ යාචක අම්මා දන්නේ නැහැ දරුවා දුක්ය විඳින්නේය කියලා. ඒ යාචක අම්මාගෙයි දරුවාගෙයි කර්ම ශක්තිය සැපය කර අල්ලාගත් උපාදානය. ප්‍රේත භික්ෂුණීන්ගේ ස්වභාවයත් එසේමයි. ප්‍රේත ලෝකයේ උපතක් යනු කර්ම විපාකය නිසා සකස්වන ඔබගේ කැමැත්තයි. එය හරියට මත් වතුර පානය කර කාමයේ වරදවා හැසිරීම නිසා මාරාන්තික රෝගයන්ගෙන් විනාශවන ජීවිත වගේය. ඔවුන් සැපයක් කර අල්ලා ගන්නේ දුකක්ය. කෙටි ආශ්වාදයත් දීර්ඝ ආදීනවයන් යන දෙකම තමාම විඳිය යුතුය. කෙටි ආශ්වාදයට ඇති ඡන්ද රාගය ඔබට දීර්ඝ ආදීනවය වසන්කරයි. මත්වතුර කෙරෙහි තෘෂ්ණාව ඇතිකරගත හොත් ඔබේ විනාශයත්, ඖෂධීය පානයක් කෙරෙහි ඔබ තෘෂ්ණාව ඇතිකරගත හොත් ඔබේ සැපයත් ඇතිකරයි. විනාශයත් සැපයත් දෙකම ඇතිකර ඇත්තේ තෘෂ්ණාව විසින්මය. මේ හේතුඵල ධර්මයන් ඔබේ ජීවිතයට ගලපා ගැනීමට ඔබට හැකියාව ලැබෙන්නේ ධර්මයේ හැසිරීම තුළින්මය. ප්‍රේත ලෝකයේ විකෘති දුක් බව, විවිධත්වය යැයි කියන්නේ මනුෂ්‍යයා විසින් කරගන්නා කාය, වචී, මනෝ කර්මවල විවිධත්වයයි. එහි ඵලයයි. ප්‍රේත ලෝකයේ දුක යනු ඔබගේ අකුසල් කර්මයන්ගේ ප්‍රතිබිම්බයයි. එය හරියට කණ්නාඩිය ඉදිරියට ගොස් ඔබ දකින ඔබගේම රූපය වගේය. ඔබ ඔබටම වගකිව යුතුය. ඔබ බියවිය යුත්තේ ප්‍රේත ලෝකයේ උපතකට නොවේ. ප්‍රේත ලෝකයේ උපතකට හේතුවන අකුසල කර්මයන් සිදුකිරීමටය. ඔබ අතින් එවැනි අකුසල කර්මයක් සිදුනොවේනම් ඔබ සතර අපායෙන්ම නිදහස්වීමේ නිදහස ලබයි. එය ඔබට ලොව්තුරා බුදුසමිඳුන් ලබාදෙන සහතිකයයි. මනුෂ්‍ය ලෝකයේදී ඔබ කාමයන් තුළින් කෙටි ආශ්වාදයක් හෝ ලබන නමුත් බහුතරයක් ප්‍රේතයින්ට මේ කෙටි ආශ්වාදයද අහිමිය.

යම් හෝ කෙටි ආශ්වාදයක් ලැබුණද එය ඒඩ්ස් රෝගියෙක් සමග කාමයේ වරදවා හැසිරුණු අයෙක් ලබන සැපය වගේය. කෙටි ආශ්වාදය උදෙසා මුළු ජීවිත කාලයත්, පරලොවත් එහි ආදීනවයන්ගෙන් වන්දි ලැබිය යුතුය. ආශ්වාදය ලැබුවේ විනාඩි 05 ක කාලයක් වීමට පුළුවන. එහි ආදීනවය කල්ප ගණනාවක් දීර්ඝවීමට පුළුවන. මේ කෙටි සැපය සහ දීර්ඝ ආදීනවය අවිද්‍යාව නිසාම ඔබ ස්වකැමැත්තෙන්ම තෝරාගත්තෙකි.

ඔබම කල්පනාකර බලන්න ඉහත සිදුවීම් ඔස්සේ පසුගිය වසර 40 ක පමණ කාලය තුළදී උතුරු නැගෙනහිර යුධ කලාපවල ඝාතනය වන ලද සෑම ජාතියකම මිනිසුන් ප්‍රමාණය දෙස බලනවිට මොන තරම් අසරණ ප්‍රේතයෙක්, ප්‍රේතියෙක්, යක්ෂයින් ඔය ප්‍රදේශවල දුක්විඳිනවා ඇතිද? සරණක් පිහිටක් නොමැතිව ද්වේශය, වෛරය තව තවත් වඩමින් ජීවත්ව සිටින මනුෂ්‍යයින් ඉන්නේ වෛරය, ද්වේෂයට වඩා මියගිය නොපෙනෙන ලෝකයේ සත්ත්වයින්ගේ වෛරය, ද්වේෂය අධිකය. මන්ද ඔවුන්ගේ වෛරය, ද්වේෂය ඇවිලෙනවා මිස නිවීමට අවශ්‍ය සාධක සතර අපායේ නොමැති නිසාය. ඔවුනගේ දහම අධර්මයයි. ඔවුන් දන්නා ගුණධර්මයක් නැත. ජීවත්ව සිටින මිනිසුන් සුඛිත මුදිත කරනවා වගේම නොපෙනෙන ලෝකයේ සිටින වෛරය, ද්වේෂය වඩන සත්ත්වයින්ද සුවපත්කිරීම වැඩදායකය. හැබැයි මේවා ඉවරයක් කළ නොහැකි වැඩය. හොඳම දෙය හැකි උපරිම ශක්තිය යොදා ඔබ සතර අපායෙන් මිදී යාමය. එහෙත් සෑම විටම ඔබ තෝරාගන්නේ මෙහි කණ පිටය. තමා තමාට මෛත්‍රිය කරගන්නේ නැතිව අනුනට මෛත්‍රිය කරගන්නට යාමය. ඔබගේ ඇස ප්‍රකෘති ස්වභාවයෙන් තිබුණත් ඇසේ සුද වර්ධනය වෙලා නම් ඇස පෙනෙන්නේ නැත. ධර්මය ලෝකයේ පැවතුණද ඔබ ධර්මයේ සරණ නොයන්නේ නම් එයත් සුද වසාගත් ඔබේ ප්‍රකෘති ඇස් දෙක වගේය. අපි එයට අවිද්‍යාවේ අන්ධභාවයයි කියමු. එහෙත් ඔබ ජාති අන්ධයෙක් නොවන බව තරයේ සිහි තබා ගත යුතුය. සතිය නැමති සැත්කම කතුරින් අවිද්‍යාවේ සුද ඉවත්කර සද්ධාව නැමති කාචයක් ඇසට පැලඳුවහොත් ඔබට නැවතත් විද්‍යාවේ ආලෝකය දෙසට ගමන් කිරීමට හැකිවනු ඇත. එහෙත් එයද නැවත මැරෙන ඇසක්

බව ඔබ දැනගත යුතුය. දැන් ඔබට වැටහෙනවා ඇති භික්ෂුව මේ සටහන මුලදී සඳහන් කළ අවුරුදු හැත්තෑපහක් ජීවත්වන මනුෂ්‍යයාට වසර පනහකින්, දහයකින් තම ආයුෂ දීර්ඝ කරගැනීමට විද්‍යාඥයින් මොන පර්යේෂණ සිදු කළද ලෝකයාට කළ යුතු වඩාත්ම වටිනාම පර්යේෂණය නම් සතර අපායෙන් මිදීමේ පර්යේෂණය කියල. එසේ නොවුණහොත් මිනිසා වැඩිපුර ජීවත්වන සෑම තත්පරයකදීම ඔහු විසින් රැස්කරගන්නේ සතර අපායට යාමට අවශ්‍ය සාධකමයි. නවීන විද්‍යාවේ නාමයෙන් කෙරෙන අවිද්‍යාවේ ක්‍රමවේදයන් මනුෂ්‍යයා දුක දෙසටම ඇද දමනවා. සතර අපායටම ගාල් කරනවා. නවීන විද්‍යාව කියන්නේ, තාක්ෂණය කියන්නේ සතර අපායට පිරිස් බලය සපයන නියෝජිතයෝ, ඒජන්තවරු. හැබැයි අවසානයේදී මේ නියෝජිතයෝත්, සේවාදායකයෝත් සතර අපායන්ට ගාල්වෙනවා. සේවාදායකයෝත් සතර අපායේම ගාල්වෙනවා. සේවාදායකයෝ ප්‍රේත ලෝකයේ සරොම් කැබැල්ලක් හරි දවටගෙන ඉන්නවිට ඒජන්තවරු නිර්වස්ත්‍රව ප්‍රේත ජීවිත ගතකරනවා. සේවාදායකයෝ තිරිසන් ලෝකයේ කිඹුලෙක්ව ඉපදෙනවිට ඒජන්තවරු කිඹුලා ජීවත්වන ජලාශයේම මාළු වෙලා ඉපදිලා කිඹුලාට ගොදුරු වෙනවා. මොකද කර්ම විපාක ඔය මනුෂ්‍ය ලෝකයේ වගේ සන්තෝෂමක්, අල්ලසක් දීල වෙනස්කරගන්න බැරි නිසා. එහෙයින් කයින් ක්‍රියාවක් කිරීමට පෙර, වචනයක් ප්‍රකාශකිරීමට පෙර, මනසින් සිතුවිල්ලක් සිතීමට පෙර සතර අපායේ දුක ගැන මොහොතක් මෙනෙහි කරන්න. එවිට එම ක්‍රියාව නිවැරදි කරගන්න ඔබට පුළුවන්. නිවැරදි කරගන්නා සෑම ක්‍රියාවක් පාසාම ඔබ පියවර තබන්නේ සතර අපායට විරුද්ධ දිශාවටය. ඒ දිව්‍ය මනුෂ්‍ය බ්‍රහ්ම සුගතීන් දෙසටය.

අපි හොඳින් කාලා, හොඳින් ඉගෙනගෙන, හොඳින් ජීවත්වෙලා හොඳින් මැරිල යමු. මෙය වර්තමාන සමාජයේ ජනප්‍රිය සුන්දර සටන් පාඨයක්. සටන් පාඨයක් යනු මුලා වූ සත්ත්වයා තම මෝහයේ ස්වභාවය ලෝකයාට හඬ ගෑමය. සටන් පාඨය සුන්දර වුවද ධර්මයෙන් තොරව ජීවත්වන ඉහත පිරිස් ඇත්තෙන්ම හොඳින් හම්බකරලා, හොඳින් කාලබීල, හොඳින් ජීවත්වුණත් ඔබ හොඳින් නිරීක්ෂණය කරලා බලන්න මේ කවුරුවත්ම හොඳින් මැරෙන්නෙ නම්

නැහැ. අනෙක් සියල්ල අවංකවම හොඳින් කෙරිලා. හැබැයි ප්‍රශ්නය හොඳින් මැරෙන්නේ නම් නැහැ. අන්න දුකට බයට පත්වෙලා. ලෙඩ, රෝග, ව්‍යාධීන් හැදිලා. සිහිමුලා වෙලා. තමාට තමාව කරදරයක් පීඩාවක් බවට පත්වෙලා තමයි මේ අය මිය යන්නේ. මෙහෙම මැරිලා නැවත උපදින තැන ගැන මොනවා කථාකරන්නද? නමුත් ලොව්තුරා බුදු සමිඳුන් දේශනා කරනවා යමෙක් ශීලයෙන් පරිපූර්ණ නම් එම පිංවතා සිහිමුලාවෙන් තොරවයි මියයන්නේ කියල. එයා ජීවත්ව සිටියදීම තමා උපදින සුගතිභූමි දකිනවා. සතුටුවෙනවා. සාධුකාර දෙනවා. මේවා සටන් පාඨ නොවේ. හේතුඵල ධර්මයන්. හේතුව, ඵලය පැහැදිලියි. විවෘතයි. ලෝකයා තෙරුවන් කෙරෙහි සද්ධාවෙන්, ශීලයෙන්, කර්මය, කර්ම ඵල විශ්වාසයන්ගෙන් ඈත්වෙන්න ඈත්වෙන්න ලෝකයේ මිනිස් ජනගහණය සීඝ්‍රයෙන් වැඩිවෙනවා. මෙහි සුවිශේෂී ලක්ෂණය තමයි ලෝක ජනගහණය ඉහළ යන විට ථෙරවාදී බෞද්ධ ජනතාවගේ සංඛ්‍යාව සීඝ්‍රයෙන් පහළ බසිනවා. ඒ කියන්නේ වැඩිවන හැම උපතක්ම සිදුවන්නේ හින්දු, මුස්ලිම්, ක්‍රිස්තියානි, මහායාන ධර්මය, අවිද්‍යාව ධර්මය කරගත්ත මව්කුසක් තුළින්. මෙලෙස බිහිවන ලෝකයා නිරතුරුවම රාග, ද්වේෂ, මෝහයෙන් වෙලාගත් කායික, මානසික, ස්වභාවික ව්‍යසනයන්ගෙන් පීඩා විඳින ඉන්ද්‍රියන් පිනවීමට වෙහෙසෙන ජනතාවක් වෙනවා. ඒක ලෝක ධර්මතාවයක්. ලෝකය නිරතුරුවම සකස්වෙන්නේ දුක දෙසට. සත්ත්වයා විසින් අවිද්‍යාව නිසා අකුසල් කිරීම වැඩිවන තරමට ඒවා විපාක දීමට සුදුසු ලෝකයක් ඉදිරියේ බිහිවන්නේ. මේ ගමන අවබෝධකර ගන්නේ සම්මා සම්බුදු රජාණන් වහන්සේ නමක්මයි. උන්වහන්සේ පිරිනිවී ශාසනය දුර්වලව යන විට මාරපාක්ෂික ධර්ම ලෝකය ඩැහැගන්නවා. මේ මොහොතේ සිදුවෙමින් පවතින්නේ මේ ක්‍රියාදාමයයි. මේ මොහොතේ ක්‍රිස්තියානි, මුස්ලිම්, හින්දු, මහායාන ආගම්වල විශාල ප්‍රචාරාත්මක ගුණාත්මක භාවයක් බාහිරින් පෙනෙන්නට තිබුණද එම ගුණාත්මක භාවය මායාවක්. ථෙරවාදී බුදුදහමට සහ එහි ඉගැන්වීම්වලට මුහුණ දීම සඳහා ඇතිකරගත් ආරක්ෂක ක්‍රමවේදයක්. අනාගතයේදී නිවන අරමුණ කරගත් සැබෑ ථෙරවාදී බුදු දහම ධර්ම විනය දෙක මාරපාක්ෂික ධර්මවලට යට වී

යනවිට ඉහත ආගම් වල ගුණාත්මක භාවයද පිරිහී යනවා. මොකද ඒ පිංවතුන්ට තරග කිරීමට අභියෝගයක් එල්ල වීමට නිවන අරමුණු කරගත් මනාව හේතුඵලධර්මයන් අනුව දේශනා කර වදාළ ධර්මයක් ලෝකයේ නොමැති නිසා. ථෙරවාදී බුදුදහම ලෝකයේ පවතින නිසයි අන්‍ය ආගම්වල ගුණාත්මකභාවයක් සඳහා ඒ අය ක්‍රියාත්මක වෙන්නේ. ඉදිරි ලෝකයේ ස්වභාවය නුවණින් දැක ඔබද ලෝකයෙන් එතෙරවීමට අවශ්‍ය සාධක ජීවිතය තුළින් පරිපූර්ණ කරගන්න. තෙරුවන් කෙරෙහි සද්ධාව, ශීලය, දන්දීම ජීවිතයේ කොටසක් කරගන්න. ඔබේ දුව, පුතා, බිරිඳ, ගේදොර ඔබ ඔබේ ජීවිතයේ කොටසක් කරගෙන ජීවත්වනවා වගේම ඒවායේ සුභසාධනය උදෙසා වෙහෙසෙනවා වගේම එම කටයුතුද අලස නොවී ඉටුකරමින් ඉහත තෙරුවන් කෙරෙහි සද්ධාව, ශීලය, දන්දීම ඔබේ ජීවිතයේ කොටසක් කරගෙන ජීවත්වන්න. අතීතයේ කළ පිංකම්, නිරතුරුවම සෑම රාත්‍රියකම මෙනෙහි කරන්න. එම පිංකම් ආරක්ෂා කරගත්තා වූ ශීලයන්, දුන්නා වූ දානයන් පිළිබඳ මතකයන් නිරතුරුවම අළුත් කරගන්න. ඔබ සිදුකළ පිංකම් අමතකව යාමට ඉඩ නොදෙන්න. ජීවිතය තුළින් දේවානුස්සතිය වඩන්න. ඔබ මේ ගමන් කරන්නේ සතර අපායෙන් මිදෙන දිශාවට බව සිහිකරන්න.

තවත් පුතුන් කුමට පතන්...

භික්ෂුව හමුවීමට පැමිණි තරුණ තාත්තා කෙනෙක් භික්ෂුවගෙන් බොහෝම සංවේදී ප්‍රශ්නයක් ඇහුවා. හාමුදුරුවනේ මම කුඩා දරුවෙක් ඉන්න තාත්ත කෙනෙක්. දරුවාගේ වයස අවුරුදු 4 යි. මේ පුංචි දරුවා හරිම දඟකාරයි. එයා එක වෙලාවකට සන්ඩුකරනවා. තව වෙලාවක සෙල්ලම් කරනවා. තවත් සමහර වෙලාවට අම්මා සමග ගාථා කියමින් බුදුරජාණන් වහන්සේ වන්දනා කරනවා. මේ දරුවා සෙල්ලම් කරන වෙලාවට නිතරම මම හාවා, මම මුවා, මම අලියා ආදී වශයෙන් සතුන් අනුකරණය කරමින් සෙල්ලම් කරනවා, හැසිරෙනවා. මේ මහත්මයා අහනවා මගේ දරුවා සතුන් අනුකරණය කරමින් සෙල්ලම් කිරීමට ප්‍රියවීම හේතුවෙන් මගේ දරුවාට යම් ප්‍රශ්නයක් වේවිද කියලා. මේ මහත්මයාට තිබෙන ප්‍රශ්නය තමයි යම් හෙයකින් දරුවා මියගියහොත් එම දරුවා හාවෙක්, මුවෙක් වෙලා උපත ලබයිද කියන කාරණය. මේ හේතුව නිසා දරුවාගේ අම්මා දරුවා මම හාවෙක්, මම මුවෙක් කියලා සෙල්ලම් කරනවිට නැහැ මගේ පුතා දෙවියෙක්, දිව්‍යාංගනාවක් කියලා දරුවාගේ මනෝභාවය වෙනත් දිශාවකට යොමුකරනවලු. තම දෑතේ නැළවෙන කුඩා බිළිදා තුළින් අනාගත වෛද්‍යවරයෙක්, ඉංජිනේරුවරයෙක්, පරම්පරාවේ ගැලවුම්කරුවෙක් බලාපොරොත්තුවන අම්මලා තාත්තලා අතර ඉහත අම්මා තාත්තා සුවිශේෂී වෙනවා.

පිංවත් ඔබ හාවෙක් කියන තැනින් මුදවලා දෙවියෙක් කියන තැනයි සිත පිහිටුවන්න උත්සහ කරන්නේ. ඒ කියන්නේ අනතුරකින් මුදවලා තව තවත් අනතුරකටයි ඔසවා තබන්නේ. භික්ෂුව දන්නා තරමින් මෙවැනි දෙමාපියන්ට දාව උපදින දඟකාර හුරුබුහුටි ළදරුවෙක්

තමන් ප්‍රියකරන සත්ත්ව සංඥාවක් සකස්වෙලා මියගියහොත් එම දරුවා කවදාකවත් තිරිසන් ලෝකයේ හාවෙක්, මුවෙක් වෙලා උපත සකස්වෙන්නෙ නැහැ. දිව්‍ය ලෝකයේ උපත දිව්‍ය හාවෙක්, මුවෙක්, අශ්වයෙක් ලෙස උපතක් සකස්වීමට තමයි ඉඩකඩ වැඩිපුර තිබෙන්නේ. දිව්‍යලෝකයේ වැඩසිටින්නේ දෙවියන් පමණක් නොවෙයි ඉහත ආකාරයේ දිව්‍යමය සතුන්ද වැඩසිටිනවා. ඉහත ප්‍රශ්නය තුළින් දරුවාට පෙර මව්පියන් මියගිය හොත් මව්පියන්ගේ අවසාන සිත තෘෂ්ණාව නිසා කුමක් උපාදානය කොටගෙන සකස්වෙයිද කියන කාරණයත් වැදගත්. මොකද පිංවත් මව්පිය දෙපල දරුවා අනිත්‍යයයි කියලා දකිනවා වගේම දරුවාගේ අනාගත සුරක්ෂිතභාවයක් ගැනත් සිතනවා. එතනදී බාහිරට ප්‍රකට නොවන උපාදානයක් ඇතුළතින් පෙනෙනවා. මෙන්න මේ ප්‍රකට නොවී සැඟවී තිබෙන උපාදානය මතුකරගන්න දක්ෂවෙන්න අවශ්‍යයි. පිංවත් දෙමාපියන් දරුවා මගේය කියන තැන ඉඳගෙනයි දරුවා සුගතියට ඔසවා තබන්න උත්සහ ගන්නේ.

මෙතනදී ඔබ දරුවා පටිච්චසමුප්පන්නව ගන්න. අවිද්‍යා පච්චයා සංඛාරා, සංඛාර පච්චයා විඤ්ඤාණං, විඤ්ඤාණ පච්චයා නාමරූපං. සුරතල් දරුවා තුළින් හේතුඵල ධර්මයන් දකින්න. මෙතනදී ඔබ නියත වශයෙන් දකිනවා හේතූන් නිසා සකස්වුණ ඔබට අයිති නැති දරුවෙක්. බිරිඳ ස්වාමි පුරුෂයා මතක්වෙන විට එම රූප පටිච්ච සමුප්පාදය තුළ විසුරුවා දකින්න. සත්ත්වයෙක් පුද්ගලයෙක් නැති හේතුඵල ධර්මයක් දකිනවිට මමය මගේය යන දෘෂ්ඨියෙන් ඔබ බැහැරට යනවා. එසේ නොවන තාක් කල් ඔබ එම අනතුර තුළ සිටිමින්මයි අනතුරෙන් මිදෙන්න උත්සහ ගන්නේ. එම නිසා එම පිංවත් දෙපොල මේ මොහොතේ තම දරුවාට දිව්‍ය සංඥාවක් සකස්කොට දීම අනතුර තුළ සිටිමින්ම අනතුරෙන් මිදීමේ මාර්ගය සෙවීමක් වෙනවා. එම නිසා පටිච්ච සමුප්පන්නව දරුවාගේ ජීවිතය දකින්න. දරුවා මට අයිති නැති බව දකිමින් දරුවාට අවශ්‍ය යහපත් මාර්ගය කියලා දෙන්න. නිතිපතා මල් කඩන්න, බුදු පහන පත්තු කරන්න, බුදු සමිඳුන් වන්දනා කරන්න, වැඩිහිටියන්ට ගරු කරන්න නිරතුරුවම දරුවාව හවුල් කරගන්න. දෙමාපියන් ධර්ම මාර්ගය තුළ දරුවනට

ආදර්ශමත් වෙන්න. ළමා වියේ දඟකාරකම් උපේක්ෂාවෙන් දකිමින් අනතුරුදායක භාවයන් නුවණින් මෙනෙහි කරමින්, ලැබුණු දරුවා මේ භව ගමනේ අවසාන දරුවා කරගන්න. මේ ස්වාමි පුරුෂයා මේ භව ගමනේ අවසාන ස්වාමිපුරුෂයා කරගන්න. බිරිඳ මේ භව ගමනේ අවසාන බිරිඳ කරගන්න. දරුවාව කමටහනක් කරගෙන දරුවන්ගෙන් මිදෙන්න. දැඩි චිත්තයක් ඇතිකරගන්න භව ගමනේ අවසාන දරුවායි මා මේ දරන්නේ කියලා. දෙමාපියන්ට අප්‍රමාණ සසර දුක සකස්කර දෙන ලොකුම කාම වස්තුව වන දරුවා කෙරෙහි තෘෂ්ණාව හීනව ගිය කළ ඔබ සමීප වනුයේ ලෝකයේ මිදී යන දිශාවටයි. දරුවා සමාජයට යහපත් දරුවෙක් වශයෙන් හදන ගමන් ධර්මාවබෝධය සඳහා දරුවා උපකාර කරගන්න. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දරුවාට කියන්නේ දේව දූතයෙක් කියලා. ඒ කියන්නේ ඔබට භවයෙන් මිදී යන්න පාර කියන දේවදූතයෙක්. භවයෙන් මිදී යන්න පාර කියන්න ආපු දේවදූතයෙක්ව ඔබ ඔබව භවයට බැඳ තබන වරපටක් බවට පත්කරගන්නවා. භික්ෂුවට කුඩා දරුවෙක් දක්කාම එම දරුවා තුළින් දුක් කන්දක් පෙනෙනවා. භවයේ ගොඩාක් ඈත දුරක් පෙනෙනවා. දරුවාගේ කෙළිලොල් භාවය තුළ සැගවී ඇති අනතුරමයි පෙනෙන්නේ. තමන්ගේ දඟකාර දරුවා සත්ත්ව සංඥාවන් සකස්කරගෙන සෙල්ලම් කරනවිට එම දරුවා මියගියහොත් භාවෙක්, මුවෙක් වෙලා උපදියිද කියන කාරණය හිතන්න දක්ෂ දෙමාපියන්ට ඉහත කාරණා ජීවිතයට එකතුකරගන්න අපහසුවක් නැහැ. මොකද ඔබ ධර්මය තුළ සිටින නිසාමයි තම දරුවාවත් ධර්මය තුළින් දකින්නේ. පිංවත් ඔබ දරුවා කෙරෙහි ධර්මානුකූලව දකිනවිට ඉන් සකස්වෙන කුසල් ශක්තිය ඔබව ධර්මාවබෝධය දෙසටත් එම කුසල් ශක්තිය හේතුවෙන් දරුවාට දීර්ඝායුෂත් අනිවාර්යයෙන්ම හිමිවෙනවා. සැබවින්ම ඔබලා දක්ෂ දෙමාපියන්. දෙමාපියන් හැමවිටම උත්සහ කරන්නේ දරුවා පැවිදි කරලා දෙමාපියන් සැනසෙන්නයි. සැනසෙනවාය කියන කාරණයේදී අපි වඩවා ගන්නේ තෘෂ්ණාවයි. හැමවිටම ආශ්වාදය කොට ජීවිතයක යථාර්ථයම ධර්මානුකූලව දකින්න. එතනදී තමයි ශාසනයක අර්ථය ජීවිතයට එකතු කරගත්තා වෙන්නේ. මගේ පුතා මේ උතුම් ශාසනයේ පැවිදි උතුමන් වහන්සේ නමක් හැටියට දකිනවාට වඩා එම පුතාවම

පටිච්චසමුප්පාද ධර්මය තුළ විසුරුවා දකින්න දක්ෂවුණොත් ඔබගේ පුතා තුළින්ම ධර්මය දැකීමේ ශක්තිය ඔබට තිබෙනවා.

භික්ෂුවක් සමාධියෙන් වැඩසිටිනවිට දිව්‍යතලයක වැඩසිටින අජානීය අශ්ව පැටියෙක් දර්ශනය වෙනවා. අඩි තුනක් පමණ උසැති මෙම දිව්‍ය අශ්ව පැටියා කොළ සහ නිල් පැහැයෙන් යුත් වර්ණයෙන් යුක්තයි. හරියටම මොනරෙක්ගේ වර්ණය. කොඳුනාරටිය දෙපසට නෙරාගිය දිගැති රෝම, රෝමවලින් පිරීගිය වලිගය..... බොහොම දර්ශනීය දිව්‍ය අශ්ව පැටියෙක්. මේ සටහන ලියනවිට මේ දිව්‍ය අශ්ව පැටියා පෙර ජීවිතයේ අශ්වය ගෝන් ටික් ටික් ටික් කියන ළමා උපාදානය දරාගෙන මියගිය දරුවෙක් වෙන්න පුළුවන්. භික්ෂුව ස්ථිරව ඒ බව කියන්න දන්නෙ නැහැ. නමුත් උපාදාන පච්චයා භවෝ කියන ධර්මතාවය සත්ත්වයා මෙවැනි උපත්වල සිරකරනවා. මේ කිසිවක් අපිට හිතල ඉවරකරන්න බැහැ. අවබෝධයෙන්මයි අවසන් කර ගතයුත්තේ. තමන්ගේ දරුවා තමන්ට අයිති නැහැය කියලා දකින තැනදි තමා තමාට අයිතිය කියන තැනක් සකස්වෙනවා. පටිච්චසමුප්පාද ධර්මයමයි මේ අවුල අපිට නිරවුල් කරදෙන්නේ.

පොඩි කමට කළත් පව
පොඩි නැත පුතුණේ

වයස අවුරුදු 15 ක පමණ පිරිමි දරුවෙක් භික්ෂුවගෙන් විමසුවා 'හාමුදුරුවනේ මම මෛත්‍රී භාවනාව, බුදුගුණ භාවනාව පුරුදු පුහුණු කරනවා. මට අනිත්‍ය භාවනාව ගැන කියල දෙන්න' කියලා. ඒ වෙලාවේ භික්ෂුව එම දරුවාගෙන් ඇසුවේ 'ඔබ පැවිදි වීමේ අදහසක් තිබෙනවාද?' කියල. එවැනි අදහසක් නොමැති බව ප්‍රකාශ කළ නිසා භික්ෂුව එම දරුවාට මතක් කළේ 'ඔබ අනිත්‍ය සංඥාව වඩන්න යන්න එපා. එය ඔබේ අධ්‍යාපන කටයුතුවලට බාධාවක් වෙයි' කියල. අනිත්‍ය සංඥාව භාවනාවක් ලෙස වඩන සිතක නිරතුරුවම කලකිරීම් සකස්වෙනවා. එවැනි කලකිරීමක් සකස්වුණොත් එය ඔබේ අධ්‍යාපන කටයුතුවලටත් බාධාවක් වේවි. ඒ නිසාම දෙමාපියනුත් දුකට පත්වේවි. එම නිසා නිතිපතා පංචශීලය ආරාක්ෂාකරගනිමින් මෛත්‍රී භාවනාව, බුදුගුණ භාවනාව වඩමින් ගෙදර වැඩිහිටියන් සමඟ බුදුරජාණන් වහන්සේ වන්දනා කරන්න. වැඩිහිටියන්ට ගරුකිරීමට පෙලඹෙන්න. මේ කාරණා තුළින් තෙරුවන් කෙරෙහි සද්ධාව සකස්කරගන්න. මේ මාර්ගය හොඳටම ප්‍රමාණවත් ඔබගේ වයසේ තරමට.

ඉහත කාරණාවන් සුවසේ ඔබගේ ජීවිතය තුළින් වැඩෙනවිට අවශ්‍ය වෙලාවේදී අනිත්‍ය සංඥාවන් මතුවෙලා ඒවි. අපි මෙහෙම අනාගතය ගැන බලාපොරොත්තු ඇතිකරගත්තත් බලාපොරොත්තු කියන්නේ මායාවක්මයි. සියල්ල අනිත්‍යවන නිසාමයි අපි සිහිනුවණින් ජීවිතය පරිහරණය කළයුත්තේ. එසේ නොවුණහොත් ධර්මයත්, අධ්‍යාපනයත් යන දෙකම අපගෙන් බිඳ වැටෙන්න පුළුවන්. ඒ නිසාම මේ දෙමාපියන්ද අසරණභාවයට පත්වෙන්න පුළුවන්.

ඉහත ගුණදම් සමග තෙරුවන් කෙරෙහි සද්ධාව ඇතිකරගෙන සංසුන් මනසක් පිංවත් ළමා ඔබ ඇතිකරගතහොත් එතැන ඉඳන් ඔබට පුළුවන් ගුරුවරුන්ට, දෙමාපියන්ට, අකීකරු සිතක් සකස්වෙන විට, අධ්‍යාපන කටයුතුවලට අලස කම්මැලි සිතක් සකස්වෙනවිට, සිත අනිත්‍ය වශයෙන් දකිමින් එහි ආදීනව දකිමින් අතහරින්න. එවිට ඔබ තුළින් ගුණාත්මක දරුවෙකුත් තමාට ගැලපෙන පරිදි අනිත්‍ය සංඥාවත් ජීවිතයට එකතු කර ගත්තා වෙනවා.

ළමා ජීවිතය කියන්නේ කුසල් නිධියක්. මේ කුසල් නිධිය ගැන ළමයින්ට හැඟීමක් නැහැ. ඒ නිසාම දරුවන් ළමා කාලයේදී අප්‍රමාණ අකුසල් සිද්ධකරගන්නවා. මේ ළමා කුසල් නිධිය දෙමාපියන් ගුරුවරුන්ට ගරුකිරීම, සැලකීම නිසාම තව තවත් ශක්තිමත් කරගන්න දරුවන්ට අවස්ථාව තිබියදී නොදනුවත්භාවය නිසාම දරුවන් ළමා කාලයේදී ගොඩාක් අකුසල් සිද්ධකරගන්නවා. වර්තමානයේ නොදැනුවත්භාවය නිසාම දරුවන් දෙමාපියන්ට මානසික පීඩාවන් ඇතිකරනවා.

වර්තමානයේ ගුරුවරයා කියන්නේ දරුවන්ගේ ප්‍රාණ ඇපයට යටත් පිරිසක් වගේ. හොඳ නරක කියල දෙන්න පුළුවන් කමක් නැහැ. දෙමාපියන්ගේ ගුරුවරුන්ගේ සිත රිදවන එක තරම් අකුසලයක් තවත් නැහැ. දරුවන් නිසා මානසික පීඩාවට පත් අම්මලා, තාත්තලා කොතෙක් අපිට මුණගැසිල තිබෙනවාද?

රාහුල පුංචි හාමුදුරුවෝ හැමදාම උදයට වැලි දෝතක් අතට අරගෙන එය උඩ දමලා ප්‍රාර්ථනාවක් ඇතිකරගන්නවා අද දවසේ මේ වැලිකැට ප්‍රමාණයට මට අවවාද අනුශාසනා ලැබේවා කියලා. පුංචි සිතක සකස්වුණ ලොකු ගුණයක් අප දක්කේ අතීත භවයන්හිදී මහා පාරමී ශක්තියක් වඩවාගෙන පැමිණි දරුවෙක්ගෙන්. ඒ දරුවායි රාහුල මහෝත්තමයන් වහන්සේ. එවැනි පිංවත් දරුවන් පහළ වෙන්නේ කාලය, ද්වීපය, දේශය, කුලය, මව කියන කාරණා ගුණාත්මකව පවතින සුදුසුම කාලයක. එම නිසා පිංවත් ළමා ඔබ සිතන්න ඕනේ ඔබත් මේ ජීවිතේ මව්කුසට බැසගත්තේ, උපත සකස්කරගත්තේ, සුදුසු කාලය බලලාය කියන කාරණය. මොකද තවමත් මේ කාලයයි, ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ. තවමත් මේ ද්වීපයයි, සද්ධර්මය සුරක්ෂිතව

පවතින. තවමත් මේ දේශයයි උතුම් මහ සංඝරත්නය ජීවමානව වැඩසිටින. තවමත් මේ කාලයයි ලෞකික සම්මා දිට්ඨිය සකස්කරගත් මව්කුසක මව් පදවිය ලැබීමට.....

පෙර ජීවිතයේ සුගතියේ සිට සුදුසුකාලය බැලීමෙන්ම ලැබූ උපතක් මේක.

ළමා කාලය කියන්නේ, වැඩිවියට පත්වීමෙන් පසු විපාක පිණිස සකස්වෙන, අකුසල් ගොඩක් සිද්ධවෙන කාලය. අම්මා, තාත්තා, ගුණවත් ගුරුවරුන්ගේ, ගුණවත්භාවය නිසාමයි ඒ අකුසල් දරුවන්ට සිද්ධවෙන්නේ. දෙමාපිය ගුරුවරුන්ගේ ගුණයන් ඒ තරමටම ශ්‍රේෂ්ඨයි. ළමා කාලයේදී අපට උගන්වපු ගුරුවරු පන්ති කාමරයේදී අධ්‍යාපන කටයුතු අතපසුකළහම ගහපු වේවැල්පාරවල් මේ මොහොතේ මතකයට නැගෙනවිට ඒ ගුරුවරන් උදෙසා ගරුත්වයක්මයි සිත තුළ සකස්වෙන්නේ. මේ සටහන් කරන සෑම අකුරක්ම ගුරුවරයාගෙනුයි ඉපදුණේ. ගමේ පන්සලේ ලොකු ස්වාමීන් වහන්සේ ළඟට ගිහිල්ලා මුලින්ම අකුරු කරන්නට 'අ, ආ' ඉගෙනගන්න දවසේ අම්මා, තාත්තා කොතෙක්නම් බලාපොරොත්තු දරුවන් තුළින් ඇතිකරගන්නවාද? තමන්ගේ දරුවා රෝහලේ ඇඳක් මත සැත්කමක් කිරීම හේතුවෙන් ජීවිතයත් මරණයත් අතර සටනක යෙදෙනවිට මේ දරුවාගේ තාත්තා පුතුට සමීපවෙලා කියනවා 'පුතේ ඔබ වෙනුවෙන් අපායට යන්න වුණත් මම ලැහැස්තියි' කියලා. දරුවා කෙරෙහි ඇති ලෙන්ගතුභාවය නිසාම මේ තාත්තාට අපායේ ඇති ගිනි රස්නය අමතකව ගියා. ගින්දර ලෝදිය අමතක කරන්න පුළුවන් ශක්තියක් දරුවන් වෙනුවෙන් අම්මා තාත්තා තුළ තිබෙනවා. මේ අයෝමය ශක්තියට අකීකරුභාවයෙන් ළමා ඔබ අභියෝග කරන්න නරකයි. ළමා කාලයේ අපි අතින් සිදුවෙන වැරදි හඳුනාගැනීමට අපහසුයි. බරපතල බවක් නොහඟවාම ඒවා අපිට මගහැරී යනවා. මේ අකුසල් විපාක පිණිස සකස්වෙන්නේ දරුවා වැඩිවියට පත්වුණාට පස්සේ.

ඉහත කාරණය නුවණින් විමසලා දරුවන් තමන් තුළ දෙමාපියන්ට, ගුරුවරුන්ට අකීකරු සිතක් පහළ වන විට එය අනිත්‍ය වශයෙන් දකලා එම සිත අතහැර දැමීමට දක්ෂ නම්, ඔබ ඔබේ ළමා ජීවිතය

අකුසලයන්ගෙන් ඈත්කරගත් ජීවිතයක් බවට පත්කරගත්තා වෙනවා. මේ සටහන ලියන්නේ පාසල් දරුවෙක් ඇසුව ප්‍රශ්නයකට පිළිතුරක් වශයෙන්. එම නිසා දරුවන්ගේ ජීවිතයට අදාළවයි මේ පිළිතුර. වැඩිහිටියන් මේ පිළිතුර තමන්ගේ ජීවිතයට ගලපාගන්න එපා. දරුවෙක් තුළින් අපි මුලින්ම උත්සහ ගතයුත්තේ ඔහුට ලෞකික සම්මා දිට්ඨිය සකස්කරගැනීමට අවශ්‍ය මාර්ගය සකස්කර දෙන්න. අපිට දරුවාට කියන්න බැහැ ජාති, ජරා, ව්‍යාධි, මරණ ගැන පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවය ගැන. ඉහත කාරණාවලටයි දුකයි කියලා කියන්නේ කියලා. මොකද එච්චර දුරක් හිතන්න එම දරුවන්ගේ ඉන්ද්‍රිය ධර්මයන් වැඩිලා නැහැ. එම දරුවාගේ ඉන්ද්‍රිය ධර්මයන් ක්‍රමානුකූලව දියුණුකරගන්න අපි උපක්‍රමශීලී වෙන්න අවශ්‍යයි. එවිටයි අපිට පුළුවන් වෙන්නේ දරුවා තරුණ වියට පත්වෙනවිට ලෞකික සම්මා දිට්ඨිය සකස්කරගත් දරුවෙක් බවට පත්කරගන්න. මෙතනදී දරුවා අධ්‍යාපන කටයුතු වෙනුවෙන් උදාසීන අලසභාවයක් ඇතිකර ගතහොත් එයයි 'දුක' ලෙසින් තේරුම් ගත යුතු කරුණ. අධ්‍යාපනය අඩාල වුණොත් අනාගතයේදී යහපත් පුරවැසියෙක් ශක්තිමත් ආර්ථිකයක් සහිත ජීවිතයක් අහිමිවෙනවා. දෙවනුව දකින්න මේ 'දුක' කුමක් නිසාද සකස්වෙන්නේ කියලා. දෙමාපියන්ට ගුරුවරුන්ට අකීකරුභාවය නිසාමයි. එහෙනම් ඔබ ඉහත දුකෙන් මිදෙන්න මේ අකීකරුභාවයෙන් මිදෙන්න ඕනේ. ඒ සඳහා ඔබ ගමන් කළ යුත්තේ දෙමාපියන් ගුරුවරුන් කෙරෙහි කීකරුභාවය ඇතිකරගනිමින්. නිරතුරුවම උදේට තේරුමක් ඇතිව පංචශීලය සමාදන් වෙමින් එම සිල්පද ආරක්‍ෂා කරගනිමින්. සවසට නිතිපතා දෙමාපියන් සමග ලොව්තුරා බුදුරජාණන් වහන්සේට මල් පහන් පූජාකරමින්, වන්දනා කරමින් තෙරුවන් කෙරෙහි සද්ධාව සකස්කරගන්නා මාර්ගය තුළ ඔබ ගමන් කරන්න ඕනේ. පාසලේ, පංසලේ පිංකම්වලට ක්‍රියාත්මකව දායකවෙන්න ඕනේ. පුළුවන් ආකාරයට මෛත්‍රී භාවනාව, බුදුගුණභාවනාව ජීවිතයට එකතුකරගන්න ඕනේ. ඉහත කාරණා පිංවත් ළමා ඔබට පහසු ආකාරයට ජීවිතයට ළංකරගතහොත් ඔබ තරුණ වියට පත්වන විට ධර්මයේ අවබෝධාත්මක දිශාවකට අවශ්‍ය ඉන්ද්‍රිය ධර්මයන් ඔබ තුළ වැඩිලයි පවතින්නේ.

ලෞකික සම්මා දිට්ඨිය සකස්කරගැනීමට අවශ්‍ය තෙරුවන් කෙරෙහි විශ්වාසය, කර්මය කර්මඵල කෙරෙහි විශ්වාසය, දානයේ ශීලයේ ආනිශංස පිළිබඳ විශ්වාසය, අම්මා තාත්තාගේ ගුණය පිළිබඳ විශ්වාසය, මරණින් මතු උපදිනවාය කියන විශ්වාසය ඔබ තුළ සකස්වෙනවා. ධර්ම මාර්ගය තුළ ගමන් කිරීමෙන් දෙමාපියන්ට, ගුරුවරුන්ට කීකරුභාවයත්, කීකරුභාවය නිසාම ගුණාත්මක අධ්‍යාපනයකුත්, මේ සියල්ල හේතුවෙන් ලෞකික සම්මා දිට්ඨිය සකස්කරගත් ගුණාත්මක වැඩිහිටියෙක් බවටත් ඔබ පත්වෙනවා.

මෙතැන සිට ඔබට පුළුවන් ඔබට අවශ්‍ය ආකාරයට ධර්ම මාර්ගයේ පෙරට යන්න. ඉහත මාර්ගයේ හික්මීමෙන් ඔබ පෙරට පැමිණියොත් පමණයි තරුණ ජීවිතයේදීම චතුරාර්ය සත්‍යය ධර්මයේ සැබෑම අර්ථය ඔබ ඔබේ ජීවිතයට එකතු කරගන්න දක්ෂවෙන්නෙ. එසේ නොවුණහොත් පින, පව හඳුනන්නේ නැති අනාගත ලෝකයේ සාමාජිකයෙක් වෙන්න ඔබටත් සිදුවේවි.

ප්‍රඥාවේ පහන් සිළෙන් රැයෙහි අඳුර දුරුකරන්න

භික්ෂුවක් ධර්ම සාකච්ඡාවක් රාත්‍රියේ පවත්වන විට එක මහත්මයෙක් නිතර නිතර ඔරලෝසුව දෙස බැලුවා. එම පිංවත් මහත්මයාගේ හැසිරීම තුළින් භික්ෂුව අදහස් කළේ 'දැන් පරක්කු වුණා' කියන කාරණයයි. දැන් එම මහත්මයාට අවශ්‍ය ගෙදර ගිහින් නිදාගන්න. මේ වගේ රාත්‍රීන් ලක්ෂ කීයක් අපේ ජීවිත සමග ගෙවීයන්න ඇතිද? ගෙවීගිය සෑම රාත්‍රියක්ම අවසන් වූයේ එළිවීමෙන්ය. නින්ද පමණක්මයි රාත්‍රීයේ අර්ථය වුණේ. දවල් සහ රාත්‍රී කියන්නේ අපි සාදාගත් සම්මුතීන් දෙකක් පමණයි. ධර්මාවබෝධයට දවල්ද, රාත්‍රියද කියලා වෙනසක් නැහැ. ධර්මාවබෝධය ලැබූ උතුමන් වහන්සේලා ධර්මය අවබෝධකරගන්නේ හුඟාක්ම ඉර පෑයීමට ප්‍රථම අළුයම් කාලයේදී. ඒ කියන්නේ සංකීර්ණ වූ දවාලට වඩා රාත්‍රියේ අවසන් යාමය ධර්මාවබෝධයට හිතකර නිසාමයි.

මාරයා නොයෙක් කාම සිතුවිලි වලින් ඔබේ රාත්‍රිය පුරවා තිබෙන්නේ. කාමයේ දොරගුළු විවර කරගැනීමට රාත්‍රියට අතවනන ඔබ, ධර්මයට හිතකර රාත්‍රියක් හැමදාමත් මාරයාට පාවා දෙනවා. රාත්‍රිය සුන්දරවෙන්නේ ඇස නිදි නොගන්වා කෙලෙස් නිදිගැන්වීමට ඔබ දක්ෂ වුවහොත් පමණි. කෙලෙස් නිදිගැන් වූ රාත්‍රියක සිතක ඇතිවන අපූරු ධර්මයේ රටා නින්දේ හිස් අර්ථය අභිබවා ගිය, ලෝකයේ හිස් අර්ථය පිළිබඳ සිතුවිලි වලින් ඔබව අවදිකරවනවා.

භික්ෂුවගේ භික්ෂු ජීවිතයේ සුන්දරම මොහොත එක්තරා රාත්‍රියක් කීවොත් එය නිවැරදියි. භික්ෂුවගේ ගිහි ජීවිතයේ ගෙවා දැමූ සමහර

රාත්‍රීන් හරිම තුච්ඡයි. ඒවා මාරයාටම අයිති රාත්‍රී කාලයන්. මාරයාට අයිති රාත්‍රීන් කමටහන් කරගෙනයි භික්ෂුව මාරයාගෙන් රාත්‍රිය උදුරාගත්තේ. කාමයන්ගේ නිරුවත හඹා යන සුපුරුදු අවිචාරවත් රාත්‍රියක, කාමයන් සකස් කරදෙන සිතේ නිරුවත හෙලි කරගැනීමට, ඒ අතීත අත්දැකීම් ගොඩාක් උපකාරී වුණා. රාත්‍රියක ඇති නිහැඬියාව තුළ සැඟවී ඇති ධර්මයේ රසය, නිදි නොලබා අවදිභාවය තුළින්මයි ඔබ මතුකරගත යුත්තේ. එවැනි සුන්දර රාත්‍රියක් 'නිදිමතයි' කියලා භික්ෂුව එදා අතහැරියානම් නින්ද විසින්ම මේ සටහන ලියන සුන්දර රාත්‍රියත් ගොරව ගොරවා නිදන රාත්‍රියක් බවට පත්වෙනවා. රාත්‍රියේ නිහැඬියාව ගොරහැඩි නින්දකට යට නොකර පිබිදුණා වූ මනසකින් නින්දේ ආදීනව දකින්න. දීර්ඝ නින්ද ඔබට කර ඇති විනාශය සුළුපටු නොවන බව ඔබට පෙනෙනු ඇත.

නොනිදා පහන්කරන රාත්‍රියකමයි ඔබත් මමත් කවදාහරි ධර්මය අවබෝධ කරගන්නේ. ඒ නිසා නින්දට දෙන වටිනාකම නොනින්දට දී නොනිදන රාත්‍රියක පිංවත් ඔබ ධර්මය අවබෝධ කරගන්න. භික්ෂුව මේ සටහන ලියනවිට වේලාව රාත්‍රී 1.30 යි. බදුල්ල කොළඹ මාර්ග යේ ගමන් කරනා බසයක් වේගයෙන් යනවා ඇතින් ඇසෙනවා. මේ මොහොතේ බසයේ රියදුරු මහතා හැර අන් සියළුදෙනාම නින්දේ පසුවෙනවා ඇති. රියදුරු මහතාටත් නින්ද ගියොත් කුමක් වේවිද? නින්ද නිසා ඔබ විතරක් නොවේ සියල්ලන්ම විනාශයටයි ප්‍රමාදයටයි පත්වෙන්නේ. මේ නිදිගත් රාත්‍රියේදී සුන්දර වූද, අසුන්දර වූද, බියජනක වූද සිහින ඔබ දකිනු ඇත. එම සිහින නිසාම දිවා කාලයේදී ඔබ ලැබුවාට වඩා වැඩි සතුටක් ලබනු ඇත. නමුත් ඔබ මේ දකින්නේ එළිවෙන සිහිනයකි. ඒත් පිංවත් ඔබ මේ රාත්‍රියේදී සමාධිමත් සිතක් සකස් කර ගෙන අවදියෙන් පසුවුණා නම් ලෝකයේ සුන්දර අසුන්දර දේ ඔබට සමාධියෙන් පෙනෙනු ඇත. සුන්දර වූ දෙවියන්ද අසුන්දර වූ අමනුෂ්‍යයින්ද ඔබට පෙනී නොපෙනී යනු ඇත. ඔබ මේ දකින්නේ එළිවෙන සිහිනයක් නොව නින්දට වටිනාකමක් දෙන ලෝකයාට නොපෙනෙන යථාර්තයයි.

සමනළ වැව ජලාශය දෙසින් හමා එන සිහින් සුළං රැළි නින්දකට අවශ්‍ය සියළු පහසුකම් සැපයුවත් පංචනීවරණ යටපත්ව ගිය සිත

නින්දකට මැලිකමක් දක්වනවා. නොනිදා පහන් කරන්න කීවාම ඔබ වැරදි අර්ථයෙන් ගන්න එපා. සෑම මනුෂ්‍යයෙකුටම නින්ද අවශ්‍යයි. නමුත් එය දීර්ඝ ගොරහැඩි නින්දක් නොව උපරිම පැය පහකට සීමා විය යුතු නින්දක්. රාත්‍රිය නොනිදා සිටීම මානසික රෝගීන්ගේද ලක්ෂණයක්. එහෙයින් ඔබ ප්‍රවේශම් විය යුතුයි. අත්‍යවශ්‍ය කෙටි නින්දකට ඔබේ ජීවිතයේ ඉඩ ලබාදෙන්න. එසේ නොවුණහොත් ඔබ මානසික රෝගියෙක් විය හැකිය. ඔබ සිතන සෑම සිතුවිල්ලක් තුළම විඤ්ඤාණය බැසගෙන ඇත. විඤ්ඤාණය නැමති මැජික්කරුවා උපාසක, උපාසිකා කියන රූපයක් නිර්මාණය කරනු ඇත. ධර්මයේ අර්ථය සෑම විටම අන්තයට නොගිය මධ්‍යම ප්‍රතිපදාව තුළට ගොනු වී ඇත. එහෙත් ඔබ ධර්මය අවබෝධ කරගන්නා රාත්‍රිය නම් නොනිදා පහන් කරනු ඇත. එය ඔබ නිදිගත් භව ගමනේ නොනිදා පහන් කළ අර්ථවත්ම රාත්‍රිය වනු ඇත. මේ කරුණු ඔබට සටහන් කරන්නේ ඔබ තුළ වීර්යක් ඇතිකරගනිමින් ධර්ම මාර්ගයේ පෙරට යන්න අවශ්‍ය ශක්තිය ලබාදීමටය. අතීතයේ වැඩසිටි රහතන් වහන්සේලාගෙන් සමහරක් රහතන් වහන්සේලා අවුරුදු පහක දහයක කාලයක් කවදාකවත් නිදාගෙන නැහැ. වෛද්‍ය මතයන් අනුව නම් වර්තමානයේ ඉහත කරුණු ප්‍රතික්ෂේප වෙන්නත් පුළුවන්. ජීවිතයට අවශ්‍ය සැබෑම නින්ද, සැබෑම විවේකය ජීවිතයට ලැබෙන්නේ සමාධිමත් සිතෙන්මයි.

දහවල් කාලයට භික්ෂුව වැඩසිටින කුටිය ඉදිරිපිට සමනල වැව ජලාශය හොඳින් පෙනෙනවා. ජලාශයේ ජලය හුඟාක් අඩුවෙලා. ජලය ගලායාමක් නැහැ. එක තැන නතරවෙලා. මේ රාත්‍රියේ භික්ෂුවගේ සිතත් ඒ වගේමයි. සිතුවිලිවල ගලායාමක් නැහැ. සිතුවිල්ලක් සකස් වුණොත් එය ධර්ම මනසිකාරයක්මයි. පංචනීවරණයි සිතුවිලි ඉදිරියට තල්ලු කරන්නේ. පංචනීවරණ යටපත් වූ සිතට ගලායන්න තල්ලුවක් ලැබෙන්නේ නැහැ. පංචනීවරණයි සිත භවයට තල්ලුකරන්නේ. දීර්ඝ සුවදායක නින්දක් ඔබ බලාපොරොත්තුවන්නේ හෙට දවසට වඩාත් වැඩි වටිනාකමක් අයිතිකර දෙන්නටයි. ඔබ නිදාගන්නේද තෘෂ්ණාව කරේ තබාගෙනය.මෙවන් මොහොතක ඔබ නිදිපැදුරේදී මිය ගිය හොත් උපාදානය සකස් වෙන්නේ හෙට දවසේ යොදාගත් වැඩ රාජකාරීන්ටමය. බලාපොරොත්තු සහගත නින්දේ ඇති නොවටිනාකම

දකිමින් අතීත, අනාගත, වර්තමාන පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යබව දකිමින්ම ලබන නින්ද සුවදායීම නින්දබව ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. එහෙයින් සෑම රාත්‍රියකම සිත බලාපොරොත්තුවලින් හිස් කර නිදාගැනීමට පුහුණුවන්න. නාසය අගට සිත යොමුකරමින් ආශ්වාසය ප්‍රශ්වාසය දකිමින්ම නින්දට යන්න. ධර්ම මාර්ගයේ ගමන් කරන යෝගාවචර පිංවත් ඔබට ථීනමිද්ධය පහව ගිය නොනින්දේ වටිනාකම හොඳින් වැටහිලා ඇති.

රාත්‍රිය ගැන කතාකරන විට රාත්‍රිය ආලෝකවත් කරන පහන් ආලෝක 28 ක් අටවිසි බුදුරජාණන් වහන්සේලා වෙනුවෙන් භික්ෂුව වැඩසිටින කුටියට පෙනෙන නොපෙනෙන මානයේ පත්තුවෙනවා. මේ සුන්දර මොහොතේ අටවිසි බුදුරජාණන් වහන්සේලා උදෙසා දවසේ 24 පැයේම පහන් ආලෝක 28 ක් දල්වන අපි අතීතයේ වැඩසිටියා වූ ලක්ෂ ගණනාවක් වූ බුදුරජාණන් වහන්සේලා උදෙසා පහන් ආලෝක දැල්වීමට ගියහොත් එය කෙසේනම් අවසන් කරන්නද? සංසාරයක් පුරාවට බුදුරජාණන් වහන්සේලා උදෙසා අපි දූල් වූ පහන් ආලෝකයන් එක පිඩක් කොට ගතහොත් එය සූර්යයාගේ ආලෝකය පරාද කරනු ඇත. සූර්යයාගේ ආලෝකය අභිබවා යාමට සමත් ආලෝක පූජාවන් සංසාරයක් පුරාවට අතීත බුදුරජාණන් වහන්සේලා උදෙසා පූජාකර ඇති අපි මේ මොහොතේ බුදුජාණන් වහන්සේ උදෙසා දල්වන පහන් ආලෝකය සඳ හිරු නොමැති කළුවර රැයක නිවීගිය හොත් අපට අන්ධකාරයේ අතපත ගෑමට සිදුවනු ඇත. එයින් අදහස් වන්නේ දූල් වූ සෑම පහන් වැටියක්ම නිවී ගොස් ඇතිය යන්නයි. එසේනම් පිංවත් ඔබ දූන් මෙතනින් නවතින්න. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ඔබ ඉදිරියේ තබා ඇති මාර්ගය පිළිගන්න. සියළු සංස්කාරයෝ අනිත්‍යයයි කියන සම්බුදු වදනම ඔබේ ජීවිතය තුළින් අර්ථයක් දෙමින් සංස්කාරයන්ගේ ශක්තිය සංස්කාර නිරෝධය උදෙසාම ප්‍රයෝජනයට ගන්න. සුදත්ත සිටුතුමා තම මිතුරාගෙන් බුදුරජාණන් වහන්සේ යාබද නගරයක වැඩසිටිනවාය කියන වචනය ඇසුණ සැනින් සඳ, හිරු නොමැති රැයක ආලෝක කිරීමට සමත් සිතේ ප්‍රභාෂ්වරභාවය තුළින් ආලෝකය උපදවාගෙන ගණ අන්ධකාර රාත්‍රියක් ආලෝකමත් කළ ආකාරයට පංච නීවරණ යටපත් වු සිතෙන් කෙලෙස් අඳුර විනිවිද යන

ප්‍රඥාවේ ආලෝකය තමා තුළින්ම නිපදවා ගැනීමට දක්ෂ වෙන්න. අතීත සංසාරයක් පුරාවට බුදුරජාණන් වහන්සේලා උදෙසා ඔබ දැල් වූ පහන් ආලෝකයන්ගේ සංස්කාර ශක්තිය ඔබගේ භවයට කැමති සිතට බයේ සැඟවී ඔබ තුළ බලාසිටින්නේ මෝදු වී විපාක දීමට සුදුසු පරිසරයක් ඔබ තුළ ඔබ ගොඩනගාගන්නා තුරුය. ප්‍රමාදය ඇත්තේ ඔබ තුළමය. මේ ප්‍රමාදයෙන් ඔබව අප්‍රමාදීභාවයට පත්කරන්නේ සද්ධාවත්, වීර්යත්, හිරිඔතප් කියන කාරණා පමණක්මය. අපි මේ මොහොතේ ප්‍රමාදයට පත් වුණොත් අනාගතයේ ඇතිවන අබුද්ධෝත්පාද කාලවලදී ඔබ මනුෂ්‍ය ලෝකයේ සිටියද, දිව්‍ය ලෝකයේ සිටියද තෙරුවන් කියන වචනය එහි අර්ථය අතුරුදහන් වනු ඇත. එදාට අපට සිදුවනුයේ මිථ්‍යාදෘෂ්ඨික ධර්මයන්ට පහන් පත්තු කිරීමටය. අතීතයේ අබුද්ධෝත්පාද කාලවල අපි ගත කළ මෙවැනි මිථ්‍යාදෘෂ්ඨිභාවයන්ද ඒවායේ ආභාෂයන්ද මෙතෙක් අපිට ධර්මය අවබෝධ කර ගැනීමේ මාර්ගයෙන් බැහැරව තැබීමට හේතුවනවාද විය හැකිය. මේ සියල්ල තුළින් අපි දැකිය යුත්තේ භවයේ අනතුරුදායක බවයි. තෙරුවන් කෙරෙහි සද්ධාවෙන් තෙරුවන් උදෙසා ඔබ ජීවිතය අතහරින්න බියවෙන්න එපා. ජීවිතය මරණයට දමන්න. ඒ කියන්නේ ඔබ කෙලෙස් සිඳ දමන්න. ජීවිතය බැඳී තිබෙන්නේ තෘෂ්ණාව නිසාමයි. ඔතන තමයි අවබෝධයේ මග සැඟවී තිබෙන තැන. ඔය තැන ඔබ පහදා ගත යුතුමයි. ඔබ තවමත් බුදුරජාණන් වහන්සේ උදෙසා ජීවිතය අතහැරීමට සූදානම් නැතිනම් එහි තේරුම ඔබ තවම බුදුරජාණන් වහන්සේ කවුද කියන කාරණය තවම අවබෝධ කරගෙන නැහැ. ඔබ තුළ බියක් තිබෙනවා, සැකයක් තිබෙනවා බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්ම මාර්ගය කෙරෙහි. කොටින්ම තවම සූදානම් මදිය කියන විචිකිච්ඡාව තිබෙනවා. මේ කුමන ආකාරයේ සිතුවිල්ලක් සකස්වුවද එය සිතක් පමණක්ම බව දකින්න. ඊයේ දවසේ ඔබට කේන්තියක් ඇතිවුණා නම් මේ මොහොතේ එම සිත තිබෙනවාද? එම සිත දැන් ඔබට අයිති නැහැ. කේන්ති සිත අනිත්‍ය වී ගියා. නමුත් ඉන් සකස්වුණ අකුසලය ඔබට විපාක පිණිස ඔබ පසුපසින්ම එනවා. කේන්තිය ඔබට අයිති නැතිවුණාට එහි අකුසල් විපාකය ඔබට අයිතියි. අනිත්‍යවන දේවල් නිත්‍යභාවයෙන් ගැනීම නිසාම භවගාමී සංස්කාරවලින් අපිව පිරෙනවා. සංස්කාරයන්ගේ

බර දරාගන්න බැරි විඤ්ඤාණය නිරතුරුවම වේගවත් භාවයෙන් ක්‍රියාත්මක වෙන්නේ. සිතක් හඳුනාගන්න පෙරාතුව තව තව සිතුවිලි සකස්වෙනවා. මෙතනදි අප උදාසීන වෙනවා. වැල යන අතට මැස්ස ගහනවා වගේ සිතට අයාලේ යන්න ඉඩදෙනවා. දැන් සිත භවයට තෝතැන්නක්. පිංවත් ඔබ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ උදෙසා දල්වන සෑම පහන් ආලෝකයක් තුළින්ම බුදුරජාණන් වහන්සේගේ රූපකාය නොව බුදුරජාණන් වහන්සේ දේශනා කර වදාළ ධර්මය දකින්න දක්ෂවෙන්න. පහනේ ආලෝකයට ඔබ බැඳුණොත් ඔබ ඒ බැඳෙන්නේ භවයටය. එම පහනේ ආලෝකය අනිත්‍ය යන දැක්ම ඔබ තුළ ඇතිකර ගතහොත් දැල්වුණා වූ පහන් ආලෝකය තුළින් ඔබ දකින්නේ ධර්මයයි. ආමිස පූජාවන් පැවත්වීමට කැමත්තක් දක්වන සියළු පිංවතුන්ලා බුදුරජාණන් වහන්සේ උදෙසා කරන ආමිස පූජාවන් තුළින් අනිත්‍ය සංඥා මතුකර ගැනීමට දක්ෂවෙන්න.

ශීලය සැබවින්ම කුමක් උදෙසාද?

ශීලය කියන්නේ බොහොම ආකර්ෂණීය දෙයක්. සිතූ සිතූ සම්පත් ලැබෙන දෙයක්. එය ශීලයේ දිට්ඨධම්මවේදනීය කුසල් විපාකය.

නමුත් ශීලය තුළින් ඇතිවන හික්මීමක් තිබෙනවා. ඒ හික්මීම පෝෂණයවෙලා තිබෙන්නේ නෙක්ඛම්මය තුළින්. මේ නෙක්ඛම්ම සිත විසින්, සිල්පද ආරක්ෂා කරගැනීම නිසා දායක පිරිස්වලින් ලැබෙන සිව්පසය විනයානුකූලව පාලනයට යටත්කර ගන්නවා. එම හික්මීම නිසාම භික්ෂූන් දක්ෂ වෙනවා ශීලය, සමාධිය උදෙසාම තමා තුළින් පෙළගස්වා ගැනීමට. එම දක්ෂභාවය නැතිකෙනා ශීලයේ දිට්ඨධම්මවේදනීය කුසල් විපාකයන් ලැබෙන විට ශීලය නිසාම ශීලයෙන් පිරිහෙනවා. ශීලයේ උතුම් හරයන් ආරක්ෂා කරගෙන ජීවත්වෙන ගෞරවනීය ස්වාමීන් වහන්සේලා පන්සල ආරණ්‍ය භේදයකින් තොරව අප්‍රමාණ සංඛ්‍යාවක් මේ පිංබිමේ වැඩසිටිනවා. එය අපි කාටත් සැනසීමක්. ශීලයෙන් පරිපූර්ණ භික්ෂුව දක්ෂවෙන්න ඕනේ මුළු ලෝකයම තමාට ලැබුණත් තමාගේ ප්‍රමාණය මොකක්ද කියලා දැනගන්න. අපගේ ප්‍රමාණය තමයි සතර රියනක ප්‍රමාණය. මේ මොහොතේ භික්ෂුව වැඩසිටින පැදුරේ ප්‍රමාණය මගේ ප්‍රමාණය කියලයි භික්ෂුව සිතන්නේ. සුබෝපභෝගී භාවයන් අපට ලැබෙන්නේ පින නිසා. ජීවිතය තුළින් රකින ශීලයේ ආනිසංශ නිසා. කොටින්ම මේවා සංස්කාර. සංස්කාර වල ස්වභාවය අනිත්‍යයි. අනිත්‍යවන දේවල් අපිට ලැබෙනවිට අපි ඒවාට බැඳුණොත් දුකටයි අපි බැඳෙන්නේ.

පිංවත් ඔබ මෙහෙම සිතන්න පුළුවන්. ලෝකයාගෙන් ලැබෙන සුබෝපභෝගී බව අපි පරිහරණය කළාට අපි මේවාට ඇලෙන්නේ

නැහැනේ කියලා. අවංකවම ඔබ නොඇලෙන කෙනෙක් වෙන්න පුළුවන්. ඔබ එවැනි සුවිශේෂී පුද්ගලයෙක් නම් ඔබ ධර්මයට පරමාදර්ශී පුද්ගලයෙක් වෙන්න ඕනේ. එවැනි පරමාදර්ශී පුද්ගලයෙක් කවදාකවත් තමා ප්‍රමාදයට පත්නොවුණොත්, තමා අනුගමනය කිරීමෙන් අනුන් ද ප්‍රමාදයට පත්වේය යන්න සිතමින් ඉන් බැහැරවෙනවා. මෙතැනදී තමන්ගේ පහසු විහරණයත් අන්‍යයන් කෙරෙහි ආදර්ශමත් භාවයත් දෙකම සිදුවෙනවා. මහා කාශ්‍යප මහරහතන් වහන්සේ ගතකළ උතුම් චර්යාවන් තුළින් ඉහත ආදර්ශයන් අපේ ජීවිතවලට හොඳින් ගලපාගන්න පුළුවන්. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ වර්ණනා කරනවා මහා කාශ්‍යප මහරහතන් වහන්සේවම ආදර්ශයට ගන්න කියලා.

ශාසනික පිරිහීම් මැද ධර්ම විනය දෙක දරාගෙන සිටින්නාටමයි මහා සංඝරත්නය කියන්නේ. මන්ද උන්වහන්සේලා ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ඉක්මවා යන්නේ නැහැ. ලෝකයා කෙරෙහි හුදු කරුණාව, අනුකම්පාව, මෛත්‍රිය හේතුවෙන් බුදුරජාණන් වහන්සේ දේශනාකර වදාළ ධර්ම විනය මාර්ගයෙන් බැහැරට යනවා නම් ඒ මොහොතේදීම අපි ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය අභියෝගයට ලක් කරනවා.

අපි අනුකම්පාව වශයෙන් දකින්නේ මෝහය මුසු අනුකම්පාව. ඉන් කෙරෙන්නේ පුද්ගලයා දුකට ඇද දැමීමක්මයි. බුදුරජාණන් වහන්සේලාගේ මහා කරුණාව සත්ත්වයා දුකෙන් බැහැරට ගැනීමයි. ලොව්තුරා බුදුරජාණන් වහන්සේලාගේ මහා කරුණාව නිසාම වැරදි කරන්නා එකවරම ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. විනය කාරණා තුළින් නැවත නැවත පිරිසිදු භාවයට පත්වෙන්න අවස්ථාව ලබාදෙනවා. වැරදි කරන ස්වභාවයෙන් යුත් සිතකුයි අපි වැරදි නොකරන ස්වභාවයකට පත්කරගන්න උත්සහ ගන්නේ. එතනදී වැරදි ස්වභාවිකයි. නමුත් වැරැද්ද වැරැද්ද වශයෙන් දකිමින් නිවැරදි වීමට අවශ්‍ය උවමනාව අපි තුළ තිබිය යුතුයි.

ගෞතම සම්මා සම්බුද්ධ ශාසනයේ අග්‍ර දායිකාව වන විශාඛා උපාසිකාවගේ හෙළිකිරීම් නිසා භික්ෂු, භික්ෂුණීන්ට විනය කාරණා කීපයක්ම බුදුරජාණන් වහන්සේ පනවා තිබෙනවා. මේ හෙළිකිරීම්

ඇය සිදුකළේ ශාසනය කෙරෙහි සැබෑම ගරුත්වය නිසා. මේ සියල්ල තෙරුවන් කෙරෙහි අචල සද්ධාව සකස්වුණ සන්තානවල ලක්ෂණයක්මයි.

මේ ලෝකයෙන් ප්‍රාතිමෝක්ෂ ශීලය සම්පූර්ණයෙන්ම අතුරුදහන්ව යන්නේ තෙරුවන් කෙරෙහි සද්ධාව ඇතිකරගත් අවසාන උපසම්පදා ස්වාමීන් වහන්සේ අපවත්වන මොහොතේයි. ඉන් පසු ලෝකයේ ඇත්තේ ශීලය ප්‍රතික්ෂේප කළ අර්ථයෙන් ගිලිහුණු බුදුදහමකි. සැබෑ ධර්මය අතුරුදහන්ව ගොස්ය. චතුරාර්ය සත්‍ය ධර්මයේ මුල්ම ආර්ය සත්‍ය වන දුක වෙනුවට 'ලෝකය සැපය, එම සැප සුවසේ විඳින්න. තරඟකාරී ලෝකයේ ඔබත් හොඳ තරඟකරුවෙකු වන්න. අවසානයේ මැරිලා නිවන් දකින්න' කියන ධර්මයක් එවිට ඔබට ඇසෙනු ඇත. අපි මේ ගාට ගාට යන්නේ ඔය තැනටය. **අතීත සම්මාසම්බුද්ධ ශාසන දහස් ගණනක් අතුරුදහන් කරවීමට අපිත් හවුල් වෙලා ඇති.** ඒත් මේ ගෞතම සම්මා සම්බුද්ධ ශාසනය එක දිනයක් හෝ වැඩිපුර ආයුෂ ලබාදීමට මම සිල්වත් වෙනවාය කියන අධිෂ්ඨානය අපි එකිනෙකා ඇතිකරගතහොත් ඒ කුසලයෙන්ම තෙරුවන් කෙරෙහි අචල සද්ධාවට ඔබ සමීපවෙනු ඇත. තුන් ලෝකයටම අමිහිරි පණිවිඩයක් වන 'ශාසන අතුරුදහන්වීම' තව තවත් ඈතට තල්ලුකර දමමින් උතුම් සිල්වත් ජීවිත ගතකරන උපසම්පදා ස්වාමීන් වහන්සේලා දහස් ගණනක් මේ මොහොතේ මේ උතුම් දේශයේත් ලෝකය තුළත් වැඩසිටිනවා. මෙතැනින්මයි ශාසනයේ අර්ථය සුරකිව පවතින්නේ.

ගිහි පිංවත් මහත්මයෙක් භික්ෂුවගෙන් විමසුවා හාමුදුරුවනේ ශීලයෙන් තොරව ධර්මය දැකීමේ හෝ ධර්මය අවබෝධ කරගැනීමේ හැකියාව තිබෙනවාද කියල. යම් පිංවතෙක් ප්‍රකාශ කරනවානම් ශීලයෙන් තොරව ධර්මය දැකීමේ හැකියාවක් තිබෙනවාය කියල එය මිථ්‍යාදෘෂ්ඨියක්. ඔහු හෝ ඇය නිවන් මාර්ගය වන ආර්ය අෂ්ටාංගික මාර්ගයයි ඒ ප්‍රතික්ෂේප කරන්නේ. ආර්ය අෂ්ටාංගික මාර්ගය ප්‍රතික්ෂේප කළ සැනින් ඔහු හෝ ඇය බුදුරජාණන් වහන්සේත්, උන්වහන්සේ දේශණා කර වදාළ ධර්මයත් යන දෙකම ප්‍රතික්ෂේප කරනවා. ආර්ය අෂ්ටාංගික මාර්ගයේදී කාරණා 3 ක්ම උතුම් ශීලය

උදෙසා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. ඒ කාරණා නම් සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව කියන අංග තුනයි. මේ තුනෙන් තොරව ආර්ය අෂ්ටාංගික මාර්ගයක් නැහැ. ශීලය තුළින්මයි සමාධිමත් සිතක් සකස්කර දෙන්නේ. සමාධිමත් සිතමයි ඔබව ප්‍රඥාව දෙසට යොමුකරන්නේ.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩසිටින කාලයේදී එක් ගාථාවක් ඇසූ පමණින් ධර්මය අවබෝධ කරගත් උතුමන් සිටියා. ඒ ගෞතම සම්මා සම්බුද්ධ ශාසනයම ඉලක්ක කර පැමිණි උතුමන්. ඒ අය තම අතීත භවයන්හිදී ශීලය සම්පූර්ණ කරගෙනයි පැමිණ තිබුණේ. වර්තමානයේදී අපි එහෙම නොවෙයි. අතීත භවයන්හිදී වීර්යය මදභාවය නිසාම, ලෞකික සැපයන් උදෙසාමයි ශීලය ආරක්ෂාකරගෙන තිබෙන්නේ. ඒ නිසා ඒවා කුසල් සංස්කාර හැටියට විපාක දීලා අවසන් වෙලා. එම නිසා වෙනත් අර්ථයන් තුළින් නෙමෙයි, තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවත්, ශීලයත් තුළින්මයි ඔබ නිවීමේ මාර්ගය අර්ථවත් කරගත යුත්තේ. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ප්‍රඥාව වැඩීම උදෙසාම ගැනෙන සම්මා සංකප්ප අංගය පෝෂණය වන්නේද, වැඩෙන්නේද, ශීලය තුළින්මය. ශීලයෙන් තොරව අව්‍යාපාද, අවිහිංසා, නෙක්ඛම්ම සංකප්පයක් ගැන සිතීම විහිළුවකි. මේ නෙක්ඛම්ම සිතමයි, පිංවත් ඔබට අතීත ශීලයන්ගේ ශක්තිය, අනිත්‍යබව අවබෝධකර දෙන්නේ.

ශීලය නැමැති සංස්කාර ධර්මයේ අනිත්‍යභාවය අවබෝධකරගැනීමට පිංවත් ඔබට මේ මොහොතේ උපකාර වන්නේද ශීලයයි. මේ උතුම් ශීලය තුළින්මයි ශීලයේද අනිත්‍යභාවය ඔබට පසක් කරදෙන නෙක්ඛම්ම සිත සකස්වෙන්නේ. ඒ නිසාම ශීලය කියන කාරණය, දස කුසල් කියන කාරණය දක්වාම ඉදිරියට ගෙනයෑමට පිංවත් ඔබ දක්ෂවෙන්න ඕනේ. ශීලයෙන් තොරව ලබන සමාධිය මිච්ඡා සමාධියක්මයි. එය ඔබව ආර්ය අෂ්ටාංගික මාර්ගයෙන් බැහැර කරනවා. ශීලය තුළින් විකසිත වූ සම්මා සමාධියමයි නිවීමේ මාර්ගයේ අර්ථය වෙන්නේ.

වන්දනාවක සැඟවුන රහස

තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව සකස්කරගත් ජීවිතයක් ගිහිවේවා පැවිදි වේවා කවදාවත් අසරණ වෙන්නේ නැහැ. ඔහු ශක්තිමත් පෞරුෂත්වයක් ඇතිකරගන්න කෙනෙක් වෙනවා. මොකද ඔහු ධර්මය තුළින් බුදුරජාණන් වහන්සේගේ ගුණයන් ඥානයන් දැක්ක කෙනෙක්. මේ ලෝක ධාතුව තුළ ඇති අයෝමය ශක්තිය සරණගිය කෙනෙක්. ඔහුට පෙනෙන්නේ සුගතියමයි. දුගතිය ඔහුට පෙනෙන්නේ නැහැ. ඔහු කථාකරන්නේ ධර්මයමයි. අධර්මයක් කථාකරන්නේ නැහැ. තෙරුවන්ගේ අයෝමය ශක්තිය සරණගිය පිංවතා, පිංවතිය අනුනගේ මුහුණ බලමින් කාගෙන් මට සරණක් පිහිටක් ලැබෙයිද සොයමින් නොයන බව බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. තමාගේ පෞරුෂත්වයෙන් බුදුරජාණන් වහන්සේගේ ශක්තිය පසුපසින් ඔහු නැගීසිටිනවා. නිරතුරුව සුගතිය දකිමින් ජීවත්වන නිසා මොහුට බියක් දැනෙන්නේ නැහැ. තෙරුවන් කෙරෙහි සද්ධාවෙන් බැහැරව ගිය කාට වුවද බිය සකස්වෙනවා. එහෙම කෙනාමයි දකින දකින මනුෂ්‍යයාගේ දකින දකින දේව රූපයන්ගේ මුහුණ බලමින් කාගෙන් මට පිහිටක් ලැබෙයිද සොයමින් පිහිට සොයා යන්නේ. පිංවත් කල්‍යාණ මිත්‍රයෙක් ඇසුරු කරමින් ධර්මය දෙස බලමින් ජීවත්වෙන්න. මෙතනදී ධර්මය කියන්නේ රූප, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ ධර්මතාවයන්ගේ අනිත්‍යභාවයයි. කාගේ මුහුණ බැලුවත් ඔබට පෙනෙන්නේ ඔච්චරයි. ඔබ තුළ සකස්වෙන්නේද ඔච්චරයි. ඒ නිසා අනුනගේ මුහුණ බැලීම නවතා දමා අනුනගේ මුහුණ බලන්න කියල අණ කරන ඔබේ සිත දෙස බලන්න. එවිට ඔබට දැනේවී තමාගේ මුහුණවත් ඔබට අයිති නැති බව. එහෙම එකේ අනුනගේ මුහුණ බලලා මොනවා අයිති කරගන්නද? භික්ෂුව මේ මොහොතේ වැඩසිටින කුටියේ

ගොදුරුගමේ උපාසිකාවක් සිටිනවා. ඇය වයෝවෘද්ධ කාන්තාවක්. ඇය තමයි ගමේ පන්සලේ ප්‍රධාන උපාසිකාව. පසළොස්වක පොහොය දවසට සිල් සමාදන් වුණා. පිරිසට මුද්‍රිත කොළවල ඇති බුදුගුණ භාවනාව ශබ්ද නඟල කියාදෙන්නේ ඇයමයි. පසුගිය දිනයක ඇය දැඩි ලෙස රෝගාතුරවෙලා රෝහලේ නවත්තලා. රෝහලේදී ඇයට ගොඩාක් අසාධ්‍ය වෙලා හුස්ම ගැනීමේ අපහසුව ඇතිවෙලා. ඇය හිතලා තිබෙන්නේ ඇය මැරෙන්නයි යන්නේ කියල. ඒ තරමට ඇය අසාධ්‍ය වෙලා. නමුත් කොහොමහරි ඇය මිය ගියේ නැහැ. නියමිත දිනයේදී භික්ෂුව ඇයගේ නිවසට පිණ්ඩපාතයට වඩිනවිට ඇය කියනවා හාමුදුරුවනේ මැරෙනවාය කියන කාරණය මේ තරම් වේදනාත්මක දෙයක් කියල තමා හිතුවේ නැහැය කියලා. මැරෙන්න යන වෙලාවේ තමන්ට ආපු බය මට කියාගන්න බැහැය කියළ. ඇයට එම අසාධ්‍යය අවස්ථාවේදී තමා කරපු පිංකමක් මතක් වෙලා නැහැ. ලෞකික බැඳීම්මයි මතකයට ඇවිත් තිබෙන්නේ. ඒවා දමල යන්න බැහැය කියන බියමයි සකස්වෙලා තිබෙන්නේ. බලන්න ඇය ගමේ පන්සලේ ප්‍රධාන උපාසිකාව. අනුනට බුදුගුණ කියාදුන්නත් තමා අමූලිකා සද්ධාව තුළයි ඉඳල තිබෙන්නේ. ඒ කියන්නේ කොළයක් බලාගෙන බුදුගුණ ප්‍රකාශ කළත් බුදුරජාණන් වහන්සේගේ, ධර්මරත්නයේ, සංඝරත්නයේ සැබෑ ගුණයන්, ඥානයන් කෙරෙහි විශ්වාසය සකස්වෙලා නැහැ. ඒ නිසාම ශීලයෙන් පරිපූර්ණත්වයට පත්වෙලා නැහැ. මේ හේතු දෙක නිසාමයි මරණ වෙලාවේ බිය සකස්වෙන්නේ. පිංවත් ඔබ අනුනගේ මුහුණු බලමින් යන්න එපා. තෙරුවන්ගේ ගුණයන් දෙස බලමින් ඉන් සකස්කොටගන්නා ශක්තියෙන් මරණ බිය පරාජය කර දමන්න. මරණ බිය ඔබෙන් බැහැර කරන්නේ දොස්තර මහත්තයාවත් ඖෂධවත් නොව තෙරුවන් කෙරෙහි ඇතිකරගත් සද්ධාව විසින්මයි.

භික්ෂුව වැඩසිටිය කුටියේ සිට ගමට වඩින බොරළු සහිත ගුරු පාරේ වඩිනවිට පාපැදි දෙකකින් පැමිණි තරුණ යුවලක් භික්ෂුව සොයා පැමිණියා. එම දෙපල මීට කිලෝමීටර් 7 ක් පමණ එහා ගමක බව ප්‍රකාශ කළා. දැඩි අව් රශ්මියෙන් සහ තෙහෙට්ටුවෙන් විඩා විඳිමින් සිටි මේ දෙපළ මාර්ගය අසල ඇති දියකඩිත්තකින් දෑත් දෙපා දෝවනය කරගෙන වහා වහා පැමිණ බොරළු පොළව මත පසඟ පිහිටුවා දීර්ඝ

ගාථා පෙළක් කියමින් භික්ෂුවට වන්දනා කළා. එය එසේ මෙසේ වන්දනාවක් නොව හදවතින්ම කළ වන්දනාවකි. අවංකව භික්ෂුව ඔවුන් ප්‍රකාශ කළ ගාථා පෙළ කටපාඩමින් කියන්න දන්නෙ නැහැ. මහ අව්කාෂ්ඨකයේ බොරළු ගුරු පාර මත නළල බිම තබා පසඟ පිහිටුවා එම තරුණ දෙපළ වන්දනා කරනවිට භික්ෂුව සිතුවේ මොවුන් දෙදෙනා මොනතරම් ගෞරවයෙන්ද මේ වන්දනා කරන්නේ කියලා. මොවුන් දෙදෙනා භික්ෂුව කෙරෙහි යම් විශ්වාසයක් පෙරදැරිවයි මේ වන්දනා කරන්නේ. ඔවුන් විශ්වාස කරන්නා වූ ඒ ගුණය භික්ෂුව තුළ නොතිබ්බානම් ඒ වන්දනාව ලබනවිටම භික්ෂුවගේ හිස පුපුරාවි කියල භික්ෂුවට සිතුණා. අපි සිතමු ඒ දෙපළ විශ්වාස කළා භික්ෂුව ශීලයෙන් පරිපූර්ණ කෙනෙක්ය කියල. එහෙම සිතල ඒ අය කරන ගෞරවනීය වන්දනාව ලබන භික්ෂුව ශීලයෙන් පරිපූර්ණ නැතිනම් ඒ ගෞරවනීය වන්දනාව ඉදිරියේ භික්ෂුවගේ හිස පුපුරායාවි. මෙතනදි භික්ෂුවගේ හිස පුපුරනවාය කියන්නේ හිස කෑලි කෑලි වලට කැඩීයනවා නොවේ. හිස මානසික වශයෙන් අවුලෙන් අවුලටම පත්වෙනවා. ඊටපස්සේ තමා කරන්නේ මොනවාද කියල තමා දන්නේ නැහැ. කථා කළ යුතු දෙය කථාකරන්නේ නැහැ. කථා නොකළ යුතු දෙය කථා කරනවා. කොටින්ම ඔහු මානසිකව අවුල් භාවයට පත්වෙනවා.

පිප්පලී කියන බමුණු තරුණයා සියතින්ම සිවුරු පොරවාගෙන බුදුරජාණන් වහන්සේ වැඩ සිටින ස්ථානය සොයාගෙන යනවා. ඔහුට ඈතින් පෙනෙනවා බුදුරජාණන් වහන්සේ වැඩසිටිනවා. මින් පෙර බුදුරජාණන් වහන්සේ දැක නොතිබුණ පිප්පලී තරුණයා තමා සොයන උතුම් ශාස්තෘන් වහන්සේ ප්‍රථම දැක්මෙන්ම හඳුනාගන්නවා. ඒ හඳුනාගත් මොහොතේ පටන් බුදුරජාණන් වහන්සේ උදෙසාම මගේ පැවිද්දවේවා කියල සියතින් පැවිදිභාවයට පත්වී සිටි තරුණයා බිම දිගාවී දොහොත් මුදුන් තබා මහපොළව මත පසඟ පිහිටුවා වන්දනා කරමින්මයි බුදුරජාණන් සමීපයට පැමිණෙන්නේ. එසේ පැමිණ පිප්පලී තරුණයා බුදුරජාණන් වහන්සේට දක්වන ගෞරවය දැකපු බුදුරජාණන් වහන්සේ දේශනාකරනවා පිප්පලී තරුණයා කරනලද ගෞරවනීය වන්දනාව මා සම්මා සම්බුද්ධත්වය අවබෝධ නොකොට ලැබුවානම් මගේ හිස සත් කඩකට පුපුරා යාවි කියල. යම් භික්ෂුවක් තමා

තුළින් ඇතිකරගත්තා වූ ගුණයන්, එම ගුණයන් උදෙසා ගිහි පිංවතුන් විශ්වාසයෙන් කරන්නා වූ වන්දනාවන් පූජනීය දෙයක්. ඒ වගේමයි අපි මේ කාරණා දෙක වරදවා ගතහොත් එය ඒ තරමටම භයානක දෙයක් වෙනවා. අපිට වන්දනා කරන පිංවතුන් බලාපොරොත්තුවන ගුණයන් අපි ළඟ නොමැතිනම් වැඳුම් ලබාගැනීමේදී අපි පරිස්සම් වෙන්න ඕනේ. අපි හැකිතාක් ශීලයෙන් ශක්තිමත් වෙමින් සුදානම් විය යුතුයි. ලෝකයාගෙන් ලබන ගෞරවනීය වන්දනාවන් දරාගැනීමේ ශක්තිය ඇති කරගැනීමට. එසේ නොවුණහොත් අපේ හිස අවුල්වේවි. එවැනි ගෞරවනීය වන්දනාවක් ලබන මොහොතේදීවත් දස දිසාවට මෛත්‍රිය පතුරුවමින් ඒ අයට ආශීර්වාද කරන්න අපි දක්ෂ වෙමු. එවිට අපට පුළුවන් අවදානමින් යම් පමණකට මිදෙන්න. වන්දනා කිරීමත්, වැඳුම් ලබාගැනීමත් ඒ තරම් ලෙහෙසි පහසු කටයුත්තක් නොවනබව නුවණින් මෙනෙහි කරමු. ඒ වගේමයි සමහර පිංවතුන්ලා සිටිනවා සිටගෙන වඳිනවා, තවත් සමහර පිංවතුන්ලා සිටිනවා දෙකට නැවිලා වඳිනවා. ස්වාමීන් වහන්සේ නමකට නොවැඳම සිටිනවාට වඩා එහෙම වන්දනා කරන එකත් හොඳයි. නමුත් මේ සියළු කාරණා සිද්ධවෙන්නේ තෙරුවන් කෙරෙහි සද්ධාව තවම සකස් නොවීමේ හේතුවයි. නමුත් වර්තමානයේ ගොඩක් පිංවතුන්ලා ස්වාමීන් වහන්සේලාට පසඟ පිහිටුවලා වන්දනා කරනවා. පිංවතුන්ලා ඒ වන්දනා කරන්නේ ඔබ තුළ ඇතිකරගත් උතුම් ගුණයන්ටමයි. ඔබ ඔබටම කරගන්නා කල්‍යාණ මිත්‍ර භාවයක් එම වන්දනාවන් තුළ සැඟවිලා තිබෙනවා.

මේ අකුසලය පොලී වෙන ලෝකයයි

ගමක ජීවත්වන මැදි වයසේ මහත්මයෙක් භික්ෂුව මුණගැසීමට පැමිණ දුක්ගැනවිල්ලක් ඉදිරිපත් කළා. 'හාමුදුරුවනේ මගේ බිරිඳට මාව රුස්සන්නේ නැහැ. මම කියන දෙය අහන්නේ නැහැ. මේ ගැන කල්පනා කරලාම දැන් මගේ මතක හිටීමේ ශක්තියත් අඩු වෙලයි තියෙන්නේ' කියලා. භික්ෂුව බලාපොරොත්තු වුණේ මේ මහත්මයා භික්ෂුව හමුවීමට පැමිණියේ ධර්ම කාරණයක් දැනගන්නය කියලා. නමුත් ඉදිරිපත් කළේ පවුල් ප්‍රශ්නයක්. දායක මහත්මයා මේ ප්‍රශ්නය ඉදිරිපත් කරලා ඒ තුළින් සැනසීමක් ලැබීමටයි බලාපොරොත්තු වුණේ. මෙවැනි අවස්ථාවක විනය කාරණා ගැන සිතල ඔහුව ප්‍රතික්ෂේප කිරීමට අපිට බැහැ. භික්ෂුවක් සෑමවිටම දායක පිංවතෙක් සතුටුකරන්න ඕනේ ධර්මය තුළින්මයි. ධර්මයෙන් බාහිරව කෙනෙක් සතුටුකිරීමේ අයිතියක් භික්ෂුවකට නැහැ. මෙය සටහන් තබන භික්ෂුවට මතකයි කුඩා කාලයේදී මගේ අම්මා තාත්තා ගේ ඇතුළේ, වචනවලින් සණ්ඩුවෙනවා. එහෙම වෙලාවට පුංචි අපිට හරි බයක් දැනෙනවා. නමුත් ටික වෙලාවකින් දෙදෙනා යාළුවෙලා. ඒ අතීතයේ ඇතිවුණාවූ දෙන්නා දෙමහල්ලන්ගේ සණ්ඩුවල ස්වභාවය. නමුත් වර්තමානය මීට වඩා හුඟක් වෙනස්. උගත් නූගත් භේදයකින් තොරව දුප්පත්, පොහොසත් භේදයකින් තොරව පවුල් ජීවිතවල සමීපභාවය දුරස්වෙලා. වරෙක පිංවත් මහත්මයෙක් භික්ෂුවට ප්‍රකාශකරනවා 'මට හොඳටම අසනීප වුණා. ඒත් බිරිඳ මොකද කියලවත් ඇසුවේ නැහැ. මම තනිවම ගිහින් බෙහෙත් අරගෙන පැමිණියා. දැන් සනීපයි. ඒත් බිරිඳ තවම දන්නේ නැහැ මම අසනීපයෙන් සිටි බවක්වත්. එය ඇය දැනසිටියත් දන්න බවක් හඟවන්නෙත් නැහැ' කියලා.

සමහර පිංවතුන්ලා ගිනියම් වූ පවුල් ජීවිත උරුම කරගන්නේ සද්ධර්මයෙන් ඈත්වීම නිසාමයි. ශීලය තුළින්මයි ඔබේ සිතේ ඇතිවන කෙලෙස් ගිනි නිවාදමන්නේ. මෙතනදි ඉක්මගියා වූ මනෝකර්ම කියන කාරණය ගැන අවධානය යොමු කරන්න ඕනේ. මනෝකර්ම කියන්නේ ලෝභ, ද්වේශ, මෝහ කියන කාරණාවන්. මනසින් සිදුවන මේ අකුසල් තුන නිසාමයි මේ කෙලෙස් ගිනි ඇවිලෙන්නේ. ලෝකය තුළින් කවදාකවත් පිංවත් ඔබට මේ ප්‍රශ්න වලට විසඳුම් ලැබෙන්නේ නැහැ. මුළු මහත් සමාජයම අර්බුදයකට යවලා එම අර්බුදයන් තුළින් මතුවන සමාජ සංකීර්ණතා නැවත නැවත ආදායම් උපදවන මාර්ගබවට පත්කරගන්න සමාජයක් තුළයි ඔබ ජීවත්වෙන්නේ. මේක තමයි ධර්මයෙන් තොර ආර්ථිකයක දියුණුව කියන්නේ. දෙන්නා දෙමහල්ලෝ රණ්ඩුකරන විට අඩුම වශයෙන් දෙදෙනාගෙ න් එක්කෙනෙකුට වස කුප්පියක් හරි විකුණලා ආර්ථිකය දිවවීමටයි ලෝකය බලාපොරොත්තු වන්නේ. සමාජය තුළ මෙම බිඳවැටීම් සිදුනොවනවානම් ආර්ථිකය තුළ නව ආදායම් මාර්ග ඇතිවෙන්නේ නැහැ. එම නිසා සමාජය හැමවිටම ඔබලාට අත දිගු කරන්නේ ප්‍රශ්න ඇතිවන දිශාවටයි. අපි සමාජයෙන් පලාගියේ විසිතුරු ලෙසින් පෙනෙන මෙම ලෝකය හෙළිකරගැනීම නිසාමයි. මනුෂ්‍යයා තුළ විසිතුරුභාවය ඇතිකරවන්නේද තෘෂ්ණාවෙන් හරිතවු මනුෂ්‍යයා තුළම සකස්වෙන පංචඋපාදානස්කන්ධය නිසාමයි. එම ලෝකයාට ඉඳිකටු තුඩක තරම්වත් බැඳෙන්න අප නැවත කැමති නැහැ. ආර්ථිකය විසින්ම අපව රණ්ඩුකරන පරිසරයකට යොමුකරලා අපිටම වස විකුණලා. අපටම ආයුධ විකුණනවා. අපේම ගුණකථන කියලා දියුණුව මනින ලෝකයක් තුළයි පිංවත් ඔබ ජීවත්වෙන්නේ. වාසනාවට බුදුරජාණන් වහන්සේගේ ධර්මය තවමත් ජීවමානව තිබෙනවා මිතුරු වෙසින් සිටින කුරිරු ලෝකයේ වෙස්මුහුණ අපිට හඳුනාගන්න. ලෝකය කවදාකවත් මේ මොහොතේ පවතින තත්ත්වයට වඩා හොඳවෙන්නේ නැහැ. ඒ නිසා පිංවත් ඔබ ලෝකය තුළින් විසඳුම් බලාපොරොත්තු වෙන්න එපා. විසඳුම් අනාගතයට භාරකරන්න එපා. පිංවත් ඔබ ධර්මයේ කැඩපතින් ලෝකය හඳුනාගන්න. එතැනයි ප්‍රශ්නයට ස්ථිර විසඳුම තිබෙන්නේ. ඔබේ ස්වාමිපුරුෂයා, බිරිඳ ඔබට අකීකරු නම්

ඔබ තව තවත් ඔහුට හෝ ඇයට සමීප වෙන්න. ඔබ අනෙකාට සමීප වෙන්න සමීප වෙන්න අනෙකා තවත් ඈත් වෙනවා නම් ඔබ තව තවත් සමීපවෙන්න. අනෙකා ඔබට බැන්නොත්, පහරක් ගැසුවොත්, ඒත් ඔබ තව තවත් ඒ තැනැන්තා හෝ තැනැත්තියට සමීප වෙන්න. ඔබ ආත්ම ගරුත්වය ගැන සිතන්න එපා. මොකද ඔබ සමීප වෙන්නේ ඔබගේ බිරිඳට, ස්වාමිපුරුෂයාට නොවේ ධර්මයටයි. මෙවැනි තැනකදී ඔබව අනෙකාගෙන් දුරස් කරන්නේ මමත්වයේ දැඩිභාවයයි. සැමියා බිරිඳට සමීප වුණාය කියලා ඔබලාට ලැබෙන සුගතියක් නැහැ. ඔහුගේ හෝ ඇයගේ අකීකරුභාවය උපයෝගී කරගෙන පිංවත් ඔබ ධර්මයට සමීපවෙන්න. ඔබලාගේ පවුල් ජීවිතවල අර්බුද මතුවෙනවානම් ඒවා ඔබලා විසින්ම අතීතයේ කරන ලද අකුසල් සංස්කාරවල ප්‍රතිඵලයන්මයි. අතීත භවයන්හිදී අනුනගේ පවුල් ජීවිත අවුල්කරලා, සැකයේ බීජයන් ඇතිකරලා, ඊර්ෂ්‍යා කරලා, එකිනෙකාගේ යුතුකම් පැහැරහැරලා ඇතිකරගත් අකුසල්වල හේතුවෙන්මයි මේ අර්බුද මතුවී එන්නේ. වර්තමාන සමාජ පරිසරයන් තුළින් එම අකුසල් තව තවත් අකුසල් වැඩෙන දිශාවටමයි යොමුකරන්නේ.

මමත්වයේ දැඩිභාවය නිසාමයි අකුසල් විපාකදෙන අවස්ථාවන්හිදී අපි දැඩිව ගැටෙන්නේ. සිහිනුවණින් ධර්මානුකූලව ඔබ එය තේරුම්ගත යුතුයි. ඔබ විසින්ම කරගන්නා ලද අතීත අකුසල් සංස්කාර හේතුවෙන් ඔබලා දුක්විඳින විට ඒවා තව තවත් අකුසල් බවට පත්කර නොගැනීමට ඔබලා දක්ෂ විය යුතුය. එම නිසා ඔබ ආත්මාර්ථකාමීවන්න නැවත බිරිඳක්, ස්වාමී පුරුෂයෙක්, විවාහයක් එපාය කියන අධිෂ්ඨානයට එන්න. එම අධිෂ්ඨානය සඵල කරගැනීම සඳහා මේ ජීවිතයේ බැඳුණ බිරිඳට ස්වාමිපුරුෂයාට මොනතරම් බාධක මධ්‍යයේ වුවද තව තවත් සමීපව යුතුකම් ඉටුකරන්න. මනුෂ්‍යයා සිල්පද වලට වටිනාකමක් නොදෙන අනාගත සමාජයේදී විවාහයක් යනු ගිනි ගොඩක්ම වනු ඇත. මේ ගිනි නිවීමට ඔබට නොහැකිය. මන්ද මේවා සංස්කාර ධර්මයන්ය. මනුෂ්‍යයා අකුසල්කිරීම වැඩිවන්න වැඩිවන්න එම අකුසල් විපාකදීමට සුදුසු ලෝකයකුයි අප ඉදිරියේ බිහිවන්නේ. මනුෂ්‍යයා කාමය වරදවා හැසිරීම වැඩිවන්න වැඩිවන්න එහි අකුසල් විපාකදෙන ලෝකයයි කඳුළු, අඳෝනා අපචාර මැදින් මේ කළ එළි බසින්නේ. ඔබට

මේ මොහොතේ ලැබී ඇති ස්වාමිපුරුෂයා, බිරිඳ ඔබට ලැබිය යුතුම කෙනාමය. කිසිදු අසාධාරණයක් ඔබට සිදුවී නොමැත. එය හොඳ වුවද නරක වුවද එය ඔබේ ලැබීමයි. මේ ලැබීම ඔබට සකස්කරදෙන්නේ අතීත කුසල, අකුසල් සංස්කාරයන් විසින්මය. ලැබුණ දෙයට නොගැටෙන්න. ගැටෙන සිත හඳුනාගන්න. ගැටෙන සිතක් යනු අකුසල් සංස්කාරයක්ම බව දකිමින් කුසල් සංස්කාරයන්ම ජීවිතයට එකතුකරගන්න.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා රූපය කියන්නේ මාරයාය කියලා. එසේ නම් ඔබ ඉදිරියේ ඇති රූපය කාගේ වුවද එම රූපය මාරයාමය. මාරයා නිරතුරුවම උත්සහ ගන්නේ ඔබට අකුසල් රැස්කරදීමටය. ඔබ ප්‍රවේශම් විය යුතුය. මාරයා පරාජය කළ හැක්කේ රූපය සමග ගැටීමෙන් නොව රූපය අවබෝධ කරගැනීමෙන්මයි. ගැටෙන තාක්, සණ්ඩු වෙන තාක් අපි ගැටෙන්නේ සණ්ඩු වෙන්නේ මාරයා සමගය. මාරයාගේ බලවත්භාවය හමුවේ මාරයා සමග ගැටීමට යාම අනුවණ කමකි. මාරයා ගැටීම නැමැති දෙයට බොහෝම කැමතිය. මන්ද මාරයාගේ ලෝකයේ ප්‍රාග්ධනය අකුසලයම වන හෙයිනි. එහෙයින් ඔබට ලැබුණ බිරිඳ ගැටීම උදෙසා නොව අවබෝධය උදෙසාම පරිහරණය කරන්න. ඔහු හෝ ඇය කේන්ති ගත්විට ඔබ සිනාසෙමින් අධිෂ්ඨානශීලීව පෙරට යන්න.

සිටු ගෙදරට මස් සපයන මස් වැද්දෙකුගේ හැඩිදැඩි රූපයට කාමයෙන් බැඳී මස්වැද්දා සමඟ කැලයට පලා ගිය සෝවාන් ඵලයට පත් සිටු දියණියක් එම වැද්දාට සුවච කීකරු බිරිඳක්ව ඔහුගේ සියළු කටයුතු නොපිරිහෙලා ඉටුකරමින් ඔහුත් සමඟ දරුමල්ලන් හදාගෙන ජීවත්වෙමින්, අවසානයේදී ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණයෙන් වැද්දාත් දරු තිදෙනාත් සෝවාන් ඵලය අවබෝධ කරගත් කථාවක් මේ අවස්ථාවේදී භික්ෂුවගේ මතකයට එනවා. අපේ ජීවිත ගිනි ගන්නා සියළුම අවුල් වියවුල් ගැටීම් ඇතිවෙන්නේ අප තුළ ඇති සක්කාය දිට්ඨිය නිසාමය. අප කොතෙක් නිවැරදි පාර්ශවයන් වීමට උත්සහ ගත්තද ගැටීම සකස්වෙන්නේ මමත්වයේ ඇති දැඩි භාවය නිසාමය. ඉහත සිටුදියණිය මමත්වයේ දැඩිභාවය නැති කළ

තැනැත්තියක් නිසා ගැටීමකින් තොරව මස්වැද්දාත් සමඟ සමගියෙන් පවුල් ජීවිතයක් ගත කිරීමට ශක්තිය ලැබිණ. ඇයගේ එම ධර්ම ශක්තිය නිසාම අවසානයේ පවුලේ සියළුදෙනාම ධර්මය දැකීමෙන් සැනසීමට පත්විය. මස්වැද්දාත් දරුවනුත් ශීලයේ පරිපූර්ණත්වයට පත්විය. සක්කාය දිට්ඨිය සිඳුනු තැන, දැන් ඔබ මාරයාව හඳුනාගෙන ඇත. දැන් ඔබ මාරයාගේ උගුල්වලට අසුවන්නේ නැත. දැන් ඔබ ගමන් කරන්නේ හඳුනාගත් මාරයා අවබෝධකරගන්නා දිශාවටය.

පවුල් ප්‍රශ්න ගැන සිහිපත් කිරීමේදී ප්‍රශ්නයට පෙරාතුවත් ප්‍රශ්නයට පසුවත් ඇතිවන ප්‍රධාන අනතුර තමයි කාමයේ වරදවා හැසිරීම. මේ අනතුරේ භයානකබව දකලමයි සමගියෙන් අපි ජීවත්වෙන්න ඕනේ. කාමයේ වරදවා හැසිරීම අප්‍රමාණ දුක් විපාක වශයෙන් ගෙන දෙන අකුසලයක්. වර්තමාන සමාජය මේ සිල් පදයට දෙන වටිනාකම ගොඩාක්ම අඩුවෙලා. ශිල්පදයට දෙන වටිනාකම අඩුවෙන්න අඩුවෙන්න එහි දිට්ඨදම්ම වේදනීය අකුසල් විපාක සමාජය තුළින් හොඳටම පෙනෙනවා. වැරදි කාම සිතුවිල්ලක් සකස්වෙන මොහොතේම ඇස් අන්ධවෙනවා, කන් නෑසී යනවා, මනස වේගවත් වෙනවා. දැන් මෙතන ඉන්නේ සිතුවිලි වේගවත් වෙච්ච ජාති අන්ධයෙක්. ඔහුට හරි වැරැද්ද පෙනෙන්නේ නැහැ. හොඳ නරක ඇහෙන්නේ නැහැ.

අතීතයේ වැඩසිටිය ඉසිදාසී මහරහත් භික්ෂුණීන් වහන්සේ ආත්ම භාව හතක් පුරාවට කාමයේ වරදවා හැසිරීමේ වරද නිසා ගිනිගත් භව ගමනේ ගිනියම් වූ දුක් පීඩාවන් පුර්වේනිවානුස්සති ඥානයෙන් දැකලා ප්‍රකාශ කරනවා. උතුම් අරිහත් උත්තමාවියකගේ මේ සිංහනාදය කර්මය කර්මඵල විශ්වාසයෙන් බැහැරව ගිය වර්තමාන සමාජයට කාමයේ වරදවා හැසිරීම විනෝදාංශයක් කරගත් සමාජයට වටිනා පාඩමක් වේවි. ඉසිදාසී රහත් තෙරණින් වහන්සේ ප්‍රකාශ කරනවා මීට ආත්මභාව හයකට පෙරාතුව මම පිරිමියෙක්. මේ පිරිමිභාවය උපයෝගී කරගෙන කාමය වරදවා හැසිරීම නිසා මරණින් පසු කල්පයක් නිරයේ පැසුණා. නිරයෙන් චුත වෙලා එළිච්චියෙකුගේ කුසේ පිරිමි එළුපැටවකු වෙලා උපත ලැබුවා. මේ එළු ජීවිතයේදී මම මිය ගියේ පුරුෂ ලිංගය කුණුවෙලා. මම නැවත වැඳිරියකගේ කුස වඳුරු පැටවකු වෙලා

ඉපදුණා. මම පුංචි කාලයේම රැලේ නායක වඳුරා මගේ පුරුෂ ලිංගය හපල කඩාගැනීම නිසාම දුකට පත් වී මරණයට පත්වුණා. ඊළඟට මම එළදෙනෙකුගේ කුසේ වසුපැටවෙක් වෙලා උපත ලැබුවා. වසුපැටවා තරුණ වයසට පැමිණෙන විට ලිංග බිජෝද්ධරණයට ලක්වුණා. ඒ ආත්ම භාවයේදී මම මියගියේ පුරුෂ ලිංගය පණුවන් ගසලා. මෙම වසුකුලයෙන් අනතුරුව මම මනුෂ්‍ය අම්මා කෙනෙකුගේ කුස ජාති නපුංසකයෙක්ව ඉපදුනා. ඉන් පසු භවයේ මම කාන්තාවක්ව ඉපදුණා. එතනදීත් මම මගේම ස්වාමිපුරුෂයාගේ දෙවැනි බිරිඳට ඊර්ෂ්‍යා කළා. ඒ හේතුවෙන් මේ ජීවිතයේදීත් මාව ස්වාමිපුරුෂයන් දෙදෙනෙක්ම ප්‍රතික්ෂේප කළා. බලන්න කාමය වරදවා හැසිරීම නම් වරද මොනතරම් නම් දුක් කන්දරාවක් අත්කරලා දෙනවාද? ඕනෑම පිරිමියෙක් කාන්තාවක් බවට පත්කිරීමේ ශක්තිය කාමයන් වරදවා හැසිරීම කියන වරද තුළ සැඟවී තිබෙනවා. වර්තමාන ලෝකයේ පිරිමි ජනගහනය පරදවා කාන්තා ජනගහනය ඉහළ යන්නේ ඉහත හේතුඵල ධර්මයන් නිසාමයි.

ලෝකය දෙස හොඳින් දෑස් හැර බලන්න. ඒ ඔබ දකින්නේ බුදුරජාණන් වහන්සේ දේශනාකර වදාළ ධර්මයයි. මේ කැලෑවල වැඩසිටින විට අපට පෙනෙනවා, වඳුරු රංචුවල නායක වඳුරා තම රැලේ වැඳිරියකට පිරිමි පැටවෙක් ඉපදුනෙත් එම පිරිමි පැටවා මරාදැමීම උදෙසා මොනතරම් වෙහෙසක් ගන්නවාද කියල. කාමය උදෙසාම නායක වඳුරා අකුසලයන් රැස්කරගන්නාවිට වඳුරු පැටියා කාමය වරදවා කළ අකුසලයක විපාකය ගෙවනවා. ලෝකය පුරා පැතිරීයන සමාජරෝග ගත්තත් ඒඩ්ස් වැනි භයානක රෝගය ගත්තත් මේවා කාමය වරදවා හැසිරීමේ දිට්ඨධම්මවේදනීය විපාකයි. ලෝකයා දුස්ශීල වෙන්න දුස්ශීල වෙන්න අනාගත ලෝකයේ උණ, සෙම්ප්‍රතිශ්‍යාව, තරමට ඒඩ්ස් රෝගය පැතිරිලා යාවී. මහා වේගයකින් පවුල් සබඳතා බිඳවැටී යයි. මේ අපි දකින්නේ සංස්කාරයන්ගේ ස්වභාවයයි. පිංවත් ඔබ දැක ඇති ඒඩ්ස් රෝගීන්ට දාව, සමාජ රෝගීන්ට දාව උපදින කුඩා දරුවන්. අපි ඒ මරණයත් සමග සටන් කරන දරුවන් දකිනවිට අනේ අපොයි කියලා කම්මුලට අත ගසාගන්නවා. මේ දරුවා එවැනි අන්තරාකාරී රෝගී මව් කුසක උපත ලැබුවේ ඔහු පෙර ජීවිතවල කරන ලද

කාමයන් වරදවා හැසිරීම නිසාමයි. කාමය වරදවා හැසිරීම වැඩිවීම නිසාම කාන්තා පක්ෂයේ ගහනය සහ ජාති නපුංසකයන්ගේ ගහනයද වර්ධනය වනු ඇත. වැරදි කාම සිතක් සකස්වෙන මොහොතේදීම නිවැරදි කර්මය කර්මඵලය විශ්වාසයෙන් ඔබ තුළ ඇතිකරගන්න. භික්ෂුව මේ සටහන තබනවිට මන්දෝත්සහගත බවක් ඇතිවෙනවා. ලෝකය නිවැරදි කරන්න අපට බැහැ. ලෝකය දිහා බලල අපි නිවැරදි ඕනේ. කාමය වරදවා හැසිරීම සම්බන්ධව භික්ෂුවට ගිහිජීවිතයේ ගොඩාක් අත්දැකීම් තිබෙනවා. ඒ නිසා භික්ෂුව අත්දැකීමෙන්ම දන්නවා එය මොනතරම් අවදානම් කාර්යයක්ද කියන එක. මෙතැනදි කාමය වරදවා හැසිරීම කියා කියූ ඒ කාමයන් තුළින්මයි කාමයේ නිරෝධය දෙසට පාර සොයාගත්තේ. මේ මොහොතේ භික්ෂුව ඒ අතීතය සිහියට නඟාගැනීමට යනවිට භික්ෂුවට පෙනෙන්නේ මැකී ගිය අතීතයක්. ජීවිතය තුළින් කළා වූ කුසල් හෝ අකුසල් සංස්කාර මනසින් මැකිලා ගිහින්. එම නිසාම භික්ෂුවට බියක් කියල දෙයක් සකස්වෙන්නේ නැහැ අතීතය ගැන සිතලා. අතීතයක්, අනාගතයක්, වර්තමානයක් නැහැ. විපාක පිණිස සකස්වෙන අතීත සංස්කාර ලෝගුවක් නම් තිබෙනවා. ඒකට තමයි ජීවිතය කියන්නේ. සංස්කාර නැමති ඉන්ධන වලිනුයි ජීවිතය දුවන්නේ. ඉන්ධන ඉතිරිව තිබෙන තාක්කල් ජීවිතය දුවාවී. එතෙක් දිරායාම පමණක්මයි ජීවිතයට බැඳිලා තිබෙන්නේ.

වරක ශරීරයේ පඨවිය ඉදිමෙනවා. එම ඉදිමීමට ආපෝ, තේජෝ, වායෝ ධාතුනුත් සහෝදරත්වයෙන් උපකාරීවෙනවා. මේ හතර දෙනා බොහෝම සහෝදරත්වයෙන් ජීවත්වෙන්නේ. සතරමහා ධාතුවත් හරියටම ධර්මයෙන් ඈත්වෙච්ච මනුස්සයෙක් වගේ නිතර කිපෙනවා. කිපීම නිසාම රතුවෙනවා, පුපුරනවා අවසානයේදී කුණු සැරව ඕජාව ලෙස ගලායනවා. අවසානයේ අළුත් හැඩයකින් අළුත් වටිනාකමකින් සතර මහා ධාතුවටම එකතුවෙනවා.

පොඩි දෙයක් ආහාරයට ගන්න ලොකු දෙයක් දන්දෙන්න

භික්ෂුව සොයා පැමිණි එක් තරුණ මහත්මයෙක්, තමා තාවකාලිකව පැවිද්ද ලැබීමට බලාපොරොත්තුවෙනවා, එය සුදුසුද කියලා විමසුවා. භික්ෂුව ප්‍රකාශ කළේ මේ ශාසනය තුළ 'තාවකාලික පැවිද්ද' කියලා දෙයක් නොමැති බවයි. තෙරුවන් කෙරෙහි සද්ධාවේ හීනභාවය නිසාම සකස්වෙන විනය කාරණා ප්‍රතික්ෂේප කිරීමේ දුර්වලතාවය හේතුවෙන් මෙවැනි දේවල් සමාජයේ සිදුවෙනවා වෙන්න පුළුවන්. නමුත් තෙරුවන් කෙරෙහි සද්ධාවට පැමිණි කෙනා කවදාකවත් ලොව්තුරා බුදුරජාණන් වහන්සේ උතුම් රහතන් වහන්සේලා දැරූ කසාවත් චීවරය තාවකාලික අරමුණකින් දරන්නෙ නැහැ. එය මහා පාපකාරී ක්‍රියාවක්. කෙනෙක් තාවකාලිකව පැවිද්ද ලබන්නේ සතියකින් එසේත් නැතිනම් මාසයකින් නැවත ගෙදර යාමේ බලාපොරොත්තුවෙන්. නැවත ඥාතීන් සමඟ බිරිඳ දරුවන් සමඟ කාමලෝකය අත්විඳින මනෝභාවයෙන්. ඔහු එම කාමසම්පත් දින කීපයකට පමණයි පැත්තකින් තබලා තිබෙන්නේ. ඒත් ඒවා සිතෙන් තිබෙන්නේ තමා ළඟමයි. මෙවැනි කෙනෙක් මහා සංඝරත්නය පෙරවූ උතුම් චීවරයක් දැරීම චීවරයට දක්වන්නා වූ අගෞරවයක්මයි. එවැනි අගෞරවයක් දක්වන කෙනෙකුට කවදාකවත් සංඝරත්නයේ ගුණයන්, ඥානයන් පිළිබඳ සද්ධාව සකස්කරගන්න බැහැ. මොකද ඔහු සංඝයා දකින්නේ අඩු තක්සේරුවකින්. එම නිසා ඔබ තුළ සද්ධාව හීනභාවයට පත්වෙන්නා වූ තාවකාලික පැවිදි දිවියකට යන්න එපාය කියල භික්ෂුව ඔහුට මතක් කළා.

වැදගත් දෙය කුමක් වුවත් සමාජය තුළ ඕනෑතරම් මෙවැනි දේවල් සිදුවේවි. ඒකට තමයි ධර්මය කියන්නේ. ධර්මය තිබෙන්නේ ගැටෙන්න නොවේ. එම නිසා සමාජය තුළ ඕනෑම දෙයක් සිදුවෙන්න දෙන්න. ඒවා නිවැරදි කරන්න ඔබ යන්න එපා. ඔබ නිවැරදි වෙන්න. එම නිවැරදිභාවය තුළින් සද්ධාව සකස් කරගන්න. තම තමන් තනිවම ගැලවෙන්න තිබෙන අවස්ථාවක් මේක. අත්වැල් බැඳගෙන ගියොත් ප්‍රමාදී භාවයටයි පත්වෙන්නේ. පිංවත් ඔබට අවශ්‍ය නම් ගිහි බැඳීම් වලින් තාවකාලිකව ඉවත්වෙලා ශීලයක් තුළ ජීවත්වෙන්න, සුදුසු ගුරුවරයෙක් යටතේ සුදුවත හෝ සුදුසු පැහැයක් දරාගත් දසශීලයේ පිහිටන්න. එවිට ඔබට පුළුවන් අවශ්‍ය අවස්ථාවකදී ශීලයත් පවාරණය කරලා නැවත සුදුසු ජීවිතයකට පැමිණෙන්න. ඒ ආකාරයට කටයුතු කළොත් ඔබ තුළ වැඩෙන තෙරුවන් කෙරෙහි සද්ධාවට හානියක් වෙන්නේ නැහැ.

අතීතයේ වැඩසිටියා වූ අති උතුම් මහරහතන් වහන්සේලා දරූ උතුම් අරිහත් ධජයට අගෞරවයක් නම් කරන්න එපා. චීවරයට පූජනීයත්වයක් ලබා දෙන්නේ කාමයන් බිමින් තැබූ සිරුරක්මයි. කාමයන් බිමින් තැබීමට වෙර වඩන සිරුරක්මයි විනයානුකූලව සැකසූ චීවරයක් දැරීමට සුදුසු බව සිතන්න. උතුම් චීවරයට අගෞරවයක් කළොත් සංසාරයේ හුගක් ඈතට යන තුරාවට උතුම් පැවිදි ජීවිතයක් ලැබීමේ වාසනාව අහිමිවේවි. සම්මා සම්බුද්ධ ශාසනයක පැවිද්ද කියන්නේ බොහෝම දුර්ලභ දෙයක්. එම නිසා ගිහි ජීවිත ගතකරන පිංවතුන්ලා උතුම් චීවරයට ලබාදිය යුතු ගෞරවය උතුම් කොට සලකන්න ඕන.

එක දායක මහත්මයෙක් භික්ෂුවගෙන් විමසුවා ස්වාමීන් වහන්ස තනිවම වියදම් කර දෙන දානයද හවුලේ පූජාකරන දානයද ආනිසංශ වැඩි කියලා. මෙහිදී අපි සිතන්න අවශ්‍යයි දන්දීමේ මූලිකම පරමාර්ථය තෘෂ්ණාව අඩුකරගැනීම බව. දානයත් තුළින් අප දන් දිය යුත්තේ අප තුළ ඇති දුකට හේතුවෙන තෘෂ්ණාවයි. තනිවම පූජාකරන දානයන්ට වඩා හවුලේ පූජාකරන දානවලින් තෘෂ්ණාව කියන කාරණයෙන් ඔබ තවත් බැහැරවෙනවා. නමුත් හවුලේ දෙන දානය පූජා කිරීමේදී අපේ පිංවතුන් මේ කාරණය දැනගත යුතුයි. ඒ දානයේ අර්ථයන් සමඵල කරගැනීමට.

ඔබ සිතන්න කෙනෙක් දානයක් පූජාකරනවා පෞද්ගලිකවම. එම දානය සඳහා ඔහුට රු. 500 ක් වැයවෙනවා. මොහුට සිතෙනවා මින් පස්සේ පිරිසක් හවුල් කරගෙන දානය පූජා කරනවා කියලා. මේ පිංවත් මහත්මයා තම හිතවතුන් තුන්දෙනෙක් දානයට හවුල්කරගන්නවා. මේ හවුල්වෙන පිංවතුන් තුන්දෙනා රුපියල් 100 බැගින් රුපියල් 300 ක් දෙනවා. ඉතිරි රුපියල් 200 ඉහත දානය හිමි මහත්මයා යොදලා දානය පූජා කරනවා. තනි පුද්ගලයා දානය පූජා කරනවිට වැයකළේ රුපියල් 500 යි. පුද්ගලයන් හතරදෙනෙක් එකතුවෙලා දානය පූජා කරන විටත් වැයකළේ රුපියල් 500 යි. මෙතනදී මොකද සිද්ධ වුණේ. දානය හිමි මහත්මයා රුපියල් 300 ක් ඉතිරිකරගත්තා පමණයි. මේ ආකාරයට පුජාකරන දානය හවුලේ පූජාකරන දානයක් වෙන්නේ නැහැ. එය අර්ථවත් හවුලේ පූජාකරන දානයක් බවට පත්වෙන්නේ දානය හිමි පිංවත් මහත්මයා රුපියල් 500 ම දානයට යොදවනවා නම්. හවුලට එකතුවෙන පිංවතුන් තුන්දෙනාගේ රුපියල් 300 ත් එයට එකතුවෙනවා නම්. එවිට දානයට රුපියල් 800 ක්ම වැයකරනවා. එතකොට එය පිරී ඉතිරීගිය දානයක්. එම දානයයි හවුල් දානයේ ආනිසංශ පක්ෂය වැඩි කර දෙන්නේ. එසේ නොවුණහොත් හවුල් දානයේ නාමයෙන් අපි ඇතිකරගන්නේ තෘෂ්ණාවමයි.

දානය ගැන සටහන් කරනවිට ලුණු ඇඹුල් නිසා දුක්වෙන මහත්මයෙක් ගැන මතක්වුණා. භික්ෂුව වැඩසිටිය කුටියක කැපකරු මහත්මයෙක් භික්ෂුව උදේම ගිලන්පස වැළඳුවාට පස්සේ සහ දානය වැළඳුවාට පස්සේ ඇවිත් අහනවා 'හාමුදුරුවනේ ගිලන්පසට සීනි ඇතිද? වැඩිද? දානයට ලුණු වැඩිද? කියලා. මේ සුපුරුදු දින චර්යාව දින කිහිපයක්ම සිදුවුණා. භික්ෂුවටත් තේරුණා ගිලන්පසවල සීනි හුඟාක් වැඩි බවකුත්. ඒත් භික්ෂුව ඒ ගැන තැකීමක් කළේ නැහැ. කැපකරු මහත්මයා නැවත දිනපතා එම විමසීම කරන නිසා 'ඇයි මහත්තයෝ නිතරම සීනි, ලුණු වැඩිද අඩුද කියල අහන්නේ' කියලා.

එතකොට එම දායක මහත්මයා කියනවා 'ස්වාමීන් වහන්ස, අපි දානයේ ලුණු ඇඹුල් බලන්නේ නැහැ. එහෙම බැලුවොත් පව් සිද්ධ වෙනවා' කියලා. ඒ මහත්මයා පුරුදුවෙලා තියෙන්නේ මහා සංඝරත්නය කෙරෙහි ඇති ගෞරවය වැඩිභාවය නිසාම ලුණු ඇඹුල්

නොබලන්න. ඒ වෙලාවේ භික්ෂුව ප්‍රකාශ කළා ඔබ ගෞරවයෙන් පූජා කරන දානයේ ලුණු ඇඹුල් අඩු වැඩි වුණොත් කොහොමද ස්වාමීන් වහන්සේලා දානය වළඳන්නේ. ඔබ ඔය ඇතිකරගෙන තියෙන ගෞරවය මෝහය මුසු ගෞරවයක්. පිංවත් ඔබ දානයේ ලුණු සීනි ගැන හැමදාම හාමුදුරුවන්ගෙන් විමසන්නේ ඔබ තුළ සැකයක් ඇති නිසා. එම නිසා පිංවත් ඔබ බුද්ධිමත් වෙන්න, ලොව්තුරු බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ චේතනාවයි කර්මයට මුල්වන්නේ කියලා. ඔබ දානයට පිළියෙල කරන ආහාරවල ලුණු සීනි රස බලන්නේ ඔබ ආහාරයට ඇති කැමැත්ත නිසාවත්, ඔබගේ කුසට ආහාරයක් පිණිසවත් නොවේ. ස්වාමීන්වහන්සේලාට දානය වැළඳීමට පහසුව ලබාදීම පිණිසයි. එවැනි චේතනාවකින් ඔබ දානය පිළියෙල කරන වේලාවට අවශ්‍ය නම් ලුණු ඇඹුල් බැලීමෙන් ඔබ තුළ ඇතිවෙන්නේ මෛත්‍රී සිතක්මයි. සංඝරත්නය කෙරෙහි ගෞරවයක්මයි. එය කවදාකවත් ඔබට අකුසලයක් වෙන්නේ නැහැ. මෙවැනි පුංචි කාරණා ඔබ සිහිනුවණින් විසඳා ගතයුතු වෙනවා. මොකද ආහාරය කියන්නේ දුකක්ම නිසා.

අපි ආහාර ගන්න ගමන්, ගන්නා වූ ආහාරය අවබෝධ කරගැනීමටත් උත්සහ ගන්න ඕනේ. ආහාරය අවබෝධකර ගැනීමෙන්ම ඔබට සම්මා දිට්ඨියට පත්වීමට හැකි බව සාරිපුත්ත මහ රහතන් වහන්සේ දේශනා කරනවා. ආහාරයට ඇලීම හේතුවෙන් ආහාරවලම බිහිවන ගුල්ලෙක්, ආමාශගත පණුවෙක් වීමේ අවදානමද තියෙනවා. එහෙයින් ආහාරය ප්‍රයෝජනයට ගත යුත්තේ තෘෂ්ණාව හීනකර ගැනීම සඳහාමය. එසේ තිබියදී ලුණු ඇඹුල් නොබැලීම වැනි කාරණයක් උතුම් ධර්ම කාරණයක් වශයෙන් අල්ලාගෙන සිටීමේදී ධර්මයේ සැබෑ අර්ථයන්ගෙන් ඈත්වීම පමණක්මයි සිද්ධ වෙන්නේ. ලුණු ඇඹුල් බැලීමෙන්ම විචිකිච්ඡාවෙන් මිදෙන්න. විචිකිච්ඡාව නැති වූ සිතකමයි ධර්මයක් වැඩෙන්නේ.

දන්දීම තුළින් ඔබට එහි ආනිසංශ ලෙසින් ලැබෙන්නේ ආයුෂ, වර්ණය, සැපය, බලයයි. ඔබ මෙතැනදී දක්ෂ වෙන්න ඕනේ ඉහත ශක්තිය ශ්‍රද්ධා, වීර්යය, සති, සමාධි ප්‍රඥා කියන ඉන්ද්‍රිය ධර්මයන් ශක්තිමත් කරගැනීම උදෙසාම ප්‍රයෝජනයට ගන්නට. දානය ගැන කථාකරලා

ශ්‍රද්ධාදී ඉන්ද්‍රිය ධර්මයන් කියන තැනටයි නැවත පැමිණියේ. එහෙම නම් දානය කියන්නේ සතර අපායෙන් මිදීමේ මාර්ගයට ශක්තිමත් සාධකයක්මයි. බතක් දන් දීමෙන් ලබන ශක්තියෙනුයි ඔබ කවදාහරි සිතක් දන්දෙන්න ශක්තිය ලබන්නේ. එහෙයින් තෘෂ්ණාව හීනවන දිශාවටම දානයේ අර්ථයන් ප්‍රයෝජනයට ගන්න දක්ෂ වෙන්න.

ලොව්තුරා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා, ත්‍යාගයට දුෂ්කර දේ දන්දෙන තැනැත්තා, මනාප දේ ලබාගනී කියලා. උතුම් දේ දෙනුයේ උතුම් දේ ලබාගනී, අග්‍ර දේ දෙනුයේ අග්‍ර දේ ලබාගනී, ශ්‍රේෂ්ඨ දේ දෙනුයේ ශ්‍රේෂ්ඨ දේම ලබාගනී කියලා. ලෞකික සැප සම්පත් බලාපොරොත්තුව දන් දෙන්නා සිතූ සිතූ සම්පත් ලබාග න්නා අතර එම ලෞකික සැපසම්පත් වල අනිත්‍යභාවය නුවණින් මෙනෙහි කිරීමට දක්ෂ තැනැත්තා දානය තුළින්ම සතර අපායෙන් මිදීමද සාක්ෂාත් කරගනී.

තෘෂ්ණාව හේතුවෙන්ම සකස්වෙන ආහාරය නිසා මනුෂ්‍යයා තුළ සකස්වන පංචඋපාදානස්කන්ධයේ අනතුරුදායකබව දැකලයි බුදුරජාණන්වහන්සේ දේශනා කරන්නේ පුත්‍ර මාංශය අනුභව කරනවා යන හැඟීමෙන් ආහාරය පරිහරණය කරන්න කියලා. දීර්ඝ කාන්තාර ගමනකදී මංමුලාවට පත්ව ආහාර, ජලය නැති වී කාන්තාරය මැද අතරමං වුවහොත්, ජීවත්වීම උදෙසාම තමාගේ එකම දරුවාගේ මාංශය එම දෙමාපියන් අනුභව කරන්නේ යම් අප්‍රියභාවයකින්ද, යම් අකමැත්තකින්ද තම ජීවිතයේ සැපය, මදය, ජවය පිණිස නොවන්නේද ජීවිතය බේරාගෙන කාන්තාරයෙන් පිටවීම සඳහාමය.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරන ඉහත කාරණයේදී ආහාරය තුළ සැඟවී ඇති අනතුරුදායක බව හොඳින් පෙනෙනවා. නමුත් වර්තමාන සමාජය තුළ ආහාර කෙරෙහි ඇති 'සුන්දරත්වය' වැඩි වෙන්න, වැඩිවෙන්න සමාජය ඉහත අනතුරු තුළමයි ගමන් කරන්නේ. ආහාරය ඇතිවන්නේත් තෘෂ්ණාව නිසාමය. ඒ කියන්නේ ආහාරයේ අර්ථය දුකය කියන කාරණයයි. දුකට හේතුවෙන ආහාරය අප ප්‍රයෝජනයට ගතයුත්තේ දුකෙන් මිදීමේ මාර්ගය උදෙසාමයි.

පිංවත් ඔබ පොඩි දෙයක් ආහාරයට ගන්න. ලොකු දෙයක් දන් දෙන්න. එවිට ඔබේ ගතත් සිතත් දෙකම පිරේවි. ඒ මතුකොටගත් පිරුණු සිතමයි, ඒ සිතුවිලි පරම්පරාවමයි සතර අපායෙන් මිදීම උදෙසාම ශක්තිමත් කරගත යුත්තේ.

පව පහුරුගාමින් නොසිට කුසල නිධිය මතුකරගන්න

මේ සටහන තබන වේලාවේ භික්ෂුවට මතක් වෙනවා භික්ෂුව ගිහිකාලයේ ගමේ පුරාණ විහාරයේ වැඩසිටි අපවත් වී වදාළ ගෞරවනීය නායක ස්වාමීන් වහන්සේව. උන්වහන්සේ සෑම වසරකට වරක්ම තම කුටිය හිස් කරනවා. එය සිද්ධකරන්නේ වාර්ෂිකව පැවැත්වෙන දානමය පිංකමට. කුටියේ ඉතිරිව තිබූ සෑම පිරිකරක්ම පිංකමට වඩින ස්වාමීන් වහන්සේලාට පූජා කරනවා. මට මතකයි ඒ ක්‍රියාව තුළින් උන්වහන්සේ පිංකමට පස්සේ ලොකු ආශ්වාදයක් ලබනවා. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කර වදාළ විනය කාරණාවලට යටත්ව සිටිමින් තමන්ට ලැබෙන අතිරික්ත සිව්පසය ඒවා හිඟ පාඩු ස්වාමීන් වහන්සේලාට බෙදාදීම විනය කාරණා ආරක්ෂා කරගැනීමෙන් අපිට ගොඩාක් උපකාරී වෙනවා. නායක ස්වාමීන් වහන්සේ මට කියලා තිබෙනවා රැස්කොට තබාගැනීමට වඩා බෙදා දීමෙන් මහා සැපයක් නිදහසක් ජීවිතයට ලැබෙනවා කියලා. පැවිදිවීමට පෙරාතුව වසර පහක් පමණ මම ගමේ පුරාණ විහාරස්ථානයේ දායක සභාවේ සභාපතිවරයා හැටියට කටයුතු කළා. ඒ කාලයේ නායක ස්වාමීන් වහන්සේ මා කෙරෙහි ලොකු විශ්වාසයක් ඇතිකරගත්තා. ඒ නිසාම පන්සල උපයෝගී කරගෙන මහා පිංකම් රාශියක් සිදුකරගත්තා. ඉන් එක් ගෞරවනීය පිංකමක් තමයි ලොකු පිංකමක් සිදුකරලා කුඩා සාමණේර ස්වාමීන් වහන්සේලා එකලොස් නමක් පැවිදි කිරීමේ පිංකම. මේ වෙලාවේ උන්වහන්සේලාගෙන් කී නමක් පැවිදි භාවය තුළ ඉන්නවාද කියන්න භික්ෂුව දන්නේ නැහැ. නමුත් එම පිංකම තුළින් ලැබුණා වූ කුසලය මට ලැබුණාය කියන

විශ්වාසය මා තුළ තිබෙනවා. ලෝකය උපයෝගී කරගෙන ලැබුණු අවස්ථාව ප්‍රයෝජනයට ගෙන මගේම නිදහස් පාර සොයාගෙන ගියා. මෙතන තමයි ඔබ හඳුනාගත යුතු දක්ෂභාවය තිබෙන්නේ. මේ කාලයේදී මට මතකයි වයස අවුරුදු අසූවක් පමණ වූ වයෝවෘද්ධ නායක ස්වාමීන් වහන්සේ දැඩි ලෙස ගිලන් වූ අවස්ථාවක්. ගිහියෙක් හැටියට හරියටම අවුරුද්දක කාලයක් දවසක් හැර දවසක් සබන්ගාල ඇඟ අතුල්ලල උන්වහන්සේව නාවල තිබෙනවා. ඒ සෑම දිනකම උන්වහන්සේ සිවුරු අඳන සෝදල තිබෙනවා. උන්වහන්සේට දානය වැළඳීමට දෑත් වෙව්ලන අවස්ථාවන්හිදී උන්වහන්සේට සියතින් දන් වළඳවල තිබෙනවා. අවශ්‍ය ප්‍රතිකාර සඳහා වෛද්‍ය මහත්වරුන් ළඟට රැගෙන ගොස් තිබෙනවා. නමුත් මේ මොහොතේ උන්වහන්සේ මොන ලෝකෙක කවුරුන් වශයෙන් ඉන්නවද කියන්න භික්ෂුව දන්නේ නැහැ. නමුත් උන්වහන්සේට උපස්ථානය කිරීම තුළින් රැස්වුණා වූ කුසලය භික්ෂුවට ලැබුණාය කියන විශ්වාසය වර්තමානයේ භික්ෂුවට තිබෙනවා. වයෝවෘද්ධ නායක ස්වාමීන් වහන්සේ පුංචි දරුවෙක් වගේ උන් වහන්සේව නාවන්න එන තුරු තම උස ආසනයේ වාඩිවී ජනේලයේ කවුළුවෙන් බලාසිටින දර්ශනය මට තාම මතකයි.උන්වහන්සේගේ ඒ බැල්ම තුළ ආදරය, රැකවරණය, ආරක්ෂාව, කරුණාව ගැබ්වෙලා තිබුණා. එහි දිට්ඨධම්ම වේදනීය කුසලය නිසාම ඒ හැම දෙයක්ම භික්ෂුවට මේ මොහොතේ ලෝකයෙන් ලැබෙනවා. ලෝකයේ ශ්‍රේෂ්ඨම ආයෝජනයට ජීවිතය යොදවල එහි ප්‍රතිලාභයන් ලබන කෙනෙක් භික්ෂුව. භික්ෂුවට මතකයි ජීවිතයේ එක්තරා රාත්‍රියකදී විහාරස්ථානයේ අධිෂ්ඨාන පූජාවක් සංවිධානය කළා. සුප්‍රසිද්ධ ගෞරවනීය ස්වාමීන් වහන්සේ නමක් පිංකමට වැඩම කළේ. පන්දහසක් පමණ ගිහිපිංවතුන්ලා මේ පිංකමට සහභාගී වුනා. රාත්‍රී 8.00ට විහාරස්ථානයේ සියළුම විදුලි ආලෝකයන් නිවීයනවිට පන්දහසක් පමණ ගිහිපිංවතුන්ලාගේ දෑතේ පහන් හෝ ඉටිපන්දමක් දැල්වුණා. ඝණාන්ධකාර රාත්‍රියක් පහන් ආලෝක පන්දහසකින් ආලෝකමත් වෙනවිට එම පිංකම සංවිධානය කළ මම හිස් දෑතින් පන්දහසක් පහන් ආලෝක දෙස බලාසිටියා පමණක්මයි කළේ. මේ පිංකම නිසාම සිල්වත් පන්දහසක් පමණ පිංවතුන්ලාගේ හදවත් තුළ ඇතිවුණ අධිෂ්ඨාන ශක්තිය මා ලෝකයාට

හොරෙන් තනිවම අනුමෝදන් වුණා. වෙහෙස මහන්සි වී පිංකම් සංවිධානය කර අනුන් පිංකම්වල යොදවා ඒ අයට සොරා මා මගේ කුසල් පක්ෂය ශක්තිමත් කරගත්තා. පිංකම් හුදු ආශ්වාදයක් කරගත්තේ නැහැ. අතීතයේ දල්වූ පහන් ආලෝක පන්දහසක් මොහොතකින් නිවීගියත් නිවීගිය පහන් ආලෝක දෙස බලමින් මා ඇතිකරගත්තා වූ අනිත්‍යයේ බීජය ප්‍රඥාවේ ආලෝකයක් බවට පත්වී තවමත් නොනිමී භික්ෂුව තුළ දල්වෙනවා. පන්සලේ වේවා ආරණ්‍යයේ වේවා ගිහිගෙදර වේවා ඕනෑතරම් කුසල්නිධි තිබෙනවා සැඟවිලා. මේවා සොයාගෙන ගිහිල්ලා සුවසේ භාරගන්න. ලෙඩෙක්, මහල්ලෙක්, පිංකමක් දෙස ඔබ නොබලා යනවා කියන්නේ කුසල් නිධියක් මගහැර යනවා කියන කාරණයයි. වසරක් එරමිණිය ගොතාගෙන කායානුපස්සනා භාවනාව වැඩුවත් නොලැබෙන අවබෝධයක් දිනක් ලෙඩෙක්, මහල්ලෙකුට උපස්ථාන කිරීමෙන් ලැබීමට හැකිබව භික්ෂුව අත්දකීමෙන් දන්නවා. නමුත් එකිනෙකාගේ ඉන්ද්‍රිය ධර්මයන්ගේ ස්වභාවය අනුව මෙය වෙනස් වෙන්න පුළුවන්. කායානුපස්සනාව කියන කාරණය, අසුභය කියන කාරණය භික්ෂුව වඩාත්ම අත්දැක්කේ ගිහි ජීවිතයේදී රෝගීන්ට උපස්ථාන කිරීම තුළින්මයි. අවබෝධයම අරමුණු කරගත් අවංක චේතනාවෙන් රෝගීන්ට උපස්ථානය කිරීමේදී කවදාකවත් රෝගියාගේ අශුචි, මුත්‍රවල ගඳක් අපුලක් දැනුණේ නැහැ. කුසලයේ ශක්තිය විසින් අශුචි, මුත්‍රාවල දුගඳත් නිශේධ කරනවා. මේ සටහන අවසන් කරනවිට මෙ දෙයත් සඳහන් කරන්න ඕන. තරුණ කාලයේ ආවේගශීලී භාවයන් නිසාම ස්වාමීන් වහන්සේලා සමග ගැටුමුත් එකක් දෙකක් ඇතිකරගෙන තිබෙනවා. ඒවායේ අකුසල් විපාකත් සමහරවිටදී ඉදිරියේදී විපාක දෙන්න පුළුවන්.

හුඟ දවසක් පේන්නේ නැතිව සිටි වලිකිකිළි අම්මලා දෙන්නෙක් ආයෙමත් රංචුව සමඟ කුටිය සමීපයට එන්න පටන් අරගෙන. වෙනදාට නැති කිචි, බිචි ගාන හඬ ඇසිල බලනවිට එක වලිකිකිළි අම්මා කෙනෙකුට කුඩා පැටව් හතර දෙනයි. අනෙක් වලිකිකිළි අම්මාට පැටව් එක්කෙනයි. අළුත් සාමාජිකයෝ පස් දෙනෙක් වලිකුකුල් රැනට එකතුවෙලා. මේ පස්දෙනාම ගැහැණු සත්තු. වලිකුකුලන්ගේත් පිරිමි ජනගහණය අඩුවෙනවා වගේ ඒ අයගේත් කාමයේ වරදවා

හැසිරීමේ ක්‍රියාවන් වැඩිවෙලා ඇති. පුංචි පැටව් හතරදෙනෙක් ඉන්න වලිකිකිළි අම්මා වෙනදාට වඩා බොහෝම කඩිසරයි. වේගයෙන් පොළව පහුරුගාමින් ආහාර සොයනවා. වෙනදාට තමාට පමණයි කෑම සොයන්න වෙහෙසුණේ. දැන් පස්දෙනෙකුට කෑම සොයන්න ඕනේ. කෑම සොයන ගමන්ම පැටවින්ගේ ආරක්ෂාවත් බලන්න ඕනි. ඒ නිසා වලිකිකිළි අම්මා තියුණු අවධානයකින් නිතර පසුවෙන්නේ. වෙනදා තරම් භික්ෂුව සමීපයට එන්නෙත් නැහැ. ඒ තරමට ඇය පැටවින්ගේ ආරක්ෂාව පිළිබඳ අරමුණු කෙරෙහි අවධානයෙන් පසුවෙන්නේ. ඒ තියුණු අවධානයත් හරියට ශීලයෙන් තොරව සකස්වෙන මිථ්‍යා සමාධියක් වගේ. දුක ආරක්ෂා කරගැනීම උදෙසායි. ඒ තියුණු අවධානය හේතුවෙන්නේ වලිකිකිළි අම්මා වගේම පැටවුනුත් බොහොම උපක්‍රමශීලියි. පුංචි හෝ අනතුරක ඉවක් දැනුණ සැණින් මේ වලිකිකිළි පැටවුන් වේගයෙන් සැඟවෙනවා. කාමච්ඡන්දයන්ට යට වූ මනුෂ්‍ය සිතත් නිරතුරුවම සැඟවිලා තිබෙන්නේ. ඔබට සමහරවිට පෙනෙනවා ඇති සිත කාමයන්ටමයි දුවන්නේ. බොහොම අකීකරුයි. ධර්ම මනසිකාරයට කැමතිම නැහැ. මේ සැඟවු ණා වූ සිත මතුකරගැනීමට ධම්මවිචය බොජ්ඣංගය වඩන්න කියල බුදුරජාණන් වහන්සේ දේශනාකරනවා. ඒ කියන්නේ සිත ධර්ම මාර්ගය සඳහා උපක්‍රමශීලීව සැඟවුණ විට සද්ධර්මයක් ශ්‍රවණය කරන්න. ධර්ම සාකච්ඡාවක යෙදෙන්න. ධර්ම පොතක් කියවන්න. තෙරුවන් වන්දනාවක යෙදෙන්න. එවිට යටපත්ව ගිය සිත ධර්ම මාර්ගය තුළට ධර්ම කෙරෙහි කැමැත්ත තුළට යොමුවේවි. ඒ මෝදුවන සිතුවිල්ල තුළින් වීර්ය, ප්‍රීතිය, පස්සද්ධිය, සකස් කරදේවි. දැන් ඔබට පුළුවන් සමාධි, උපේක්ෂා ධර්මයන්ට ක්‍රමානුකූලව සිත යොමුකරන්න. සිත අකීකරුවන විට ඔබ උපක්‍රමශීලී වන්න. ධර්ම මනසිකාරයක්ම සිත තුළින් මතුකොට ගන්න දක්ෂවෙන්න. ඇසට ප්‍රිය, හුරුබුහුටි දකින ඕනෑම කෙනෙක් ආදරය කරන වලිකිකිළි අම්මාගේ ජීවිතය තුළ සැඟවුණ අනතුරත් පිංවත් ඔබ නුවණින් මෙනෙහි කරන්න. වලිකිකිළි අම්මා වේගවත්ය කියන්නේ ඇය වේගයෙන් සංස්කාර රැස්කරගන්නවාය කියන කාරණයයි. සෑම නිමේෂයකම ඇය තුළ රැස්වෙන්නේ ලෝභ, ද්වේෂ, මෝහ අකුසලයන්මයි. ඇය සෑම නිමේෂයකම අනාගත භවය

සඳහා අප්‍රමාණ අකුසල් ප්‍රමාණයක් රැස්කරගන්නවා. ඈය කවදානම් ගැලවෙන්නද? වලිකිකිළි අම්මාගේ පවටම උපන් දරුවො පස්දෙනෙක්. කාමයන් උදෙසා කාමයම රැස්කරමින් භවයේ වේදනාත්මකව නිරයේ දුකට සියතින්ම පාර සකස්කර ගන්නවා. මනුෂ්‍යයින් වන අපත් අනාගතයේදීත් වන වදුළුවල සංචාරය කර වලිකුකුළන්ගේ සුන්දරත්වය දැක සතුටුවේවි. සුන්දර ඡායාරූප සිහිවටන ලෙස ගනීවි. අවසානයේදී අපි දෙගොල්ලන්ම එකම තැනයි ඉන්නේ. පෙනෙන සුන්දරත්වය තුළින් හුදු ආශ්වාදයම නොව අවබෝධය ලබන්න.

ඔබ ඔය ඊර්ෂ්‍යා කරන්නේ සංස්කාරවලට බව දැනගන්න

ඊර්ෂ්‍යාව කියන වචනය සටහන් තබනකොටම එහි තරමක පැටලිලි ස්වභාවයක් තියෙනවා. ඒ පැටලැවිල්ල වගේමයි ඊර්ෂ්‍යාව කියන වචනයේ අර්ථය අපව භව ගමනේදී පටලවන්නේ. මමය කියලා ගන්න දෘෂ්ටියේ දැඩි භාවය නිසාම, ලෝකයා අපව ඉක්මවා යනවාට අපි කැමති නැහැ. හැකියාවෙන්, දැනුමෙන්, රූපයෙන්, වත්පොහොසත්කම්වලින්, ගරු සත්කාරවලින්, එකිනෙකා පරයා යනකොට එතැන සකස්වෙන්නේ ඊර්ෂ්‍යාව කියන ධර්මතාවයයි. සංස්කාර කියන ධර්මතාවයේ අර්ථය නොවැටහෙන්න, නොවැටහෙන්න මනුෂ්‍යයා ඊර්ෂ්‍යාව දෙසටමයි ගමන් කරන්නේ.

මේ ලෝකයේ එක සුන්දර කාන්තාවක් ජීවත්වෙනවා, ඇයගේ ශරීරයේ සුන්දරත්වය, ලාලිත්‍යය, රිද්මය, හැඩය, වර්ණය මේ මොහොතේ අතිශය චමත්කාරජනකයි. ඒ රූපය නිසාම ඇය ලෝකයේ ජනප්‍රිය කාන්තාවක්. ඇය මේ රූපයෙන් ලෝකයාව හැඟීම්වලින් අන්දමන්ද කරනවා. ඇය අන්‍යාගමික කාන්තාවක්. ඇයගේ මේ අසිරිමත් රූපය නිසාම ඇයට ඊර්ෂ්‍යා කරන අය අප්‍රමාණව ඇති.

ඒ අසිරිමත් රූපය නිසාම වර්තමානයේ ඇය සතර අපාය දෙසටමයි මාර්ගය සකස්කරගන්නේ. එක් භික්ෂුවක් උතුම් සමාධියේදී අරමුණුකර බලනවා, ඉහත රූමත් කාන්තාව පෙර ජීවිතයේදී කුමන අයුරේ ජීවිතයක් ගතකරපු කෙනෙක්ද කියලා.

එවිට එම භික්ෂුවට අරමුණුවෙලා තියෙන්නේ වයස අවුරුදු 40 ක පමණ පැහැපත් කාන්තාවක්. ඇය තැඹිලි පැහැති රෙදි පටියකින්

බැඳගත් තනපටයක් සහ ඉනේ සිට පහතට අඳින ලද තැඹිලි පැහැති රෙදිකඩකින් සැරසී ඉඳලා තිබෙන්නේ. ඇයගේ ස්වරූපයෙන් භික්ෂුව ඇයව හඳුනාගෙන තිබෙන්නේ දේවදාසියක් ලෙසිනුයි.

ඉන්දියානු සමාජයේ දෙවියන් උදෙසාම කැප වූ, ජීවිතය පූජාකළ කාන්තාවන් සිටියා. ඒ අයගේ මුළු ජීවිතයම ගෙවුණේ තමන් අදහන දෙවියන් වෙනුවෙන්, එම දෙවියන්ට පූජෝපහාර පැවැත්වීම උදෙසායි. ඇය මුළු ජීවිතය තුළදීම කරන්නේ දෙවියන්ව මලින් සැරසීමට මල් මාලා ගොතන එක. දේව මන්දිර පිරිසිදු කරන කාර්යය. සුවඳ හමන මුරුතැන්බත් පිසින කාර්යය. සුවඳ දුමෙන් දේවමන්දිර සුවඳවත් කරන කාර්යය. දෙවියන් උදෙසාම ජීවිතය පූජාකරන්නී... ඇය දේවදාසියක්. තමා අදහන ආගමට අනුව දෙවියන්ට මලින් පූජාපැවැත්වීම නිසාම එහි විපාකයක් හැටියට මේ ජීවිතයේදී අබෞද්ධ පවුලක වුණත්, සුරූපී උපතක් සකස්කොටගත්තා. මේ ජීවිතයේදී ඇයට නිල් මහනෙල් මලක් වැනි ශරීරයක්, ඇස් දෙකක් ලැබුණේ ඇය ගිය ජීවිතයේදී දෙවියන්ට පූජාකළ මල්වල අසිරියෙන්මයි. එහෙමනම් ඇයගේ රූපයට අපි ඊර්ෂ්‍යාකරලා වැඩක් නැහැ. ඒවා හේතුඵල ධර්මයන්. නමුත් එතැන තිබෙන්නේ මිථ්‍යාදෘෂ්ඨික ජීවිතයක්.

ඇයගේ සුන්දර ජීවිතය දකිනකොට අපට පෙනෙන්නේ ඔබ දක්‍ෂනම් ඔබ පූජා කරන මලකින් මොන තරම් අසිරියක් ලබන්න පුළුවන්ද කියලා. නමුත් මල් පූජා කරමින් දෙවියන්ට සුවඳින් පූජෝපහාරයන් පැවැත්වීමෙන් ලබාගත් අසිරිමත් රූපය නිසාම, එම රූපයේ ආශ්වාදය නිසාම, ඇය දන් අකුසල් වැඩෙන මාර්ගයකමයි ගමන්කරන්නේ. ඉහත කරුණ ඔබට සටහන් කළේ ඊර්ෂ්‍යාව කියන කාරණයේ ඇති අර්ථ විරහිතබව ඔබට දැනගන්නයි. ඔබ ඔය ඊර්ෂ්‍යා කරන්නේ අනුන්ගේ කුසල් සංස්කාර ධර්මයන්ටයි. අනුන් පොහොසත්වෙන්නේ, බලවත් වෙන්නේ, රූමත්, උගත් වෙන්නේ ඒ අය පෙර ජීවිතයේ රැස්කරගත් කුසල් සංස්කාර ධර්මයන් අනුවමයි. යමෙක් යමෙකුගේ සංස්කාරවලට ඊර්ෂ්‍යා කරනවා කියන්නේ ධර්මයට ඊර්ෂ්‍යා කරනවාය කියන කාරණයයි. ධර්මයට යමෙක් ඊර්ෂ්‍යා කරනවානම් ඔහු තමාගේම හිස කළු ගලක ගසාගන්නා අඥාන පුද්ගලයෙක් වෙනවා.

පිංවත් ඔබ කළු ගලක ඔලුව ගසාගත්තොත් මොකද වෙන්නේ? මුහුණ ලේ පැහැ වෙනවා, දත් එළියට පනිනවා. මුහුණ ඉදිමිලා විකෘති වෙනවා. මේ සියල්ල ඊර්ෂ්‍යාවේ ඵලයයි.

වරක් භික්ෂුවක් උතුම් සමාධියේ පසුවෙනකොට රාත්‍රී කාලයේදී, තම ජීවිතයේ පළමුවරට යක්ෂණියක් දර්ශනය වෙනවා. ඇය මිථ්‍යාදෘෂ්ටික යක්ෂණියක්. ඇගේ බෙල්ලෙන් උඩ කොටස විතරයි දර්ශනය වෙලා තියෙන්නේ. ඇයගේ ස්වරූපය මොනතරම් බියකරුද කියනවා නම් එම යක්ෂණියගේ කට දෙපැත්තෙන් එළියට නෙරපු අඟල් තුනක පමණ දළ කැබැලි දෙකකුත් ඇයට තිබිලා තියෙනවා. රත්පැහැ ගැන්වුණු පුපුරන මුහුණක් ඇයට තියෙන්නේ. හරියටම තමාගේ හිස තමාම කළුගලක ගසාගත්තා වැනි මුහුණක්. එම බියකරු යක්ෂණිය දකිනකොට, භික්ෂුව එම යක්ෂණිය තුළින් දැකලා තිබෙනනේ ද්වේෂය, ඊර්ෂ්‍යාව ජීවිතය කරගත් කාන්තාවක්. පිංවත් ඔබ සිතන්න ඔබ තුළින් ඊර්ෂ්‍යාව සකස්වෙනවා නම් ඔබ තුළින් ඔබ යක්ෂයෙක්, යක්ෂණියක් දකින්න දක්ෂ වෙන්න. මොකද මේ පවුකාර ධර්මයන්මයි මේ යක්ෂණියට ඒ දුක උරුම කරදුන්නේ. මේ යක්ෂණියගේ දළ දෙකෙන් කියන්නේ ඊර්ෂ්‍යාවේ තියුණුභාවය. යක්ෂණියගේ ජීවිතයේ අකුසල් බලවත්භාවය නිසාම ඇයගේ යක්ෂ ජීවිතයට ආයුෂ, වර්ණය, සැපය, බලය වැඩිවෙලා. ඒ වැඩිවීම හේතුවෙන්නේ තව තවත් දුක වැඩිවීමටමයි. ඒ නිසා පිංවත් ඔබ ඊර්ෂ්‍යා කරන්න එපා. ඊර්ෂ්‍යාව තුළින් යක්ෂයෙක් දකින්න.

සමහර ගම්මානවල පිඬුසිඟා වඩිනකොට මොන තරම් දුප්පත් මනුෂ්‍යයෝ ජීවත්වෙනවද කියලා පෙනෙනවා. ඉළුක් සෙවිලි කළ කුඩා වරිච්චි බිත්ති හතර තුළ පාන්, විස්කෝතුවකින්, කැඳ උගුරකින්, වේල පිරිමහගන්න කුඩා කිරි දරුවන්, අම්මලා දකිනකොට 'අනේ පුතේ, මේ ජීවිතයේදී අනුනට ඊර්ෂ්‍යාකරන්න එපා'ය කියලා කියන්න භික්ෂුවට හිතෙනවා. ඒත් බියක් දැනෙනවා, අනේ මේ දරුවන්ට එහෙම කීවොත්, භික්ෂුව කෙරෙහි ද්වේශයක් ඇතිකරගෙන තව අකුසල් රැස්කරගනියි කියලා. අනුනට ඊර්ෂ්‍යා කරන මනුෂ්‍යයා නැවත මනුෂ්‍ය ජීවිතයක් ලැබුවොත් ඔහු අල්පභෝගී සම්පත් ඇති, අල්පේශාක්‍ය

දුර්වර්ණ ජීවිතයක් ලබන බව ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. බලන්න ඊර්ෂ්‍යාව තුළ මොනතරම් අවදානමක්ද සැඟවිලා තියෙන්නේ. යමෙක් අනුනට ඊර්ෂ්‍යා කරන්නේ නම්, ඔහු ඊර්ෂ්‍යා කරන්නේ තමාගේම සැපයට බව හොඳින් සිතන්න. ඔබ අවබෝධයෙන්ම ඊර්ෂ්‍යාවෙන් මිදෙන්න. එවිට ඔබ උපේක්ෂාව තුළට පැමිණේවි. දැන් ඔබට පුළුවන් මෛත්‍රියට සිත යොමුකරන්න. ඊර්ෂ්‍යාවත්, මෛත්‍රියත් කියන්නේ එක සිතිවිල්ලක් අතර ඇති පරතරය පමණයි. ඒ තරම් සරල තැනක් ඔබ මගහරිනවා.මේ එක සිතිවිල්ලක පරතරය ඔබව සුගතියේ සිට දුගතියට ඇදදැමීමට හොඳටම ප්‍රමාණවත් වෙනවා. වර්තමාන අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ ඇති තරගකාරීත්වය නිසා කුඩා වයසේදීම දරුවන් තුළ ඊර්ෂ්‍යාවේ බීජයන් ඇතිවෙනවා. ඒ අනාගත සමාජයේ ව්‍යාකූල බව කියන්නා වූ බොහොම අනතුරුදායක ප්‍රවණතාවයක්.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා ගිය ජීවිතයේ මහණ බමුණන්ගෙන් කුසලය, අකුසලය ගැන, කළයුත්ත නොකළයුත්ත ගැන නොඇසීමේ හේතුව නිසාම මේ ජීවිතයේදී අකුරු ශාස්ත්‍රයේ අදක්ෂභාවයට පැමිණෙනවාය කියලා. පුද්ගලයකු අතින් ඉහත කාරණා සිදුනොවන්නේ මාන්නය නිසාමයි. එම නිසා නිහතමානීව උත්සහය තුළින් ඔබ අධ්‍යාපන කටයුතු කළහොත් ඔබට අනුනට ඊර්ෂ්‍යා කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. ඔබට ලැබිය යුත්ත ලැබේවි. තෙරුවන් කෙරෙහි විචිකිච්ඡාවෙන් බැහැරවෙන මොහොත දක්වාම ඔබ තුළ ඊර්ෂ්‍යාව සකස්වෙනවා. මොකද ධර්මානුකූලව ලෝකය දකින්න තවම ඔබ ධර්මය කෙරෙහි සැකයෙන් බැහැර නොවී ඇති නිසා.

ඔබ සක්කාය දිට්ඨිය තුළිනුයි ලෝකය දකින්න උත්සහ ගන්නේ. මෙතැනදී ඔබට ලැබෙන ඵලය ලෝභ, ද්වේෂ, මෝහ අකුසලයන්මයි. සද්ධර්මයේ අසමර්ථයන්ගෙන් ලෝකය බැහැරවෙන්න, බැහැරවෙන්න මාරයාගේ ආධිපත්‍යයයි ලෝකයේ පැතිරෙන්නේ. ඒ සද්ධර්මයෙන් බැහැර වූ අනාගත ලෝකයට අවශ්‍ය මාර සමාජය තමයි වර්තමානයේ හරිබරි ගැහෙමින් මේ සකස්වෙන්නේ.

පිංවත් ඔබ සද්ධර්මය තුළින් අනාගතයේ බිහිවෙන මේ විෂම ලෝකය හඳුනා ගන්න. මාරයාගේ විෂම සැලසුම් පරාජය කර ඔබ ලොව්තුරා බුදුරජාණන්ගේ මහා කරුණා ගුණයේ සෙවනට එන්න.

ඔබ විනෝදය ලෙස දකින්නේ තෘෂ්ණාවේ ගින්දරයි

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා 'පිංවත් අනුරුද්ධ, බුදුරජාණන් වහන්සේ දහම් දෙසන්නේ ජනතාව විශ්මයට පත්කරන්නවත්, ජනතාව සුරතල් කරන්නවත්, ලාභ සත්කාර ලබන්නටවත්, මා ගැන මෙසේ යැයි හඳුනාගැනීමටවත් නොවේ. ශ්‍රාවකයින්ගේ මෙලොව, පරලොව යහපත උදෙසාමයි' කියලා. බුදුරජාණන්වහන්සේගේ මහා කරුණාව යොමුවන්නේ සත්ත්වයාගේ මෙලොව පරලොව ඉලක්කකොට පමණක්මයි. මේ සා අසිරිමත් රැකවරණයක් වූ ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණයේ රැකවරණය දරුවෙක් උදෙසා, බිරිඳක්, ස්වාමිපුරුෂයෙක්, තනතුරක්, දේපලක් උදෙසා මගහරිනවා නම් එම අනුවණකමේ විපාකයන් ඔබට අනාගතයේදී අවුරුදු ලක්ෂ ගණනාවක් ගෙවන්නට සිදුවේවි.

පිංවත් ඔබට අයිති නැති දරුවෙක්, බිරිඳක්, ස්වාමිපුරුෂයෙක් උදෙසා ඔබට අයිති සද්ධර්මයේ රැකවරණය අහිමි කරගන්න එපා. මේ කෙටි මනුෂ්‍ය ජීවිතය, අති දීර්ඝ දුකෙන් මිදීම උදෙසාම ප්‍රයෝජනයට ගන්න. බුදුරජාණන් වහන්සේ සාරසංඛ කල්ප ලක්ෂ ගණනාවක් දස පාරමී ධර්ම පිරුවේ පිංවත් ඔබ උදෙසාමයි. ඇස් ගලව ගලවා දන් දුන්නේ, මහා සාගරයේ ජලය පරදවා යන තරමට රුධිරය දන්දුන්නේ, මහ පොළොවේ පස් පරදවන තරමට ශරීර මාංශ දන් දුන්නේ පිංවත් ඔබ උදෙසාමයි. හය අවුරුද්දක් දුෂ්කර ක්‍රියා කෙරුවේ ඔබ උදෙසාමයි. නමුත් පිංවත් ඔබට ඇස්, මස්, ලේ දන් දෙන්න අවශ්‍යම නැහැ. රූපය කෙරෙහි ඇති තෘෂ්ණාව නිසා ඔබ තුළ සකස්වෙන ලෝභ, ද්වේෂ, මෝහ අකුසලයන් පමණක් ඔබ දන් දෙන්න. එවිට අප බෝධිසත්වයාණෝ

ඔබ වෙනුවෙන් දන් දුන් ඇස්, මස්, රුධිරය වෙනුවෙන් ඔබ කෘතගුණ දැක්වූවා වෙනවා. ඔබට ලැබුණ මේ උතුම් අවස්ථාවේදී එවන් අසිරිමත් ශාස්තෘන් වහන්සේ නමකට ණයකාරයෙක් නම් වෙන්න එපා.

මාරයා සැඟවී බලා සිටිනවා, ඔබට දරුවාගේ සුරතල් පෙන්වලා, බිරිඳගේ, සැමියාගේ ආදරය පෙන්වලා, මෙවරත් ඔබව බුදුරජාණන් වහන්සේගේ ණයකාරයෙක් කරවන්නට.

බැංකුවට ඔබ ණය වුණොත් දේපල රාජසන්තක කරාවි බුදුරජාණන් වහන්සේට ඔබ ණය වුණොත් භවයේ සැපයම මාරසන්තක වෙනවා. දුකින් බැහැරට මගපෙන්වූ ඒ උතුම් ශාස්තෘන්වරයාණන් වහන්සේට පිංවත් ඔබ නිරතුරුවම ඔබේ ජීවිතය තුළින් අලෝභ, අද්වේශ, අමෝහ සුවඳ කුසුම් පූජාකරන්න. බුදුරජාණන් වහන්සේ ඒ මල් සුවඳ නිරතුරුවම වර්ණනා කළහ. 'මේ ලෝකයේ කිසිම මනුෂ්‍යයෙකුට, දෙවියකුට, බ්‍රහ්මයකුට විඳින්නට තබා සිතන්නවත් බැරි අප්‍රමාණ වූ දුක් කන්දරාවක් සය අවුරුද්දක් පුරා මම දුෂ්කර ක්‍රියා කළ කාලයේදී වින්ඳා' කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

මේ හැම දුක්ගැහැටක්ම උන්වහන්සේ කැමැත්තෙන්ම දරාගත්තේ පිංවත් ඔබ මේ මොහොතේ ලබන සද්ධර්මයේ සැනසිල්ල ඔබට ලබාදීමටයි. එවන් අසිරිමත් ශාස්තෘන් වහන්සේ නමක් වෙනුවෙන් නිරතුරුවම පිංවත් ඔබ තුළ අලෝභ, අද්වේෂ, අමෝහ සිතිවිලි ඇතිකරගෙන බුදුරජාණන් වහන්සේගේ රූපකාය සිතෙන් මවාගෙන ඒ පවිත්‍ර සිත බුදුරජාණන් වහන්සේට පූජා කරන්න. බුදුරජාණන් වහන්සේගේ උතුම් ගුණයන්, ඥානයන්ට නිරතුරුවම ඔබ මනසින් සමීප වෙන්න. එවිට පිංවත් ඔබ තුළ බුදුරජාණන් වහන්සේ කෙරෙහි අයෝමය විශ්වාසයක් සකස්වේවි.

භික්ෂුවට මතකයි අතීතයේ එක්තරා දවසක උදෑසන සුදු සරමක් සුදු කමිසයක් බෑගයක දමාගෙන උදෑසන 5 ට බසයේ නැගලා, කිසිම ඥාතියෙක් හිතවතෙක්ගෙන් තොරව භික්ෂුව පැවිදිවීම සඳහා උපන් නිවසින් පිටවගිය ආකාරය. එදා පටන් මේ මොහොත දක්වා භික්ෂුවට අයෝමය ශක්තිය වුණේ බුදුරජාණන් වහන්සේමයි. ස්ථිර

වාසස්ථානයක් නොමැතිව තැන් තැන්වල ආරණ්‍යවල හුදෙකලා කුටිවලට ගිය ගමනේදී සමහර පිංවතුන්ලා භික්ෂුව හැඳින්වූවේ 'අභිගුණ්ඨක භික්ෂුව' කියලා. මගේම කණට ඇසිලා තියෙනවා පිංවතුන්ලා එහෙම කියනවා. මා හඳුනාගත්තා ඒ කථාකරන්නේ මාරයාය කියලා. බුදුරජාණන්වහන්සේ කෙරෙහි ශ්‍රද්ධාව තුළින් ඒ වෙලාවේ භික්ෂුව මාරයාව හඳුනාගෙනයි තිබුණේ. මාරයාට අවශ්‍ය වුණේ 'අභිගුණ්ඨක හාමුදුරුවෝ' කියන නම පටබැඳලා මා තුළ ලැජ්ජාව සකස්කරලා ආරණ්‍යයක, පන්සලක ස්ථිර නිත්‍ය පදිංචිකරුවෙක් කරන්න. උතුම් පැවිද්ද ලැබීමට පෙරාතුවම මාරයාගේ එම අවකාශය මම බලාපොරොත්තුවුණා. භික්ෂුවට, ස්ථිර නිත්‍යතැනක් නැති 'අභිගුණ්ඨක හාමුදුරුවෝ' කියනකොට මට සතුටක් ඇතිවුණා. භික්ෂුව කල්පනාකළේ, සාරිපුත්ත මහෝත්තමයාණන් වහන්සේ, මහා කාශ්‍යප මහෝත්තමයාණන් වහන්සේටත් ස්ථිර, නිත්‍ය තැනක් තිබුණේ නැහැ නේද කියලා. ඒ කියන්නේ උන්වහන්සේලාත් 'අභිගුණ්ඨක' ජීවිත ගතකළේ. ඒ උතුම් ජීවිතය මටත් ලැබීම භාග්‍යයක්කොටයි භික්ෂුව සැලකුවේ. ඒ 'අභිගුණ්ඨක භික්ෂුව' කියන නාමය භික්ෂුවට ලැබුණු ගෞරව නාමයක් ලෙසයි භික්ෂුව මේ මොහොතේත් දකින්නේ. ඒ ගත කළ අභිගුණ්ඨකභාවයමයි මේ සටහන් ලියන්න අවශ්‍ය අවබෝධය ලබාදුන්නේ. මොකද භික්ෂුවට පැවිදිවෙන්න පෙරාතුව කවදාකවත් බුදුරජාණන්වහන්සේ දේශනාකොට වදාළ සූත්‍ර පොතක් කියවා තිබුණේ නැහැ. කවදාවත් භාවනා පංතියකට ගිහින් තිබුණේ නැහැ. ජීවිතේ කවදාවත් දහම්පාසලකට ගිහින් තිබුණේ නැහැ. භික්ෂුව ගිහිකාලයේ අධ්‍යාපනය ලැබුවේ ක්‍රිස්තියානි පාසලක. එහි බුදුදහම ඉගැන්වූවේ 7 වැනි ශ්‍රේණියෙන් පසුවයි. මෙවැනි පසුබිමක් තුළ 'අභිගුණ්ඨක හාමුදුරුවෝ' කියන අර්ථයේම ඵලයයි මේ භික්ෂුව. අභිගුණ්ඨක කියන වචනයේ අර්ථය මෙතැනදී භික්ෂුව දකින්නේ 'අතහැරීම' කියන අර්ථයෙන්. ඔබ අතහැරිය යුත්තේ රූපය කෙරෙහි ඇති තෘෂ්ණාව පමණක්මයි. එතැනදී ඔබට මුළු සද්ධර්මයේම රැකවරණය ලැබෙනවා. සද්ධර්මයේ රැකවරණය ලබාගත් තැනැත්තාට මිනිස්, දෙවි, බඹුන් තුන් ලෝකයේම ගරු බුහුමන් ලැබෙනවා. 'ඔබ සියල්ල අතහරින්න. එවිට ඔබට සියල්ල ලැබෙයි' කියන අර්ථය භික්ෂුව නිරතුරුවම කියන්නේ ඉහත අත්දැකීම නිසාමයි.

භික්ෂුවට ඉහත ශක්තිය ලබාදුන්නේ, සසර පිළිබඳ ඇතිකරගත් බිය විසින්මයි. මේ බිය සකස්කරදුන්නේ තෙරුවන් කෙරෙහි ඇතිකරගත් ශ්‍රද්ධාවයි.

සමාජය තුළ පිංවතුන්ලා විනෝදවනවිට, සෙල්ලම්කරනවිට භික්ෂුවට හරි බයක් දැනෙනවා, ඔබලා පිළිබඳව. විනෝදවෙන්න සෙල්ලම්කරන්න පුළුවන් ලෝකයන් නොවෙයි මේක. ලෝකය නිරතුරුවම ගිනිගන්නවා තෘෂ්ණාවෙන්. තෘෂ්ණාවේ ගින්දරයි ඔබ විනෝදය, සෙල්ලම හැටියට දකින්නේ. නොදන්නාකම නිසාම ගින්දරත්, විනෝදයත් සෙල්ලමක් කොටගනිද්දී පිච්චීමට අදාළ සංස්කාරයන් අනාගත විපාකයන් පිණිස සකස්වෙනවා. පරිස්සමෙන් විනෝදවෙන්න. තෘෂ්ණාව කියන්නේ ගින්දරක්. අනුනගේ විනෝදය, සෙල්ලම ඔබ ගින්දරක් ලෙස දකිමින් ඒ ගිනි නිවන දිශාවට යොමුවෙන්න.

ඔබේ භෂ්මාවශේෂ පූජනීයත්වයට පත්කරන්න

පිංවත් මහත්මයෙක් භික්ෂුවගෙන් විමසුවා 'හාමුදුරුවනේ කුසලය සහ පින කියන්නේ එකම කාරණයක්ද?' කියලා. මෙය පිංවතුන්ලා නිතර ස්වාමීන් වහන්සේලාගෙන් විමසන ප්‍රශ්නයක්. සාරිපුත්ත මහෝත්තමයාණන් වහන්සේ දේශනා කරනවා, කුසලය කියලා කියන්නේ කාරණා 10 කට කියලා. එම කාරණා දහය තමයි සතුන් මැරීමෙන් වැළකීම, සොරකම් කිරීමෙන් වැළකීම, කාමය වරදවා හැසිරීමෙන් වැළකීම, බොරුකීමෙන්, පිසුනාවාචා, පරුෂාවාචා, සම්පප්‍රලාප කීමෙන් වැළකීම, අනභිධ්‍යාව, අව්‍යාපාදය, සම්මාදිට්ඨිය යනු කුසලය කියලා. ඉහත කාරණා 10 ට තමයි සාරිපුත්ත මහෝත්තමයාණන් වහන්සේ කුසලය කියලා කියන්නේ.

කුසල් මූලයන් හැටියට සාරිපුත්ත මහරහතන් වහන්සේ දේශනා කරනවා අලෝභ, අද්වේශ, අමෝහය කියලා. මේ කාරණා දහය පිංවත් ඔබට මේ ආකාරයට ගන්නත් පුළුවන්. ඒ කයෙන් සිදුවෙන්නා වූ කුසල් 3 යි, වචනයෙන් සිදුවෙන්නා වූ කුසල් 4 යි, මනසින් සිදුවෙන්නා වූ කුසල් 3 යි කියලා. ඉහත කාරණා 10 ට තමයි කුසල් කියලා කියන්නේ.

එතකොට පින කියලා කියන්නේ කුමකටද? බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා පින යනු යහපත්, සිත්කළු, මන වඩන සැපයට කියන තවත් නමක්ය කියලා. එසේනම් පින කියන්නේ සැපයට කියන්නා වූ තවත් නමක්. දැන් පිංවත් ඔබට කුසලය කියන වචනයේ අර්ථයත්, පින කියන වචනයේ අර්ථයත් හොඳින් පැහැදිලියි. පින කියන කාරණයත්, කුසලය කියන කාරණයත් අර්ථයන් දෙකක්. නමුත් මේ

කාරණා දෙක හේතුඵල අනුව එකට සම්බන්ධ වෙනවා. ඒක වෙන්නේ මෙහෙමයි. යමෙක් කුසල් ධර්මයන් ජීවිතය තුළින් වඩනකොට, ඔහු තුළ සැපය, ඒ කියන්නේ පින ඇතිවෙනවා. යම් පිංවතෙක් සැපයෙන් ජීවත්වෙනවානම් ඔහු ජීවත්වෙන්නේ කුසල් ධර්මයන් ජීවිතය තුළින් සිදුකරගන්නා නිසාමයි. පිංවත් ඔබ ධර්මානුකූලව සැපයෙන් ජීවත්වෙනවාය යන්නෙන් කියවෙන්නේ ඔබ තුළ කුසලයත්, පිනත් දෙකම තිබෙනවාය කියන කාරණයයි. පිංවතුන් වචනවල අර්ථයන් පසුපස හඹායෑම හැකිතාක් අඩුකර අනිත්‍ය ධර්මය තුළින්ම විතර්ක සකස්කොටදෙන සිත දෙස බලන්න දක්ෂවෙන්න. එවිට ඔබට පෙනේවි ඔබ පිළිතුර තුළ සිටිමින්ම පිළිතුරු සොයන බව.

පිංවත් මනුෂ්‍යයෙක් භික්ෂුවගෙන් විමසුවා 'ස්වාමීන් වහන්ස, මනුෂ්‍යයන් විසින් පූජෝපහාර පවත්වන ධාතූන් වහන්සේලා ඍද්ධියෙන් වඩින්නේ කොහොමද කියලා. පිංවත් ඔබ ධර්ම රත්නය පිළිබඳව අචල ශ්‍රද්ධාවක් ඇතිකර ගැනීමට අවශ්‍ය නම් මෙවැනි කාරණාවන් පිළිබඳව ධර්මානුකූල අර්ථය දැනගතයුතු වෙනවා. එසේ නොවුණහොත් මෝහය මුසු, අමූලිකා ශ්‍රද්ධාවයි අප තුළ වැඩෙන්නේ.

ධාතූන් වහන්සේ නමක් කියන්නේ අතීතයේ වැඩසිටි උතුම් ආර්යයන් වහන්සේලාගේ ශරීරයේ කොටසකට. එය දන්ත ධාතූන් වහන්සේ නමක් වෙන්න පුළුවන්, නැතිනම් ශරීරයේ වෙනත් අස්ථි කැබැල්ලක් වෙන්නත් පුළුවන්. අස්ථි කැබැල්ලක්, දතක් කියලා කියන්නේ සතර මහා ධාතුවෙන් සැදුණු දෙයක්. මේ උතුම් ආර්යයන් වහන්සේලා කියන්නේ, රූපයේ ආධිපත්‍යය පතුරුවාගෙන සිටින සතර මහා ධාතුව තම අවබෝධ ඥානයෙන් විනිවිද දුටු කෙනෙක්. සත්ත්වයා ලෝකයට බැඳ තබන පංචඋපාදානස්කන්ධයේ මුල්ම උපාදානස්කන්ධය වන රූප උපාදානස්කන්ධය අවබෝධකරගත් තැනැත්තාමයි රූපය කෙරෙහි ඇති තෘෂ්ණාවෙන් මිදෙන්නේ. රූපය නැමැති සතර මහා ධාතුව අවබෝධකරගත්තා වූ රහතන් වහන්සේ ඒ අවබෝධය ලබාගන්නේ නාමරූප ධර්මයන් උපයෝගී කරගෙනමය. රහතන්වහන්සේ පිරිනිවීයන මොහොතේ විඤ්ඤාණ ධාතුව රහතන් වහන්සේ තුළින්ම පිරිනිවී ගියත්, මෙලොව ඉතිරිවුණා වූ ශරීරය හෙවත් සතර මහා

ධාතුව පූජනීයත්වයට පත්වෙනවා. සතර මහා ධාතුව අවබෝධ කරගත් නිසාමයි උන්වහන්සේගේ රූපය පූජනීයත්වයට පත්වෙන්නේ. එම නිසාම ධාතුන් වහන්සේලාට පූජෝපහාර දක්වන්න කියන කාරණය බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

මේ කිසිම ධාතුන් වහන්සේනමකට ඍද්ධිමත්භාවයක් ඇතිකරගෙන තැනින් තැනට වැඩම කරන්න පුළුවන්කමක් නැහැ. ධාතුන් වහන්සේනමකට ඍද්ධිමත්භාවයක් ඇතිවීමට නම් ධාතුන් වහන්සේ තුළ පංචඋපාදානස්කන්ධයක් සකස්වෙන්න අවශ්‍යයි. පංච උපාදානස්කන්ධයක් සකස්වෙන්න නම් සංස්කාර හේතුවෙන් සකස්වුණ විඤ්ඤාණය ධාතුන්වහන්සේලා තුළ බැසගෙන තිබෙන්න ඕනේ. ඒ හේතුවෙන්ම නාම රූප ධර්ම සකස්වෙන්න ඕනේ. ආයතන හය පිහිටන්න ඕනේ. මේ කිසිවක් සකස් නොවන ධාතුන්වහන්සේ නමක් කෙසේ නම් ඍද්ධියෙන් වඩින්නද? එය කවදාකවත් ධර්මානුකූලව සිදුවන දෙයක් නොවෙයි. ඒ අපි අමූලිකා ශ්‍රද්ධාව නිසාම ධර්මයේ සැබෑ අර්ථයෙන් දුරස්ව ලෝකය දකින නිසාම ඇතිකරගන්න අදහසක්.

නමුත් පිංවතුන්ලා අපිට නිතර ප්‍රකාශ කරනවා. තම තමන්ගේ පූජනීය ස්ථානවලට ධාතුන් වහන්සේලා වැඩියා කියලා. 'ගිය සතියේ ධාතුන්වහන්සේලා දෙනමයි වැඩසිටියේ. අද බලනකොට ධාතු කරඬුවේ ධාතුන් වහන්සේලා හත්නමක් වැඩ සිටියා' කියලා. ඒ කියන්නේ ධාතුන් වහන්සේලා පස්නමක් වැඩිවෙලා. ඒ කියන්නේ මෙතැනදී සිද්ධවෙන්නේ ධාතුන් වහන්සේලා ඍද්ධියෙන් වැඩීමක් නෙමෙයි. සම්‍යදෘශ්ඨික දෙවිවරු විසින් සුදුසු පූජනීය ස්ථානවලට ධාතුන් වහන්සේලා රැගෙන යනවා. අතීතයේ වැඩසිටියා වූ සාරිපුත්ත මහරහතන් වහන්සේගේ පටන් ඒ උතුම් ආර්යයන් වහන්සේලාගේ අවවාද අනුශාසනා ලැබූ, ශිෂ්‍යභාවය ලැබූ නමුත් නිවන් අවබෝධ කරගැනීමට නොහැකි වූ ලක්ෂ ගණනාවක් ගිහි පැවිදි පිංවතුන්ලා මේ මොහොතේ සශ්‍රික දිව්‍යතලවල මහේශාක්‍ය දෙවිවරු ලෙස වැඩසිටිනවා. ඒ දෙවිවිවරු තමන් සතු දිව්‍යචක්කු තුළින් තමන්ගේ ගුරුවරයාගේ පූජනීය ධාතුන් වහන්සේලා වැඩසිටින්නේ කොහේද යන්න දන්නවා. තම සත්පුරුෂ ගුරුවරයාට ඇති ගෞරවය

නිසාම එම ගුරුවරයාගේ පූජනීය ධාතූන් වහන්සේලාට අවශ්‍ය පූජෝපහාරයන් නොලැබෙනවා නම්, එම දුසිල්වතුන් සිටින ස්ථානවල වැඩසිටිනවානම් දෙවිවරු තම දිව්‍යචක්කු වලින් එය දැකලා සුදුසු පූජනීය ස්ථානවලට, සිල්වතුන් අතරට එම ධාතූන් වහන්සේලා රැගෙන ගොස් තබනවා. මහේශාක්‍ය දෙවිවරු තම අතීත කල්‍යාණ මිත්‍රයන් වහන්සේලාට දක්වන ගෞරවය තමයි පිංවත් ඔබ 'ධාතූන්වහන්සේලා ඍද්ධියෙන් වඩිනවා'ය යනුවෙන් දකින්නේ. ඉහත කාරණයෙන්ම පිංවත් ඔබ දැනගන්න ඕනා, උතුම් ධාතූන් වහන්සේලාට පූජෝපහාර දක්වන්න කියලා බුදුරජාණන් වහන්සේ දේශනාකර වදාළ කරුණට දෙවිවරු වර්තමානයේත් මොනතරම් ගරුකරනවාද කියන දෙය.

මේ මොහොතේ සම්‍යාදෘශ්ඨික දෙවිවරු උතුම් ධාතූන් වහන්සේලාට ගරු සත්කාර කරමින් පිංවත් ඔබලාට දෙන පණිවුඩයක් තිබෙනවා. ඒ උතුම් පණිවුඩය ඔබට හඳුනාගන්න පුළුවන්කම ලැබෙන්නේ අකාරවතී ශ්‍රද්ධාව කියන තෙරුවන්ගේ ගුණයන්, ඥානයන් අර්ථයෙන් දැක ඇතිකරගන්නාවූ ශ්‍රද්ධාව තුළින්මයි. මෝහය මුසු අමූලිකා ශ්‍රද්ධාවෙන් නම් නොවෙයි. පිංවත් දෙවියන් ඔබට කියන පණිවුඩය තමයි, සම්මා සම්බුද්ධ ශාසනය ජීවමානව පවතින මේ මොහොතේ මහපොළොවට පස්වෙන, ගින්දරට අළුවෙන, පිංවත් ඔබගේ ඔය ශරීරයේ ඇටකටු, ධාතූන් වහන්සේලා බවට පත්කර පූජනීයත්වයට පත්කරගන්න කියන කාරණය. ධාතූන් වහන්සේ තුළින් ඔබ දැකිය යුතු අර්ථය ඔතැනයි තිබෙන්නේ. පිංවත් ඔබටත් පුළුවන් ඔය ශරීරයේ තිබෙන සෑම ඇට කැබැල්ලක්ම පූජනීයත්වයට පත්කරගන්න. උතුම් ධාතූන් වහන්සේ නමක් බවට පත්කරගන්න. එය කරගතහැක්කේ උතුම් ධාතූන්වහන්සේලා වන්දනාකරන ගමන්ම, ඉන් ඔබ්බට ගොස් ධාතූන් වහන්සේත් අනිත්‍යයේ ඵලයක්ය, ධාතූන්වහන්සේත් අනිත්‍යභාවයට පත්වෙන සතර මහා ධාතු කොටසක්ය කියන කාරණය අවබෝධ කරගැනීමට දක්ෂ වීමෙන්ය. එම අවබෝධය ලැබීමට නම් පිංවත් ඔබ පළමුවෙන්ම පංචඋපාදනස්කන්ධයක් සකස් නොවෙන, රූපයක් පමණක් වන උතුම් ධාතූන් වහන්සේලාට ඍද්ධියක් ඇතිනොවන බව ධර්මානුකූලව තේරුම්ගත යුතුව ඇත. පිංවත් ඔබත් ධර්මාවබෝධයෙන් සැනසෙන්න. එවිට ආයාසයෙන් තොරවම,

ඔබේ ධාතූන් වහන්සේලාත් පූජනීයත්වයට පත්වේවි. එතෙක් අපේ භස්මාවශේෂයන්ට ලෝකය බියක්මයි දක්වන්නේ. ඒවාට ගරුකරන්නේ ප්‍රේතයන් යක්‍ෂයන් පමණක්මය. පිංවත් ඔබ සතර අපායෙන් මිදීමෙන්මයි, තම භස්මාවශේෂ පූජනීයත්වයට පත්කරගැනීමේ මාර්ගයට අවතීර්ණවෙන්නේ. එම නිසා පිංවත් ඔබ බොහොම සිහිනුවණින් යුතුව අමූලිකා ශ්‍රද්ධාවෙත්, ආකාරවතී ශ්‍රද්ධාවෙත් වෙනස කල්‍යාණමිත්‍ර ආශ්‍රය තුළින්ම හඳුනාගෙන, ශීලයෙන් පරිපූර්ණවෙමින්, නිරතුරුවම අනිත්‍ය සංඥාවන් තුළින් ජීවිතය දකිමින් නිවැරදි මාර්ගය තුළම අවබෝධය කරායන්න. ඉක්මන් කෙටි මිථ්‍යාවන් පසුපස යන්න නම් එපා.

බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මනුෂ්‍යයා අධිමාන්නය නිසාත්, මෝහය නිසාත්, සිහිමුලාවීම නිසාත්, මාර්ගඵලයන් ප්‍රකාශකරනවා කියලා. බුදුරජාණන් වහන්සේගේ කාලයේ සුනක්ඛත්ත වැනි පැවිදි අය පවා බලුව්‍රත, හරක් ව්‍රත රකින නිර්වස්ත්‍ර මිථ්‍යාදෘශ්ඨිකයන්ව රහතන්වහන්සේලා හැටියට දැක්කා. අනාගත සමාජය තුළ ශාසන විකෘතීන් සකස්වීම සඳහා මාර්ගඵල උන්මාදය කියන කාරණය බොහොම වේගයෙන් පැතිරයන්න පුළුවන්. මෙය ධර්මතාවක්. ඒ ඇසෙන හඬ ශාසනයේ අර්ථයන් අතුරුදන්වීමේ කාලය ළඟාවන බව පිංවත් ඔබට කරන අනතුරු හැඟවීමක්. මේ සියළු අභියෝගයන් ධර්මානුකූලව දකිමින් බුදුරජාණන් වහන්සේ දේශනාකර වදාළ ධර්ම මාර්ගය තුළින්ම ගමන්කොට ධර්මය දකින්න. ඔබ අර්ථවත්ව ධර්ම මාර්ගය තුළ ගමන්කිරීමේදී පිංවත් ඔබ තුළින් ක්‍රමානුකූලව මමත්වයේ දැඩිභාවය නැතිවී යාවි. මාන්නය ක්‍ෂයවෙන ප්‍රමාණයට නිහතමානීබව ඔබගේ ජීවිතය තුළ ඇතිවේවි. දැන් ඔබ ලෝකය ඉදිරියේ ප්‍රදර්ශකයෙක් නොවේ, අවබෝධයෙන්ම එම සිත අනිත්‍යබව දැකීමට හැකි දක්‍ෂ වීර්යවන්තයෙක්.

අහසට පොළොවට දෙස් දී කුමකට?

වෙලාව පෙරවරු 8.00 යි. භික්ෂුව පිණ්ඩපාතය වැඩමකරලා පෙරලා කුටියට පැමිණි මොහොත. අහස හොඳටෝම කළුකරලා තිබුණේ. දූන් වහිනවා. එක දිගටම මාස 2 ක් මෙම ප්‍රදේශයේ දැඩි පෑවිල්ල තිබුණේ. ඒත් වැව් ජලයෙන් ගම්වාසීන් කුඹුරු අස්වද්දලා දූන් අස්වැන්න නෙලන කාලය. කුටියේ කැපකරු මහත්මයාත් මතක් කළා ඉදිරියේ අස්වැන්න නෙළන නිසා දින 10 ක් පමණ කුටියට නොපැමිණෙන බව. ඒත් මේ උදෑසන වහිනකොට භික්ෂුවට සිහිපත්වුණා ඒ අය මොනතරම් මානසික පීඩා විඳිනවා ඇතිද කියලා. පසුගිය දිනවල වැසි නැතිව තිබිලා අස්වැන්න නෙළන අවස්ථාවේ වහිනකොට මීට පෙරත් ගොවි මහත්වරුන් බොහොම වේදනාවෙන් භික්ෂුවට ප්‍රකාශ කර තිබෙනවා 'හාමුදුරුවනේ අපි බොහොම පිංකම් කළත්, මහන්සිවෙලා, ණය වෙලා ගොවිතැන් කළත් අවසන් මොහොතේදී මෙවැනි බාධක සිද්ධවෙනවා' කියලා. ඉහත ප්‍රශ්නය භික්ෂුවට යොමුකරපු වෙලාවේ භික්ෂුව එම ගොවියාහට දුන් පිළිතුර මෙහි සටහන් කරනවා. මක්නිසාද, එවැනි ස්වාභාවික විපත්වලින් වේදනාවට පත්වෙන පිංවත් ඔබට මෙම කරුණු නුවණින් මෙනෙහි කිරීමට ශක්තියක් ලැබීම පිණිස.

අපි ගොඩාක් කැපවීම් කරලා, බලාපොරොත්තු ඇතිකරගෙන යමක් සිද්ධකරලා, ඒවායේ ප්‍රතිඵලවලින් ලබන සිහින මාළිගා මනසින් ගොඩනඟලා, ස්වභාවධර්මය නිසා ඒවා විනාශ වී යනකොට, දුර්වල වෙනකොට අප්‍රමාණ වේදනාවට පත්වෙනවා. මානසික රෝගීන් බවට, සියදිවි නසාගන්නන් බවට පත්වෙනවා. ස්වභාවධර්මයේ සැබෑ මුහුණුවර ඔබ ඉදිරියේ ක්‍රියාත්මකවන විට ඔබ ඊට ඇලීම, ගැටීම හේතුවෙන් ඔබත් ස්වභාවධර්මයේම කොටස්කරුවෙක් බවට

පත්වෙනවා. ස්වභාවධර්මයේ සැබෑම ස්වභාවය අනිත්‍යයයි. ඔබ දක්ෂවෙන්න ඕනේ අනිත්‍යවන ධර්මතාවයන් සමග ගැටීමට නොයා අනිත්‍ය ස්වභාවය අවබෝධකරගැනීමට. මෙවැනි ධර්මයන් සමග ගැටුණු ගොවි මහත්තයෙක් ලොව්තුරා බුදුරජාණන් වහන්සේ වැඩ සිටි සමයේ ජීවත්වුණා. ඒ අවාසනාවන්ත ගොවි මහතාට බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය නිසා වාසනාව උදාවුණා.

මේ ගොවි මහතාට බුදුරජාණන් වහන්සේ මුණනොගැසෙන්න, මේ මොහොතේත් ඔහු සතර අපායේ කොතැනක හෝ දුක්විඳින අවාසනාවන්තයෙක් වෙන්න ඉඩ තිබුණා. ඒත් භාග්‍යවතුන් වහන්සේ විසින් පිරිනැමූ භාග්‍යය නිසා මේ මොහොතේ මාර්ගඵලලාභී දෙවියෙක් හැටියට දිව්‍ය සැප විඳිනවා ඇති. සමහර විට දිව්‍යතලයකදීම නිවන් අවබෝධකර පිරිනිවීයන්නත් ඇති.

ලොව්තුරා බුදුසමිඳුන් දිවැස් ඥානයෙන් දකිනවා, මේ බමුණාට සෝවාන් ඵලයට පත්වීමට වාසනාව තිබෙන බව. මේ මිථ්‍යාදෘශ්ඨික බමුණාට එම ශක්තිය මෝදු කරදීමට බුදුරජාණන් වහන්සේ කුඹුර සකස්කිරීමත්, අස්වැන්න නෙළීමත් අතර ගතවන කාලයම උපයෝගීකරගන්නවා. නගුල යොදා කුඹුර සාන අවස්ථාවේ, සී සාන අවස්ථාවේ, අස්වැන්න පැසෙන කාලයේ මේ කුඹුර මැදින් බුදුරජාණන් වහන්සේ වඩින ගමන් බමුණාගෙන් විමසනවා 'බමුණ, කුඹුර හානවා නේද? ' කියලා. 'සී සානවා නේද? ' කියලා. ඊට වැඩි යමක් කතාකරන්නේ නැහැ. බමුණත් එහෙමයි කියලා කෙටියෙන් පිළිතුරු දෙනවා. බුදුරජාණන් වහන්සේ මුල ඉඳලාම දන්නවා බමුණාට මේ ගොයමේ අස්වැන්න ස්වභාවධර්මය නිසාම නෙලාගන්න ලැබෙන්නේ නැහැ කියලා. නමුත් බමුණා මේ ටික දන්නෙ නැහැ. අස්වැන්න ගැන බලාපොරොත්තු ගොඩනගාගෙන ඔහු වී අටුව පිරෙන විදිහ ගැන සිහින දකිමිනුයි හිටියේ. අස්වැන්න නෙළන දිනයට පෙර දින මහා වැසි කඩා වැටී ගොයම විනාශවී යනවා. එදා බුදුරජාණන්වහන්සේ වෙනදා වගේ කුඹුරට වැඩියේ නැහැ. බමුණාගේ නිවසටමයි වැඩියේ. බමුණා දැඩි මානසික පීඩනයකට පත් වී ගෙදර පැදුරේ ඇලවී හඬමින් සිටියා. වේදනාවෙන් මුසපත් වී සිටි බමුණා

බුදුරජාණන් වහන්සේ දකලා මොහොතින් පියවි සිහිය ලැබුවා. බමුණා මිථ්‍යාදෘශ්ඨික වුනත් බලාපොරොත්තු කඩවීමේ වේදනාවෙන් බුදු සමිඳුන්ට චෝදනා කළේ නැහැ. 'ඔබ වහන්සේ වරින්වර මගේ කුඹුර මැදින් වැඩියා. ඔබ වහන්සේගේ ඇස්වහ කටවහ නිසා මගේ ගොයම විනාශ වුණේ' කියලා. මොකද බොහෝ බෞද්ධ පිංවතුන් අතර සිටිනවා, සිල්වත් ස්වාමීන් වහන්සේනමක් උදේ පාන්දරින් දක්කහම, එය අසුබ දසුනක් ලෙස සලකන පිංවතුන්. මෙවැනි අය සමග බැලුවහම බමුණා මිථ්‍යාදෘශ්ඨික වුවත් අතීතයේ පුහුණුකළ යහපත් ගුණයන් තිබුණා.

මේ අවස්ථාවේදී අපි ආශාවෙන් බැඳී සිටින සියළුම සංස්කාරයන්ගේ අනිත්‍යභාවය පැහැදිලි කරදී භාග්‍යවතුන්වහන්සේ විසින් බමුණාව සෝවාන් ඵලයේ පිහිටුවනවා. අධික වර්ෂාව නිසා ගොයමේ අස්වැන්න විනාශවුණා. අපි හිතමු එතැන වී බුසල් දෙසීයක් තිබුණා කියලා. ඒ වී ප්‍රමාණය මිලකරන්න පුළුවන් මෙපමණයි කියලා. නමුත් එම වටිනාකම මගේ කොට නිත්‍යභාවයෙන් අල්ලාගැනීම නිසා බමුණාට අයිතිවුණේ දුක ශෝකයයි. සමහරවිට බුදුරජාණන් වහන්සේ බමුණාගේ ගෙදරට නොවැඩියානම්, බමුණාට පපුවේ අමාරුවක් හැදිලා මැරෙන්නත් තිබුණා. ඒ සියල්ල වෙන්න තිබුනේ අනිත්‍ය දේ නිත්‍යභාවයෙන් ගැනීම නිසාමයි. වී බුසල් දෙසීය පිළිබඳ තෘෂ්ණාව සකස්කරගන්නාතාක් බමුණාට හිමිවුණේ දුකමයි. ඒ කෙරෙහි ඇති තෘෂ්ණාව අතහැරුණු මොහොතේ බමුණාට සක්විති රජකමටත් වඩා ශ්‍රේෂ්ඨ සෝවාන් ඵලය අවබෝධකරගැනීමට හැකි වුණා. නිත්‍යභාවයෙන් යමක් අල්ලාගතහොත් දුකක්. එයම අවබෝධයෙන් අතහැරියහොත් ලෝකයේ ශ්‍රේෂ්ඨම සැපයක් උරුමවෙනවා. ඉහත සිද්ධිය අනුසාරයෙන් පිංවත් ඔබ සිතන්න, පිංවත් ඔබ මහන්සිවෙලා, ගොවිතැන් කරලා, අස්වැන්න නෙලන අවස්ථාව එනකොට එසේත් නැතිනම් වෙනත් ව්‍යාපාර කටයුත්තක්, සුබ කටයුත්තක් යෙදෙන අවස්ථාවක ඒවාට කාලගුණයෙන්, බාහිර හේතුන්ගෙන් බාධා පැමිණියොත් ඒවා නිසා පිංවත් ඔබ කරපු පිංකම්වලට, මුණගැසෙන ස්වාමීන් වහන්සේලාට දෝෂාරෝපණය කරන්න එපා. එම අකුසලයෙන් සංසාරයේ මීට වඩා දරුණු බාධක ඔබ ඉදිරියට එන්න පුළුවන්. අපේ යමක් විනාශ

වුණානම්, අලාභ වුණා නම් ඊට වගකිවයුත්තේ අව්ව, වැස්ස, සුළඟ නොවේ. ඒවාට බොහෝ සෙයින් හේතුවෙන්නේ අතීතයේ ඔබ විසින්ම කළා වූ අකුසල් සංස්කාරයි. ඒවායේ විපාක ස්වභාවධර්මය හරහා ඔබට ලැබෙන විට ඒවා අල්ලාගැනීමට නොගොස්, අතහැර දැමීමට උත්සහ ගන්න.

අතීත භවයන්හිදී වැස්ස වලාහක දෙවියන් ලෙස ඉපදිලා, හිරුකිරණ උපාදානය කරගත් දෙවියන් ලෙස ඉපදිලා පංච කාමයන් විඳීම හේතුවෙන් අකලට වැසි වස්සවලා, නියං ඇතිකරලා ලෝකය පීඩාවට පත්කරලා ඔබලා විසින්ම කරගත් අකුසල් ඔබලාට විපාක දෙනවා වෙන්න පුළුවන්. එසේත් නැතිනම් අතීත භවයන්හිදී ගංවතුර ආධාර වංචාකරලා, අසරණභාවයට පත්වූ අය පීඩාවට පත්කරලා ඒවායේ විපාකයන් නිසා මේ ජීවිතයේදී මේ විනාශයන් සිදුවෙනවා ඇති. මේවා හේතුඵල ධර්මයන්. වැස්සෙන් විනාශයක් වුණොත් අපි දකින්නේ බෙංගාල බොක්කේ වායු අවපාතයක්ය කියන කාරණය. නියඟයක් ආවොත් කැලෑ විනාශ කළාය කියන කාරණය. හැමදාමත් ඔබ සිතන්නේ ඔය ටිකයි. බෙංගාල බොක්කේ වායු අවපාතය ගැන කොච්චර සිතුවත් එය අවසන් වෙන්නේ නැහැ. බෙංගාල බොක්ක තිබෙනතාක් වායු අවපාතයන් ඇතිවේවි. මේවා හේතුඵල ධර්මයන්. අපි ඒවා ගැන කථා කරාවි. ගංවතුරට නියඟයට ආධාර දේවි. පිංවත් ඔබ සිතන්න දක්ෂවෙන්න ඕනේ, වර්තමානයේදී පිංවත් ඔබ මිනිස් ජීවිතයක් ලැබුවත්, අතීත භවයන්හිදී ඔබ වැස්ස වලාහක දෙවියන් ලෙස ඉපිද, වැසි වලාකුළු උපාදානය කරගෙන කල්ප ගණන් ජීවත්වූ පිරිසක් බව. අතීතයේ වැසි ඇතිකරපු ඔබ, මේ මොහොතේ වැස්සට ගංවතුරට හේතු හොයනවා. අතීතයේ අපි වලාකුළු වලට, හිරුකිරණට අධිගෘහිත දෙවියන් ලෙස ඉපදිලා, පංචනීවරණයන්ගේ ග්‍රහණයට යටවෙලා, පංචකාම සම්පත් විඳීම උදෙසා අකලට වැසි වස්සවලා, ඔබලාගේ ආශ්වාදය උදෙසා මනුෂ්‍යයාව පීඩාවට පත්කරලා සිදුකරගෙන ඇති විපාක නොදුන් අකුසල් කන්දරාව සමග සසඳා බලනකොට වර්තමානයේ අපි මේ තරමින්වත් ගංවතුරෙන්, නියඟයෙන් බේරී සිටීම ගැන සතුටුවෙන්න ඕනේ.

බෙංගාල බොක්කේ වායු අවපාතයෙන් එහාට හිතන්න පුළුවන් උතුම් ධර්මයක් බුදුරජාණන් වහන්සේ අපට උරුම කරදී තිබෙනවා. බුදුරජාණන් වහන්සේ එම බමුණාට හේතුඵල ධර්මයන් ගලපා දීලා බමුණාට හිතන්න සැලැස්වුවා. විවේකීව. ගොඩක් දේවල් බමුණාට හිතන්න තිබුණේ නැහැ. රට, ජාතිය, ආගම, හඳහන, ග්‍රහ අපල, කාලගුණවාර්තා...... මේවා බැහැර කළා. බුදුරජාණන් වහන්සේගේ නික්ලේශී රූපකාය දකිනකොටම බමුණාගේ දුක උපදවන සිතුවිලි, චංචල කෙලෙස් සිතිවිලි යටපත් වුණා. විවේකී මනසින් බමුණා සිතන්නට ඇති. 'ගොයම ඇතිවුණේ හේතුවක් නිසයි, වැස්ස ඇතිවුණෙත් හේතුවක් නිසයි, මේ දුක ඇතිවුණෙත් හේතුවක් නිසාමයි' කියලා. දුකට හේතුවුණේ අස්වැන්න කෙරෙහි ඇතිකරගත් තෘෂ්ණාවයි. තෘෂ්ණාව බැහැරකරලා, දුකෙන් මිදෙනවාය කියන කාරණය මෙනෙහිකරනකොටම, බමුණාට වී බුසල් දෙසීය කෙරහි වටිනාකම අත්හැරෙනකොටම ගිහි පිංවතෙකුට ලබාගත හැකි උතුම්ම වටිනාකම වන සෝවාන් ඵලය ලබාගත්තා. ගංවතුරත්, අස්වැන්න විනාශයත් දෙකම මොන තරම් දක්‍ෂ ආකාරයට මෙම බමුණා තම ජයග්‍රහණය සඳහා උපයෝගීකරගත්තාද? අවසානයේ බලනවිට ගංවතුර ගැලුවෙත්, අස්වැන්න විනාශවුණෙත් බමුණාගේ පිනටමයි.

ඕනෑම අභියෝගයක් උතුම්ව ධර්මයේ ජයග්‍රහණයක් කරා මෙහෙයවීමේ මාර්ගය අපට ඉගැන්වූවේ ලොව්තුරා බුදුරජාණන් වහන්සේයි. එම නිසා පිංවත් ඔබත් ඕනෑම විනාශයක් හේතුඵල ධර්මයන් අනුව ගලපා බලන්න. ඔබට මේවායින් පීඩාවක් වුණොත්, ඔබේ පෙර පිනකටයි එය සිද්ධවුණේ කියලා දකින්න දක්‍ෂවෙන්න. විනාශය කෙරෙහි ඇතිවන ගැටීමෙන් දුක ඇතිකරගන්නවා වෙනුවට අවබෝධයෙන්ම දුකෙන් මිදෙන දිශාවටම යන්න. මොකද අව්ව, වැස්ස, සුළඟ, අවපාත, වායුපීඩන, භූමිකම්පා, සුනාමි.... මේවා සියල්ල ස්වභාවධර්මයේ ස්වභාවයන්මයි. මේ සියල්ලම සකස්වී ඇත්තේ නිරතුරුවම වෙනස්වන සතර මහා ධාතුන්ගෙන්මය. වෙනස්වන දෙයක් අල්ලාගැනීම දුකකි. දුක ඔබට සින්නක්කරව අයිති දෙයක් නොවේ. රූපය කෙරෙහි ඔබ ඇතිකරගත්තා වූ තෘෂ්ණාවේ අඩුවැඩිභාවය මත දුක ඔබ තුළ ඇතිවෙන ධර්මතාවයකි. ඉහත බමුණාට දුක සකස්කළේද, දුකෙන් මිදෙන්නට

උපකාරී වූයේද වී බුසල් දෙසීය කෙරෙහි ඇතිකරගත් තෘෂ්ණාව සහ තෘෂ්ණාවෙන් බැහැරවීමයි. මෙතැනදී පිංවත් ඔබ අවධාරණය කරගතයුත්තේ දුක ඇතිවූයේ බමුණා තුළය, දුකට හේතුව තෘෂ්ණාව ඇතිවූයේද බමුණා තුළය, තෘෂ්ණාව නැතිවූයේද බමුණා තුළය. ඒ සඳහා නෙක්ඛම්ම සංකල්පය ඇතිවූයේද බමුණා තුළය යන්නයි.

චතුරාර්ය සත්‍ය ධර්මය නිරතුරුවම, ඔබේම ජීවිතය තුළින් ගලපා බලමින් අවබෝධයට පැමිණෙන්න උත්සහ ගන්න.

ඔබේ ඔය මහන්සිය හිස් අතින් මැරෙන්නද?

මේ ජීවන ගමනේදී ඔබේ ක්‍රියාකාරකම් පැහැදිලිව කොටස් දෙකකට බෙදාගන්න. එකක් ඔබගේ සැපය උදෙසා කරන ක්‍රියාවන්. අනෙක අනුන් උදෙසා කරන ක්‍රියාවන් හැටියට. මෙතැනදී අනුන් උදෙසා කරන ක්‍රියාවන් හැටියට ගැනෙන්නේ රැකියා, ව්‍යාපාර, ගොවිතැන්, පවුල් ජීවිතය සහ සමාජීය ජීවිතය සමග බැඳුණු සියළුම වගකීම්. මේ සියල්ල අනුන් උදෙසායි ඔබ කරන්නේ කියලා දකින්න.

ඔබ උදෙසා ඔබ සිදුකරගන්නා දේවල් මොනවාද? තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන්, කර්මය කර්මඵල කෙරෙහි විශ්වාසයෙන් ඔබ සිදුකරගන්නා සියළුම කුසල් ධර්මයන් ඔබ උදෙසා සිදුකරගන්නා දේවල් හැටියට දකින්න. මේ වගකීම් දෙක නිරතුරුවම පිංවතුන්ලා පටලවා ගන්නවා. මේ පටලවාගැනීම නිසාම ජීවිත කාලයම අනුන්ට සේවය කරලා තමා හිස් අතින් මියයනවා.

තමා තමාටවත් අයිති නැතිකොට අනුන් කෙසේ තමාට අයිතිවෙන්නද කියන ධර්මතාවය අවබෝධ කරගැනීමට ඇති ඔබට, මෙලොව පරලොව සැබෑම සැපය උදාවනුයේ තම වගකීම පටලවා නොග ැනීමෙන් පමණක්මය. සත්ත්වයා අප්‍රමාණ දුක් විඳින සතර අපායන් අභිබවා, මේ උතුම් මනුෂ්‍ය ජීවිතය ඔබ ලැබුවේ පෙර ජීවිතයේ කරන ලද ව්‍යාපාර, ගොවිතැන්, රැකිරක්‍ෂා නිසා නොවේ. පෙර ජීවිතයේ සිදුකරගත් කුසල් සංස්කාරයන් නිසාමය. එහෙයින් එවන් මහඟු අවස්ථාවක් සලසාදීම පිළිබඳව පිංවත් ඔබ කෘතගුණ සැලකියයුත්තේ කුසල් ධර්මයන්ටමය.

'වෙලාව තිබුණොත් පන්සල් යනවා' 'නිවාඩු තිබුණොත් සිල් සමාදන් වෙනවා' 'වැඩ ඉවරවුණොත් පිංකමට යනවා'.... වර්තමාන සමාජයේ මෙවැනි වචන භාවිතය ඉතාමත් වැඩියි නේද? එහෙම ප්‍රකාශ කරන පිංවතාගේ කාර්යබහුල ජීවිතයට වර්තමාන සමාජයේ ලොකු වටිනාකමක් ලැබෙනවා. අපිට ඇහෙනවා සමාජයේදී කියනවා 'අහවලාට දැන් වගකීම් කටයුතු වැඩියි. ඒ නිසා පිංකමට එන්නේ නැහැ. සිල්ගන්න යන්නේ නැහැ. පන්සලට එන්න වේලාවක් නැහැ' වැනි අදහස් ප්‍රකාශ වෙනවා. මෙවැනි නොවටිනා වටිනාකම් ඔබ ඔබේ කරගත්තොත් වටිනා මනුෂ්‍ය ජීවිතය ඔබෙන් ගිලිහී යන බව ඔබ සිහි තබාගන්න ඕනේ. මෙවැනි අයට මැරෙන මොහොතේ මතකයට එන්නේ රැකියාව, ව්‍යාපාරය, ගොවිබිම උපාදානයයි. ඊට පස්සේ ප්‍රේත ලෝකයේ ඉපදිලා උපාදානය කරගත් තැනම දිගින් දිගට ඉන්න පුළුවන්. හැබැයි මනුෂ්‍යයෙක් හැටියට නම් නෙමෙයි. ප්‍රේතයෙක් හැටියටයි.

පිංවත් ඔබට මේ කාරණය හොඳින් පැහැදිලිවෙන්න, භික්ෂුවක් සමාධියෙන් පසුවන විට දර්ශනය වූ ප්‍රේත මහත්මයකුගේ කථා පුවතක් මෙහි සටහන් කරනවා.

මේ මහත්මයා හිටපු දේශපාලනඥයෙක්. සහජයෙන්ම උරුම බලකාමී ගති ලක්ෂණ මේ මහත්මයාට මනුෂ්‍ය ජීවිතයේදී තිබුණා. මේ මහත්මයා හදිස්සියේ මැරුණාට පස්සේ උපත සකස්වෙන්නේ ප්‍රේත ලෝකයේයි. ඒ පරදත්ත රූප ජීවී ප්‍රේත ස්වභාවයක්. හොඳ ශක්තිමත් කළු පැහැති ශරීරයක්, සුදුපාට සරමක් කැහිපොට ගසා ඇඳලා, අත් සහිත සුදු මේස් බැනියමක් සරමට යටකර ඇඳලා.... බොහොම කඩිසර ප්‍රේතයෙක්. මොහු දැන් ප්‍රේත ලෝකයේ සැරිසරනවා. ඔහු හැසිරෙන ප්‍රදේශය ගැන කියන්න භික්ෂුව දන්නේ නැහැ. සමහර විට ඔහුගේම මැතිවරණ ආසනයේ වෙන්න පුළුවන්. හැබැයි මේ ප්‍රේත දේශපාලනඥයා දුකකින් නෙමෙයි ප්‍රේත ජීවිතය තුළ සිටින්නේ. මනුෂ්‍ය ජීවිතයේදී දේශපාලකයෙක් වශයෙන් ජනතා සේවයක් ලෙසින් කළා වූ 'දන්දීම' නිසා.

එම යහපත් ක්‍රියාවන් හේතුවෙන් මොහුට ආයුෂ, සැප, බලය වැඩි ප්‍රේත ජීවිතයක් ලැබිලා තියෙන්නේ. මනුෂ්‍ය ජීවිතයේදී තම දේශපාලන භූමිකාව යම් සේ සටන්කාමීව ගතකළද, එවැනි සටන්කාමීත්වයකින් 'මමයි චණ්ඩියා' කියන්න වාගේ ස්වභාවයකින් තමයි මොහුව භික්ෂුවට දර්ශනය වී ඇත්තේ.

මේ කථා පුවතින් පැහැදිලිවෙනවා ඇති පිංකම් කිරීමට, කුසල් දහම් වැඩීමට, ශීලයක් සමාදන්වීමට විවේකයක්, වෙලාවක් නොතිබුණ කාර්යබහුල, අවිවේකී මහත්වරුන් ප්‍රේත ලෝකයේත් ගතකරන කාර්යබහුල ජීවිතයේ ස්වභාවය. මොහු ප්‍රේත ලෝකයේත් චණ්ඩියා වගේ දේශපාලනය කරන්නේ මනුෂ්‍යයන් සමඟ නෙවෙයි. ප්‍රේත ලෝකයේම සිටින දේශපාලන ප්‍රේතයින් සමඟයි. මනුෂ්‍ය ලෝකයේ වගේම ප්‍රේත ලෝකයේද සිටිනවා, දේශපාලනය උපාදානය කරගෙන මැරිලා නිල් පාට, කොලපාට, රතුපාට කමිස ඇඳගත් ප්‍රේතයින්. රැවුල කොණ්ඩය වවාගත් ප්‍රේතයින්.

ඔබ අහලා ඇති 'මම මැරුණත් නිල්, කොල, රතු .....' 'මාව කැපුවත් මගේ ලේ නිල්පාටයි, කොළ, රතු ..... පාටයි' වැනි දේශපාලනය උපාදානය කරගත් දේශපාලන සාමාජිකයින්. මෙවැනි අය තමයි මරණින් මතු, දේශපාලන ප්‍රේතයින් වශයෙන් උපත ලබන්නේ. මේ අය සමඟ තමයි දැන් ඉහත ප්‍රේත දේශපාලනඥයා දේශපාලනය කරන්නේ. මොහු දැන් තමාට විරුද්ධ අනික් පාට වල ප්‍රේතයින්ව තමන්ගේ මැතිවරණ බලසීමාවෙන් පන්නනවා ඇති. පහරදෙනවා ඇති, බියගන්වනවා ඇති. දැන් මොහු ගතකරන ප්‍රේත ජීවිතය තුළ අකුසල්මයි රැස්වෙන්නේ. ධර්මයක්, හොඳක්, නරකක්, ශීලයක් මොහු දන්නේ නැහැ. ඒ නිසා දුකෙන් දුකටම ඇදීයාම පමණයි සිද්ධවෙන්නේ. මේ කථාව කියවලා පිංවත් ඔබට සිතුණොත් රතු ඉර වැදුණත් කමක් නැහැ, වැටුප් කැපුණත් කමක් නැහැ, නිවාඩු වැටුණත් කමක් නැහැ, ලොක්කා බැන්නත් කමක් නැහැ, ලබන පාර පැරදුණත් කමක් නැහැ මම මුල්තැන දෙන්නේ මගේ ධර්ම මාර්ගයටයි' කියලා. පිංකම් කිරීම කුසල් දහම් කිරීම යොදාගන්නේ අංක එකටයි කියලා. කැපෙන වැටුප මිල කරන්න පුළුවන් වුණත් ව්‍යාපාරයේ පාඩුව මිල

කරන්න පුළුවන් වුණත් මේවා කෙරෙහි තෘෂ්ණාවෙන් බැඳිලා සතර අපායට වැටුණොත් එම දුක ප්‍රමාණය කරන්න බැහැයි කියලා, එය ඔබ ලැබූ භාග්‍යයක්මයි.

තෙරුවන් කෙරෙහිම, ශීලය දානය කෙරෙහිම විශ්වාසය තබන්න. ඔබව සැබෑම සැපයට ඔසවා තබන රැකියාව, ව්‍යාපාරය, ගොවිතැන, දේශපාලනය වන්නේ කුසල් දහම් බවම දකින්න.

සමාජයේ ජීවත්වන කාර්යබහුල පිංවතුන්ලාට පසළොස්වක පොහොය දිනයට පන්සලකට යන්න විවේකයක් නැහැ. නමුත් ඒ පිංවතාට කිව්වොත් රාජකාරි මට්ටමෙන් මාසයක් ඇමරිකාවට එන්නය කියලා, ඔහු සිය පවුලත් සමඟම එහි යන්න හදන්නේ. ඒ නිසා මෙහි තිබෙන්නේ කාර්යබහුල බව නොවෙයි, කාමච්ඡන්දයන් කෙරෙහි ඇතිකරගත් දැඩි තෘෂ්ණාවයි. ඔය තෘෂ්ණාව තමයි ඊළඟ භවයේ උපතට අදාළ උපාදානය සකස්කරදෙන්නේ. මෙතැනදී දුප්පත්, පොහොසත් කියලා උපාදානයේ වෙනසක් නැහැ.

භික්ෂුවක් සමාධියෙන් පසුවෙනවිට අරමුණු වෙනවා භික්ෂුව වැඩසිටින කුටියට ආසන්නව තිබෙන කුඹුරු යායක්. එම කුඹුරුයාය තුළ අමුඩයක් හැඳගත් උස, සිහින්, වර්ණ සැප බලයෙන් හීන ප්‍රේතයින් දෙදෙනෙක් උදළු දෙකක් කර තබාගෙන සිටිනවා. අමුඩය ගසාගෙන සිටින නිසා මේ ගොවි ප්‍රේතයින් දෙදෙනා මීට පෙර පරම්පරාවේ සිට මියගිය දෙදෙනෙක් විය යුතුයි. සමහරවිට ඇඳුම් පැළඳුම් දන් නොදීම නිසා එහි අකුසල් විපාකය වීමටද පුළුවන්. මෙයත් තෘෂ්ණාව නිසා සකස්කරගත් ප්‍රේත ජීවිත දෙකක්. පෙරදී සඳහන් කළ කෝටිපති දේශපාලකයා වගේ නෙමෙයි, දුප්පත් ගොවි මහත්වරු දෙදෙනෙක්.

අපිට පෙනෙනවා ගම්මානවල ජීවත්වන විට මිනිසුන් කාලසටහන් සකස්කරගෙනයි පිංකම් කරන්නේ. හේන කොටන කාලයට, අස්වැන්න නෙළන කාලයට ඒ පිංවතුන් පිංකම්, පන්සල, දානය, ස්වාමීන් වහන්සේ අමතක කරනවා. නොදන්නකම නිසාම දෙවැනි තැනටයි දමන්නේ. මුල් තැන අදාළ ගොවිතැන් කටයුත්තටයි දෙන්නේ. කිසිම තර්කයක් නැහැ, එම පිංවතුන් ගොවිතැන, එහි අස්වැන්න නිසයි ජීවත්වන්නේ

කියන එකට. එයට මුල්තැන දෙන්න ඕනේ. නැතිනම් ඔවුනුත් අපිත් බඩගින්නේ. එහෙත් මෙතැනදී භික්ෂුව සඳහන් කරන්නේ ගොවිතැනට නෙමෙයි දිව්‍ය ලෝකයට යන්න ලැබුණත්, පිංකම් උදෙසා දිනකට, නැතිනම් මාසයකට වැයකරන කාලය අහිමි කරගන්න එපා. මොකද ඒ කෙටි කාලයයි ඔබ, ඔබ වෙනුවෙන් යමක් කරගන්නාවූ කාලය බවට පත්වෙන්නේ. සැබෑම සැපය උදෙසා කරගන්නා වූ ආයෝජනය වෙන්නේ. එම නිසා කටයුතු සැලසුම් කරනකොට කුසල් දහම්වලට මුල්තැන දෙන්න. අනිත් කටයුතු වීර්යයෙන් යුතුව කුසලයට බාධාවක්, අඩුවක් නොවන සේ සිදුකරන්න.

දුකට හේතුවන වී බුසල් සියයක් වෙනුවෙන් ඔබට ලැබිය හැකි උතුම් දිව්‍ය සැපයක් අහිමි කරගන්න එපා. වී බුසල් සියයක් ඔබේ පරලොව සුගතියත් කියන කාරණා දෙකම සාර්ථක කරගන්න උත්සහ ගන්න. එසේ නොවී ඔබත් අංක එක ගොවිතැනට දුන්නොත් අදාළ ගොවි ප්‍රේතයින් දෙදෙනා මෙන් (වර්තමානයේ අමුඩ නැති නිසා) කොට කලිසම් ඇඳගත් ප්‍රේතයින් ලෙස ඉපදීමට අවශ්‍ය උපාදානය, ඔබගේ තෘෂ්ණාව විසින් ඔබට සකස්කර දෙනු ඇත.

මේ භවයේ ඇති බියකරු බව නිසාමය බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ 'තම හිස ගිනිගත්තෙක් ඒ ගින්න නිවන්න වෙහෙසගන්නේ යම්සේද, මේ භව ගින්න නිවාදැමීමට එවැනි වෙහෙසක් ගන්න' කියලා. එම ගිනි නිවෙන මාර්ගයට අවතීර්ණ වෙන්න කියලා. එසේ නොවුණොත් වැස්සෙන්, නියගයෙන්, සුළඟින් විනාශවෙන අස්වැන්න දෙස බලමින් පසුතැවෙමින්ද, අවසානයේ ප්‍රේත ලෝකයේදී ඔබගේ ගොවිබිමේ හිමිකරුවා වීමට ඔබට පුළුවන්. එම නිසා පිංවත් ඔබ ව්‍යපාරයට, ගොවිතැනට, රැකියාවට, ඉඩකඩම්, දූ දරුවාට ඇති තෘෂ්ණාවට වඩා වැඩි කැමැත්තක් පිංකම් කෙරෙහි, කුසල් දහම් කෙරෙහි ඇතිකරගන්න. මොකද තෘෂ්ණාව හේතුවෙනුයි උපාදානය සකස්කර දෙන්නේ. උපාදානයයි ඊළඟ භවය සකස්කර දෙන්නේ.

ඉහත කාරණය මැනවින් තේරුම්ගන්න පුළුවන් සිද්ධියක් පහත සඳහන් කරනවා. අපි නිරතුරුවම පටිච්ඡසමුප්පාද ධර්මයේ අර්ථයන්ට පිටින් ගොස් අපේ ජීවිතය දකිනවා. ඔබ සිතා සිටිනවා ඒ දැක්ම ධර්මය එකඟයි කියලා.

භික්ෂුව ධර්ම සාකච්ඡාවක් කරන අවස්ථාවක මැදිවියේ කාන්තාවක් බොහොම සතුටින් උදම් ඇනුවා ඇය මැරෙන්න බය නැහැ කියලා. 'හාමුදුරුවනේ, මම දන් වුණත් මැරෙන්න බය නැහැ. මම ඕනෑ තරම් පිංකම් කරලා තිබෙන්නේ' කියලා. නමුත් භික්ෂුව ඇයගේ අදහස් තුළින් දැක්කා ඇය මොනතරම් පිංකම් කළා කීවත්, පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවය වඩලා නැහැ කියලා. මෙය සමාජයේ හුගදෙනෙක් තුළ තිබෙන දුර්වලකමක්. තමන් කරන පිංකම් නිසාම පංචඋපාදානස්කන්ධයේ නිත්‍යභාවය වැඩිකර ගන්නවා. තමා මැරෙන්න බය නැහැ කියලා කියපු මැදිවියේ පිංවත් කාන්තාවද, තමා කරන පිංකම් ගැන කියමින් තමයි භික්ෂුව ඉදිරියේ උදම් ඇනුවේ. ඇය කීවා 'මම නිතරම දන් දෙනවා, සිල් ආරක්ෂා කරනවා, සමාජ සේවය කරනවා' කියලා. ශීලය ගැන, දානය ගැන තෙරුවන් ගැන ඇය දැනගෙන සිටියත් දැනගත යුතුම දෙය, එනම් දුක සකස් කරන තෘෂ්ණාව ගැන ඇය දැනගෙන හිටියේ නැහැ.

තමා මැරෙන්න බය නැහැ, පිංකම් කරලා තිබෙනවා කියපු එම කාන්තාවගෙන් භික්ෂුව ඇසුවා 'ඔබට දරුවන් කී දෙනෙක් සිටිනවාද?' කියලා. ඇය කීවා තරුණ දුවෙක් සහ පුතෙක් සිටිනවාය කියලා. පුතා තවම පාසල් යනවා. ඇයගේ ස්වාමිපුරුෂයා මියගිහින්. ඇය ව්‍යාපාරයක් කරමින් හොඳ ආර්ථික තත්ත්වයකින් ජීවත්වෙනවා. තම ව්‍යාපාරය වගේම දරුවන් උදෙසාද ඇය බොහොම වෙහෙස මහන්සි වෙනවා. දරුවන් දෙදෙනාට ඇය තමාගේ ජීවිතයටත් වඩා ආදරෙයි. මැරෙන්න බය නැහැ කියපු ඇයගෙන් භික්ෂුව මෙහෙම දෙයක් විමසුවා.

'මෙතැනට දන් මහත්මයෙක් එනවා කියලා හිතන්න. ඒ මහත්මයා සත්‍යවාදී වචන කථාකරන මහත්තයෙක්. ඒ මහත්මයා ඔබට කියනවා මම ඔබව හෙට උදේම ඇමරිකාවට එක්කරගෙන යනවා. එහිදී මනුෂ්‍යයෙකුට ලැබෙන උපරිම සැපසම්පත් දී මැරෙන තුරාවටම ඔබව රැක බලා ගන්නවා. හැබැයි මට එහි රැගෙන යන්න හැකියාව තිබෙන්නේ ඔබව විතරයි. දරු දෙදෙනා රැගෙන යෑමට මට අවස්ථාවක් නැහැ. ඒ අයව තියලයි යන්න වෙන්නේ. මොහු අවංකවමයි මේ ප්‍රකාශය කරන්නේ'.

භික්ෂුව ඇයගෙන් විමසුවා ඔබ ඔහු සමඟ හෙට උදේම ඇමරිකාවට යන්න කැමති වෙනවද? කියලා. ඇය ගත් කටටම කීවේ 'මගේ දරුවො දෙන්නා දාලා මම කොහේවත් යන්නේ නැහැ' කියලා. මෙන්න මෙතැන තමයි උපාදානය කියන්නේ. ඇය මුලින්ම උදම් ඇනුවා 'මම පිං කරනවා, දන් දෙනවා, සමාජ සේවය කරනවා, සිල් ආරක්ෂා කරනවා. මම ඕනා වෙලාවක මැරෙන්න බය නැහැ' කියලා. නමුත් ඒවා සියල්ල යටපත් වී තෘෂ්ණාවේ බලවත්භාවය නිසා දරුවන් ගැන උපාදානය ඉස්මතු වුණා. ඉහත සත්‍යවාදී මහත්මයා ඇයට අඬගසන්නේ ඇමරිකාවේ සුපිරි සැපසම්පත් සහිත ජීවිතයක් ලබාදෙන්න. ඇය එම සැපය අතහැර තමා සැපයක් කරගත්ත දරුවන් උපාදානය කරගත්තා. පිංවත් ඔබ සිතන්න ඇය මේ මොහොතේ අසනීපයකින්, අනතුරකින් ක්ෂණික මරණයකට පත්වුනොත් ඇය දක්ෂවෙයිද අවසන් මොහොතේ තමා කළ පිංකම් සිහියට නඟාගෙන සුගතියක උපතකට යන්න. එය එසේනම් පිංකම් අමතක වී දරුවන් ගැන උපාදානය සකස්වෙයිද?

පිංවත් ඔබ මේ කාරණය ගැන හොඳින් සිහියට ගන්න. මහ පොළොවේ පස්වලට සාපේක්ෂව අතට ගත් පස් පිඩක ප්‍රමාණයයි නැවතත් සුගතිගාමී ජීවිත ලබන්නේ කියලා බුදුරජාණන් වහන්සේ උපමාවක් සහිතව පෙන්නලා දෙනවා. මෙන්න මේ ප්‍රකාශය තුළ සැඟවුණු සත්‍යය ඔබ නුවණින් මෙනෙහි කළයුතු වෙනවා.

වර්තමාන සමාජයේ බහුතරයක් අප්‍රමාණ පිංකම් කළත්, එම පිංවතුන් තම දූ දරුවන්, දේපල, යානවාහන, නිලතල කෙරෙහි බැඳිලයි ජීවත්වෙන්නේ. දෘෂ්ඨී මතවාදවල කිමිදෙමින් ජීවත්වෙන්නේ. ඔබ සතර අපායෙන් මිදී නොමැතිනම්, අවම වශයෙන් ශීලයෙන්වත් පරිපූර්ණ නැතිනම් ඔබ මොනතරම් පිංකම් කර තිබුණත් ඔබ මියයන මොහොත හරිම භයානකයි. තීරණාත්මකයි. සැබැවින්ම මරණයේ භයානක කම ඇත්තේ සුනාමි, භූමිකම්පා, මිසයිල ප්‍රහාරයක නොවේ ඉහත සඳහන් ආකාරයේ අනවබෝධයයි භයානක. ඒ සඳහන් කළ කාන්තාව තමා මරණයට බය නැහැ කියලා උදම් ඇනුවත් ඊළඟ ජීවිතයේ දෙවියෙක් මනුෂ්‍යයෙක් වෙනවාය කියලා කීවත් එය කෙසේ

නම් සිදුවෙන්නද? ඇය එසේ සිතාගෙන ඉන්න පුළුවන් නමුත් ක්ෂණික මරණයක් සිදුවුවහොත්, ඇයට තමන් කළ පිංකම් අමතක වී තෘෂ්ණාව වැඩි අරමුණ වන දරුවන් දෙපල මතකයට ඇවිත් පරදත්තරූපජීවී ප්‍රේතියක් වීමටයි සිදුවන්නේ. නමුත් ඇය සුගතියකට සිත පිහිටුවාගැනීමට අවශ්‍ය තරම් පිං ජීවිතයෙන් රැස්කර තිබෙනවා. නමුත් වැඩි තෘෂ්ණාව සකස්වෙන්නේ සුගතිය කියන රූපයට නොවේ. දරුවන් දෙපල කියන රූපයටයි. මැරෙන මොහොතේ දිව්‍ය සංඥාවක් මතු වී දෙවියෙක් ඇවිත් ඇයට දිව්‍ය ලෝකයට එන්නයැයි අඬගැසුවද (ඇමරිකාවට ගොස් උපරිම සැපසම්පත් පිරිනැමීමට කරන ආරාධනය ප්‍රතික්ෂේප කරන්නාක් මෙන්) ඇය අල්ලාගන්නේ දෙවියන් නොව දරු දෙදෙනායි. බලන්න නොදන්නාකම නිසා වන විනාශයක මහත. අපි 'දන්නවාය' කියා සිටීමෙන් වන අත්වැරැද්ද, අපව කල්ප ගණනාවක් ඇද දමනවා. පිංවත් ඔබ ගැන ඔබ අතිශෝක්තියෙන් සිතා සිටින්නේ නම් මොහොතක් නිහතමානී වෙන්න. මොකද අතිශෝක්තිය කියන්නේ සක්කාය දිට්ඨියේ ළඟම ඥාතියෙක්.

ඔබට පුළුවන් ඔබ සැබැවින්ම අවංක නම් ස්වයං පරීක්ෂණයක යෙදෙන්න. ඔබ භාවනාවක් කරන වේලාවක, රාත්‍රී නින්දට යන වේලාවක මොහොතකින් මනසින් මියයන්න. ඒ කියන්නේ මැරෙන්න. ඔබ සිතන්නේ මැරෙනවාය කියන කාරණය බොහොම ලෙහෙසි කටයුත්තක් කියලා. මරණය පහසු කටයුත්තක් වෙන්නේ ශීලයෙන් පරිපූර්ණ කෙනෙකුට විතරයි. ඉන් මෙහා මරණය අති දුෂ්කර කාරණයක්. එය සිනහවෙනවා, අඬනවා වගේ සරල, ලෙහෙසි දෙයක් නොවෙයි. නමුත් ඔබ මෙතැනදී මියයන්නේ මනසින්. ඔබ සැබැවින්ම මියයෑමට පෙර මරණයේ ස්වභාවය අත්දැකිය යුතුයි. එම ස්වභාවය දිනපතා සිදුකිරීමෙන් එය ඔබට මරණානුස්සති භාවනාවක් බවටද පත්වේ. මනුෂ්‍යයා සෑම දෙයක්ම දන්නවා වුවද තමා මැරෙනා බව නොදන්නාකම නිසා, මැරී නැවත ඉපදෙන බව නොසිතනවාය කියන දෙයයි සමාජය දෙස බැලූ විට අපට පෙනෙන්නේ. එනිසා වරක් දෙවරක් ඔබ මනසින් මියයන්න. ඔබ අවංකවම සිතන්න තව මොහොතකින් ඔබ මියයාවි කියලා. එවිට ඔබට දැනෙනවා, මතකයට එනවා කුමන රූපයක් කෙරෙහිද ඔබේ තෘෂ්ණාව බලවත් කියලා.

එය අඹුදරුවන්, යානවාහන, දේපල, මතවාද, දෘෂ්ඨියක් වේවා එය නිවැරදිව හඳුනාගෙන ඒවායේ අනිත්‍යය නිරතුරුවම විදර්ශනාවට ලක්කරන්න.

ස්ථාවර සාමයක් උදෙසා...

සඳට යන්නට, අඟහරු ලෝකයට යන්නට ඒවා අයිතිකරගැනීමට, සුපිරි මධ්‍යස්ථාන පිහිටුවාගෙන අති නවීන රොකට් නිපදවන, දියුණු යැයි සම්මත ලෝකයාට ඒවාට ගොස් කංකුං, මුගුණුවැන්න සිටුවීම පිණිස ගෙම්බන් වඳුරන් ඇතිකිරීම පිණිස පර්යේෂණ කරන ලෝකයාට, සඳත් හිරුත් ග්‍රහලෝකත්, මේ නාමරූප ධර්මයන් තුළින් අර්ථවත්කොට පෙන්වා වදාළ ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ ධර්මය කෙසේ නම් හඳුනාගන්නද?

දියුණුවේ නාමයෙන් විනාශය සොයාගෙන යන ලෝකයක්, විනාශයෙන් අනතුරුව සාමය සොයාගෙන යන ලෝකයක් මිනිස් සිතේ සැබෑම 'සාමය' කෙසේ නම් හඳුනාගන්නද?

මිනිස් සිතේ සැබෑම සාමය වන කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්දච්ඡ කුක්කුච්ඡ, විචිකිච්ඡා යන පංච නීවරණ යටපත් වූ, මිදුනා වූ සිතේ ඇතිවන සැබෑ ලෙසින්ම අර්ථවත් 'ලෝක සාමය' කෙසේ නම් හඳුනාගන්නද?

පංචනීවරණයන් බහුල වූ සිත විසින්, අනිත්‍ය වූ ලෝකය ග්‍රහණය කරගැනීමට ඔබව මෙහෙයවන විට, පංච නීවරණ යටපත් වූ සිත පිංවත් ඔබව හුදෙකලාවටම, නිවීම උදෙසාම, සැබෑම සාමය දෙසටම යොමු කරයි. පිංවත් ඔබ කෝටි ප්‍රකෝටි ගණන් මුදල් වියදම් කරගෙන, ලෝක සාමය උදෙසා, ලෝකයේ, රටේ, නගරයේ, ගමේ, නිවසේ සාමය උදෙසා ක්‍රියාකාරී වන අයෙක් නම්, ඒ කිසිදු වියදමකින් තොරව ලොව්තුරා බුදුරජාණන් වහන්සේ වදාළ වටිනාකම ඉලක්කමෙන් කියා නිමකළ නොහැකි සාමයේ මග පිංවත් ඔබට විවෘත බව සිතන්න.

පංච නීවරණ යටපත්වූ සැබෑම සාමයේ සැපය අත්විඳින ඔබට ලෝකය දැනෙන්නේ, ලෝකය පෙනෙන්නේ සැබෑම සුන්දර තැනක් ලෙසටයි. පිංවත් ඔබ ලෝකයේ සුන්දරත්වය දකින්න මොනතරම් වෙහෙස ගන්නවාද? දෙස් විදෙස් සංචාර, විනෝද ගමන්, වන්දනා ගමන්, ලෝකයේ සුන්දරත්වය සොයාගෙන යන ගමනේදී ඔබ සංචාරකයෙක් බවට පත්වෙනවා. නිකං සංචාරකයෙක් නොවේ. පිංවත් ඔබ අසුන්දර සංචාරකයෙක් බවට පත්වෙනවා. අසුන්දර සංචාරකයෙක් කියලා සටහන් කළේ ඔබ තවමත් සුන්දරත්වය සොයන නිසයි. ඔබ යමක් සොයන්නේ ඔබට එය නොලැබී ඇති නිසයි. ඔබ තවම සුන්දරත්වයෙන් තෘප්තිමත් නොවී ඇති නිසයි. නිරතුරුවම පංච නීවරණයන් වැඩෙන මාර්ග ඔස්සේම ලෝකයේ සුන්දරත්වය සොයායන 'අසුන්දර මිනිසුන්' අපි.

අතීත භවගමනේදී ඔබත් මමත් සක්විති රජවෙලා, සක්විති රජුගේ ස්ත්‍රීරත්නය වෙලා ඉපදිලා, අවුරුදු 84,000 ක් එම සැප විඳලත්, පංචනීවරණ ධර්මයන් නිසාම, සුන්දරත්වයෙන් තෘප්තිමත් නොවූ පිරිසක් අපි. සක්විති රජකමෙනුත් තෘප්තිමත් නොවූ අපි වර්තමානයේ රුපියල් 20 ක් වියදම්කොට ලොතරැයියක් මිලදීගෙන ලෝකයේ සුන්දරත්වය දකින්න සිහින මවනවා. තෘෂ්ණාවේ දිග පළල වන කාමච්ඡන්දයෙන් විසිරුණා වූ සිත ලෝකය තුළ අයාලේ යන්නට ඔබට බොහොම කෙටි, අධිවේගී කාපට් මාර්ග පෙන්වනවා. සතර අපාය නැමැති බිහිසුණු අනතුරු මුව අයා බලා සිටියදී ඔබ මේ අධිවේගී මාර්ගයේ ථීනමිද්ධයෙන් අඩ නින්දට වැටුණු දෑසින් ගමන් කරනවා. බියක් දැනෙන්නේ නැහැ. සිත විසිරිලා කාමච්ඡන්දයෙන් අයිතිකරගැනීමේ දිශාවටමයි අවධානය යොමුවෙලා තිබෙන්නේ. මගතොට මුණගැසෙන සෑම රතු එළියකදීම ඔබට මොහොතක් නැවතී යන්න සිත සකස්වෙන්නේ නැහැ. ඒ කෙටි විරාමයේදීත් සිත ව්‍යාපාදයෙන් නලියනවා. මේ යන ගමනේදී ඔබට මග නොමග කියාදෙන සත්පුරුෂයෙක් මුණගැසෙන්න පුළුවන්. ඒ සත්පුරුෂයා දෙසත් ඔබ විචිකිච්ඡාවෙන් බලන්නේ ඔබ තුළ මහා යුද්ධයක්, හඳුනානොගත් යුද්ධයක් විසින් නොමග මග බවට පත්කර කියාදෙන දරුණු සතුරන් පස්දෙනෙක් ඔබ ඔබේ සැබෑම මිතුරන් කරගෙන කෙසේ නම් ඔබ

සාමයේ සැබෑ අරමුණු ජයග්‍රහණය කරගන්නද? සැබෑම සාමයට එරෙහි වූ පංචනීවරණ නැමැති සතුරන් පස්දෙනා ඔබ ඔබේ මිතුරන් කරගෙන කෙසේනම් ඔබ සැබෑම සාමය අත්විඳින්නද?

පිංවතුනි, ලෝකය සැබෑම සුන්දරයි. මේ ඇස සැබෑවටම සුන්දරයි. තෘෂ්ණාවෙන් තොරව මේ ඇස දෙස බලද්දී මේ ඇසෙන් දකින රූපය සැබෑම සුන්දරයි. තෘෂ්ණාවෙන් තොරව රූපය දෙස බලද්දී මේ කන සැබෑම සුන්දරයි. මේ කන දෙස තෘෂ්ණාවෙන් තොරව බලද්දී මේ කනින් ඇසෙන ශබ්ද හරිම සුන්දරයි. මේ ශබ්ද තෘෂ්ණාවෙන් තොරව අසද්දී කොටින්ම මේ රූපය සුන්දරයි. තෘෂ්ණාවෙන් තොරව රූපය දකිද්දී තෘෂ්ණාවෙන් තොරව දකින රූපය කමටහනක්මයි. ලෝකයේ යථාර්ථය දැකීමට හේතු වූ මෙවලමක්මයි. මේ ඇස කමටහනකට විෂය වූ රූපයක්මයි. මේ ඇස, ඇසෙන් දුටු රූපය. මේ ඇස නිසාමයි ලෝකය දැක්කේ. මේ කන නිසාමයි ලෝකය ඇසුණේ. මේ නාසය, දිව, මනස, කය නිසාමයි ලෝකය දැනුණේ. ලෝකය දකින, ලෝකය ඇසුණ, ලෝකය දැනුණ නිසාමයි ලෝකයෙන් මිදෙන දිශාවට අපව යොමුවුණේ. ලෝකයේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම ස්වභාවයම අවබෝධකොට ගැනීමට හැකිවුණොත් එම අවබෝධය කරා යෑමට උපකාරී වූ මෙවලම් කෙසේ නම් අසුන්දරයි කියන්නද?

සතර මහා ධාතුවෙන් සැදුණු, නිරතුරුවම වෙනස්වන, අසුන්දර වූ රූපය අවබෝධයේ සැබෑම සුන්දරත්වය දෙසට යොමුකරගන්න. තෘෂ්ණාවෙන් තොරව රූපය දකින්න. එවිට රූපය සැබෑම සුන්දරයි. තෘෂ්ණාවෙන් තොරව ඔබ රූපය දැක්කොත් රූපය කෙරෙහි ඇලීමක්, ගැටීමක්, උපේක්ෂාවක් ඔබ තුළ ඇති නොවේවි. රූපය, රූපයේ ස්වභාවයෙන්ම වන අනිත්‍ය ස්වභාවයෙන්ම පවතීවි. ඒ අනිත්‍ය ස්වභාවය නැවත නැවත දකිමින් ලෝකයේ ඇත්ත දකිනා, තෘෂ්ණාවේ බර බිම තැබූ සැබෑ සුන්දර මිනිසෙක් වෙන්න. ඒ සුන්දර මිනිසුන්ට දැන් ලෝකය දුකක් නොව, දුක අවබෝධ කරගැනීමට විෂය වූ කමටහනකි. මෙවලමකි.

පිංවත් ඔබ සැමවිටම රූපය විවෘතව දකින්න. ටිකක් නොවේ, භාගයට නෙමෙයි, විවෘතවම රූපයේ රසය, හැඩය, වර්ණය, ස්පර්ශය විඳින්න. අසිහියෙන් නොවේ, සිහිමුලාවෙන් නොවේ. රූපයේ ආශ්වාදය තුළින්ම ගිහි පිංවතුන්ලා රූපයේ ආදීනවය ප්‍රකට කරගන්න. පිංවත් ඔබ රූපය ඉදිරියේ උපක්‍රමශීලී වන්න. යම් රූපයක් විවෘතව, විනිවිද, විදර්ශනාවෙන් නොදකින නිසාමයි එම රූපය කෙරෙහි නැවත, නැවත කෙලෙස් සකස්වෙන්නේ. මොනම රූපයක්වත් භාගෙට දකින්න එපා. එය විවෘතව අත්විඳලා එම රූපයේ නිසරුබව, විඳීමේ නිසරුබව අවබෝධ කරගන්න. නිසරු රූපය කෙරෙහි, විඳීම කෙරෙහි ඔබ ඇතිකරගන්නා තෘෂ්ණාවේ නිසරු බව වටහාගන්න.

තෘෂ්ණාවෙන් ගිනිගත් ඇස ප්‍රඥාවේ සිසිල් දියෙන් නිවී යනවිට ඇස නිසා සකස්වෙන ඵස්ස, වේදනා, සංඥා, සංඛාර, විඤ්ඤාණ ගිනි නිවී යන විට, ඇස ඔබට තවත් රූපයක් පමණක්ම වනු ඇති. ඇස ඇත. තෘෂ්ණාව නැත. තෘෂ්ණාවේ ගිනි නිවුණ ඇස තවත් බාහිර රූපයන් නිසා කෙසේ ගිනිගන්නද? මිනිස් සිතක සැබෑම සාමය, ලෝක සාමය ඇත්තේ මෙතැනය.

මේ ගින්න නොනිමෙන තාක්කල් සාමය යනු යුද්ධයට පෙර ඇතිවන නිහඬතාවයක් පමණක් වනු ඇත.

පිංවත් ඔබගේම රූපය තුළින් ධර්මය මතුකොට ගැනීමට හැකියාව තිබියදී ඔබ ඒ හැකියාව, තෘෂ්ණාව විසින් වසාදමලා, සතර සතිපට්ඨාන ධර්මය පොත්වලින් සොයනවා. පොත් විවෘත කිරීමට පෙරාතුව ඔබේම ශරීරය ඔබට විවෘතකරගන්න. ඔබේ ජීවිතය සරලභාවයට පත්කරගන්න. ඔබ විසින් ගොඩනගාගන්නා කෘතිමභාවය තුළ බරත්, ජීවිතයේ සරලභාවය තුළ සැහැල්ලුවත් මුලින්ම අත්දකින්න. කෘතිම භාවයේ බර යනු කෙලෙස්වල බරම බව දකින්න. සරළභාවයේ සැහැල්ලුව යනු නික්ලේශී බවම බව දකින්න. කෙලෙස් යනු අකුසල්මය. කෘතිමභාවයේ බරත්, කෙලෙස්වල බරත් දෙකටම මැදිවී ධර්මයෙන් බැහැරව යන මාර්ගයෙන් බැහැරව යන මාර්ගය ඔබේ ජීවිතයෙන් වසා දමන්න.

අපි මේ යන ගමනේදී ලෝකය තුළදී තරඟකාරීව නැගී සිටීමට, කැපී පෙනීමට සිතුවිලි සමග මහා යුද්ධයක් නේද නිරතුරුවම කරන්නේ. කුසල් අකුසල් මනසිකාරවලින් සන්නද්ධව යුද භූමිය තුළ ඔබ සටන්වදිනවා නේද? නිත්‍ය වූ ජයක්, පරාජයක් නැති ස්ථිර වූ දූකක් පමණක් ඇති රූපය අයිතිකොට ගැනීමේ යුද්ධය සැබෑම සාමයක් ඇතිකරගැනීමේ මාර්ගයට ඔබත් එන්න. මේ සැබෑ සාමයට එන ඔබට මුළු ලෝකයම අනතුරට ලක්වුවද ඔබ තුළ ඇති සාමයට අනතුරක් නොවනු ඇත. මුළු ලෝකයම විනාශවුවත් ඔබට නොසැලෙන සාමයක් ලබාදුන්නේ ඇමරිකාවවත්, රුසියාවවත්, චීනයවත් නොව ලොව්තුරු බුදුරජාණන් වහන්සේගේ ධර්මයයි. ලෝකය, ලෝකයා බොහෝම අවදානම් ගමනකයි යන්නේ. ඒ නිසා අනුන්ගේ දෑත් අත්හැර බුදුරජාණන් වහන්සේ සරණ කරගෙන පිංවත් ඔබ තුළ සැබෑ සාමය ඇතිකරගන්න. ඔබ කාමච්ඡන්දයන් දළුලන මිථ්‍යා සමාධියෙන් බැහැරව, සම්මා සමාධියටම පැමිණෙන්න.

ඇයි! ඔබ පිංවන්ත නැතිද?

අද පසළොස්වක පොහොය දවසක්. පිණ්ඩපාතය බෙදන වයෝවෘධ මව්වරු කිහිප දෙනෙක් පැමිණියා වන්දනා කරන්න. මින් එක් අම්මා කෙනෙක් අපි දන්න බොහොම සත්පුරුෂ ස්වාමීන් වහන්සේ නමකගේ අම්මා කෙනෙක්. මේ අම්මලා දෑත් නළලේ තබාගෙන බොහොම හැඟීම්බරව ප්‍රකාශ කළේ 'අපේ හාමුදුරුවනේ ඔබ වහන්සේලා දකීමත් මහා පිනක්' ය කියලා. ඒ වෙලාවේ භික්ෂුව එම මෑණිවරුන්ට ප්‍රකාශ කළේ 'මෑණිවරු සිතනවා නම් මා දකීම පිනක්ය කියලා, මා කියනවා ඔබලා වැනි මෑණිවරු දකීමත් පිනක්ය කියලා.' මොකද අපිව ලෝකයට බිහිකළේ, හොඳ නරක කියලා දුන්නේ අම්මලා, තාත්තලා නිසා. 'බුද්ධං සරණං ගච්ඡාමි' කියලා බුදුරජාණන්වහන්සේගේ සරණ මුලින්ම පිහිටෙව්වේ මව්වරු, පියවරු. ඒ නිසා මෑණිවරුනි අනුන්ගේ පින ගැන සිතනවා වගේම වඩාත් වටිනවා තමා කවුද කියන කාරණය සිහිපත් කරගැනීම. අපි හැමෝම අතින් ගිලිහෙන කාරණයක් මේක. ඔබේ වටිනාකම ඔබ සිතන්නේ නැහැ. අනුන් මත්තෙමයි යැපෙන්න හදන්නේ. මේ හැම අම්මා කෙනෙක්ම, මේ හැම තාත්තා කෙනෙක්ම අතීත බුද්ධ ශාසනවලදී තම මව්කුසවල්වලින් බිහිකරපු දරුවෝ රහතන් වහන්සේලා, අරහත් භික්ෂුණීන් වහන්සේලා වෙලා තිබෙනවා. එවැනි ආශ්චර්යමත් පිනැති දරුවෝ බිහිකරපු අම්මලා වුණු අවස්ථාවලදීත් ඔබලා සිතුවේ දරුවාගේ ආශ්චර්යය පමණයි.

ඒ රහතන්වහන්සේලා ඍද්ධියෙන් වඩිනකොට 'අනේ මගේ පුතා, දුව' කියලාමයි සාධුකාර දුන්නේ. ඔබට එදාත් සිතුණේ නැහැ එවන් උතුම් දරුවන් බිහිකරපු ඔබ මොනතරම් වාසනාවන්තද, පිංවන්තද කියලා. දරුවන්ව කර මත තබාගෙන බර ඇද්දා මිසක්, බර දරාගත් ඔබගේ ශක්තිය ගැන හැම මොහොතකම ඔබට අමතකවුණා.

මේ මොහොතේත් ඔබ කරන්නේ එයමයි.

එම නිසා එවැනි උතුම් දූවරු, පුතණුවන් ලබන්නට පිං කළ මැණිවරුනි, ඔබේ පුතාගේ, දුවගේ ආශ්චර්යයන් දකිනවා වගේම, ඔබට අමතකව ඇති ඔබේ පිංවත් බවත් දකින්න. එහෙම නොවුනොත් දරුවන් ලෝකයෙන් එතෙරට යාවි. ඔබලා මෙවරත් අසරණ වේවි.

තම ඥාති වර්ගයා තුළ අර්ථවත්ව චීවරයක් දරා ගැනීමට පිනැති දරුවෙක් උපදින්නේ හේතුඵල ධර්මයක් නිසාමයි. එම ඵලය අර්ථවත්ව නෙලාගන්න ඥාති සමූහයාම දක්‍ෂවෙන්න ඕනා. දරුවා කෙරෙහි ඇති ඡන්දරාගය වැඩිවෙනකොට, දරුවා වෙනුවෙන් මැරෙන්න, නිරයට යන්න සූදානම් තාත්තලා අම්මලා ඉන්නවා. දුරදිග නොබලා,ඉක්මනට ගන්න තීරණ ඉක්මනින්ම අපව දුකට කැඳවාගෙන යනවා. දරුවා තරම් කාම වස්තුවක් තවත් මේ ලෝකය තුළ නැහැ. සිදුහත් කුමාරයා එදින උපන් හුරුබුහුටි, පිනැති රාහුල කුමාරයාගේ ශරීරයවත් ස්පර්ශ නොකර ගිහිගෙදරින් නික්ම ගියේ දරුවා කියන කාම වස්තුවේ අනතුරුදායකබව දන්නා නිසාමයි. බැඳුණොත් ගැලවෙන්න බැරි බව දන්නා නිසාමයි. එම නිසා දරුවා කියන කාම වස්තුව අපි බොහොම පරෙස්සමින් පරිහරණය කරන්න ඕනේ. මොකද එය ගින්දරටත් වඩා අනතුරුදායක නිසා.

දරුවන් කෙරෙහි අපි ඇතිකරගත් ඡන්ද රාගය නිසා සසර මොනතරම් අපි සතර අපායන්හී දුක්විඳින්න ඇතිද? මනුෂ්‍ය අම්මාත්, තිරිසන් සත්ත්ව අම්මාත් කියන කාරණයේදී ආදරයේ වෙනසක් නැහැ. බලවත් අකුසල් හේතුවෙන් තම දරුවන් මරා දමන මනුෂ්‍ය අම්මලා වගේම, තිරිසන් සත්ත්ව අම්මලාත් ඉන්නවා. බුදුරාණන්වහන්සේ දේශනා කරනවා අම්මා කෙනෙක් තම දරුවන් වෙනුවෙන් සංසාරයේ හෙළපු කඳුළු මහා සාගරයේ ජලයටත් වඩා වැඩිය කියලා. මේ සා කඳුළු සාගරයක් දරුවන් වෙනුවෙන් හෙළලා මේ උතුම් ජීවිතයේදී එම කඳුළු සාගරයට තවත් කඳුළු බාල්දි හත අටක් එකතුකරලා ඔබ මියගියහොත් එය අවාසනාවක්මයි.

පිංවත් ඔබට පුළුවන්කම තිබෙනවා මේ කඳුළු සාගරයම මේ ජීවිතයේදීම සින්ඳන්න. එය කළහැක්කේ දරුවන් කෙරෙහි තව තව ඡන්දරාගය

සකස්කර ගැනීමෙන් නොවේ. දරුවා කියන කාම වස්තුවේ අනිත්‍ය බව, දුක්ඛ, අනාත්ම බව අවබෝධ කරගැනීමෙන්.

පිංවත් මැණියනි, මේ මොහොතේ මා භික්ෂුවක්, ඔබ දායිකාවක්. මේ මොහොතේ අපේ හමුවීම එසේ වුවත් අතීත සංසාරයේ කොතෙක් නම් මේ සටහන් ලියන භික්ෂුව ඔබට පුතෙක් වෙලා ඇතිද? ඔබේ සහෝදරයෙක්, ඔබේ ස්වාමිපුරුෂයා වෙලා ඉන්න ඇතිද? ඔබේ මුණුපුරෙක්, ගුරුවරයෙක් වෙලා ඉන්න ඇතිද? ඔබ වැඳිරියක් වෙලා, ඒ වැඳිරියගේ පැටවා මම වෙලා, මොනතරම් ඔබේ ශරීරයේ මා එල්ලාගෙන අත්තෙන් අත්තට පනින්නට ඇතිද? ඔබ බැළලියක් වෙලා මම එම බැළලියගේ පැටවා වෙලා මොන තරම් ඔබ මාව කටින් එල්ලාගෙන තැන් තැන්වල ආරක්ෂාවට සඟවන්න ඇතිද? ඔබ කිකිළියක් වෙලා මම ඔබේ පැටවා වෙලා ඔබ මොන තරම් නම් පණුවන් ඇහිඳ ඇහිඳා මට කවන්නට ඇතිද? ඔබ එළදෙනෙක් වෙලා මම ඔබගේ වසුපැටවා වෙලා ඔබ මට තණබුරුලුවලින් මොනතරම් කිරි පොවන්නට ඇතිද? ඔබ කිඹුලියක් වෙලා, මම ඔබේ කිඹුල් පැටවා වෙලා පුංචි කාලයේදීම ඔබ මාව කී වතාවක් නම් මරාගෙන කන්න ඇතිද? ඔබ ප්‍රේතියක් වෙලා, එම ප්‍රේතියගේ දරුවා මම වෙලා ඔබ මට මොනතරම් සෙම් සොටු කවන්න ඇතිද? සෑම අම්මා කෙනෙක්ම තාත්තා කෙනෙක්ම මෙය තම ජීවිතයට ගලපා දකින්න.

යථාර්ථය මෙය නම් ඔබට සිතෙන්නේ නැතිද දරුවා කියන කාම වස්තුවේ ඇති අනතුරුදායකබව.

අපි දෙගොල්ලෝ ගනුදෙනුවක් කරන්නේ. දරුවන් නිසා මව්පියන් දුකට වැටෙනවා. ඊළඟට දරුවන් දෙමාපියන් වෙලා තම දරුවන් උදෙසා දුකට වැටෙනවා. නිමාවක්, සීමාවක්, විරාමයක් නැවතීමක් නැහැ.

ඔබේත් මගේත් ඇස් වහලා දුක ගලාගෙනයනවා.

අපි සුදානම් අපේම දෑසින් ගලාගෙන ගිය කඳුලු සාගරය මත කිමිදි කිමිදී අනතුරු අමතක කර ආශ්වාදයම සොයන්න.

හිතන්න මව්කුසක ඇති අපුලභාවය. තවත් ගර්භාෂ කුටියකට රිංගා නොගන්න බවට ඔබ ඔබට සපථ වෙන්න. ජීවත්ව සිටින දෙමාපියන්ට, දරුවන්ට යුතුකම් නොපිරිහෙලා ඉටුකරමින් නැවත මව්කුසක් එපාය කියන දිශාවටම ගමන් කරන්න.

දරුවන්ට දෙමාපියන් කියන්නේත් හොඳ කමටහනක්. දරුවන්ට පුළුවන් මනසින් අනාගතයට යන්න. තමනුත් අනාගතයේදී විවාහවෙනවා, දරුමුණුපුරන් හදනවා, වයසට යනවා. මේ දුක මටත් උරුමයි කියලා. දෙමාපියන්ට පුළුවන් අතීතයට මනසින් යන්න. අපිත් මේ දරුවන්ගේ වයසේ සිටියා දැන් සියල්ල අනිත්‍යවෙලා අපේ දුක, අපේ කඳුළු, අපේ ශ්‍රමයෙන්මයි දරුවන් ලොකු මහත් වුණේ. අපේ ශක්තිය ක්ෂයවෙලා යනකොට දරුවෝ ඒ ශක්තියෙන් ලොකු මහත් වෙනවා.

ඔබට පුළුවන්නම් එහෙම දකින්න, සංසාරයක් පුරාවට ඔබට අම්මා, තාත්තා වූ සියල්ලන්ටම යුතුකම් ඉටුකළ දරුවෙක් වෙනවා ඔබ.

දුකට කැමති අය දුක දෙසටම ගියාවේ. දුකට අකමැති ඔබට පුළුවන්, මුළු ලෝකයම එකම දිශාවකට ගියත් ඔබ තනියම ලෝකයේ සැබෑම සැපය ඇති දිශාවට යන්න. මේ යන ගමනේදී මුළු ලෝකයෙන්ම ඔබ කොන්වුවත්, ඔබ බයවෙන්න සැලෙන්න එපා. කව්රු නැතිවුණත් ඔබ ළඟ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සිටිනවාය කියන විශ්වාසය ඇතිකරගන්න. මුළු ලෝකයම අත්හැරලා ඔබ බුදුරජාණන් වහන්සේගේ ගොඩට එන්න. මුළු ලෝකයම ඔබේ කරට අතදාගෙන සිටියත් වැඩක් නැහැ, බුදුරජාණන් වහන්සේ ඔබ ළඟ නැතිනම්. ඔබ අනාථයන් අතර තවත් අනාථයෙක් පමණයි. අනාථයින් අතර ඔබ සනාථ පුද්ගලයෙක් වෙන්න. අපි හැම වෙලාවේම ලෝකයට බයයි. සමාජයට බයයි. ඒ අපේ අසරණභාවයට හේතුව බුදුරජාණන් වහන්සේ සරණ නොකරගන්නා නිසයි, ධර්මයේ ශක්තිය හඳුනා නොගත් නිසයි.

මේ සටහන් ලියන භික්ෂුව යම් දවසක ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සරණ කරගත්තද, එදා පටන් ලෝකය කියන දෙය තණ දොයිතුවකටවත් තැකුවේ නැහැ. 'බුදුරජාණන්වහන්සේ' කියන අයෝමය විශ්වාසය හමුවේ ලෝකය කියන්නේ හුදු මායාවක්,

රැවටීමක්, අසරණභාවයක් කියන කාරණයමයි දැනුණේ. හෙටක් කියන කාරණය දැනුණේ නැහැ. රැයක්, දවාලක් කියන කාරණය දැනුණේ නැහැ. මේ ඉහළට ගන්නා හුස්ම පොද පහළට ගන්නා මොහොතේ මැරෙයි කියන කාරණයයි දැක්කේ.

මේවා හේතුඵල ධර්මයන්. උතුම් ධර්මයේ ආශ්චර්යයෙන් ගොඩනැගෙන ඵලයක්. මේ සහශක්තිමත් ධර්ම මාර්ගයක් තිබෙනකොට ඇයි අපි අසරණවෙන්නේ, ලෝකය බදාගෙන.

උදේට පංච ශීලය සමාදන්වෙන පිංවත් මහත්මයා, හවසට මඟුල්ගෙදර ගිහින් අරක්කු බොනවා. අරක්කු බීවේ ඇයි කියලා ඇහුවහම 'යාළුවෝ තරහ වෙයි කියලා බීවා' කියනවා. බලන්න මෝහයේ විශාලත්වය. පංචශීලයවත් සමාදන් නොවූ මිතුරන්ගේ මිතුරුකම උදෙසා, ඔබ වෙනුවෙන්ම සාරසංඛ කල්ප ලක්ෂයක් ඇස්, ඉස්, මස්, ලේ දන්දෙමින් කැපකිරීම් කළ බුදුරජාණන් වහන්සේට පිටුපානවා. බුදුරජාණන් වහන්සේගේ සරණ අහිමි කරගන්නවා. අනේ ඔබ අසරණයි, බයයි, කෑදරයි.

ඔබට වටින්නේ ඔබව දුකින් මුදවාගැනීම උදෙසා ඒ සා කැපකිරීම් කළ බුදුරජාණන් වහන්සේද, නැතිනම් මිතුරන්ද?

හිතවතාටත්, ඥාතියාටත් වඩා පහළ තැනක ඔබ බුදුරජාණන් වහන්සේව තැබුවහොත්, ඒ මොහොතේම ඔබේ සිත පිහිටන්නේ සතර අපායේයි. මිතුරන් උදෙසා නිරයට වැටෙන අදක්ෂයෙක් වෙන්න එපා. ඔබ සැබෑ ලෙසින්ම තෙරුවන් සරණගිය පිංවතෙක් නම්, ඔබ තුළ ආත්ම ශක්තියක් සකස්වෙන්න ඕනේ සමාජය තුළ දුස්ශීලභාවය ඉදිරියේ සිල්වත්ව නැගී සිටින්න.

සෑම මොහොතකම සිතන්න බුදුරජාණන් වහන්සේ ඔබ දෙස බලා සිටිනවාය කියලා. එවිට පිංවත් ඔබට පුළුවන් මිතුරන් සියයක් ඉදිරියේ වුවත් ඔබේ ශීලයට අනතුරක් වෙනවා නම් එම තැනින් ඉවත්ව යන්න. එවිට යාළුවෝ ඔබට බැන්නත්, පිංවත් දෙවියන් ඔබට සාධුකාරදේවි. ධර්ම මාර්ගය තුළ ඔබ තව තවත් ශක්තිමත් වේවි. අසරණයන්ගෙන් මිදී සරණක් ලැබූ අය අතරට යන කෙනෙක් වේවි.

සමාජය අනතුරුදායක නම්, ශිල්පද ඔබ ඔබේ සැබෑ මිතුරා බවට පත්කරගන්න. එවිට සිතේ සංසිඳීමක් ඇතිවේවි. එම සංසිඳුණ සිත ඔබ ඉදිරියේ ඇති බියකරු යථාර්ථය හොඳින් ග්‍රහණය කරදේවි. එවිටයි ඔබට පුළුවන් ලෝකයට ආදරය කරන සැබෑම ආදරවන්තයෙක් වන්න. ආදරය කියන වචනයට සමාජය ගොඩාක් අර්ථයන් දෙනවා. ලෝකය කියන කාරණය ගනිද්දිත්, 'ලෝකය දුකය' කියන කාරණය ගනිද්දිත් සමාජය ආදරයට දෙන අර්ථකථන වැරදි නැහැ. ඒ නිසා ඒවා ලෝකයේ ස්වභාවයේම තිබුණාවේ. ඒවා වෙනස්කරන්න අපි කාටවත් බැහැ. ඒවා දුකට අයිති ලෝකයේ ස්වභාවයයි. එම නිසා අනාගතයේදී තව ඕනෑතරම් ටජ්මහල් ඉදිවේවි. එක්ටැම්ගෙවල් ඉදිවේවි. ජීවිත පූජාවන් සිදුවේවි. සිහිමුලාවන්ට පත්වේවි. මුසාබස්වලට තරුණ තරුණියන් විකිණේවි. කාමයේ ආදීනවය, නිස්සරණය නොහඳුනන්ගේ ලෝකයේ ආශ්වාදයේ කෙටි වූ දුක් කඳුළු සහ සතුටු කඳුළු මහා සාගරයේ දිය පරයා යන තරමට දෑස්වලින් වැගිරේවි. දුකටත් සැපයටත් එකම කඳුළ හෙලන මුලාවේ ලෝකය, තව තව සුන්දර අර්ථකථනයන් ආදරය ගැන සමාජයට සපයාවි. ඒ අය ආදරවන්තයන්ගේ වීරයන්, වීරවරියන් වේවි. එම වීරයන්, වීරවරියන්ම තම ජීවිතයේ අවසන් කාලයේ, අසරණභාවයෙන්, අනුනගේ ආදරය ඉල්ලා ජීවත්වෙයි. සමාජයේ කොයි තරාතිරමේ සිටියත් ඔතැනට තමයි අපි යන්නේ. ආදරයේ නාමයෙන් අපි බොරුවක්මයි කරන්නේ. ඔබට ආදරය නොකරන ඔබ, අනුනට කෙසේ ආදරය කරන්නද? ඔබ ළඟත් නැති දෙයක් ඔබ කෙසේ නම් අනුනට දෙන්නද? නැති බව නොදන්නාකම නිසාම, ඇති බව සිතමින් තමනුත්, අනුනුත් දුකට වැටීමයි අවසානයේ සිදුවන්නේ.

එවන් දුකට ලෝකයකුයි අප ඉදිරියේ තිබෙන්නේ. තමා තමාට ආදරය කරනවා කියන්නේ ආත්මාර්ථකාමීව තමාගේ ගොඩ ලොකු කරගන්නවා කියන කාරණය නොවෙයි. මුලින්ම තමා සුරක්ෂිතභාවයට පත්වෙනවා. කුමක්ද මේ ලෝකයේ තිබෙන සැබෑම සුරක්ෂිතභාවය. තෙරුවන් සරණේ පිහිටලා, ශීලයක් සමාදන්වීම තරම් සුරක්ෂිතභාවයක් පිංවත් ඔබට හමුවන්නේ නැහැ. මෙතැනදි ගිහි පිංවතුන්ලා දස කුසල්ම ජීවිතයට එකතුකරගන්න දක්ෂ වෙන්න ඕනේ. කයෙන්, වචනයෙන්

වන අකුසල් වගේම මනසින් අකුසල් වන ලෝභ, ද්වේශ, මෝහ කියන කාරණා ගැන අවධානයෙන් ඉන්න ඕනේ.

ලොව්තුරා බුදුරාජාණන් වහන්සේ මහා සිහනාද සූත්‍රයේදී දේශනා කරනවා, දුස්ශීලභාවය නිසා අනාගතයේදී මනුෂ්‍යයාගේ ආයුෂ ක්‍රමානුකූලව කෙටි වෙමින් පරමායුෂ වසර 10 ක් වන බව. එදාට මනුෂ්‍යයා තුළ මෘග සංඥාවන් මතුවෙලා, මිනිසෙක් තවත් මිනිසෙක්ව දකින්නේ මුවෙක් හැටියට කියලා. මේ මෘග සංඥාවන් නිසා මිනිසා තියුණු අවි ආයුධවලින් එකිනෙකා මරාගන්නවා කියලා.

ලෝකය යම් දවසක මේ තැනට යා යුතුමයි. ඒ නිසාමයි ලෝභ, ද්වේශ, මෝහ කියන කාරණා ලෝකයට අයිති ධර්මතාවයන් වෙන්නේ. ඒවා ලෝකය තුළ තිබිය යුතුයි. ඒවා නැතිකරන්න ඔබට මට බැහැ. මේ විෂම ධර්මතාවය තේරුම්ගෙන පිංවත් ඔබ ලෝකයාගේ ලෝභය තුළ ඔබගේ 'අලෝභය' දකින්න. ලෝකයාගේ ද්වේශය තුළ ඔබගේ මෛත්‍රිය දකින්න. ලෝකයාගේ මෝහය තුළ ඔබගේ අමෝහය දකින්න. වැරදි කරන ලෝකය තුළ 'ටිකක් නිවැරදි' කෙනෙක් වෙන්න උත්සහ ගන්න එපා. වඩාත් නිවැරදි කෙනා වෙන්න උත්සහ ගන්න. මෙතැනයි ලොව්තුරා ධර්මය තිබෙන්නේ. දුස්ශීලභාවය විසින් යම් දවසක මිනිසාගේ ආයුෂ වසර දහයක් දක්වා අල්ප කරනවා වගේම, ශිල්වත්භාවය නිසා නැවත ක්‍රමානුකූලව, ශීලයේ ශක්තියෙන් මනුෂ්‍යයා සකස්වෙමින් අවුරුදු 80,000 ක් පරමායුෂ ඇති මිනිසුන්ගේ ලෝකයක් ක්‍රමානුකූලව බිහිවෙනවා කියලා ඉහත සූත්‍රයේදී බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා. බලන්න දුස්ශීලභාවයත්, ශීලයත් අතර තිබෙන පරතරය. පිංවත් ඔබ, ආදරයත්, අනාදරයත් අතර තිබෙන පරතරය වශයෙන්ද මෙය දකින්න පුළුවන්. පරතරය මේ සා විශාල වුවද, මේ යථාර්ථය අවබෝධ කරගැනීම සඳහා ගොඩාක් දේවල් කිරීමට අවශ්‍ය නැහැ. එක සිතිවිල්ලයි වෙනස් කරගත යුත්තේ. රූපය සැපය කියලා ගන්නා වූ මිථ්‍යා සිතුවිල්ල. වේදනාව, සංඥාව, සංස්කාර, විඤ්ඤාණය සැපය, නිත්‍යය, ආත්මීයය කියලා ගන්නා වූ මිථ්‍යා සිතුවිල්ල වෙනස් කරගැනීම පමණයි ඔබ කළ යුත්තේ. පිංවත් ඔබ මේ කාරණා පහට බැඳෙන්නේ තෘෂ්ණාව නිසාමයි. 'තෘෂ්ණාව'

කියන එකම කාරණය ගැන නුවණින් සිතුවත් ඔබට පුළුවන් මාර්ගයක් පාදාගන්න. මෙන්න මේ මාර්ගය පාදාගන්න ශීලය මහෝපකාරී වෙනවා.

ඔබ සමාදන්ව ආරක්ෂාකරන සෑම ශිල්පදයක් පාසාම ඔබ කැමති දෙයක් ඔබට අතහැරෙනවා. ඔබ දක්ෂවෙන්න ඕන ශීලය විසින් ලබාදුන් දක්ෂභාවය වඩාත් අර්ථවත් කරලා අලෝභ, අද්වේෂ, අමෝහ කියන යථාර්තයන් තුළින් ඔබ රැස්කරගත් කුසල් සංස්කාර ආරක්ෂා කරගන්න. ඒ අවස්ථාව පිංවත් ඔබට ලබාදෙන්නේ අනිත්‍ය සංඥාවන් ජීවිතය තුළින් දැකීමෙන්. මෙතැනදී පිංවත් ඔබට සැබෑම සාමයත්, සැබෑම ආදරයත් ලෝකයාට දැක්වීමට හැකිවේවි. තමන් ආදරය නාමයෙන් කරන්නේ ලෝභ, ද්වේෂ, මෝහය තීව්‍ර කරගැනීම නම් පිංවත් ඔබ කාට ආදරය කළත් එතැන සකස්වෙන්නේ තෘෂ්ණාවමයි.

තෘෂ්ණාවෙන් බැඳුණ දෙය ඔබෙන් ඈත්වෙන විට එතැන සකස්වෙන්නේ ද්වේෂයයි. තමන්ට අයිති නැතිදෙයක් කෙරෙහි තෘෂ්ණාවෙන් බැඳෙන්නේ මෝහය නිසාමයි. අවසානයේදී ආදරයේ නාමයෙන් ඔබ කරන්නේ අනාදරයයි. එම නිසා පිංවත් ඔබ ලෝකයාට ආදරය කිරීමට පෙර දසකුසල් ධර්මයන් පිංවත් ඔබේ ජීවිතයේ සහකරු, සහකාරිය කරගන්න. පිංවත් ඔබට දැනේවි සශ්‍රීක දිව්‍යතලයක දෙවියෙක් දිව්‍යංගනාවක් ඔබ ළඟ සිටිනවා වගේ. විසිතුරුභාවයත්, පිවිතුරු භාවයත්, විශ්වාසයත් ඔබට ඇතිවේවි. ඔබට තනිකමක් දැනෙන්නේ නැහැ. බියක් සකස්වෙන්නේ නැහැ. 'මා අසරණයි' කියන හැඟීමක් ඇතිවෙන්නේ නැහැ. ශීලයේ ශක්තිය නිසාම සමාධිමත් සිතුවිලි ඇතිවේවි. ඒ සමාධිමත් සිතුවිලි ආදරයත් අනාදරයත් අතර වෙනස ඔබට අත්දැකීමෙන් පසක් කරදේවි. දස කුසල් ඔබේ ජීවිතයේ සහකරු සහකාරිය කරගැනීමට ඔබ දක්ෂවුවහොත් ඔහු ඇය ඔබට පාවඩ එලනුයේ සුගතිය දෙසටමයි. පිංවත් ඔබ මේ යන ගමනේදී බුදුරජාණන් වහන්සේ දේශනාකර වදාළ ධර්මයම මාර්ගය කරගන්න. බුදුරජාණන් වහන්සේ දේශනාකර වදාළ සබ්භාශ්‍රව සූත්‍රය, ආනාපාන සති සූත්‍රය, සතර සතිපට්ඨාන සූත්‍රය තුළ භව නිරෝධයට අවශ්‍ය කරුණු කාරණා අන්තර්ගතව තිබෙනවා. මහාසිහනාද සූත්‍රය,

සප්තසූර්යගමන සූත්‍රය ජීවිතයට එකතුකරගැනීමෙන් අනාගත සංසාර බිය හොඳින් ඔබට ඇතිකරගන්න පුළුවන්. ඉහත සූත්‍ර පහ කියවන්න කියල විශේෂයෙන් සඳහන් කළේ අනෙක් සූත්‍ර වැදගත් නැහැය කියල නොවේ. සෑම සම්බුදු වදනක්ම එක හා සමානව වැදගත්. නමුත් කාර්යබහුල ලෝකයේ ඔබට සියළුම සම්බුදු වදන් මේ සූත්‍ර පහ තුළ කැටිවී තිබෙනවාය කියල භික්ෂුවට හිතෙනවා. එය වැරදි නම් සමාවෙන්න. සාරිපුත්ත මහරහතන් වහන්සේටත් වැරදුණ තැන් බුදුරජාණන් වහන්සේ නිවැරදි කළා. සාරිපුත්ත මහරහතුන් වහන්සේට වැරදුණානම් අපි කවුරුන්ද? එම නිසා අපි, අපි ගැන අධිතක්සේරුවකට එන්න හොඳ නැහැ. සෑම විටම නොදන්නා භාවය දැනගැනීමෙන්මයි අපිට දන්නා භාවයට පැමිණිය හැක්කේ. එහෙම වුණොත් පමණයි දන්නා භාවයට පැමිණ නොදන්නා භාවයෙන් ලෝකය තුළ ජීවත්වෙන්න හැකිවෙන්නේ. මෙන්න මෙතනටයි අපි හැමෝම එන්න උත්සහ ගන්න ඕනේ.

ගෝරතර සසරේ
තවත් එක් සන්ධියක
ඉබාගාතේ ඇවිදි
සංසාර සතුන් හට
නොඇලෙන්න කියාදුන්
නොගැටෙන්න සිහිය දුන්
අතහරින සතිය දුන්
නිදුකානගේම පුත්
සඟ මැණික ඔබම විය

කරගන්න මහ කුසල්
බෙදා ලොවටම දහම
ඔබේ අවබෝධයෙන්
සැනසීය මනු කැලක්
එමතු නොව දෙවියෝද
එයින් තුටු වනු දනිමි

සාරිපුත් පරපුරේ
අපේ කාලේ උපන්
මහකසුප් මහතෙරගෙ
එමඟ යන බුදු පුතුනි
එක්කෝ මරණයය
නොමැතිනම් නිවනමය
කියා කළ සිහ නාද
තව කොහෙන් අසන්නද

ඔබේ දම් ගැලපුමට
නොතිත් පැසසුම් එතැයි
කියූ කල මා ඔබට
පුතේ මේ මගෙ නොවෙයි
බුදුරජුන් දහමමය
නිහතමානීව කිවු
ඒ වදන් රාවදෙයි

කොහේ හෝ වන පෙතක
මේ මොහොතෙ වැඩ සිටින
අපේ පිනටම උපන්
හිමියනේ ඔබෙ ගුණෙන්
දකිමු අපි බුදු රජුන්

ඒ අමා මෑණියන්
සහස් දෙකකුත් අඩක්
ගෙවී වස් ගතවෙතත්
වදයි ඔබ වැනි පුතුන්
ලෝ සතට සෙනෙහසින්

ISBN 978-955-1118-11-2

මිල රු. 140 /-